192 වන කාණ්ඩය - 3 වන කලාපය
தொகுதி 192 - இல. 3
**Volume 192 - No. 3**

2010 අගෝස්තු 04 වන බදාදා
2010 ஓகஸ்ட் 04, புதன்கிழமை
**Wednesday, 04th August, 2010**

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**විගණකාධිපතිවරයාගේ වාර්තාව**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**වරප්‍රසාද :**
2010.08.03 දින පැවැති අධ්‍යාපන අමාත්‍යාංශයේ විශේෂ උපදේශක කාරක සභාවට සහභාගි වීම වැළැක්වීම

**වරප්‍රසාද යෝජනාව:**
2010 මැයි 04 දින පාර්ලිමේන්තු රැස්වීමට සහභාගි වීම වැළැක්වීම
2010 මැයි 05 දින පාර්ලිමේන්තු රැස්වීමට සහභාගි වීම වැළැක්වීම

**අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදී

**කල් තැබීමේ යෝජනාව:**
රාජ්‍ය සේවක විශ්‍රාම වැටුප් විෂමතා

**ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු**

---

# பிரதான உள்ளடக்கம்

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**சிறப்புரிமை:**
2010 மே 04ஆந் திகதி கல்வி பற்றிய ஆலோசனைக்குழுவில் கலந்துகொள்வதைத் தடுத்தமை

**சிறப்புரிமைப் பிரேரணை:**
2010 மே 04ஆந் திகதி பாராளுமன்ற அமர்வில் கலந்துகொள்வதைத் தடுத்தமை
2010 மே 05ஆந் திகதி பாராளுமன்ற அமர்வில் கலந்துகொள்வதைத் தடுத்தமை

**நீதித்துறை (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு, நிறைவேற்றப்பட்டது

**ஒத்திவைப்புப் பிரேரணை:**
அரச ஊழியர் ஓய்வூதிய முரண்பாடு

**வினாக்களுக்கு எழுத்துமூல விடைகள்**

---

# PRINCIPAL CONTENTS

AUDITOR-GENERAL'S REPORT

ORAL ANSWERS TO QUESTIONS

PRIVILEGE:
Precluding Participation at Special Consultative Committee on Education held on 3rd August 2010

PRIVILEGE MOTION:
Precluding Participation at Parliament Sitting on 04th May 2010
Precluding Participation at Parliament Sitting on 05th May 2010

JUDICATURE (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed

ADJOURNMENT MOTION:
Pension Anomalies of Public Servants

WRITTEN ANSWERS TO QUESTIONS

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

***2010 අගෝස්තු 04 වන බදාදා***
*2010 ஓகஸ்ட் 04, புதன்கிழமை*
*Wednesday, 04th August, 2010*

***අ.භා. 1.00ට පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.***
*பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 1.00 p.m.,* MR. SPEAKER [THE HON.CHAMAL RAJAPAKSA] *in the Chair.*

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
### கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
### AUDITOR-GENERAL'S REPORT

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වැනි ව්‍යවස්ථාව ප්‍රකාර 2007 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ XIV වැනි කොටස සහ හයවැනි කාණ්ඩයේ X වැනි කොටස; 2008 මුදල් වර්ෂය සඳහා වාර්තාවේ පස්වැනි කාණ්ඩයේ VIII වැනි කොටස සහ හයවැනි කාණ්ඩයේ XIV වැනි කොටස; 2009 මුදල් වර්ෂය සඳහා වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ I සහ II වැනි කොටස්, දෙවැනි කාණ්ඩයේ I සහ II වැනි කොටස් සහ හතරවැනි කාණ්ඩයේ I වැනි කොටස ඉදිරිපත් කරමි.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා )**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තාවේ එකී කොටස් මුද්‍රණය කළ යුතුය"යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## පෙත්සම්
### மனுக்கள்
### PETITIONS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා - පැමිණ නැත.

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා (අධිකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன - நீதி அமைச்சர் )
(The Hon. Athauda Seneviratne - Minister of Justice)

ගරු කථානායකතුමනි, තෝලංගමුව, සීගිරි සෙවන පදිංචි කේ.ජී. වසන්ත කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු කුමාර වෙල්ගම මහතා - පැමිණ නැත.

ගරු දයාශ්‍රිත තිසේරා මහතා - පැමිණ නැත.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

ගරු කථානායකතුමනි, ගෝනවිල, මාකඳුර "සිසිල" නිවසෙහි පදිංචි එම්. එම්. තිලකරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)

ගරු කථානායකතුමනි, රජවැල්ල, විජයශ්‍රීගම, "ප්‍රදීප" නිවසෙහි පදිංචි එල්.සී. ධර්මසූරිය මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)

ගරු කථානායකතුමනි, කළුතර, පලාතොට, සරත් මාවත, "ජනිත" නිවසෙහි පදිංචි ජී.බී. සිරිල් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු රුවන් විජයවර්ධන මහතා - පැමිණ නැත.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
### வினாக்களுக்கு வாய்மூல விடைகள்
### ORAL ANSWERS TO QUESTIONS

### ඇහැලියගොඩ අධ්‍යාපන කලාපය : ගුරුවරු
### எகலியகொட கல்வி வலயம்: ஆசிரியர்கள்
### SCHOOLS IN EHELIYAGODA EDUCATION ZONE: TEACHERS

0106/'10

2. **ගරු මහාචාර්ය රජීව විජේසිංහ මහතා**
(மாண்புமிகு பேராசிரியர் ரஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) ඇහැලියගොඩ අධ්‍යාපන කලාපයේ ළමයින් 100 කට වඩා අඩු සංඛ්‍යාවක් අධ්‍යාපනය ලබන පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) 2008 සහ 2009 වර්ෂවලදී මෙම එක් එක් පාසලෙහි සාමාන්‍ය පෙළ සහ පහ වසර ශිෂ්‍යත්ව විභාගයන්හි ප්‍රතිඵල කවරේද;

(iii) මෙම පාසල්වලට අවශ්‍ය තරමට, ප්‍රමාණවත් ගුරුවරු සංඛ්‍යාවක් සිටින්නේද;

(iv) ගුරුවරුන් නොපැමිණෙන අවස්ථාවලදී මෙම පාසල්වල ශිෂ්‍යයන් ඵලදායී කාර්යයන්හි නිරත වීම තහවුරු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඇහැලියගොඩ අධ්‍යාපන කලාපයේ,

(i) ප්‍රමාණවත් ගුරු සංඛ්‍යාවක් නොමැති විශාල පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) විද්‍යාව හෝ ගණිතය හෝ ඉංග්‍රීසි විෂයයන් සඳහා ප්‍රමාණවත් ගුරුවරු සංඛ්‍යාවක් නොමැති විශාල පාසල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ග්‍රාමීය ශිෂ්‍යයන්ට ප්‍රමාණවත් ගුරුවරුන් ලබා දීම තහවුරු කිරීම සඳහා පාසල් සහ ගුරු සේවක සංඛ්‍යාව ප්‍රතිසංවිධානය තුළින් කාර්යක්ෂම කිරීමට පළාත් අධ්‍යාපන අමාත්‍යවරුන් සඳහා එතුමා නිර්ණායක සකසන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) எகலியகொட கல்வி வலயத்தில் 100 க்கும் குறைவான பிள்ளைகள் கல்வி பயிலும் பாடசாலை களின் எண்ணிக்கையையும்,

(ii) அந்த ஒவ்வொரு பாடசாலையினதும் 2008, 2009 ஆம் ஆண்டுகளுக்கான சாதாரண தரப்பரீட்சை மற்றும் 5 ஆம் ஆண்டு புலமைப்பரிசில் பரீட்சை ஆகியவற்றின் பெறுபேறுகளையும்,

(iii) அப்பாடசாலைகள் போதிய ஆசிரியர்களைக் கொண்டிருக்கின்றனவா என்பதையும்,

(iv) அத்தகைய பாடசாலைகளில் ஆசிரியர்கள் சமுக மளித்திராத போது மாணவர் களை பயனுள்ள வகையில் ஈடுபடுத்தி வைத்திருப்பதை உறுதிப் படுத்த மேற்கொள்ளப்படும் நடவடிக்கைகளையும்

அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(ஆ) எகலியகொட கல்வி வலயத்தில்,

(i) போதிய ஆசிரியர்களைக் கொண்டிராத பெரிய பாடசாலைகளின் எண்ணிக்கையையும்,

(ii) விஞ்ஞானம் அல்லது கணிதம் அல்லது ஆங்கிலத் திற்கு போதிய ஆசிரியர்களைக் கொண்டிராத பெரிய பாடசாலைகளின் எண்ணிக்கையையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) கிராமிய மாணவர்களுக்கு போதிய ஆசிரியர்கள் வழங்கப்படுவதை உறுதிப்படுத்தும் விதத்தில் பாடசாலை களதும், கற்பித்தல் ஆளணியினதும் நியாயபூர்வமான பங்கீட்டினை உறுதிப்படுத்த, மாகாண கல்வி அமைச்சு களுக்கான வழிகாட்டு நெறிகளை வகுப்பாரா என்பதை அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this house -

(i) the number of schools in the Eheliyagoda Education Zone which have less than 100 children on roll;

(ii) the results of the Ordinary Level Examination and the Year 5 Scholarship Examination in each of those schools for the years 2008 and 2009;

(iii) whether such schools have sufficient complement of teachers; and

(iv) the measures to ensure the students of such schools are kept gainfully occupied when teachers are absent?

(b) Will he state in Eheliyagoda Education Zone -

(i) the number of larger schools which have insufficient teachers; and

(ii) the number of larger schools which have insufficient teachers for science, mathematics or English?

(c) Will he inform this House whether he would draw up guidelines for Provincial Ministries of Education to ensure rationalization of schools and teaching cadres so as to ensure that rural students are provided with adequate teaching staff?

(d) If not, why?

**ගරු බන්දුල ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பந்துல குணவர்தன - கல்வி அமைச்சர்)
(The Hon. Bandula Gunawardane - Minister of Education)

(අ) (i) ඇහැලියගොඩ අධ්‍යාපන කලාපයේ ළමයින් 100කට වඩා අඩු සංඛ්‍යාවක් අධ්‍යාපනය ලබන පාසල් සංඛ්‍යාව: 14යි.

(ii) 2008 සහ 2009 වසරවලදී මෙම එක් එක් පාසලෙහි සාමාන්‍ය පෙළ සහ 5 වසර ශිෂ්‍යත්ව විභාගයන්හි ප්‍රතිඵල ඇමුණුමෙහි දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

(iii) පහත සඳහන් පාසල් 5 සඳහා ප්‍රමාණවත් ගුරු සංඛ්‍යාවක් නැත.

1. ර/ගැටහැත්ත දෙමළ විද්‍යාලය
2. ර/උතුරු කරඳන විද්‍යාලය
3. ර/වැවිල විද්‍යාලය
4. ර/මෝරගල දෙමළ විද්‍යාලය
5. ර/දිවුරුම්පිටිය දෙමළ විද්‍යාලය

(iv) සහන කාල සටහන් පැවරුම් ක්‍රියාත්මක කිරීම විදුහල්පතිවරුන් පන්ති කාමරයේ ඉගැන්වීම ඇගයීම් ප්‍රශ්න පත්‍ර ලබා දී විෂය නායකයා මඟින් ක්‍රියාත්මක කර වීම

කියවීම රුචිය වැඩි දියුණු කිරීම යටතේ පන්ති පුස්තකාල, කියවීම් මුල්ල, බිත්ති පුවත්පත, පොත් පෙට්ටි යන ආදිය සැපයීම.

ශිෂ්‍ය නායකයින් යෙදවීම.

(ආ) (i) 05යි.

(ii) 05යි.

(ඇ) සෑම පාසලකටම නිශ්චිත ගුරු සංඛ්‍යාවක් ලබා දීම සඳහා අවශ්‍ය වන චක්‍රලේඛ මේ වන විටත් නිකුත් කර තිබේ. එම චක්‍රලේඛ සියලුම රජයේ පාසල්වලට අදාළ වේ.

(ඈ) පැන නොනඟී.

***සභාමේසය මත තබන ලද ඇමුණුම:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

No of Students in Eheliyagoda Division 2010
School list of less than 100 students

| | | Grade1-5 | Grade 6-11 | | Grade 5 Examination | | | | OL Examination | | | | Remarks |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 2008 | | 2009 | | 2008 | | 2009 | | |
| | Name of the School | Total | Total | Grand Total | sit | Pass | sit | Pass | Sit | Qualified to Al | Sit | Qualified to Al | |
| 1 | GETAHETTA T.V. | 56 | 34 | 90 | 5 | 0 | 2 | 0 | | | | | OL Started in 2010 |
| 2 | IDDAMALGODA SENIOR SCHOOL | 43 | 45 | 88 | 8 | 0 | 8 | 3 | 8 | 2 | 8 | 1 | |
| 3 | DEIYAGAL V. | 34 | 30 | 64 | 5 | 0 | 3 | 0 | 8 | 0 | 7 | 2 | |
| 4 | KARANDANA NORTH V. | 27 | 35 | 62 | 4 | 0 | 5 | 0 | 7 | 0 | 6 | 1 | |
| 5 | WILOGODA WIJENAYAKA V. | 39 | 19 | 58 | 3 | 0 | 7 | 0 | | | | | |
| 6 | MAHARA SWARNAJAYANTHI V. | 24 | 32 | 56 | 1 | 0 | 5 | | 4 | 0 | 2 | 1 | |
| 7 | KALATUWAWA WEST V | 40 | 15 | 55 | 4 | 2 | 5 | 0 | | | | | |
| 8 | ANDAGALA SUGATHA BUDDHI V. | 22 | 29 | 51 | 5 | 0 | 6 | 0 | 5 | 0 | 5 | 2 | |
| 9 | WEWILA V. | 33 | 17 | 50 | 10 | 0 | 6 | 0 | | | | | |
| 10 | SIRISAMANPURA V | 39 | 0 | 39 | 0 | 0 | | | | | | | |
| 11 | MORAGALA T.V. | 22 | 0 | 25 | 0 | 0 | | | | | | | |
| 12 | DIVURUMPITIYA T.V. | 15 | 5 | 20 | 2 | 1 | 0 | 0 | | | | | Class Range 1-6 |
| 13 | WICKRAMAKANDA V | 15 | 0 | 15 | 3 | 0 | 1 | 0 | | | | | |
| 14 | NUGADANDA BHADRAWATHI V. | 11 | 0 | 11 | 3 | 0 | | | | | | | |

**ගරු මහාචාර්ය රජීව විජේසිංහ මහතා**
(மாண்புமிகு பேராசிரியர் ரஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය. ඒ සඳහන් කරපු ක්‍රියාමාර්ග ඇත්තටම ඉෂ්ට වනවාද කියලා බලන්න කලාප කාර්යාලයෙන් කටයුතු කෙරෙනවාද, නැත්නම් එම උත්තර තහවුරු කිරීමට ක්‍රියාමාර්ග ගන්න පුළුවන්ද?

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු මන්ත්‍රීතුමනි, පළාත් පාසල් සියල්ල මධ්‍යම ආණ්ඩුව යටතේ පවතින පාසල් නොවෙයි. පළාත් සභාව විසින් පරිපාලනය කරනු ලබන පාසල් තිබෙනවා. ඒ නිසා ඒවාට උපදෙස් ලබා දීලා තිබෙනවා, පාසල්වල කටයුතු සිදු කෙරෙන ආකාරය පිළිබඳව අධීක්ෂණය කරන්න කියලා. ඒ අනුව කලාප කාර්යාල විසින් අධීක්ෂණ කටයුතු කෙරෙනවා. ඒවායේ දුර්වලතා තිබෙන්න පුළුවන්. ඒ කටයුතු නොකෙරෙන සමහර තැනුත් තිබෙනවා. ඒවා පිළිබඳව වාර්තා වන ආකාරය අනුව සොයා බලා පියවර ගන්නවා.

**ගරු මහාචාර්ය රජීව විජේසිංහ මහතා**
(மாண்புமிகு பேராசிரியர் ரஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)

ගරු කථානායකතුමනි, මා දෙවන අතුරු ප්‍රශ්නය අහනවා. මා සම්පූර්ණයෙන් පිළිගන්නවා එම පාසල් මධ්‍යම ආණ්ඩුවට අයිති නැහැ කියා. එහෙත් විශේෂයෙන් ගුරු අඩු පාඩු පිරවීමට අපට යම් කිසි ක්‍රියා මාර්ග ගන්න පුළුවන්ද ? උදාහරණයක් හැටියට කලින් සඳහන් වූ උතුරු කරඳන පාසලේ ඉංග්‍රීසි ගුරුවරුන් දෙදෙනෙක් සිටින බව මා දන්නවා. එහෙත් අවට පාසල්වල -ලොකු පාසල්වල - ඉංග්‍රීසි ගුරුවරු නැහැ. මේ වාගේ අඩු පාඩු ගැන කටයුතු කිරීමට අපේ මධ්‍යම ආණ්ඩුව විසින් උපදෙස් දෙන්න පුළුවන්ද?

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

මධ්‍යම ආණ්ඩුව විසින් උපදෙස් දීලා තිබෙනවා. නාගරික පාසල්වල හා ජනප්‍රිය යයි සම්මත පාසල්වල විශාල ගුරු අතිරික්තයක් තිබෙනවා. දුෂ්කර පළාත්වල පාසල්වලට ගුරු පත්වීම් ලබා ගෙන පසුව විවිධ දේශපාලන හේතු හා බලපෑම් මත අනෙක් ප්‍රදේශවලට මාරුවීම් හදා ගෙන ඇවිත් තිබෙනවා. මේ තත්ත්වය වෙනස් කිරීම සඳහා ගුරු තුලිතයක් ඇති කරන්න අතිරික්ත තිබෙන ප්‍රදේශවලින් හිඟය තිබෙන ප්‍රදේශවලට ගුරුවරු යැවීම සඳහා සංඛ්‍යා දත්ත රැස් කරලා පළාත් සභාවල මහ අමාත්‍යතුමන්ලා හා අධ්‍යාපන අමාත්‍යතුමන්ලා සමඟ සාකච්ඡා කරලා ඉදිරි වර්ෂය ආරම්භ වන විට වැඩ පිළිවෙළක් හදන්න වනවා. ඔබතුමාගේ ප්‍රශ්නය මා පිළිගන්නවා. ලංකාවේ ඇතැම් දුෂ්කර පළාත්වල තිබෙන පාසල්වල ගුරු හිඟයක් නොවෙයි ගුරු අසමතුලිතතාවක් තිබෙනවා. එය තුලිත කර, මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වනවා.

**ගරු මහාචාර්ය රජීව විජේසිංහ මහතා**
(மாண்புமிகு பேராசிரியர் ரஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)

ගරු කථානායකතුමනි, මා තුන්වන අතුරු ප්‍රශ්නය අහනවා. විශේෂයෙන් දුෂ්කර පළාත්වල තිබෙන පාසල්වලට ගුරුවරුන් පත් වුණාට පසුව මාරු වීම් ඉල්ලනවා. සාමාන්‍යයෙන් ඒවා ලැබෙනවා. අපට බැරිද මේ මාරු වීම් නිසා සිදු වන බලපෑම් අඩු කරන්න ගුරු පත්වීම් තහවුරු කරන්න? දුෂ්කර පළාත්වල පාසල්වලට විශේෂයෙන් ඉංග්‍රීසි සහ ගණිතය සඳහා ගුරුවරුන් පත් කරලා එම පත්වීම් තහවුරු කරන්න බැරිද?

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
පුළුවන්. ඒ සඳහා ඒ ඒ ප්‍රදේශ අනුව ගුරුවරුන් බඳවා ගැනීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කළොත් දුෂ්කර පළාත්වල රැඳී සිටින්නට පුළුවන්කම තිබෙනවා. ඒ අනුව අපි ඉදිරියේදී ගුරුවරුන් බඳවා ගැනීමේදී විශේෂයෙන් ඒ පළාත්වල පවතින පුරප්පාඩු අනුව සුදුසුකම් තිබෙන ගුරුවරුන් ඉන්නවා නම් ඒ පළාත තුළින් බඳවා ගන්නත්, පළාත තුළ ස්ථාන මාරුවීම් ලබා දෙන්නත් කටයුතු කරන්න බලාපොරොත්තු වනවා.

**ගරු මහාචාර්ය රජීව විජේසිංහ මහතා**
(மாண்புமிகு பேராசிரியர் ரஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)
බොහොම ස්තුතියි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 4-0124/'10-(1), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற் கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena- Minister of Water Supply and Drainage and Chief Government Whip)
ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 8-0125/'10-(1), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## හම්බන්තොට දිස්ත්‍රික්කයේ රජයේ පාසල් : විස්තර
## அம்பாந்தோட்டை மாவட்ட அரசாங்கப் பாடசாலைகள் : விபரம்
## GOVERNMENT SCHOOLS IN HAMBANTOTA DISTRICT : DETAILS

13. **ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

0223/'10

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, හම්බන්තොට කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල්වලින් දැනට වසා ඇති හෝ වැසීමට තීරණය කර ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයට අයත් පාසල්වල අතිරික්ත ගුරුවරුන් සිටින්නේද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) ගුරු ඌනතා ඇති පාසල්වල නම් කවරේද;

(iv) ඌනතාවයන් පවතින්නේ කුමන විෂයයන් සඳහාද;

(v) මෙම ගුරු ඌනතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබා දීමට කටයුතු කරන්නේද;

(vi) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදීද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அம்பாந்தோட்டை மாவட்டத்தில் அம்பாந் தோட்டை வலயக் கல்விக் காரியாலயத்திற்குரிய அம்பாந்தோட்டை கோட்டக் கல்விக் காரியால யத்தினால் நிருவகிக்கப்படும் அரசாங்கப் பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்,

(ii) அப் பாடசாலைகளின் பெயர்கள் யாவையென்ப தையும்,

(iii) மேற்படி பாடசாலைகளில் தற்போது மூடப் பட்டுள்ள அல்லது மூடுவதற்குத் தீர்மானிக்கப் பட்டுள்ள பாடசாலைகளின் எண்ணிக்கை எவ்வள வென்பதையும்,

(iv) அப்பாடசாலைகளின் பெயர்கள் யாவையென்பதை யும்,

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இக்கோட்டாவுக்குரிய பாடசாலைகளில் மிகையான ஆசிரியர்கள் உள்ளனரா என்பதையும்,

(ii) அவ்வாறான பாடசாலைகளின் பெயர்கள் யாவை யென்பதையும்,

(iii) ஆசிரியர் பற்றாக்குறை நிலவும் பாடசாலைகளின் பெயர்கள் யாவையென்பதையும்,

(iv) பற்றாக்குறை நிலவுவது எந்தப் பாடங்களுக்கு என்பதையும்,

(v) இவ்வாறு ஆசிரியர் பற்றாக்குறை நிலவும் பாடசாலைகளுக்கு ஆசிரியர்களைப் பெற்றுக் கொடுக்க நடவடிக்கை எடுப்பாரா என்பதையும்,

(vi) அவ்வாறாயின் அது எவ்வளவு காலத்தினுள் நடைபெறுமென்பதையும்,

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல் ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House of -

(i) the number of Government schools coming under the purview of the Hambantota Divisional Education Office which is under the Hambantota Zonal Education Office of the Hambantota district;

(ii) the names of those schools;

(iii) the number of schools that have already been closed down or decided to be closed down, out of the schools mentioned in (ii) above ; and

(iv) the names of those schools?

(b) Will he state -

(i) whether there are overstaffed schools belonging to this division;

(ii) the names of those schools;

(iii) the names of schools with shortage of teachers;

(iv) the subjects for which shortages exist;

(v) whether action will be taken to provide teachers to the schools with shortage of teachers; and

(vi) if so; the time frame within which it will be done?

(c) If not, why?

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

(අ) (i) 23යි.

(ii) ඇමුණුමෙහි දක්වා තිබෙනවා. ඇමුණුම **සභාගත*** කරනවා.

(iii) නැත.

(iv) එම පාසල්වල නම් සඳහන් කිරීමේ අවශ්‍යතාවක් පැන නොනඟී.

(ආ) (i) ඔව්.

(ii) හ/දෙහිගහලන්ද මහා විද්‍යාලය

හ/ඥානෝදය කනිෂ්ඨ විද්‍යාලය

(iii) 2003-38 සංශෝධිත PPG චක්‍රලේඛනයට අනුව හම්බන්තොට කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන පාසල්වල සංඛ්‍යාත්මක ගුරු ඌනතාවක් නැත.

(iv) ඉංග්‍රීසි සහ සෞන්දර්යය විෂයයන් සඳහා.

(v) ඔව්.

(vi) ඉදිරි සැප්තැම්බර් මාසයේදී.

(ඇ) පැන නොනඟී.

***සභාමේසය මත තබන ලද ඇමුණුම:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

1. හ/ශාන්ත මේරි ජාතික පාසල
2. හ/සභිරා ජාතික පාසල
3. හ/සුචි ජාතික පාසල
4. හ/බුන්දල කනිෂ්ඨ විද්‍යාලය
5. හ/තෙලුල්ල ප්‍රාථමික විද්‍යාලය
6. හ/බඳගිරිය මහා විද්‍යාලය
7. හ/දෙහිගහලන්ද මහා විද්‍යාලය
8. හ/මිරිජ්ජවිල මහා විද්‍යාලය
9. හ/සාමෝදාගම කනිෂ්ඨ විද්‍යාලය
10. උඩමලල කනිෂ්ඨ විද්‍යාලය
11. හ/පල්ලෙමලල කනිෂ්ඨ විද්‍යාලය
12. හ/ගොන්නොරුව කනිෂ්ඨ විද්‍යාලය
13. හ/ධර්මතිලක කනිෂ්ඨ විද්‍යාලය
14. හ/ඥානෝදය කනිෂ්ඨ විද්‍යාලය
15. හ/මහආර කනිෂ්ඨ විද්‍යාලය
16. හ/බැරගම ජනපද කනිෂ්ඨ විද්‍යාලය
17. හ/බැරගම කනිෂ්ඨ විද්‍යාලය
18. හ/හම්බන්තොට මහා විද්‍යාලය
19. හ/හල්වැව ප්‍රාථමික විද්‍යාලය
20. හ/පහළ අන්දරවැව කනිෂ්ඨ විද්‍යාලය
21. හ/යහන්ගල ප්‍රථමික විද්‍යාලය
22. හ/බඳගිරිය මුස්ලිම් ප්‍රාථමික විද්‍යාලය
23. හ/ජනාධිපති මහින්ද රාජපක්ෂ රොටරි මිත්‍රත්ව ආදර්ශ ප්‍රාථමික විද්‍යාලය.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. හම්බන්තොට කොට්ඨාසයේ පාසල් පද්ධතියේ අධ්‍යාපනයට අවශ්‍ය මූලික ආයතන බොහොමයක් සමහර පාසල්වලට අහිමි වී තිබෙනවා. උදාහරණයක් වශයෙන් කිව්වොත්, පුස්තකාල නැති පාසල් පහක් තිබෙනවා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

හැම පාසලකම ඒ වාගේ අඩු පාඩු තිබෙනවා. අප ඉදිරි කාලය තුළදී ඒ ටික සම්පූර්ණයෙන්-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

නැහැ, මම ප්‍රශ්නය අහලා ඉවර නැහැ.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ප්‍රශ්නයක් නොවෙයි නේ. ඔබතුමා කථාවක් පවත්වනවා නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ පුස්තකාල අවශ්‍යතාව සම්පූර්ණ කරන්න කොපමණ කාලයක් ගන්නවාද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා, මේ ප්‍රශ්නයට අදාළ අතුරු ප්‍රශ්න අහන්න. පිළිතුරට අදාළ අතුරු ප්‍රශ්න. පුස්තකාල ගැන-

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ගුරුවරු පිළිබඳවයි ප්‍රශ්නය අහලා තිබෙන්නේ. මම උත්තර දීලා තිබෙනවා. සැප්තැම්බර් මාසය වන විට ගුරු හිඟය සම්පූර්ණ කරන්න බලාපොරොත්තු වනවා. ඒ සඳහා විභාග පවත්වලා ගුරුවරුන් බඳවා ගෙන තිබෙනවා. 554 දෙනෙක් ඉංග්‍රීසි භාෂා ගුරුවරු. සෞන්දර්ය ගුරුවරු 3,174ක් බඳවා ගැනීම සඳහා අයදුම් පත් කැඳවලා තිබෙනවා. ලබන පාසල් වාරය ආරම්භ වන විට ඒ ගුරු හිඟය පියවෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම ඔබතුමාගෙන් පළමුවැනි අතුරු ප්‍රශ්නය විධියට ඇහුවේ මේකයි. පුස්තකාල හිඟයක් තිබෙනවා, හම්බන්තොට කොට්ඨාසයේ-

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඒක වෙනම ප්‍රශ්නයක් විධියට ඉදිරිපත් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ කියන්නේ හම්බන්තොට කොට්ඨාසය අධ්‍යාපනයට අදාළ නැහැ කියන එකද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක අහපු ප්‍රශ්නයට අදාළ නැහැ ගරු මන්ත්‍රීතුමා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඒක මේ ප්‍රශ්නයට අදාළ නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා, අහපු ප්‍රශ්නයට දෙන පිළිතුර ආශ්‍රයෙන් අතුරු ප්‍රශ්න අහන්න. පුස්තකාල පිළිබඳව අලුත් ප්‍රශ්නයක් අහන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන ක්ෂේත්‍රයට පුස්තකාල අඩු පාඩුකම් අදාළ නැද්ද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ ප්‍රශ්නයට අදාළ නැත. තමුන්නාන්සේ අහපු ප්‍රශ්නය තමුන්නාන්සේම හරියට තේරුම් ගෙන නැති බවකුයි මට පෙනෙන්නේ. කරුණාකර ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්න අහන්න.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඉතින් කොහොමද පක්ෂයක් දුවන්නේ?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 15-0328/'10-(1), ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දෙවන වටය. ප්‍රශ්න අංක 1-0093/'10-(2), ගරු රවි කරුණානායක මහතා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## අනාථ කඳවුරු සහ එල්ටීටීඊ සැකකරුවන් : විස්තර

## அகதி முகாம்கள் மற்றும் எல்ரீரீஈ சந்தேக நபர்கள் : விபரம்

## REFUGEE CAMPS AND LTTE SUSPECTS : DETAILS

0112/'10

3. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) උතුරු නැඟෙනහිර යුද්ධයෙන් පසු දැනට පුද්ගලයන් රඳවා ගෙන සිටින අනාථ කඳවුරු පිහිටා ඇති ස්ථාන කවරේද;

(ii) එසේ රඳවා ගෙන සිටින පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) එල්ටීටීඊ සැකකරුවන් ලෙස අත් අඩංගුවට ගෙන සිටින පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් කඳවුර තුළ සිටින සැකකරුවන් සංඛ්‍යාව වෙන වෙනම කොපමණද;

(iii) ඔවුන්ට ලබා දෙන පුහුණුවීම් කවරේද;

(iv) ඔවුන්ගේ අනාගත සුභ සාධනය සඳහා ගන්නා පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම් ඒ මන්ද?

புனர்வாழ்வளிப்பு, சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வடக்கு, கிழக்கு யுத்தத்தின் பின்னர் தற்போது ஆட்கள் தடுத்து வைக்கப்பட்டுள்ள அகதி முகாம்கள் அமைந்துள்ள இடங்கள் யாவை என்பதையும்,

(ii) அவ்வாறு தடுத்து வைக்கப்பட்டுள்ள ஆட்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்

அவர் இச்சபையில் குறிப்பிடுவாரா?

(ஆ) (i) எல்.ரீ.ரீ.ஈ. சந்தேச நபர்களாக கைது செய்யப்பட்டுள்ளவர்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்,

(ii) ஒவ்வொரு முகாமிலும் இருக்கும் சந்தேக நபர்களின் எண்ணிக்கை வெவ்வேறாக எவ்வளவு என்தையும்,

(iii) அவர்களுக்கு வழங்கப்படும் பயிற்சிகள் யாவையென்பதையும்,

(iv) அவர்களின் எதிர்கால நலனோம்புகையை முன்னிட்டு எடுக்கப்படும் நடவடிக்கைகள் யாவையென்பதையும்

அவர் இச்சபையில் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Rehabilitation and Prison Reforms:

(a) Will he submit to this House -

(i) the locations of refugee camps where people are detained at present after the North-East war;

(ii) the number of persons so detained?

(b) Will he state -

(i) the number of persons arrested as LTTE suspects;

(ii) separately, the number of suspects in each camp;

(iii) the types of trainings given to them;

(iv) the measures taken for their future wellbeing?

(c) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) වවුනියාව - කඳවුරු 05යි.

යාපනය - කඳවුරු 01යි.

(ii) පුද්ගලයන් 31,696යි.

(ආ) (i) දැනට අත් අඩංගුවේ සිටින පුද්ගලයන් සංඛ්‍යාව – 8,790

බුද්ධි අංශය මගින් නිරීක්ෂණ කටයුතු සඳහා රඳවා සිටින සංඛ්‍යාව - 706

2010.05.31 දින වන විට අභ්‍යාසලාභීන් සංඛ්‍යාව - 8,074

(ii) එක් එක් කඳවුරු තුළ සිටින සැකකරුවන් සංඛ්‍යාව

| **අනු අංකය** | **මධ්‍යස්ථානය** | **පිරිමි** | **ගැහැණු** | **සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| 01 | කාර්මික විද්‍යාලය, නෙලුක්කුලම | 637 | | 637 |
| 02 | ධර්මපුරම් මධ්‍යස්ථානය | 836 | | 836 |
| 03 | දෙමළ ප්‍රාථමික විද්‍යාලය වව්නියාව | 445 | | 445 |
| 04 | ඕමන්තේ මහා විද්‍යාලය | 1,066 | | 1,066 |
| 05 | පොම්පෙමඩු කලාපය 01 | 511 | | 511 |
| 06 | මරදමඩු | 957 | | 957 |
| 07 | තෙලිප්පලේ | 48 | 15 | 63 |
| 08 | කයිතඩි | 28 | 07 | 35 |
| 09 | වැලිකන්ද | 380 | | 380 |
| 10 | කන්දකාඩු | 500 | | 500 |
| 11 | ත්‍රිකෝණ මඩු | 1,500 | | 1,500 |
| 12 | සමූපකාර පුහුණු මධ්‍යස්ථානය, පුන්තෝට්ටම් | | 399 | 399 |
| 13 | පොම්පෙමඩු විශ්වවිද්‍යාල පරිශ්‍ර මධ්‍යස්ථානය | | 745 | 745 |
| | | **6,908** | **1,166** | **8,074** |

(iii) ඔවුන්ට ලබා දෙන පුහුණුවීම්

1. විදුලි කාර්මික
2. වඩු කාර්මික

3. පෙදරේරු
4. ජලනල
5. රූපලාවන්‍ය
6. ජුකී මැෂින්
7. පරිගණක
8. කෘෂිකාර්මික
9. පුනරුත්ථාපනය වූ ළමා අභ්‍යාසලාභීන් හට රත්මලාන හින්දු විද්‍යාලයේ නේවාසිකව අධ්‍යාපනය ලබා දීමට අවශ්‍ය කටයුතු සැලැස්වීම.
10. සා/පෙළ, උසස්/පෙළ විභාග මඟ හැරුණු වැඩිහිටි තරුණ/තරුණියන්ට ඉදිරි විභාගවලදී එම විභාගයන් සඳහා පෙනී සිටීමට අවශ්‍ය අධ්‍යාපන කටයුතු වව්නියාව වධ්‍යස්ථාන දෙකකදී පවත්වා ගෙන යනු ලැබේ.

(iv) ඔවුන්ගේ අනාගත සුබ සාධනය සඳහා පහත සඳහන් පියවර ගනු ලබයි.

1. සාම ගම්මානය යටතේ පවුල් එක්සත් කිරීම.
2. පවුල් යළි එක්සත් කිරීමේ PARC මධ්‍යස්ථානය පිහිටුවීම (විවාහක හිටපු සටන්කරුවන් සඳහා ස්ථාපිත කරන ලද මධ්‍යස්ථානය)
3. කෘෂි කර්ම පාදක වෘත්තීය පුහුණුව. (කන්දල්කාඩු/ ත්‍රිකෝණමඩු පුනරුත්ථාපන ගම්මානය)
4. හිටපු සටන්කරුවන් සඳහා තොරුතුරු තාක්ෂණය ආශ්‍රිත වෘත්තීය පුහුණු වැඩසටහන් පැවැත්වීම.
5. පුනරුත්ථාපනය කොමසාරිස් ජනරාල් කාර්යාංශය ආශ්‍රිත වෘත්තීය පුහුණු කටයුතු නැංවීම සඳහා පරිගණක විද්‍යාගාරයක් පිහිටුවීම.
6. සංහිඳියාවේ මාධ්‍යයක් ලෙස ක්‍රීඩාව උපයෝගී කර ගැනීම.
7. මානසික සංවර්ධනය හා උපදේශනය.
8. සෞන්දර්යාත්මක වැඩමුළු පැවැත්වීම.
9. ළදරු පාසල් ගුරු සහායක පුහුණුව.
10. භාෂා පුහුණුව. (ඉංග්‍රීසි)
11. බර වාහන යන්ත්‍ර පුහුණුව.
12. බර වාහන පැදවීමේ රියැදුරු පුහුණු වැඩසටහන්- යාපනය. (රියැදුරන් 100ක් සඳහා)
13. ජුකී මැෂින් යන්ත්‍ර පුහුණුව සඳහා මධ්‍යස්ථානයක් 2010 ජූලි මස 13 දින වව්නියාවේදී ආරම්භ කිරීම.
14. ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල, වෘත්තීය පුහුණු වැඩසටහන - කළුතර වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය.
15. උප්පැන්න සහතික, ජාතික හැඳුනුම් පත්, අධ්‍යාපන සහතික, විදේශ ගමන් බලපත්‍ර, ආදී මූලික පුද්ගල අනන්‍යතා සහතික සකස් කිරීම.
16. විමර්ශන කාල සීමාව අතරතුර හිටපු සටන්කරුවන්ට විදේශ රැකියා අවස්ථා සොයා දීම.
17. සමූහ මංගල උත්සවයක් පැවැත්වීම (යුවළ 53ක් සඳහා)
18. වෘත්තීය පුහුණුව සඳහා මධ්‍යස්ථාන 02ක් වව්නියාව සහ කන්දකාඩුහි වෘත්තීය පුහුණු අධිකාරියේ අනුග්‍රහයෙන් ආරම්භ කිරීම.
19. බේකරි පාඨමාලාව.
20. නාට්‍ය හා රංග කලා පුහුණුව.
21. සා/පෙළ, සහ උ/පෙළ විභාගයට ඉදිරිපත් වීමට නියමිත සිසුන් වෙනුවෙන් සති අන්ත දේශන පැවැත්වීම.
22. වැඩිහිටි අධ්‍යාපනය ඉදිරියට පවත්වා ගෙන යාම/ විධිමත් අධ්‍යාපනයට සහය වීම.

(ඇ) පැන නොනඟී.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මට ප්‍රශ්න කිහිපයක් අහන්න තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු අමාත්‍යතුමා ඉන්නවා.

**ගරු ඩිව් ගුණසේකර මහතා (පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு டியூ குணசேகர - புனர்வாழ்வளிப்பு, சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon. DEW Gunasekara - Minister of Rehabilitation and Prison Reforms)

ගරු කථානායකතුමනි, එහි පළමුවන ප්‍රශ්නය ඇත්ත වශයෙන්ම අදාළ වන්නේ නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශයටයි. ඒ වුණත් මම ඒ අමාත්‍යාංශයෙන් තොරතුරු අරගෙන පිළිතුරු සපයන්න බලාපොරොත්තු වනවා. විස්තරාත්මක තොරතුරු අවශ්‍ය නම් එතුමාට ඒ අමාත්‍යාංශයෙන් අලුතින් ප්‍රශ්නයක් අහන්න සිදු වනවා.

එහි පුද්ගලයන් සංඛ්‍යාව 31,696යි. කඳවුරු සංඛ්‍යාව 6යි; වවුනියාවේ 5යි, යාපනයේ 1යි. දැනට අත් අඩංගුවේ සිටින පුද්ගලයන් සංඛ්‍යාව 8,780යි, මගේ අමාත්‍යාංශය යටතේ. බුද්ධි අංශය මඟින් නිරීක්ෂණ කටයුතු සඳහා රඳවා සිටින සංඛ්‍යාව එයින් 706ක් වනවා. ඉතුරු සංඛ්‍යාව 8,074යි. එය තමයි පුනරුත්ථාපනයට ලක් කර තිබෙන සංඛ්‍යාව. එක් එක් කඳවුරු තුළ සිටින සංඛ්‍යාව සඳහන් ලොකු ලැයිස්තුවක් තිබෙනවා. අවශ්‍ය නම් කියවන්නම්. ටිකක් වෙලාව යනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක අවශ්‍ය නැහැ. අනික් ටික කියවන්න. ඊළඟ දෙකට උත්තර දුන්නොත් ඇති.

**ගරු ඩිව් ගුණසේකර මහතා**
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)
ඊළඟට තිබෙන්නේ ඔවුන්ගේ අනාගත සුබසාධනය සඳහා ඔවුන්ට ලබා දෙන පුහුණුවීම්.

විදුලි කාර්මික, වඩු කාර්මික, පෙදරේරු, ජලනල, රූපලාවන්‍ය, ජුකී මැෂින්, පරිගණක, කෘෂිකාර්මික. පුනරුත්ථාපනය වූ ළමා අභ්‍යාසලාභීන්හට රත්මලාන හින්දු විද්‍යාලයේ නේවාසිකව අධ්‍යාපනය ලබා දීමට අවශ්‍ය කටයුතු සැලැස්වීම. ගරු කථානායකතුමනි, මේ ආකාරයෙන් තිබෙනවා, ඔවුන්ට ලබා දෙන පුහුණුවීම්. ඊට අමතරව තවත් සුබසාධන කටයුතු ගණනාවක් තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මේකයි. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශයට අයිති සිරකරුවන් විධියට කොටසක් ඉන්නවා කියා කිව්වා. ඊට අමතරව තවත් ස්ථානවල සිරකරුවන් විධියට රඳවා ගෙන ඉන්නවාද?

**ගරු ඩිව් ගුණසේකර මහතා**
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)
නැහැ. මා ඉස්සෙල්ලා කිව්වේ IDPs.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ. ඔබතුමාගේ විෂය පථයට අදාළව ඉන්න කට්ටිය කියා කිව්ව නිසායි මා ඇහුවේ.

**ගරු ඩිව් ගුණසේකර මහතා**
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)
ඔක්කෝම ඉන්නවා, අටදහස් හත්සිය අසූවක්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එහෙම නැති අයත් ඉන්නවාද කියලායි මා ඇහුවේ.

**ගරු ඩිව් ගුණසේකර මහතා**
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)
නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
දෙවැනි අතුරු ප්‍රශ්නය මේකයි. සිරකරුවන් විධියට රඳවා ගෙන ඉන්න අය අතර ඉන්නවාද කුමරන් පත්මනාදන් හෙවත් කේපී කියලා පුද්ගලයෙක්.

**ගරු ඩිව් ගුණසේකර මහතා**
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)
නැහැ. මගේ ලැයිස්තුවේ නැහැ. හැබැයි ඒ ප්‍රශ්නය අහලා නැහැ. ඒ ප්‍රශ්නය ඇහුවා නම් මම සොයා බලනවා ඉන්නවාද කියලා. පත්මනාදන්ලා ඇති ඕනෑතරම්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා ගාව නැද්ද?

**ගරු ඩිව් ගුණසේකර මහතා**
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)
එහෙම ප්‍රශ්නයක් අහලා තිබුණේ නැහැ. අහලා තිබුණා නම් මම උත්තර දෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමාගේ බන්ධනාගාරය ඇතුළේ නැද්ද?

**ගරු ඩිව් ගුණසේකර මහතා**
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)
කොහොමද දැන් කියන්නේ-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මා අහන්න කැමැතියි ගරු කථානායකතුමනි, තුන්වන අතුරු ප්‍රශ්නය. එල්ටීටීඊ සංවිධානයේ ප්‍රධානියා විධියට ඊ ළඟට කටයුතු කරපු කුමරන් පත්මනාදන් මැතිතුමා ඔබතුමාගේ බන්ධනාගාරයේ නැත්නම් ඔබතුමාට කියන්න පුළුවන්ද ඔහු බන්ධනාගාර ගත වෙලාද ඉන්නේ නැත්නම්-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ ප්‍රශ්නයට ලැබුණු පිළිතුරුවලට අදාළ නැත.

**ගරු ඩිව් ගුණසේකර මහතා**
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)
ඒ ප්‍රශ්නය අහලා තිබුණා නම් මම පිළිතුරු දෙනවා. එහෙම ප්‍රශ්නයක් අහලා නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කුමරන් පත්මනාදන් කියන්නේ ලොකුම එල්ටීටීඊ ත්‍රස්තවාදියෙක්. ඉතින් එතුමා බන්ධනාගාරයේ නැත්නම් වෙන කොහේද ඉන්නේ?

**ගරු ඩිව් ගුණසේකර මහතා**
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)
හොයන්නේ නැතිව මම කොහොම ද කියන්නේ?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මා අහන්නේ කුමරන් පත්මනාදන් එතුමාගේ බන්ධනාගාරය ඇතුළේ නැත්නම් කොහේද ඉන්නේ කියලායි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහපු ප්‍රශ්නයට ලැබෙන පිළිතුර අනුව අතුරු ප්‍රශ්න අහන්න. වෙනත් දේවල් අහන්න ගියාම අරහෙන් මෙහෙන් -

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ රටේ මිනිසුන්ගේ ප්‍රශ්නයක් නේ, ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. එතුමා තුන්වන අතුරු ප්‍රශ්නයටත් උත්තර දුන්නා. දැන් හරි. [බාධා කිරීම්]

ප්‍රශ්න අංක 5 - 0214/'10- (1), ගරු අජිත් කුමාර මහතා.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 6 -0354/'10- (1), ගරු අජිත් පී. පෙරේරා මහතා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අධිකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## කොළඹ දිස්ත්‍රික්කයේ සමෘද්ධිලාභීන් : විස්තර
## கொழும்பு மாவட்ட சமுர்த்தி பெறுநர்கள்: விபரம்
## SAMURDHI RECIPIENTS IN COLOMBO DISTRICT: DETAILS

0094/'10

7. **ගරු ජෝන් අමරතුංග මහතා (ගරු රවි කරුණානායක මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு ரவி கருணாநாயக்க சார்பாக)
(The Hon. John Amaratunga - on behalf of the Hon. Ravi Karunanayake)

ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කයේ මැතිවරණ කොට්ඨාස 15 තුළ සිටින සමෘද්ධිලාභීන් සංඛ්‍යාව 2008 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා වූ සෑම වර්ෂයකම ජුනි මස 30 වන දිනට කොපමණද;

(ii) ඉහත පවුල්වලට ලැබෙන සමෘද්ධි දීමනාවේ ප්‍රමාණය අනුව ඔවුන් අයත් වන කාණ්ඩයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2004, 2005, 2006, 2007, 2008 සහ 2009 වර්ෂයන් සඳහා උද්ධමන අගය කවරේද;

(ii) 2004 පාදක වර්ෂය ලෙස ගෙන 2010 දක්වා වූ පසුව එළඹෙන වර්ෂවලදී උද්ධමනය අඩු කළ විට සමෘද්ධිලාභීන් ලැබූ දීමනාවෙහි මූර්ත වටිනාකම කවරේද;

(iii) සමෘද්ධිලාභීන්ගේ ක්‍රයශක්තිය අඩු වී ඇති බව එමගින් පෙන්නුම් කෙරෙන්නේද;

(iv) ඉහත සඳහන් කරුණු නිසා ඇතිවූ ප්‍රතිඵලයක් ලෙස එවන් සමෘද්ධිලාභීන් අතර දරිද්‍රතාව වැඩිවී තිබේද?

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම් ඒ මන්ද?

பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2008 முதல் 2010 வரை, ஒவ்வொரு வருடமும் யூன் மாதம் 30 ஆம் திகதியளவில், கொழும்பு மாவட்டத்தில் 15 தேர்தல் தொகுதிகளிலும் உள்ள சமுர்த்தி பெறுநர்களின் எண்ணிக்கை எத்தனை என்பதையும் ,

(ii) மேற்படி குடும்பங்களுக்கு கிடைக்கப்பெறுகின்ற சமுர்த்தி மானியத்தின் அளவின் அடிப்படையில் அவர்கள் எந்தப் பிரிவுக்குட்படுகின்றனர் என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 2004, 2005, 2006, 2007, 2008, 2009 ஆகிய வருடங்களில் பணவீக்க வீதம் எவ்வளவு என்பதையும் ,

(ii) 2004ஆம் ஆண்டை அடிப்படையாகக்கொண்டு 2010 வரை தொடர்ந்துவந்த ஆண்டுகளில் பணவீக்கத்தை குறைத்ததன் பின்னர் சமுர்த்தி பெறுநர்கள் பெற்றுக்கொண்ட கொடுப்பனவின் நிதியின் மெய்ப்பெறுமதி என்ன என்பதையும்,

(iii) சமுர்த்தி பெறுநர்களின் கொள்வனவுச் சக்தி குறைந்துள்ளது என்பதை இது காட்டுகின்றது என்பதையும்,

(iv) மேற்கூறிய காரணங்களினால் சமுர்த்தி பெறுநர்களுக்கு மத்தியில் ஏழ்மை அதிகரித்து உள்ளதா என்பதையும்

அவர் கூறுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Economic Development:

(a) Will he inform this House -

(i) the number of Samurdhi recipients as at 30th June of every year from the year 2008 to 2010 in the 15 electorates in the Colombo District;

(ii) the categories of the above families according to the amount of Samurdhi allowance they received?

(b) Will he state -

(i) the value of inflation for the years 2004, 2005, 2006, 2007, 2008 and 2009;

(ii) the value in real terms they received in the subsequent years up to 2010 when discount the inflation taking 2004 as a base year;

(iii) whether it shows that the purchasing power of the Samurdhi recipients has been reduced; and

(iv) whether the poverty among such recipients has been increased as a result of the above?

(c) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) සමෘද්ධි සහනාධාර වැඩසටහන යටතේ සමෘද්ධිලාභීන් පිළිබඳ තොරතුරු ගණනය කර ඇත්තේ මැතිවරණ කොට්ඨාස මට්ටමින් නොව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුවය. එම නිසා කොළඹ දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල (කොට්ඨාස 13) 2008 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා සෑම වර්ෂයකම ජුනි මස 30 දිනට සමෘද්ධිලාභීන් සංඛ්‍යාව පහත පරිදි වේ.

| **වර්ෂය** | **සමෘද්ධිලාභීන් සංඛ්‍යාව** |
|---|---|
| 2008 | 60,709 |
| 2009 | 56,596 |
| 2010 | 55,504 |

(ii)

| **පවුලේ සාමාජික සංඛ්‍යාව** | **දීමනා පත්‍රයේ වටිනාකම 50%කින් වැඩි කිරීමට පෙර (රු.)** | **දීමනා පත්‍රයේ වටිනාකම 50%කින් වැඩි කිරීමෙන් පසු (රු.)** |
|---|---|---|
| 6 හෝ ඊට වැඩි | 1015/- | 1500/- |
| 3 හෝ ඊට වැඩි 5 දක්වා | 615/- | 900/- |
| 2 | 350/- | 525/- |
| තනි පුද්ගලයකු සඳහා | 250/- | 378/- |
| සවිබල ගැන්වූ පවුල් | 155/- | 210/- |
| කලින් ජනසවිලාභීන් | 415/- | 415/- |

(ආ) (i) වසර 2004 සිට 2009 දක්වා කොළඹ පාරිභෝගික මිල දර්ශනයේ (2002=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස සහ වාර්ෂික සාමාන්‍ය වෙනස අනුව ගණනය කරන ලද උද්ධමනය පහත සඳහන් වේ.

වාර්ෂික උද්ධමනය (5) : (2004-2009)

| **වර්ෂය** | **ලක්ෂ්‍යමය** | **වාර්ෂික සාමාන්‍ය** |
|---|---|---|
| 2004 | 13.0 | 9.0 |
| 2005 | 7.4 | 11.0 |
| 2006 | 13.5 | 10.0 |
| 2007 | 18.8 | 15.8 |
| 2008 | 14.4 | 22.6 |
| 2009 | 4.8 | 3.4 |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

(ii)(iii) මේ අනුව සමෘද්ධිලාභීන්ගේ 2004 - 2009 දක්වා සමෘද්ධිලාභීන් ලැබූ දීමනාවෙහි මූර්ත වටිනාකම මෙසේ දැක්විය හැකිය.

| **2004 මාසික වටිනාකම සමෘද්ධි දීමනාව (රුපියල්)** | **2009 මාසික සමෘද්ධි දීමනාව (රුපියල්)** | **2004-2009 මූල්‍ය වර්ධනය (රුපියල්)** | **මූර්ත** |
|---|---|---|---|
| 155 | 210 | +55 | 117 |
| 250 | 375 | +125 | 209 |
| 350 | 525 | +175 | 293 |
| 615 | 900 | +285 | 502 |
| 1015 | 1500 | +485 | 836 |

(iv) වෙනත් වර්ධකයන් - සමාජ ආරක්ෂණ වැඩසටහන් මේ යටතේ,

දරු උපත් සඳහා ගෙවීම්,-

| | 2004(රු) | 2009(රු) |
|---|---|---|
| පළමු දරු උපත සඳහා | 2000 | 5000 |
| දෙවන දරු උපත සඳහා | 1000 | 2500 |

| | 2004(රු) | 2009(රු) |
|---|---|---|
| වෛද්‍ය ප්‍රතිකාර | 1500 | 3000 |

| | 2004(රු) | 2009(රු) |
|---|---|---|
| මරණාධාර සඳහා ගෙවීම් | 5000 | 10000 |

| | 2004(රු) | 2009(රු) |
|---|---|---|
| සිප්දොර ශිෂ්‍යත්ව | 350 | 500 |

වර්ධනයන් සිදු වී ඇත.

***සැලකිය යුතුයි.***
2004 දී කොළඹ පාරිභෝගික මිළ දර්ශකය 100කි. 2009 වර්ෂයේදී එය 179.4 ලෙස ගණනය කර ඇත.

වැදගත් කරුණු:

- සමෘද්ධිලාභීන් ශක්තිමත් කිරීම සඳහා ලැබූ මූල්‍ය දීමනාව 2004-2009 කාල පරාසය තුළදී 50%කට වඩා ප්‍රමාණයකින් වර්ධනය කර ඇත.
- තත්ත්ව ක්‍රය ශක්තිය ගණනය කිරීමේදී සලකා බැලිය නොහැකි සමාජ ආරක්ෂණ ප්‍රතිලාභයන්ද 50%කට වඩා 2004-2009 දක්වා වැඩි කර ඇත.
- රජයේ ආර්ථික වැඩ පිළිවෙළ 2008 වර්ෂයේ 30%ක් වූ උද්ධමනය අනුපාතය තනි ඉලක්කමක් දක්වා පහළට ගෙනවිත් ඇත.

(ඈ) පැන නොනඟී.

ඇමුණුම I

# Samurdhi Stamps Final Report
## 2008 January To June

**District Colombo**

| Divisional Secretariat | Rs.1015 | Rs.615 | Rs.350 | Rs.250 | Rs.415 | Rs.155 | Total | Monthly Allcation |
|---|---|---|---|---|---|---|---|---|
| Colombo | 28 | 4,896 | 1,798 | 1,166 | 2 | 38 | 7,928 | 3,966,980 |
| Kolonnawa | 44 | 1,109 | 739 | 896 | 2,394 | 44 | 5,226 | 2,209,675 |
| Kaduwela | 1 | 939 | 1,060 | 705 | 2,331 | 761 | 5,797 | 2,211,070 |
| Homagama | 16 | 1,132 | 733 | 898 | 1,730 | 192 | 4,701 | 1,941,180 |
| Hanwella | 11 | 1,092 | 1,119 | 1,253 | 1,473 | 578 | 5,526 | 2,088,530 |
| Padukka | 68 | 839 | 786 | 804 | 719 | 384 | 3,600 | 1,419,010 |
| Maharagama | 23 | 1,631 | 1,197 | 1,017 | 4 | 198 | 4,070 | 1,731,960 |
| Sri Jayawardhanapura | 4 | 487 | 1,042 | 1,123 | 3 | 20 | 2,679 | 953,360 |
| Timbirigasyaya | 9 | 1,308 | 1,757 | 1,217 | 1 | 17 | 4,309 | 1,735,805 |
| Dehiwala | 3 | 771 | 288 | 453 | 0 | 7 | 1,522 | 692,345 |
| Ratmalana | 0 | 860 | 673 | 877 | 0 | 73 | 2,483 | 995,015 |
| Moratuwa | 0 | 3,193 | 1,389 | 1,278 | 0 | 234 | 6,094 | 2,805,615 |
| Kesbewa | 48 | 3,438 | 1,940 | 1,334 | 1 | 13 | 6,774 | 3,178,020 |
| Summary for 'District' = Colombo (13 detail records) | | | | | | | | |
| Sum | 255 | 21,695 | 14,521 | 13,021 | 8,658 | 2,559 | [redacted] | 25,928,565 |

ඇමුණුම I

# Samurdhi Stamps Final Report
## 2009 January To June

**District Colombo**

| Divisional Secretariat | Rs.1015 | Rs.615 | Rs.350 | Rs.250 | Rs.415 | Rs.1500 | Rs.210 | Total | Monthly Allcation |
|---|---|---|---|---|---|---|---|---|---|
| Colombo | 0 | 4,439 | 1,591 | 1,005 | 2 | 27 | 32 | 7,096 | 3,586,135 |
| Kolonnawa | 0 | 1,061 | 699 | 829 | 2,269 | 31 | 37 | 4,926 | 2,100,320 |
| Kaduwela | 0 | 923 | 1,016 | 661 | 2,258 | 1 | 613 | 5,472 | 2,155,795 |
| Homagama | 0 | 1,036 | 685 | 825 | 1,609 | 15 | 163 | 4,333 | 1,807,605 |
| Hanwella | 0 | 1,078 | 1,086 | 1,223 | 1,451 | 11 | 553 | 5,402 | 2,083,615 |
| Padukka | 0 | 838 | 781 | 763 | 699 | 68 | 263 | 3,412 | 1,426,785 |
| Maharagama | 0 | 1,469 | 1,103 | 966 | 3 | 18 | 159 | 3,718 | 1,592,620 |
| Sri Jayawardhanapura | 0 | 467 | 976 | 1,085 | 3 | 4 | 16 | 2,551 | 910,660 |
| Timbirigasyaya | 0 | 1,185 | 1,567 | 1,116 | 1 | 9 | 16 | 3,894 | 1,573,500 |
| Dehiwala | 0 | 652 | 286 | 427 | 0 | 2 | 7 | 1,374 | 612,300 |
| Ratmalana | 0 | 803 | 619 | 847 | 0 | 0 | 47 | 2,316 | 932,115 |
| Moratuwa | 0 | 2,980 | 1,300 | 1,228 | 0 | 0 | 198 | 5,706 | 2,636,280 |
| Kesbewa | 0 | 3,229 | 1,835 | 1,276 | 1 | 44 | 11 | 6,396 | 3,015,810 |
| Summary for 'District' = Colombo (13 detail records) | | | | | | | | | |
| Sum | 0 | 20,160 | 13,544 | 12,251 | 8,296 | 230 | 2,115 | [redacted] | 24,433,540 |

ඇමුණුම I

# Samurdhi Stamps Final Report
## 2010 January To June

**District Colombo**

| Divisional Secretariat | Rs.1015 | Rs.615 | Rs.350 | Rs.250 | Rs.415 | Rs.1500 | Rs.210 | Total | Monthly Allcation |
|---|---|---|---|---|---|---|---|---|---|
| Colombo | 0 | 4,268 | 1,524 | 953 | 0 | 24 | 22 | 6,791 | 3,437,090 |
| Kolonnawa | 0 | 1,057 | 699 | 821 | 2,262 | 31 | 37 | 4,907 | 2,092,955 |
| Kaduwela | 0 | 919 | 1,014 | 661 | 2,248 | 1 | 610 | 5,453 | 2,147,855 |
| Homagama | 0 | 986 | 660 | 784 | 1,569 | 11 | 153 | 4,163 | 1,733,155 |
| Hanwella | 0 | 1,089 | 1,076 | 1,219 | 1,444 | 13 | 536 | 5,377 | 2,082,405 |
| Padukka | 0 | 854 | 763 | 737 | 689 | 68 | 242 | 3,353 | 1,415,265 |
| Maharagama | 0 | 1,471 | 1,106 | 964 | 0 | 18 | 159 | 3,718 | 1,593,155 |
| Sri Jayawardhanapura | 0 | 467 | 972 | 1,075 | 0 | 4 | 11 | 2,529 | 904,465 |
| Timbirigasyaya | 0 | 1,129 | 1,480 | 1,073 | 0 | 8 | 15 | 3,705 | 1,495,735 |
| Dehiwala | 0 | 642 | 289 | 433 | 0 | 2 | 6 | 1,372 | 608,490 |
| Ratmalana | 0 | 800 | 606 | 830 | 0 | 0 | 44 | 2,280 | 920,840 |
| Moratuwa | 0 | 2,862 | 1,254 | 1,176 | 0 | 0 | 180 | 5,472 | 2,530,830 |
| Kesbewa | 0 | 3,193 | 1,839 | 1,297 | 0 | 44 | 11 | 6,384 | 2,999,905 |
| Summary for 'District' = Colombo (13 detail records) | | | | | | | | | |
| Sum | 0 | 19,737 | 13,282 | 12,023 | 8,212 | 224 | 2,026 | [redacted] | 23,962,145 |

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 9 -0215/'10- (1), ගරු අජිත් කුමාර මහතා.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මා අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මෙම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 10 - 0327/'10- (1), ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මෙම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති තුනක් කල් ඉල්ලනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය පසු ගිය පාර්ලිමේන්තුවේ තුන් වතාවක් අහලා, තුන්වන වතාවටත් කල් ගත්ත ප්‍රශ්නයක්. මේ ආණ්ඩුවේ ඇමතිතුමන්ලා මේ ප්‍රශ්නයට උත්තර දෙන්නේ නැහැ. ඒක ඔබතුමාගේ ප්‍රශ්නයක් නොවෙයි. එක්කෝ නිලධාරින් මේක හංගනවා. ඇත්තටම මේ ප්‍රශ්නය පසු ගිය පාර්ලිමේන්තුවේ තුන් වතාවක් ඇහුවා. ආපසු උත්තර දෙන්නම් කියලා ඒ අවස්ථාවේදී කිව්වා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. ගරු මන්ත්‍රීවරුන්ගේ ප්‍රශ්නවලට ඉක්මනට පිළිතුරු සපයන්න අදාළ අමාත්‍යාංශවල ලේකම්තුමන්ලා දැන ගන්න ඕනෑ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
දැන් මේ ප්‍රශ්නය අහලා අවුරුදු එකහමාරකට, දෙකකට වැඩියි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පළමුවන වතාවටයි මේ ප්‍රශ්නය ඇහෙන්නේ ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු සභාව නොමඟ යවන්න එපා ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. [බාධා කිරීම්]

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 11 - 0355/'10- (1), ගරු අජිත් පී. පෙරේරා මහතා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අධිකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
අධිකරණ ඇමතිතුමා ඉන්නවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මාසයක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 12-0216/'10 - (1), ගරු අජිත් කුමාර මහතා.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## තරු පන්තියේ හෝටල් : විස්තර
## இலங்கையில் நட்சத்திர தர ஹோட்டல்கள்: விபரம்
## STAR-CLASS HOTELS : DETAILS

0311/ '10

14. **ගරු ජෝන් අමරතුංග මහතා (ගරු රවි කරුණානායක මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு ரவி கருணாநாயக்க சார்பாக)
(The Hon. John Amaratunga - on behalf of the Hon. Ravi Karunanayake)

ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති තරු පන්ති පදනම මත වූ හෝටල් කාමර සංඛ්‍යාව;

(ii) වාර්ෂික රාත්‍රී කාමර සංඛ්‍යාව;

(iii) පසු ගිය වර්ෂ දහය සඳහා වාර්ෂික පදනම මත සංක්‍රමණික ආගමන සංඛ්‍යාව;

(iv) විදේශිකයකු විසින් ශ්‍රී ලංකාව තුළදී වියදම් කරන ලද සාමාන්‍ය මුදල;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සංචාරක පැමිණීම් මත පනවන ලද සියලුම බදු සහ පසු ගිය වර්ෂ දහය තුළ වාර්ෂික පදනමින් ලබාගත් මුදල කොපමණද;

(ii) සංචාරක ක්ෂේත්‍රය සඳහා ජාතික ප්‍රතිපත්තියක් ස්ථාපිත කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் நட்சத்திர தர அடிப்படையில் உள்ள ஹோட்டல் அறைகளின் எண்ணிக்கை,

(ii) இரவு தங்கு அடிப்படையில் அறைகளின் வருடாந்த எண்ணிக்கை,

(iii) கடந்த தசாப்தத்தில் வருடாந்த அடிப்படையில் குடிவரவின் எண்ணிக்கை,

(iv) வெளிநாட்டவர் ஒருவரினால் இலங்கையினுள் செலவு செய்யப்பட்ட சராசரி தொகை

எவ்வளவு என்பதை அவர் இச்சபைக்கு அறியத்தருவாரா?

(ஆ) (i) உல்லாசப் பயணிகளின் வரவின்மீது விதிக்கப்பட்ட அனைத்து வரிகளையும் மற்றும் கடந்த தசாப்தத்தில் அதன் மூலம் ஈட்டிய தொகை எவ்வளவு என்பதையும் வருடாந்த அடிப்படையிலும்,

(ii) உல்லாசப் பயணத்துறைக்கென தேசிய கொள்கையொன்று வகுக்கப்படுமா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Economic Development:

(a) Will he inform this House -

(i) the number of hotel rooms in Sri Lanka in star class basis;

(ii) the number of room nights per year;

(iii) the number of transit arrivals for the last 10 years on per year basis; and

(iv) the average amount spent in Sri Lanka by a foreigner?

(b) Will he state-

(i) all the taxes imposed on tourist arrivals and amount earned by each, separately, for last ten years on per year basis; and

(ii) whether a national policy on tourism would be developed?

(c) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති තරු පන්ති පදනම මත වූ හෝටල් කාමර සංඛ්‍යාව

| තරු වර්ගීකරණය | | කාමර සංඛ්‍යාව |
|---|---|---|
| තරු 05 | - | 3080 |
| තරු 04 | - | 1582 |
| තරු 03 | - | 1079 |
| තරු 02 | - | 2517 |
| තරු 01 | - | 1041 |
| වර්ගීකරණය නොකරන ලද | - | 5352 |
| මුළු එකතුව | - | 14651 |

(ii) වාර්ෂික රාත්‍රී කාමර සංඛ්‍යාව

4,075,799 රාත්‍රී

(iii) පසු ගිය වර්ෂ දහය සඳහා වාර්ෂික පදනම මත සංක්‍රමණික ආගමන සංඛ්‍යාව.

| වර්ෂය | | සංචාරක පැමිණීම |
|---|---|---|
| 2000 | - | 400,414 |
| 2001 | - | 336,794 |
| 2002 | - | 393,171 |
| 2003 | - | 500,642 |
| 2004 | - | 566,202 |
| 2005 | - | 549,308 |
| 2006 | - | 559,603 |
| 2007 | - | 494,008 |
| 2008 | - | 438,475 |
| 2009 | - | 447,890 |

(iv) විදේශිකයෙකු විසින් ශ්‍රී ලංකාව තුළදී වියදම් කරන ලද සාමාන්‍ය මුදල.

| වර්ෂය | | වියදම් කරන ලද සාමාන්‍ය මුදල (ඇ.ඩොලර්) |
|---|---|---|
| 2000 | - | 62.3 |
| 2001 | - | 63.1 |
| 2002 | - | 63.4 |
| 2003 | - | 66.8 |
| 2004 | - | 72.2 |
| 2005 | - | 74.6 |
| 2006 | - | 83.4 |
| 2007 | - | 79.1 |
| 2008 | - | 76.7 |
| 2009 | - | 81.8 |

(ආ) (i) 2003 අංක 28 දරන මුදල් පනත යටතේ අපගමන බදුවලින් 1/3 ක ප්‍රමාණයක් 2003 සැප්තැම්බර් 01 දින සිට සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට බැර කරනු ලැබේ. එහි විස්තර පහත දැක්වේ.

| වර්ෂය | | වාර්ෂිකව ලැබූ මුදල (රු. මිලියන) |
|---|---|---|
| 2003 (සැප්තැම්බර්- දෙසැම්බර්) | - | 207.62 |
| 2004 | - | 780.36 |
| 2005 | - | 574.41 |
| 2006 | - | 696.00 |
| 2007 | - | 440.96 |
| 2008 | - | 738.82 |
| 2009 | - | 766.26 |

(ii) සංචාරක ක්ෂේත්‍රය සම්බන්ධ කඩිනම් සිව් අවුරුදු සැලැස්මක් ඉදිරිපත් කර ඇත.

(ඇ) පැන නොනඟී.

## වරප්‍රසාද : 2010.08.03 දින පැවැති අධ්‍යාපන අමාත්‍යාංශයේ විශේෂ උපදේශක කාරක සභාවට සහභාගි වීම වැළැක්වීම

## சிறப்புரிமை: 2010.08.03 ஆந் திகதி கல்வி பற்றிய ஆலோசனைக்குழுவில் கலந்து கொள்வதைத் தடுத்தமை

## PRIVILEGE : PRECLUDING PARTICIPATION AT SPECIAL CONSULTATIVE COMMITTEE ON EDUCATION HELD ON 3RD AUGUST 2010

**ගරු ජෙනරාල් සරත් ෆොන්සේකා මහතා**
(மாண்புமிகு ஜெனரல் சரத் பொன்சேக்கா)
(The Hon. General Sarath Fonseka)

ගරු කථානායකතුමනි, වරප්‍රසාද කඩ වීමක් පිළිබඳවයි. නැවත වතාවක් එකම දේ පිළිබඳව මෙම ගරු සභාවේ හා ඔබතුමාගේ අවධානය යොමු කරවීමට සිදු වීම ගැන පළමුව මාගේ කනගාටුව පළ කරමි. මීට ඉහතදී ද අවස්ථා කිහිපයකදීම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වන මා හට පාර්ලිමේන්තුවේ උපදේශක කාරක සභා රැස්වීම්වලට සහභාගි වීමෙන් වැළැක්වීමට මා රඳවා ගෙන සිටින හමුදා නිලධාරින් ක්‍රියා කළ බව ඔබතුමා දන්නෙහිය. ඒ පිළිබඳව මේ ගරු පාර්ලිමේන්තුවේ සහ ගරු අධිකරණයේ අවධානයට ලක් කරන ලදී.

ඊයේ (03) දිනයේ ද පෙරවරු 9.30ට පාර්ලිමේන්තුවේ පැවැති අධ්‍යාපන අමාත්‍යාංශයේ විශේෂ උපදේශක කාරක සභා රැස්වීමට මා සහභාගි වීමට නියමිතව තිබුණි. මා විසින් අදාළ නිලධාරින්ට ඒ බව දැනුම් දුන්නද, ඔවුන් මා පාර්ලිමේන්තුවට පැමිණීම වළක්වන ලදී. මේ පිළිබඳව පාර්ලිමේන්තු මහ ලේකම්තුමාගේ ලිඛිත අවසරයක්ද හමුදාපතිවරයාට හා අදාළ නිලධාරින්ට මා විසින් යොමු කරන ලදී.

පසු ගිය ජූලි 29 දින මහාධිකරණයේ ත්‍රි පුද්ගල විනිසුරු මඩුල්ල විසින්ද මා හට පාර්ලිමේන්තුවේ සියලු කාරක සභා සහ පක්ෂ නායක රැස්වීම්, කණ්ඩායම් රැස්වීම් හා පාර්ලිමේන්තු වාර සඳහා සහභාගි වීමට ඇති අයිතිය තහවුරු කර තිබියදී අදාළ අධිකරණයේ නියෝගය නොසලකා මෙම අධ්‍යාපන අමාත්‍යාංශ කාරක සභාවට සහභාගි වීමට ඉඩ නොදෙන ලදී. ගරු අධිකරණය විසින් දෙන ලද නියෝගයේ පිටපතක් මේ මොහොතේදී **සභාගත*** කරමි.

මේ තත්ත්වය විසින් මාගේ වරප්‍රසාද පමණක් නොව මේ ගරු පාර්ලිමේන්තුවද හෑල්ලු කර ඇත. ජනතා පරමාධිපත්‍ය පමණක් නොව ගරු අධිකරණයම හෑල්ලුවට ලක් කර ඇත. ඔබතුමාගේ මැදිහත් වීම ඵල රහිත කර ඇත. ඔබතුමා මීට පෙර අවස්ථාවේ දී මෙම නිලධාරින් පාර්ලිමේන්තු වරප්‍රසාද කමිටුව හමුවට කැඳවා මාගේ අයිතිය තහවුරු කරන බව පැවසුවද, එය තවම ඉටු වී නැති බවද අවධාරණය කරමි.

එම සියලු කරුණු සලකා මා හට මින් ඉදිරියට හෝ පාර්ලිමේන්තුවට හා උපදේශක කමිටු ඇතුළු පාර්ලිමේන්තු කටයුතු වෙනුවෙන් සහභාගි වීමට ඇති අයිතිය තහවුරු කිරීමට මැදිහත් වන මෙන් ඔබතුමාගෙන් ඇතුළු සියලු පක්ෂ විපක්ෂ සහෝදර මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිමි. ස්තුතියි, ගරු කථානායකතුමනි.

***සභාමේසය මත තබන ලද ලියවිල්ල:**
** சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு:*
** Document tabled:*

**අධි චෝදනා පත්‍රය**

1988 අංක 21 දරණ පනතින් සංශෝධිත 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 450(3) වගන්තිය යටතේ නීතිපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන අධි චෝදනා පත්‍රයයි.

**කොළඹ අධිකරණ කලාපයේ**

**මහාධිකරණය.**

නීතිපතිගේ
අංකය : සීඑෆ්/07/2010

මහාධිකරණයේ
අපරාධ නඩු අංකයඃ } එච්.සී.5311/2010

කොළඹ ම/උ
නඩු අංකය : } බි 6314/10

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

විරුද්ධව

ගාර්දිහේවා සරත් චන්ද්‍රලාල් ෆොන්සේකා

**කොළඹ මහාධිකරණය අංක 01**

**මහාධිකරණ විනිසුරු - දීපාලි විජේසුන්දර මැතිනිය, (සභාපති)**

**මහාධිකරණ විනිසුරු - ඩබ්.ටී.එම්.පී.බී. වරාවැව මැතිතුමා,**

**මහාධිකරණ විනිසුරු - සුල්ෆිකාර් රෂීන් මැතිතුමා, ඉදිරිපිටදිය.**

වාර්තා කලේ :- ල.ලේ. ගයානි දමයන්ති.

නඩු අංකය :- එච්.සී 5311/10

දිනය :- 2010.07.29

විත්තිකරු සිටී.

විත්තිකරු වෙනුවෙන් පෝල් රත්නායක නීතිඥ සමාගමේ උපදෙස් පරිදි නීතිඥ නලින් ලද්දුවහෙට්ටි මයා සමග නීතිඥ යූ.එල්.පී.බංඩාර මයා, නීතිඥ පී. වන්නිනායක මයා, නීතිඥ ප්‍රියදර්ශනි ඉලුක්පිටිය මිය, නීතිඥ නිශාන්ති වෙත්තසිංහ මයා, නීතිඥ සෝමා විජේසූරිය මිය, නීතිඥ නිරාෂා ගමගේ මිය, නීතිඥ බංඩාර ඒකනායක මයා, නීතිඥ සුමිත් සිල්වා මයා, නීතිඥ ඉනෝකා ගමගේ මිය, නීතිඥ මරවින් ද සිල්වා මයා, නීතිඥ නන්දන මල්කුමාර මයා, නීතිඥ ලක්මාල් බාලසූරිය මයා, නීතිඥ අනුරුද්ධ ලියනගේ මයා, නීතිඥ සුධර්මා බංඩාර තිලක මයා, නීතිඥ මංජුල පතිරාජ මයා, නීතිඥ රෙක්සි පියදාස මයා, නීතිඥ ගයානි ගුණසේකර මිය, නීතිඥ චන්ද්‍රා අබේරත්න මිය, නීතිඥ කැලුම් උබේසේකර මයා, නීතිඥ නියුමන් හෙන්රි මයා, නීතිඥ ප්‍රේමණි පොතුපිටිය මිය, නීතිඥ ඉනෝකා පෙරේරා මිය, නීතිඥ රංජන් කාරියවසම් මයා, නීතිඥ පද්ම ශ්‍රියානි පුංචිහේවා මිය, නීතිඥ වසන්ත පිටිගල මයා, නීතිඥ ජෙෆ්රි සෙනුර්දීන් මයා, නීතිඥ රන්දුල ආරියදාස මයා, නීතිඥ සුනිල් වටගල මයා, නීතිඥ ජනපිත් ද සිල්වා මයා, නීතිඥ අරුණ ඉහළවිතාරණ මයා, නීතිඥ අනුෂ ලියනගේ මයා, නීතිඥ රංජිත් පෙරේරා මයා, නීතිඥ සිරිල් විජේකෝන් මයා සහ නීතිඥ නාමල් රාජපක්ෂ මයා පෙනී සිටී.

පැමිණිල්ල වෙනුවෙන් නියෝජ්‍ය සොලිස්ටර් ජනරාල් වසන්ත නවරත්න බංඩාර මහතා සමග ජ්‍යෝෂ්ඨ රජයේ අධි නීතිඥ ඩිලාන් රත්නායක මහතා සහ රජයේ අධි නීතිඥ යොහාන් ලියනගේ මහතා පෙනී සිටී.

**පැමිණිල්ල වෙනුවෙන් නියෝජ්‍ය සොලිස්ටර් ජනරාල් වසන්ත නවරත්න බංඩාර මහතා කරුණු ඉදිරිපත් කරයි,**

මා ඔබතුමිය, තුමන්ලාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටින්නේ විත්තිකරුට අධි චෝදනා භාර දෙන ලෙස,

----------

මුද්‍රිතට අධි චෝදනා පත්‍රය, අදාල ඇමුණුම් සහ සී.ඩී. තැටි 03 ක් විවෘත අධිකරණයේදී භාර දෙන ලදි.

**පැමිණිල්ල වෙනුවෙන් නියෝජ්‍ය සොලිස්ටර් ජනරාල් වසන්ත නවරත්න බංඩාර මහතා කරුණු ඉදිරිපත් කරයි,**

ස්වාමිනි, මෙම අවස්ථාවේදී සාක්ෂි ආඥා පනතේ විශේෂ විධිවිධාන පනතේ 07 වෙනි වගන්තිය ප්‍රකාරව අද දින මෙම අධි චෝදනා පත්‍රයේ ලැයිස්තුගත කොට තිබෙන සී.ඩී තැටි තුන සම්බන්ධයෙන් දින 45 ක කාලයක් සදහා දියයුතු දැන්වීම අද දින මා නිල වශයෙන් ඔබතුමන්ලාගේ අධිකරණයට දැනුම් දී සිටිනවා. එහි එම දැන්වීමේ පිටපතක් දැනටමත් අපි අධි චෝදනා පත්‍රය සමග ඔබතුමන්ලාගේ අධිකරණයට භාර දී තිබෙනවා. ඒ අනුව අධි චෝදනා පත්‍රයේ ඉදිරිපත් කිරීම් අංක 06 වන සංයුක්ත තැටි තුනක් එහි අඩංගු දැනුම් දෙනවා. මෙම සංයුක්ත තැටි තුනේ අඩංගු කරුණු විත්තිකරු විසින් කරන ලද ප්‍රකාශයත්, එම කරන ලද ප්‍රකාශ රූපවාහිනී නාලිකාවන් තුලින් විකාශනය කර තිබෙන ප්‍රවෘත්ති නිවේදන ඇසුරින් මෙම සංයුක්ත තැටි තුනේ කරුණු අඩංගු වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් දින 45 දැනුම් දීම එම විධිවිධානය අද පැමිණිල්ල විසින් ඉටු කරනු ලබනවා.

**විත්තිය වෙනුවෙන් නීතිඥ නලින් ලද්දුවහෙට්ටි මහතා කරුණු ඉදිරිපත් කරයි,**

ගරු විනිසුරුතුමියනි, තුමන්ලාගෙන් මෙම ගරු නියෝජ්‍ය සොලිස්ටර් ජනරාල්තුමා විසින් ඉදිරිපත් කරන ලද 1995 අංක 14 දරණ සාක්ෂි විශේෂ විධි විධාන පනතේ 07 වන වගන්තිය යටතේ සිදු කරනු ලබන දැන්වීම මෙම සංයුක්ත තැටිවල ක්‍රියාකාරීත්වයට යටත්ව ලැබුනු බවට පිළිගැනීමක් කරනවා. එම සංයුක්ත තැටිවල ක්‍රියාකාරීත්වය යම්කිසි දෝෂයක් තිබුනහොත් ඒ පිළිබදව අධිකරණයට දැන්වීමට අවකාශ මා මේ අවස්ථාවේදී ලබා ගන්නවා.

**<u>පැමිණිල්ල වෙනුවෙන් නියෝජ්‍ය සොලිස්ටර් ජනරාල් වසන්ත නවරත්න බංඩාර මහතා කරුණු ඉදිරිපත් කරයි,</u>**

ඒවාගේම මම ඉතාම ගෞරවයෙන් ඔබතුමන්ලාගේ ගරු අධිකරණයට දන්වා සිටිනවා එම සී.ඩී තැටි සම්බන්ධයෙන් සාක්ෂි දීමට සාක්ෂිකරුවන් ගණනාවක් ලැයිස්තුගත කර තිබෙනවා. මගේ උගත් නීතිඥ මහත්මයා සී.ඩී. තැටි බැලීමෙන් අනතුරුව ඒවා පිළිගැනීමට සූදානම් නම් අපරාධ නඩු විධාන සංග්‍රහයේ 420 වගන්තිය යටතේ පිළිගැනීමක් හැටියට පිළිගැනීමට සූදානම් නම් අපිට එම සාක්ෂිකරුවන් කැඳවීමට අවශ්‍ය වන්නේ නැහැ. නමුත් අවශ්‍ය නම් අපි කැඳවීමට සූදානම්. අධිකරණයේ කාලය ඉතුරු කර ගන්න පුලුවන් මගේ උගත් නීතිඥ මහත්මයාට මෙම සී.ඩී. තැටිවල අඩංගු කරුණු අපරාධ නඩු විධාන සංග්‍රහයේ 420 වගන්තිය යටතේ පිළිගැනීමක් හැටියට දෙපාර්ශවය පිළිගන්නේ නම් සාක්ෂි ලැයිස්තුවේ සාක්ෂිකරුවන් ගණනාවක් කැඳවීමට අවශ්‍ය නොවන බව මා මෙම ගරු අධිකරණයට ඉතාමත් ගෞරවයෙන් දැනුම් දෙනවා.

<u>නියෝගය</u>

කොළඹ මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක බි 6314/10 දරණ නඩුවේ අධිකරණයට ඉදිරිපත් කර ඇති සියලුම නඩු භාණ්ඩ මෙම අධිකරණයට වහාම ඉදිරිපත් කිරීමට මහේස්ත්‍රාත් අධිකරණයේ

නඩු භාණ්ඩ ලේඛණයේ අංක 04 ලෙස සඳහන් කර ඇති භාණ්ඩ අධිකරණයට ඉදිරිපත් කර නැත. ඉදිරිපත් කර නැති ලේඛණ නියෝජ්‍ය සොලිස්ටර් ජනරාල්වරයා අධිකරණයට සහ විත්තිකරුට පිටපත් ලබා දීමට භාර ගනී. නඩු විභාගයට ප්‍රථමයෙන් මෙම පිටපත් විනිශ්චයකාරතුමන්ලා තුන්දෙනාට සහ විත්තිකරුගේ නීතිඥවරයාට භාර දීමට නියෝජ්‍ය සොලිස්ටර් ජනරාල්වරයා භාර ගනී.

චූදිතගෙන් ඇඟිලි සලකුණු ලබාගන්න.

**<u>විත්තිය වෙනුවෙන් නීතිඥ නලින් ලද්දුවහෙට්ටි මහතා කරුණු ඉදිරිපත් කරයි,</u>**

ගරු මැතිනියනි, මේ අවස්ථාවේදී මෙම සැකකරු හට වෙනත් නඩු රාශියක් පවතින බැවින් ඇප ඉල්ලීමක් කර මෙම අධිකරණයේ කාලය වෙහෙසීමට මා අදහස් කරන්නේ නැහැ. එය නිසි අවස්ථාවේදී කිරීමට ඇති අයිතිය පමණක් මා රඳවා ගන්නවා. මෙම සැකකරු දැනට කොළඹ කොටුව සහ අලුත්කඩේ ගරු මහේස්ත්‍රාත්තුමන්ලාගේ නියෝග මත රිමාන්ඩ් භාරයට පත් කර තිබෙන අතර ඔහුගේ ආරක්ෂාව පිළිබඳව ගැටලු මතු වී ඇති හෙයින් දෙපාර්ශවයේම ඉල්ලීම මත ඔහු යුධ හමුදාපති භාරයේ නාවික හමුදා මූලස්ථානයේදී බන්ධනාගාර කොමසාරිස්වරයාගේ අධීක්ෂණය යටතේ රිමාන්ඩ් ගත කර තිබෙනවා. එසේ කරන අවස්ථාවේදී මෙම විත්තිකරු මහජන ඡන්දයෙන් පත් වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වන හෙයින් ඔහු පත්කල ජනතාවගේ සුභසිද්ධිය සඳහා කටයුතු කිරීමටත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස ඔහුගේ වගකීම් ඉටු කිරීම සඳහා අවස්ථා 04 කදී පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු වලට සහභාගී වීමට ඔහුට අවසර දී තිබෙනවා. එම අවස්ථා 04 ගරු මැතිනියනි,

01. සියලුම පාර්ලිමේන්තු සැසිවාරයන්,
02. ඔහු සාමාජිකත්වය දරන සියලුම තේරීම් කාරක සභා සැසිවාරයන්,
03. ඔහු සාමාජිකත්වය දරන සියලුම උපදේශක කාරක සභා සැසිවාරයන්.
04. ඔහු විපක්ෂයේ පක්ෂ නායකයෙකු බැවින් පක්ෂ නායක රැස්වීම්.

ඒ ඔහුට දැනටමත් අවසර දී තිබෙන ඔහු සහභාගී වන පාර්ලිමේන්තු කටයුතු 04 තවදුරටත් ඔහුට කරගෙන යාමට හැකි වන පරිදි ඔබතුමන්ලාගේ අධිකරණයේ අධිකරණ බලය දැන් බලාත්මක වී ඇති බැවින් බන්ධනාගාර කොමසාරිස්ට හා ඔහු රඳවා තිබෙන හමුදාපතිතුමන් වෙත නියෝගයක් කරන මෙන් මා ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**<u>පැමිණිල්ල වෙනුවෙන් නියෝජ්‍ය සොලිස්ටර් ජනරාල් වසන්ත නවරත්න බංඩාර මහතා කරුණු ඉදිරිපත් කරයි,</u>**

මෙම අවස්ථාවේදී මගේ උගත් නීතිඥ මහත්මයා කියා සිටියා ඔහු ඇප ඉල්ලීම සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේ අධිකරණයේ කාලය නාස්ති නොකරන බව. මම කියා සිටින්නේ ඇප ඉල්ලීම සම්බන්ධයෙන් මෙම අවස්ථාවේදී ඔබතුමන්ලාගේ නියෝගයක් කල යුතුව තිබෙන බවයි. මක්නිසාදයත්, මෙය ඔබ අධිකරණයේ තිබෙන නඩුවක්. වෙනත් අධිකරණවල තිබෙන වෙනත් නඩු මෙම අධිකරණයේ අධීක්ෂණයට ලක්වන්නේ නැහැ. එම නිසා මම ගෞරවයෙන් මෙම අවස්ථාවේදී කියා සිටිනවා චෝදනා ඉදිරිපත් කර තිබෙන මූලික වශයෙන් හදිසි අවස්ථා නියෝග යටතේ. එකී නියෝගයන්හි මා මේ අවස්ථාවේදී කියා සිටින්නේ හදිසි අවස්ථා නියෝග යටතේ අපි 62 වගන්තිය යටතේ නීතිපතිතුමාගේ බලතල අනුව ඇපදීමට විරුද්ධ වෙනවා.

<u>නියෝගය</u>

චූදිත සම්බන්ධයෙන් ඇප ඉල්ලීමක් කර නොමැති බැවින් ඇප සම්බන්ධයෙන් ප්‍රශ්නයක් මතු වන්නේ නැත. ඔහු දැනට සිටින ආකාරයට තවදුරටත් හමුදා භාරයේ රඳවා තබා ගැනීමට නියෝග කරමු. අවශ්‍ය දින වල සියලුම පාර්ලිමේන්තු සැසිවාරයන්වලටත්, ඔහු සාමාජිකත්වය දරන සියලුම තේරීම් කාරක සභා සැසිවාරයන්ටත්, ඔහු

සාමාජිකත්වය දරණ සියලුම උපදේශක කාරක සභා සැසිවාරයන්ට සහ ඔහු විපක්ෂයේ පක්ෂ නායකයෙක් බැවින් පක්ෂ නායක රැස්වීම් වලටත් ඉදිරිපත් කිරීමට නියෝග කරමු. මෙම නඩුව පවතින දින වලදී මහාධිකරණයට ඉදිරිපත් කිරීමටත් නියෝග කරමු.

බන්ධනාගාර අධිකාරීටත්, හමුදා භාර නිලධාරීටත්, මෙම නියෝග අදාල වනු ඇත.

පැසා 01 - 20 දක්වා සිතාසි.
විභාගය :- 2010.09.27 සිට දිනපතා (පෙරවරු 11.00ට)

අ/කළේ,
(දීපාලි විජේසුන්දර -සභාපති)
මහාධිකරණ විනිසුරු - කොළඹ
2010.07.29

අ/කළේ,
(ඩබ්.ටී.එම්.පී.බී. වරාවැව)
මහාධිකරණ විනිසුරු - කොළඹ
2010.07.29

අ/කළේ,
(සුල්ෆිකාර් රෂීන් )
මහාධිකරණ විනිසුරු - කොළඹ
2010.07.29

සහතික කිරීම.

ඉහතින් දැක්වෙනුයේ කොළඹ මහාධිකරණ නඩු අංක එච්.සී. 5311/10 දරණ නඩු වාර්තාවේ 2010.07.29 වැනි දින නියෝගයේ සත්‍ය සහතික පිටපතකි.
පිටු (01-10 දක්වා) ටී.අංකය : 4 172346 / 21
සැකසුවේ :-
සැසඳුවේ :-

රෙජිස්ට්‍රාර්.

කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණය.

22 JUL 2010

ස්ථානාධිපති
වාණිජ අපරාධ විමර්ශන අංශ 111
අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව
කොළඹ 01.
පැමිණිල්ල

නඩු අංකය : බී 60/10

වොලින්ටන් වෙන්ටන් ඩේහොටි.
අංක 50/1/1,
කන්දවත්ත පාර,
නුගේගොඩ.
වූදිත

---

10.07.21

එස්.ඩබ්.නුර්දීන් මයා මෝෂමක් මගින් ඉල්ලීමක් කිරීමට ගරු අධිකරණයේ කැඳවන ලෙස අයැද සිටී.

3 වූ:- එස්.චන්ද්‍රලාල් පොන්සේකා
ඉදිරි දිනය :- 2010.07.26

- (3) සැකකරුව පාර්ලිමේන්තු සැසි වාර වලට හා අනෙකුත් සැසි වාර වලට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් 2010.6.23 (දෙදහස් දහයේ ජුනි විසි තුන) දින කරන ලද නියෝගයට අදාලව නියෝගයක් නි/ කරන ලදී.

කැඳවන්න.
26/7/2010
අත්/ කළේ: මහේස්ත්‍රාත්

සටහන්
බලන්න.

02 කොළඹ කොටුව මහේස්ත්‍රාත් ලංකා ජයරත්න මැතිණිය ඉදිරිපිටදී ය.

සටහන් කළේ : ලසුලේඛිකා එම්.එස්.දේවිකා විසිනි.
නඩු අංකය : 60/2010
දිනය : 2010.07.21

අද දින නීතිඥ ශිරාස් නුරදීන් මහතාගේ මෝෂමක් මත මෙම නඩුව කැඳවා ඇත. මෝෂමේ සඳහන් කරුණු තහවුරු කරමින් නීතිඥ ශිරාස් නුරදීන් මහතා සමග නීතිඥ නලින් ලද්දුව හෙට්ටි මහතා කරුණු දක්වයි.

මෙම නඩුවේ 3 වන සැකකරු සරත් චන්ද්‍රලාල් පොන්සේකා යන අය රක්ෂිත බන්ධනාගාරගත කිරීමේදී ඔහුව,

(1) පාර්ලිමේන්තු සැසි වාර පවත්වන දින වලදී එම සැසි වර යටතේ තේරීම් කාරක සභා වලට,
(2) ඔහු සාමාජිකත්වය දරණ තේරීම් කාරක සභාව වෙතද
(3) උපදේශක කාරක සභා වලටද,
(4) පක්ෂ කණ්ඩායම් රැස්වීම් වලටද,

ඒවා එසේ පැවැත්වෙන නියමිත දින වලදී ඉදිරිපත් කරන ලෙසට අවසර දෙමින් බන්ධනාගාරයට ඒ සඳහා නියෝගයක් කර ඇත. කෙසේ වෙතත් ඔහුව එනම් 2010 ජුලි මස 16 වන දින පෙ.ව.9.30 ට සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවටද, සවස 2.30 ට රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභා වට ඉදිරිපත් නොකල බව සඳහන් කර සිටී.

ඒ අනුව එම නියෝගය ප්‍රකාරව මින් ඉදිරියේදී අදාල සැසි වාර වලට සහභාගී කරවන ලෙස බන්ධනාගාර අධිකාරීට නියෝග කරන ලෙසට ඉල්ලීමක් කරයි.

නි යෝ ග ය.

මෙම නඩුවේ 3 වන සැකකාර සරත් චන්ද්‍රලාල් පොන්සේකා යන අය 2010.06.23 වන දින රක්ෂිත බන්ධනාගාර ගත කිරීමෙන් අනතුරුව බන්ධනාගාරය මගින් ඉහත කී සැසිර වාර සඳහා, එනම් :

(1) අදාල පාර්ලිමේන්තු සැසි වාර පවත්වන දිනදී, එම සැසි වාර වලටද,
(2) ඔහු සාමාජිකත්වය දරණ තේරීම් කාරක සභාව වෙතද,
(3) උපදේශක කාරක සභා සැසි වාර වලටද,
(4) පක්ෂ කණ්ඩායම් රැස්වීම් වලටද,

එකී සැසි වාර සඳහා නියම කරන දින වලදී බන්ධනාගාරය මගින් ඉදිරිපත් කිරීමට මා විසින් අවසරය ලබා දී ඇත. ඒ අනුව මාගේ එකී නියෝගය ප්‍රකාරව කටයුතු කිරීමට බන්ධනාගාර අධිකාරී වරයා වෙතට නියෝග කරමි.

මෙම නියෝගය ලිඛිතව බන්ධනාගාර අධිකාරී වරයා වෙත දන්වා යැවීමට රෝස්ට්‍රාර්වරියට නියෝග කරමි.

අද දින සටහන් වල පිටපත් ගාස්තු මත 3 වන සැකකරුගේ නීතිඥ මහතාට නිකුත් කරන්න.

අත්/කළේ: ( ලංකා ජයරත්න )
මහේස්ත්‍රාත් - කොටුව.
2010.07.21

---

ඉහත සඳහන් වනුයේ (පිටු අංක 01 - 03 දක්වා) කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ අංක: බී.60/2010 දරණ නඩුවේ 2010.07.21 දිනැති කාර්යය සටහනෙහි සහ එදින නිති සාතියෙහි සත්‍ය පිටපතක් බව මෙයින් සහතික කරමි.

සැකසුවේ :
සැසඳුවේ :
4/21 170759 / 07.21

රෙජිස්ට්‍රාර්
කොටුව මහේස්ත්‍රාත් අධිකරණය
කොළඹ 01.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු මන්ත්‍රීතුමා මීට ප්‍රථමයෙනුත් මේ හා සමාන වරප්‍රසාද ප්‍රශ්නයක් යොමු කළා. ඒ දෙකම පිළිබඳව -අද එකත්, ඊට පෙර එකත් පිළිබඳව- මාගේ නියෝගය මම හෙට උදේ ලබා දෙන්නම්.

## වරප්‍රසාද යෝජනා
## சிறப்புரிமைப் பிரரேரணைகள்
## PRIVILEGE MOTIONS

### I

### වරප්‍රසාද : 2010 මැයි 04 දින පාර්ලිමේන්තු රැස්වීමට සහභාගි වීම වැළැක්වීම
### சிறப்புரிமை: 2010 மே 04ஆந் திகதி பாராளுமன்ற அமர்வில் கலந்துகொள்வதைத் தடுத்தமை
### PRIVILEGE: PRECLUDING PARTICIPATION AT PARLIAMENT SITTING ON 04TH MAY 2010

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පාලිත තෙවරප්පෙරුම මහතා විසින් තමන්ගේ වරප්‍රසාද කඩ වී ඇති බවට 2010 මැයි 05 වැනි දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, ස්ථාවර නියෝග 127 යටතේ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය."

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

### II

### වරප්‍රසාද : 2010 මැයි 05 දින පාර්ලිමේන්තු රැස්වීමට සහභාගි වීම වැළැක්වීම
### சிறப்புரிமை: 2010 மே 05ஆந் திகதி பாராளுமன்ற அமர்வில் கலந்துகொள்வதைத் தடுத்தமை
### PRIVILEGE: PRECLUDING PARTICIPATION AT PARLIAMENT SITTING ON 05TH MAY 2010

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සරත් ෆොන්සේකා මහතා විසින් තමන්ගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2010 මැයි මස 07 වැනි දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, ස්ථාවර නියෝග 127 යටතේ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය."

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු රවි කරුණානායක මහතා, පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීම - පැමිණ නැත.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය, පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීම - පැමිණ නැත.

මී ළඟට, දිනට නියමිත ප්‍රධාන කටයුතු. අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 - අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනි වර කියවීම.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ඊට පෙර මම වෙනත් කාරණයක් ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. ඒ, අද දින,"The Island" පුවත් පතේ සිරස්තල ප්‍රවෘත්තියයි. I quote:

" 'Ministers asleep, parliamentary CCs non-functional - UNP' by Zacki Jabbar."

ගරු කථානායකතුමනි, මේ වාර්තාව වැරදියි. ගරු කථානායකතුමා විසින් පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවන් ප්‍රකාශයට පත් කරන ලද්දේ 2010.06.09 වන දිනයි. කමිටුව විසින් අදාළ මන්ත්‍රීවරුන්ට 2010.06.09 දාතමින් යුත් ලිපියක් යවා තිබෙනවා. මේ වන විට පළමුවැනි මාසය තුළ අමාත්‍යාංශ 16ක් රැස් වෙලා තිබෙනවා. අගෝස්තු මාසයේදී අමාත්‍යාංශ 8ක් රැස්වීමට දැනට වැඩ කටයුතු ආරම්භ කර ඒවා කෙරී ගෙන යනවා. අමාත්‍යාංශ දෙකකට කල් දීලා තිබෙනවා, කලින් රැස් වුණු අමාත්‍යාංශ හැර. මේ අනුව අමාත්‍යාංශ 26ක පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවන් රැස්වීමේ කටයුතු සිදු වෙලා තිබෙනවා. [බාධා කිරීමක්] Hon. Member, please have patience. I know you have made a statement. You are impatient to correct your own statement. - [*Interruption.*] You must first allow me to reply. Do not make utterances in this manner. You must be able to prove what you are saying.

ගරු කථානායකතුමනි, මේ අනුව අමාත්‍යාංශ 45කින් 26ක සියලු කටයුතු සිදු වෙමින් පවතිනවා. මේ අනුව උපදේශක කාරක සභා රැස් වෙලා නැහැ කියන එක සම්පූර්ණ අසත්‍යයක්. මා "The Island" පුවත් පතට ගරු කරනවා. නමුත් මෙය නිවැරදි කළ යුතුයි. "The Island" පුවත් පතට හිතුණු දේවල් පළ කරන්න බැහැ.

ගරු කථානායකතුමනි, දෙවැනි කාරණය මෙයයි. දවසකට රැස් විය හැක්කේ උපදේශක කාරක සභා හතරයි. මෙය පාර්ලිමේන්තුවේ තියෙන සම්පත්, පහසුකම් පිළිබඳ ගැටලුවක්. ශාලා අංක 1 සහ ශාලා අංක 2හි රැස් විය හැකියි. උදේට උපදේශක කාරක සභා දෙකක් රැස් විය හැකියි; හවසට තව උපදේශක කාරක සභා දෙකක් රැස් විය හැකියි. එතකොට උපදේශක කාරක සභා හතරයි රැස් වෙන්න පුළුවන්. මේ කාරණය ගැන අවධානය යොමු කරලා නැහැ. ආණ්ඩු පක්ෂය සිතා මතා උපදේශක කාරක සභාව රැස් නොකිරීම- [බාධා කිරීම්] කාමර තියෙනවා. "රැස් විය හැක්කේ" කියන වචනයි මා පාවිච්චි කළේ. කාමර තියෙනවා පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේ ඕනෑ තරම්.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඇමතිවරු නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඇමතිවරු ඉන්නවා. ඔබතුමන්ලාට තේරෙන්නේ නැහැ. පාර්ලිමේන්තුවේ මේ කාරක සභා කාමර දෙකේ පමණයි මෙවැනි විශාල කාරක සභා රැස්වීම් තැබිය හැක්කේ. ඔබතුමන්ලාගේ ඕනෑකමින් තමයි, කාරක සභා මන්ත්‍රී ප්‍රමාණය වැඩි කර ගත්තේ. ඒ නිසා ඒ මන්ත්‍රීවරුන්ට ඉඳ ගන්න ඉඩ තියෙන්න ඕනෑ. නිලධාරින්ට ඉඳ ගන්න ඉඩ තියෙන්න ඕනෑ. [බාධා කිරීම්] ඉන්න පොඩ්ඩක්. මේ කාරණාවන් දැන ගන්න, තොරතුරු දන්නේ නැත්නම්. [බාධා කිරීම්] ඒ නිසා පාර්ලිමේන්තුවට බැහැ, එක දවසකට උපදේශක කාරක සභා රැස්වීම් 10ක් දාන්න. ඒ ගැටලුව පවතිනවා. ඒක අපි විසඳා ගන්න ඕනෑ, ගරු කථානායකතුමාත් එක්ක ඔබතුමන්ලා අපි රැස් වෙලා. එසේ නැතිව පත්තරේට ප්‍රකාශයක් කරලා විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා තාවකාලික සතුටක් ලබන්න එපා. [බාධා කිරීම්] ඔබතුමා තාවකාලික සතුට තමයි ලබන්න කැමැති. සතුටක් ලබන්නයි මේ ප්‍රකාශය කරලා තියෙන්නේ. ඒ නිසා මේ ප්‍රකාශය නිවැරදි කරවීම ඉතාම වැදගත්.

රජය මේ පිළිබඳ කාල සටහනක් ඇති කර ගන්න පක්ෂ නායක කමිටුවේ දී එකඟතාවක් ඇති වෙලා තිබෙනවා. අපි සාකච්ඡා කරලා ඒ කාල සටහන ඇති කර ගනිමු.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, එම ප්‍රකාශය මතු කිරීම පිළිබඳව මම එකඟ වන්නේ නැහැ. කාරක සභා 8ක් පවත්වන්න පුළුවන්. කාමර 8ක් තිබෙනවා. මාස 5ක් 6ක් ගත වුවත් අමාත්‍යාංශ 46ක් තිබියදී මීට පෙර අමාත්‍යාංශ 26ක පමණයි උපදේශක කාරක සභා පවත්වලා තිබෙන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මාස 5ක් 6ක් නොවෙයි, ගරු කථානායකතුමා විසින් ප්‍රකාශ කළ දවසේ සිට තමයි කාරක සභා පටන් ගන්න වලංගු කාලය වන්නේ. ගරු කථානායකතුමනි, අපි අප්‍රේල් මාසයේ 22 වැනිදා දිවුරුම් දුන්නාට කාරක සභා ස්වයංක්‍රියව පිහිටු වන්නේ නැහැ. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, විවාද කරන්න දෙයක් නැහැ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
විවාදයක් නොවෙයි, මගේ ප්‍රකාශය හැල්ලුවට ලක්- [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මම හිතන්නේ පාර්ලිමේන්තුවේ කටයුතු පිළිබඳව, පුවත් පත් මීට වඩා වග කීමෙන් යුතුව ප්‍රකාශ නිකුත් කරන්න. කවුරු මොනවා කිව්වත්, පාර්ලිමේන්තුවෙන් විමසලා ඒ බව වාර්තා කරනවා නම් වඩා හොඳයි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඔබතුමා දන්නවා, අපි මාස ගණනක් සිට ඉල්ලුවා, මාසයටම තිබෙන උපදේශක කාරක සභා පිළිබඳව අපට කලින් දැනුම් දෙන්න කියලා. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
උපදේශක කාරක සභා පැවැත්වීමේ වගකීම තිබෙන්නේ ඒ අමාත්‍යාංශ ලේකම්තුමන්ලාට. අපි ඒක කියන්නට ඕනෑ. [බාධා කිරීමක්] හොඳයි, ඒ ඇති. නමුත් මීට පස්සේ- [බාධා කිරීමක්]

දැන් ප්‍රධාන කටයුතු. න්‍යාය පත්‍රයේ විෂය අංක 1. අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියැවීම.

## අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත
## நீதித்துறை (திருத்தம்) சட்டமூலம்
## JUDICATURE (AMENDMENT) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

[අ. භා. 1.35]

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා (අධිකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன - நீதி அமைச்சர் )
(The Hon. Athauda Seneviratne - Minister of Justice)
ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කිය විය යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු කථානායකතුමනි, අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත අද දෙවැනි වර කියවීමට ඉදිරිපත් කරනවා. මේ රටේ නඩු විසඳීම ප්‍රමාද වීම ඉතිහාසය පුරාම ඓතිහාසික කාර්යයක් හැටියට සිදු වෙමින් පවතිනවා. සෑම ක්ෂේත්‍රයකම සිවිල් නඩු පමණක් නොවෙයි, අපරාධ නඩු, පවුල් පිළිබඳ නඩු ආදී මේ සියලුම නඩු විසඳීම දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රමාද වෙමින් තිබෙනවා. නඩුවක් විසඳීමට ප්‍රමාද වීමෙන් යුක්තිය ඉටු කර දීම අහිමි වනවා. නඩුවක් කෙටි කාලයක් තුළ විසඳා දීමෙන් පමණයි ඒ නඩු කියන්නන්ට සාධාරණයක් ඉෂ්ට වන්නේ. නමුත් නඩු කියන්නන්ට සාධාරණය ඉතිහාසය පුරාම ඉටු වෙලා නැහැ. මේ රටේ විතරක් නොවෙයි වෙනත් රටවලත් මේ තත්ත්වය තිබෙනවා. අපේ ඉතිහාසයේ මේ රටේ රක්ෂා කරපු, වැදගත් තනතුරු දැරූ ඉංග්‍රීසිකාර මහත්වරුන්ගේ ලිය කියවිලිවල තිබෙනවා, අපේ ලංකාවේ ජනයා නඩු කීමට ඉදිරිපත් වනවා බොහොම වැඩියි කියලා. ඒ නිසා නඩු ඉදිරිපත් කිරීම අධෛර්ය කර, නඩු ඉදිරිපත් කිරීම වැළැක් වීම සඳහා ඉංග්‍රීසි ආණ්ඩුව විසින් පනතකුත් ගෙනැල්ලා තිබෙනවා. එසේ තිබෙද්දිත් නඩු ඉදිරිපත් වීම අතිවිශාල වශයෙන් සිද්ධ වනවා. මේවා විසඳලා දීම සඳහා ලෝකයේ එක එක රටවල් තමන්ගේ සංස්කෘතිය අනුව, ආගමික සම්බන්ධතාවන් අනුව, දේශපාලන තත්ත්වයන් අනුව, ආර්ථික තත්ත්වයන් අනුව, සමාජ තත්ත්වයන් අනුව ඒ රටවල නීති සම්පාදනය කිරීම සිද්ධ කරනවා, අධිකරණ පිහිටුවනවා. ඒ රටවල ඓතිහාසික කරුණුත් මුල් කර ගෙනයි ඒ කටයුතු සිද්ධ වන්නේ. නීති සකස් වීමට මූලික වශයෙන් බලපානවා, මෙන්න මෙය. ඒ රටවල අතීතයේදී ලිඛිත නීති රීති තිබුණේ නැහැ. අද තිබෙන ආකාරයේ සංවිධානාත්මක අධිකරණ ක්‍රම අතීතයේදී තිබිලා නැහැ. නමුත් චාරිත්‍ර, සිරිත් විරිත් මුල් කර ගෙන, සම්ප්‍රදායන් මුල්

කර ගෙන, පාරම්පරික ඇදහිලි මුල් කර ගෙන, ඒ සමාජවල පුද්ගලයන් එකතු වෙලා විවෘතව, සුහදව, වාඩි වෙලා සමථකරණයෙන් තමයි දෙපාර්ශ්වය විසින් කතා කරලා ඒවා විසඳා ගෙන තිබෙන්නේ. ඒ සඳහා ඒ ඒ යුගවල, ඒ රාජ්‍යයන් තුළ මේ තත්ත්වයන් සිදු වෙලා තිබෙනවා. ප්‍රබල වශයෙන්ම සිදු වෙලා තිබෙන්නේ සමථකරණයයි. Mediation තමයි සිදු වෙලා තිබෙන්නේ. ඒ වැඩ පිළිවෙළ තමයි වඩාම යෝග්‍යය. අදාළ දෙපාර්ශ්වය එකට ඉඳලා සාකච්ඡා මඟින්, අදහස් හුවමාරු කිරීම මඟින් ඒ ගම්වල ජනතාව එකතු වෙලා කටයුතු කිරීමෙන් මිත්‍රශීලිබවකින් සහ අන්‍යෝන්‍ය අවබෝධයකින් රටක ඇති වන, පවුල්වල ඇති වන අවුල් බොහෝ විට විසඳා ගන්න පුළුවන් වනවා.

සංවිධානාත්මක නඩු විසඳුම් පිළිවෙළ ඇති වුණාට පසුව, විශේෂයෙන්ම අධිකරණ කටයුතු එදාට වඩා හොඳින් කෙරනවා. අපේ අතීතයේ තිබුණේ ගම්සභා ක්‍රමය. ඒ ගම්සභා ක්‍රමය තුළින් රජ්ජුරුවන් නියම කරලා තිබුණ ඒ ගමේ සිටිය ප්‍රධානීන් එකතු වෙලා විවෘතව සාකච්ඡා කරලා නඩු විසඳා ගෙන තිබෙනවා. බොහොම සැහැල්ලු පිළිවෙළට, බොහොම නිරවුල් විධියට එකට වාඩි වෙලා, සමඟි සම්පන්න වෙලා ඒ ගම් සභා ක්‍රමය තුළින් මේ නඩු විසඳා ගත්තා. ඒ නඩුව එතැනින් විසඳුණේ නැත්නම් -බොහෝ විට ඒ නඩු ඒ ආකාරයෙන් විසඳෙනවා- රජ්ජුරුවන්ගේ නියමය අනුව ඒ නඩු විසඳීමට ඉදිරිපත් වන අවස්ථා තිබෙනවා. රජ්ජුරුවන්ගේ වචනය තමයි අවසාන වචනය. ඒ අපේ රටේ තිබුණ නඩු ක්‍රමය. ඉතාම සීමිත නඩු ප්‍රමාණයක් තමයි ඒ යුගයේ ඉදිරිපත් වෙලා තිබෙන්නේ. ඒ ගම්වල තිබුණු ඉඩකඩම් පිළිබඳව, දේපළ පිළිබඳව, පවුල් පිළිබඳව ඉදිරිපත් වුණ තත්ත්වයන් ඒ අනුව බලපානවා. අපේ ලංකාවේ මුහුදු බඩ පළාත්වලට පෘතුගීසිකාරයන් පැමිණි පසුවත් ලංකාවේ නඩු ඇසීම පිළිබඳව විශාල වෙනසක් ඇති වුණේ නැහැ. ඒ අයට වුවමනා කළේ වෙළෙඳාමයි. ඒ අයට වුවමනා කළේ බදු එකතු කිරීමයි. ක්‍රිස්තියානි ආගම පැතිර වීම වාගේ දේවල් තමයි මුල් වුණේ. ඊ ළඟට, ඕලන්ද ජාතිකයන් පැමිණීමත් සමඟ යම් යම් වෙනස්කම් ඇති වුණා. ඒ කාලයේ තමයි වැඩියෙන් වෙනස්කම් ඇති වන්නට පටන් ගත්තේ. ඒ යුරෝපීය අයට වෙනම උසාවි ඇති කරලා නීතිඥයන් පෙනී සිටීමට සකස් කරලා නඩු ඇසීමේ ක්‍රම ඇති කරන්නට යෙදුණා. ඊට පසුව ඉංග්‍රීසිකාරයාගේ පැමිණීමත් සමඟ තවත් සංවිධානාත්මකව formal විධියට නඩු ඇසීමේ වැඩ පිළිවෙළ ක්‍රමයෙන් ඉදිරියට ගෙන ගියා. නඩුවක් විසඳීමේදී අප විශේෂයෙන්ම බලාපොරොත්තු වන්නේ ඒ නඩුව විසඳන තැනැත්තා බොහොම මධ්‍යස්ථව සාධාරණව අපක්ෂපාතීව ඒ පාර්ශ්වයන් ඉදිරිපත් කරන කරුණු සැලකිල්ලට අරගෙන ඒ නඩුව විසඳා දෙයි කියලායි. ඉංග්‍රීසිකාරයාගේ පැමිණීමත් සමඟ සිදු වුණු වෙනස්කම් අනුව අද අපේ උසාවි ක්‍රමය බොහෝ සංකීර්ණ තත්ත්වයකට ගොඩනැඟිලා තිබෙනවා. විවිධ පැති සඳහා උසාවි ඇති කර තිබෙනවා. මහේස්ත්‍රාත් උසාවි තිබෙනවා. දිස්ත්‍රික් උසාවි තිබෙනවා. මහාධිකරණ තිබෙනවා. අභියාචනාධිකරණ තිබෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණය තිබෙනවා. මේ ආකාරයට නඩු විසඳන මූලික ආයතන තිබෙනවා. මේ මාර්ගයෙන් නඩු විසඳුණත් තවමත් අතිවිශාල ප්‍රමාණයක නඩු විසඳිලා නැහැ. මේ ප්‍රමාදය නිසා සමහර නඩුවල සාක්ෂිකාරයන්ට සාක්ෂි මතක නැහැ. අවුරුදු 15ක් 20ක් ගත වෙලා සාක්ෂි දෙන්න ඉදිරිපත් වුණාම ඒ සාක්ෂිය මතක නැහැ. එක්තරා පුද්ගලයෙක් මට කිව්වා, කුඹුරක් පිළිබඳව වූ නඩුවක් ගැන. අවුරුදු 20කට පස්සේ ඒ කුඹුරේ අයිතිය තීන්දු වුණාලු. නඩුව තීන්දු වන කොට කුඹුර නැහැයිලු. කුඹුර සේදිලා ගිහිල්ලා. නඩුවට අවුරුදු 20ක් ගත වෙලා. ඒ වාගේ සිද්ධීන් වෙනවා. සමහර නඩුවලට අවුරුදු 40ක් ගත වන අවස්ථාත් තිබෙනවා. ඊයේ පෙරේදා මට එක්තරා පුද්ගලයෙක් හමු වුණා. ඔහුගේ නඩුවට අවුරුදු 27ක් වෙනවාලු. නඩු විසඳීමේදී ඇති වෙලා තිබෙන අපහසුතාවන් හා ප්‍රමාදයන් තුළ සාධාරණයක් ඉෂ්ට වීම අමාරුයි. මේ නිසා මා වරින් වර උසාවි සංඛ්‍යාව වැඩි කර තිබෙනවා. අපි මේ වෙන කොට ඉතිහාසයේ පළමුවෙනි වතාවට උසාවි 63ක් වැඩි කර තිබෙනවා. ඒ මඟින් අපි බලාපොරොත්තු වනවා ඒ දිස්ත්‍රික්කවල නඩු විසඳීම කාර්යක්ෂම කරන්න, ඉක්මන් කරන්න, වඩා හොඳ අධිකරණ තීන්දු ඉක්මනින් ලබා දීමට අවස්ථා උදා කර ගන්න. දැන් අපට වුවමනා කරන්නේ මේ නඩු ඒ ආකාරයෙන් විසඳා ගැනීමට අපට අවශ්‍ය වන තත්ත්වයන් පරීක්ෂා කර, නැවතත් අවුරුදු කිහිපයකින් ඒ ලබන අත් දැකීම් තුළින් මේ තත්ත්වයන් වෙනස් කරන්නයි.

කම්කරු විනිශ්චය සභා තිබෙනවා. ඒ කම්කරු විනිශ්චය සභා උසාවි ක්‍රමයට හැඩ ගැසීම නිසා ඒ කම්කරු උසාවිවලත් ප්‍රමාදයන් සිදු වනවා. ඒවා කම්කරු විනිශ්චය සභායි. ඒවා උසාවිම නොවෙයි. ඒවා උසාවි ක්‍රමයකට හැඩ ගැසීම නිසා දෙපාර්ශ්වය එකතු වෙලා සාකච්ඡා මඟින් සමථකරණයට යන එකට වඩා නඩු විසඳීම ප්‍රමාද වනවා. කම්කරුවන්ගේ ප්‍රශ්න විසඳා ගන්න, දෙපාර්ශ්වය අතර කටයුතු කරමින් ඒ ප්‍රශ්න විසඳා ගන්න, කම්කරු විනිශ්චය සභා ක්‍රමය ඇති කෙරුවේ 1956 වර්ෂයේ බලයට පැමිණි දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමාගේ ආණ්ඩුවේ කම්කරු ඇමතිතුමා වශයෙන් සිටි ටී.බී. ඉලංගරත්න මහතායි. අපි හැකි තාක් ඉක්මනින් ඒවායේත් වෙනස්කම් ඇති කළ යුතුයි. සමහර කම්කරුවන්ට රස්සාව නැති වුණාම ඒ ප්‍රශ්නය විසඳීම සඳහා අවුරුදු ගණන් ගත වන කොට ඒ අයට ජීවත් වීම පවා අපහසු වනවා. ඒ නිසා අපි කම්කරු විනිශ්චය සභාත් රාශියක් වැඩි කරලා තිබෙනවා. සෑම නගරයකම වාගේ කම්කරු විනිශ්චය සභාවක් ඇති කරන්න කටයුතු කරලා තිබෙනවා. සිවිල් නඩු ප්‍රමාද වන එකට විසඳුමක් වශයෙන් අප විසින් ඇති කරන ලද මහාධිකරණවලට සිවිල් නඩු විසඳීම සඳහා අවස්ථාව ලබා දීලා තිබෙනවා. සිවිල් නඩු විසඳීම හුඟක් අභියාචනාධිකරණයේ පවා ප්‍රමාද වෙලා තිබෙනවා. මේ මහාධිකරණ වැඩි කිරීම තුළින් ඒවා විසඳීමට අවස්ථාව උදා වනවා. මහාධිකරණ විනිශ්චයකාරවරුන් 60 දෙනෙක් පත් කර ගැනීම සඳහා අපි පසු ගිය කාලයේදී අනුමැතිය ලබා ගත්තා. ඒ අය 75 දක්වා වැඩි කර ගැනීම සඳහා තමයි මේ සංශෝධන පනත් කෙටුම්පත අද අපි විවාද කරන්නේ. සෑම දිස්ත්‍රික්කයකටම අපි මහාධිකරණයක් ලබා දීලා තිබෙනවා. අපි කොළඹ මහාධිකරණ කිහිපයක්ම ඇති කර තිබෙනවා, සිවිල් නඩු ඇසීමට හා අපරාධ නඩු ඇසීමට. වාණිජ පැත්තටත් මහාධිකරණ තුනක් වෙනමම ඇති කර තිබෙනවා. ඒ වැඩ පිළිවෙළවල් තුළින් ඉක්මන් ප්‍රතිඵලයක් ලබා දෙන්න අපි බලාපොරොත්තු වනවා.

අධිකරණ ක්‍රමය ගත්තාම විශේෂයෙන්ම අපිට නීතිඥවරුන්ගේ සහාය වුවමනා කරනවා. ඒ නීති සංගම්වල නිලධාරි මහත්වරු සමඟත් සාකච්ඡා වට කිහිපයක් පැවැත්වූවා. එතුමන්ලාගේ සහයෝගයත් ලබා ගෙන, ඉදිරි කාලයේදී අධිකරණයේ විනිශ්චයකාරතුමන්ලාගේ අදහසුත් සැලකිල්ලට අරගෙන වෙනස්කම් කරන්න බලාපොරොත්තු වනවා. අධිකරණවල පවතින තත්ත්වයන් හරි ගස්සා ගන්න අපි

අග්‍රවිනිශ්චයකාරතුමා සමඟත් සාකච්ඡා කළා. අග්‍රවිනිශ්චයකාරතුමා වඩා ඉක්මන් නඩු විසඳීමක් ඇති කර ගැනීමේ වුවමනාවෙන් බොහොම කැමැත්තෙන් ඒ කාර්යයන්ට ඉදිරිපත් වුණා. එතුමා වෙනස්කම් ඇති කරන්න උනන්දුවක් දක්වන අග්‍රවිනිශ්චයකාරතුමෙක් බව මා සඳහන් කරන්න කැමැතියි. නඩු විසඳීම සඳහා අපට පොලීසියේ සහයෝගය අවශ්‍ය වනවා. ඒ වාගේම නීතිපතිතුමාගේ සහයෝගය අවශ්‍ය වනවා, ඒ වැඩ පිළිවෙළ සාර්ථක කර ගන්න. අග්‍ර විනිශ්චයකාරතුමාත් නීතිපතිතුමාත් පොලිස්පතිතුමාත් ඒ වාගේම ප්‍රධාන වශයෙන් මේ අංශවල අයත් මාස තුනෙන් තුනට එකතු වෙලා ප්‍රමාද වෙලා තිබෙන නඩු ගැන, නඩු ප්‍රමාද වන හේතු ගැන සාකච්ඡා කර ඒවා ඉක්මන් කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කිරීමට අපි බලාපොරොත්තු වනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඇමතිතුමා තව කොපමණ කාලයක් ගන්නවාද?

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
තව විනාඩි 15ක් විතර.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමාට ලබා දී තිබෙන්නේ විනාඩි 15යි. එහෙම දෙන්න අනෙක් කථිකයන්ගෙන් කාලය අඩු කරන්න වනවා.

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
එහෙම නම් තව විනාඩි 10කින් කථාව ඉවර කරන්නම්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
වැඩියි. විනාඩි 05කින් විතර කථාව ඉවර කරන්න.

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
විනාඩි 05කින් ඉවර කරන්නම්.

අපි බලාපොරොත්තු වන්නේ මේ නඩු ප්‍රමාද වීමට තිබෙන තවත් හේතුවක් වන රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ අඩු පාඩුකම් නැති කර ගන්නයි. ඒ සඳහා අවශ්‍ය නිලධාරි පිරිසක් පත් කර ගන්න සාකච්ඡා කරලා තිබෙනවා, ඉක්මනින් රස පරීක්ෂක වාර්තා ලබා ගන්න. ඒ වාගේම මම පොලිස්පතිතුමා එක්කත් සාකච්ඡා කෙරුවා. මොකද, පොලීසියේ අපරාධ අංශය බොහොම අවශ්‍ය වනවා, නඩුවක් පැමිණිලි කිරීමට සහ ඒවා විසඳා ගැනීමට. ඒ අයගේ සහාය ලබා ගෙන පොලිස්පතිතුමා සමඟ ඒ කටයුතු කරන්නට බලාපොරොත්තු වනවා.

අපට නීතිපතිතුමාගේ සහයෝගයත් අවශ්‍ය වනවා. එතැනත් නොයෙක් ආකාරයේ ප්‍රමාදයන් වනවා. ඒවා හරි ගස්සලා ඉක්මන් නඩු විසඳීමකට යන්න කටයුතු සකස් කර ගන්න අපි බලාපොරොත්තු වනවා. ඒ වාගේම නඩු තිබෙන ප්‍රමාණය දිහා බලලා -දැන් නඩු ගොඩ ගැහිච්ච ප්‍රමාණයක් තිබෙනවා- ඒවා සැලකිල්ලට අරගෙන, ක්‍රමානුකූලව සංවිධානාත්මකව ඇති කරලා තිබෙන උසාවිවලට අමතරව, අපි බලාපොරොත්තු වනවා, අවුරුදු දෙකක පමණ කාලයකට අතිරේක උසාවිත් දිස්ත්‍රික්කවල පටන් ගෙන ඒ ඒ උසාවිවලට නඩු ප්‍රමාණයක් භාර දීලා අවුරුදු දෙකක් තුළ ඒ ගොඩ ගැහිලා තිබෙන සියලුම නඩු තොගය ඉවර කරලා ක්‍රමානුකූලව සෙමෙන් සෙමෙන් අනෙක් නඩු විසඳන්න පුළුවන් තත්ත්වය හරි ගස්සලා දෙන්න.

සමථ මණ්ඩල ක්‍රමය ඇති කරලා දැන් අවුරුදු 20ක් වනවා. ඒ සමථ මණ්ඩල ක්‍රමය තුළින් අවුරුදු පතා සෑහෙන නඩු ප්‍රමාණයක් සමථකරණය වනවා. කලින් නියම කරලා තිබුණේ, මූල්‍ය වටිනාකම රුපියල් විසිපන් දාහකට අඩු පැමිණිලි නඩු පමණක් ඒවාට යොමු කරන්නයි. ඒ තත්ත්වය වෙනස් කරලා, මූල්‍ය වටිනාකම රුපියල් ලක්ෂයකට අඩු පැමිණිලි නඩු සමථ මණ්ඩල වෙත ඉදිරිපත් කරන්න ඒ ශක්තිය, අවසරය ලබා දීලා තිබෙනවා. මම කැබිනට් මණ්ඩලයෙනුත් ඒකට අවසර ලබා ගත්තා. ඒ අනුව අවුරුද්දකට නඩු ලක්ෂ දෙකක් තුනක් සමථකරණය කරන්න සමථ මණ්ඩලයටත් පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරනවා.

ඒ වාගේම පවුල් නඩු ප්‍රසිද්ධියේ අහනවා වෙනුවට නිල කාර්යාල තුළ - Chamber තුළ- අසා විසඳුම් දෙන්න අපි උත්සාහ කරනවා; බලාපොරොත්තු වනවා. ඒවා පත්තරවල දැම්මාම ඒ දරුවන්ටත් සමහර විට හොඳ නැහැ. ඒ පවුල වෙන් වෙනවා නම් ඒ අයටත් හොඳ නැහැ. ආත්ම ගෞරවයට හොඳ නැහැ. ඒ එක පැත්තක්. ඒ අතර පුළුවන් තරම් සමථකරණය කරන්න -අඹු සැමියන් දෙදෙනා වෙන් වී සිටිනවා නම්, වෙන් වන්නට කරුණු එසේ ඉදිරිපත් වුණත් සාකච්ඡා කරලා නැවත එක්කාසු කරන්න- පුළුවන් ද කියා බලන එකට ප්‍රමුඛත්වය දීලා කටයුතු කරන්න යෝග්‍යයි කියන අදහසේයි මා ඉන්නේ. මොකද, යුරෝපීය රටවල සියයට හැටක් විතර දික්කසාද වනවා. එම නිසා සමාජ ප්‍රශ්න, පවුල් ප්‍රශ්න, දරුවන් පිළිබඳ ප්‍රශ්න බරපතළ වෙලා තිබෙනවා. එම නිසා මේ පවුල් නඩු සමථකරණය කිරීමේ ක්‍රියාමාර්ගයන් ඒ රටවලුත් දැන් අනුගමනය කරනවා. එතකොට සමාජ ප්‍රශ්නත් අඩු වනවා. ඒ උත්සාහය යුරෝපයේ රටවලත් කරනවා. ඒ විධියේ වැඩ පිළිවෙළක් ඇති කරන්නට උත්සාහ කරනවා.

ඒ වාගේම ළමා උසාවි පිළිබඳ වැඩ පිළිවෙළක් ඇති කරන්න අදහස් කරනවා. විහාර දේවාලගම් නඩු දහසකට වඩා තිබෙනවා. ඒවා අවසාන කරන්න අවුරුදු දහය, පහළොව යනවා. ඒක සුදුසු නැහැ. අපේ නායක මාහිමිපාණන් වහන්සේලාත් කියනවා, මේ පිළිබඳව වෙනම උසාවියක් ඇති කරලා මේ නඩු ටික ඉක්මනින් විසඳා දුන්නොත් හොඳයි කියලා. විහාර දේවාලගම් නඩු විසඳීම සඳහා අලුත් උසාවියක් ඇති කරලා ඒවා ඉක්මන් කර දීම සඳහා කටයුතු කරන්න අප බලාපොරොත්තු වනවා. ඒ අතර සමහර මහේස්ත්‍රාත් අධිකරණවල, දිස්ත්‍රික් අධිකරණවල උදය වරුව ගත වනවා, නඩු කැඳවලා කල් දමන්න. ඒ තත්ත්වය අනුව නඩුකාරතුමාගේ නඩු ඇසීමේ කාලය පැය තුනක් විතර ඒ නඩු කල් දැමීමට ගත වනවා. එම නිසා, ඒ කාර්යයන් Chamber එකේදී කරන්න, ඒ නීතිඥ මහත්වරුත්, පැමිණිලිකරුවනුත්, විත්තිකරුවනුත් එකතු වී නඩුවට දිනය අරගෙන යන්න පුළුවන් වෙන්න, තනතුරක් ඇති කරලා නඩුකාරතුමාගේ සහායට නීතිඥ මහත්මයකු පත් කරන්නට අප සාකච්ඡා කර ගෙන යනවා. ඒ වාගේම, නඩුවක් පවරන කොට නඩුව භාර ගන්නා රෙජිස්ට්‍රාර්තුමාට අවශ්‍ය ඒ නඩුවට අදාළ සියලු කරුණු සම්පූර්ණ කරලා තියන්න ඕනෑ. දැන් සිද්ධ වන්නේ මොකක්ද? නඩුව භාර ගන්නවා. ඊට පස්සේ මුද්දර ගාස්තු නැහැ කියලාත් නඩුව කල් තබනවා. Bench එකේ - නඩුකාරතුමාගේ ආසනයේ- ඉඳ ගෙන තමයි නියම කරන්නේ නඩුව මාස ගණනක් කල් තබන බවට. නඩුව අහන එක මාස ගණනක් කල් තබනවා මුද්දර ටික ගහන්න කියලා. ඒ නිසා ඒ අඩු පාඩුකම් සියල්ල සකස් කර ගෙන නඩුව ලියාපදිංචි කර ගැනීමේ පිළිවෙළක් ඇති කරන්න ඕනෑය කියා අපි කල්පනා කර තිබෙනවා. ඒ විධියේ විසඳුමකුත් ලබා දෙන්න බලාපොරොත්තු වනවා. එතකොට සෑම උසාවියකම නඩුකාරතුමන්ලාට නඩු අහන්න පැය තුනක විතර කාල වේලාවක් ඉතුරු වනවා. මෙන්න මේ වෙනස්කම් ඇති කරන්න බලාපොරොත්තු වනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි.

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
නියමිත කාලය අවසානද ගරු කථානායකතුමනි?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කමක් නැහැ, තමුන්නාන්සේලාගේ පැත්තෙන් කාලය අඩු කරන්නම්.

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
විශේෂයෙන්ම Human Rights cases, ඒ කියන්නේ මානව අයිතිවාසිකම් පිළිබඳ නඩු පවරන්න පුළුවන් ශ්‍රේෂ්ඨාධිකරණයේ

විතරයි. ඒ වෙනුවට අපි සංශෝධනයක් ගෙනෙන්න බලාපොරොත්තු වනවා අභියාචනාධිකරණවලට, පළාත් අධිකරණවලට ඒ තත්ත්වය දීලා ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් කරන්න පුළුවන් අවස්ථාව හරි ගස්වලා දෙන ආකාරයේ. ඒ වාගේම ගිනි අවි පිළිබඳව නඩු ඉදිරිපත් කළාම ඇප ගන්න කොළඹටම එන්න ඕනෑ. එය පළාත් අධිකරණවලට පැවරීම සඳහා අවශ්‍ය නීතිය වෙනස් කිරීමේ කටයුතු දැනට අපි ආරම්භ කර තිබෙනවා. ඒ වෙනස්කම් ඇති කිරීමේ කටයුතුත් කරන්න අපි බලාපොරොත්තු වනවා. ඒ විධියට නීතිය පුළුවන් තරම් සරල කරලා දෙන්න, පහසුවෙන් තම ප්‍රශ්න විසඳා ගන්න ජනතාවට අවස්ථාවක් ලබා දෙන්න බලාපොරොත්තු වනවා. මේ කෙටි කාලය තුළ තමුන්නාන්සේලා සියලු දෙනාගේම සහයෝගය දෙන්න, අදහස් දෙන්න. අවශ්‍ය වන ප්‍රතිසංවිධාන වැඩ පිළිවෙළ ඇති කරලා ගොඩ ගැහිලා තිබෙන මහා නඩු ගොඩ අවුරුදු දෙකක් ඇතුළත විසඳා දීමට මම බලාපොරොත්තු වනවා. අපේ අග්‍රවිනිශ්චයකාරතුමාගේ සහාය, පොලීසියේ සහාය, නීතිපතිතුමාගේ සහාය, රජයේ රස පරීක්ෂකගේ සහාය, ඒ වාගේම නීතිඥතුමන්ලාගේ සහාය ලබා ගෙන මහා පරිවර්තනයක් කරන්න අපි බලාපොරොත්තු වනවා.

නඩුවක් සාධාරණ ලෙස ඉක්මනින් විසඳලා දෙන්නේ නැත්නම් -නඩු විසඳීම සඳහා අවුරුදු 30, 40 යනවා නම්- ඒ නඩු කියනවාට වැඩිය හොඳයි නොකියා ඉන්න එක. එහෙම සිද්ධ වීම නිසා සමහර විට පාතාල ලෝකයේ ක්‍රියාවන්ට ඒ මිනිස්සු යොමු වන්නත් පුළුවන්කම තිබෙනවා. රටේ නීතිය ක්‍රියාත්මක කරන්න රටේ සාමය ප්‍රධාන වෙනවා. පසු ගිය කාලයේ මේ රටේ සාමයක් තිබුණේ නැහැ. උතුරු නැගෙනහිර ප්‍රදේශවල කැලෑ නීතිය, ත්‍රස්තවාදී නීතිය ක්‍රියාත්මක වුණේ. ඒ වෙනුවට ඒ ප්‍රදේශවල කැඩී බිඳී තිබෙන සියලු අධිකරණ ප්‍රතිසංස්කරණය කරලා නඩුකාරතුමන්ලා පත් කරලා ඒවා නැවත පටන් ගන්න කටයුතු කරනවා. දැනට කුලී ගෙවල්වල ආරම්භ කර තිබෙන අධිකරණ සඳහා අලුත් අධිකරණ ශාලා හදන්න අවශ්‍ය මිල මුදල් ලබා ගෙන අවශ්‍ය කටයුතු අපි කර ගෙන යනවා. මේ ජනාධිපතිතුමාගේ යුගයේදී රටේ නීතිය සාධාරණ ලෙස ක්‍රියාත්මක කර දීමේ අවස්ථාව ඉක්මනින් රටට උදා කර දෙන්න බලාපොරොත්තු වන බව මතක් කරමින් මා මගේ කථාව අවසන් කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

[අ. භා. 2.00]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, ඇමතිතුමා සඳහන් කළා, මහාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ සංඛ්‍යාව 75ක් දක්වා වැඩි කරන්නේ දැන් තිබෙන නඩු ඇසීමේ ප්‍රමාදය නිසාත්, නඩු ඇසීම ඉක්මන් කරන්නට වුවමනා නිසාත්ය කියා. ඒ වාගේම විශේෂයෙන්ම කොළඹ අවට තිබෙන මහාධිකරණ ගණනාවක් ගැනත් සඳහන් කළා. මම ඇමතිතුමාගෙන් අහන්නේ මේවා ඔක්කොම වුවමනාද කියලායි. මොකද, අද ආණ්ඩුව කරන්නේ මොකක්ද? නීතිය අනුව ක්‍රියා කරනවාද? අපි ඊයේ දැක්කා, කොළඹ මහාධිකරණයට අයත් කැලණිය ප්‍රදේශයේ සමෘද්ධි නිලධාරියකු ගෙනැල්ලා ගහක බැඳලා තිබෙන ආකාරය. ඒක ඇමතිතුමා අනුමත කරනවාද? ඩෙංගු මර්දනය වැදගත්. රජයේ නිලධාරින් ඒකට එකතු වන්නේ නැත්නම් ඒ අයට දඬුවම් කරන්න ඒ අදාළ සේවයේ රෙගුලාසි තිබෙනවා. මේ පුද්ගලයා ප්‍රකාශ කර තිබෙන්නේ, ඔහුට එදා එන්න බැරි වුණේ ඔහුගේ දරුවාට අසනීප වෙලා තිබුණු නිසා කියලායි. ඉතින් කැලෑ නීතිය ක්‍රියාත්මක වනවා නම් අපි ඇත්ත වශයෙන්ම මහාධිකරණ ඇති කරන්නේ මොනවාටද? මාධ්‍ය ගෙනැල්ලා මාධ්‍යයෙන් පෙන්වන්න පියවර ගන්නවා. පොලීසිය කළේ මොකක්ද? මේකෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන මූලික අයිතිවාසිකම් දෙකක් කඩ කරනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එකොළොස්වන ව්‍යවස්ථාවෙන් කියැවෙන්නේ වධහිංසාවලින් නිදහස - Freedom from torture - ගැනයි. ප්‍රසිද්ධියේ ගෙනැල්ලා ගහකට බැඳලා ගහන එක වධහිංසාවක්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන ව්‍යවස්ථාව අනුව ඕනෑම පුද්ගලයකුට දඬුවම් කරන්න පුළුවන් නීතිය යටතේ විතරයි. එහෙම නම් නීතිය යටතේ දඬුවම් කරන්න. මේ නිලධාරියා වරදක් කර තිබෙනවා නම් නඩු පවරන්න. නීතිය කැඩුවේ කවුද? නීතිය කැඩු එක්කෙනාට ඔයගොල්ලෝ දඬුවම් දෙන්නේ නැද්ද? ඒකයි මම අහන්නේ. දැන් බලන්න, දණ්ඩ නීති සංග්‍රහයේ - Penal Code Section 186 - Threat of injury to a public servant; රජයේ සේවකයකුට හානි කිරීම, තුවාල කිරීම. Section 312 - Voluntarily causing grievous hurt, තමන්ම වෙන පුද්ගලයකුට තුවාල කිරීම. Section 323 - Voluntarily causing hurt to deter public servant from his duty, රජයේ සේවකයකුගේ වැඩ කටයුතු කරන එක නවත්වන්න කටයුතු කිරීම; තුවාල කිරීම, තර්ජනය කිරීම. Section 330 - Wrongful restraint; Section 331 - Wrongful confinement; Section 341 - Criminal force.

මේ ගරු මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමා තමයි ඉස්සෙල්ලාම අපරාධ නීතිය ඉගැන්නුවේ. මා හිතන හැටියට මේ කරුණ වැටෙන්නේ ඒකට. If you look at your examples, it must come under that. මේකට අද මොකක්ද ගන්නා පියවර? [බාධා කිරීම්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
What about Batalanda torture house? - [*Interruption.*]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

You just sit down now. - [*Interruption.*] ගරු කථානායකතුමනි, මම කනගාටු වෙන්නේ මේකයි. මේ පුද්ගලයා මුස්ලිම් සමෘද්ධි නිලධාරියෙක්. වෙන කවුරුවත් නොවෙයි. මෙහෙමද මුස්ලිම් අයගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්නේ? මම ඒ ගැන රජයෙන් දැන ගන්න කැමැතියි. සමෘද්ධිය භාර ඇමතිතුමාගෙන් දැන ගන්න කැමැතියි. අපි කථා කරනවා මේ රටේ නීතිය ගැන. ඊයේ සිදු වුණු එක අද මුළු ලෝකය වටේම ගිහින් තිබෙනවා. මේ රටේ කීර්ති නාමයට මොකද වෙන්නේ? මොකක්ද අයිතිය? මොකක්ද, අද රජයේ සේවකයාට තිබෙන අයිතිවාසිකම ගෙනැල්ලා ගස්වල බඳිනවා නම්, ගහනවා නම්. ඇමතිතුමා කථා කරනවා මහාධිකරණ වැඩි කරන්න කියලා. මොකටද වැඩි කරන්නේ මෙහෙම ගෙනැල්ලා ගහන කොට? [බාධා කිරීමක්] ඇයි, පොලීසිය එහෙනම්,- [බාධා කිරීමක්] ගරු ඇමතිතුමා, මම එකක් කියන්නම්. [බාධා කිරීමක්] හරි. හරි. ඇමතිතුමා ඇයි මේක ආරක්ෂා කරන්නේ? ඔබතුමා කියන්නේ,- [බාධා කිරීමක්] ගරු ඇමතිතුමා කිව්වේ ඒක සාධාරණයි කියලායි. [බාධා කිරීමක්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒක සාධාරණද? [බාධා කිරීම්]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
හරි. ඔබතුමා සාධාරණයි කියනවා නම් ඒක ඔබතුමා කියන්න. මම කියන්නේ මේක අසාධාරණයි. පොලීසියට පුළුවන් ඕනෑම අපරාධයක් දැක්කාම ඒකට විරුද්ධව ක්‍රියා කරන්න. එදා පොලීසිය බලා ගෙන හිටියා. පොලීසිය එතැන හිටියා. පොලීසියේ අය ඊයේ රූපවාහිනියේ දැක්කා. අද පත්තරවල දැක්කා. එහෙම නම් ඒ පිළිබඳව පියවර ගන්නවාද? [බාධා කිරීම්] කෑ ගහන්න පුළුවන්. මා අහන්නේ, මොකක්ද,- [බාධා කිරීම්] රජයේ සේවකයන් වෙනුවෙන් අපට අහන්න තිබෙන්නේ රජයේ සේවකයන්ට ආරක්ෂාව දෙන්නේ මෙහෙමද කියලායි.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
බටලන්දේ,- [බාධා කිරීම්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා මේ පැත්තේ ඉන්නකොට බටලන්ද නැහැ නේද? [බාධා කිරීම්]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
නැඟිටලා කියන්න මේක හරිද වැරැදිද කියලා. [බාධා කිරීම්] අධිකරණ ඇමතිතුමා කියනවා ගහේ බඳින එක හරි කියලා. [බාධා කිරීම්] එතුමා කියනවා කැලේ නීතිය හරි කියලා. ඇමතිතුමනි, ඔබතුමා මට කියන්න කැලේ නීතිය හරිද නැද්ද කියලා.

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
ගහේ බඳින එක ගැන මා කියන්නේත් නැහැ. [බාධා කිරීම්]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ඇයි කියන්න බැරි?

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
මේ දෙකම වැරැදියි. බටලන්දේ එක මීට වඩා බරපතළයි. බටලන්දේ එක මීටත් වඩා බරපතළයි. එතැන තමයි අපේ විපක්ෂ නායකතුමා සිටියේ.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
මේ රටේ රජයේ සේවකයන් වෙනුවෙන් අපි කථා කරන්නේ. [බාධා කිරීම්]

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
එතැන මරනකොට, ගහනකොට එතුමාටම ඇහුණා. [බාධා කිරීම්] එතැන සිටියා. [බාධා කිරීම්] එහෙමයි සිද්ධ වුණේ. මම ඒකටත් විරුද්ධයි. මේකටත් විරුද්ධයි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
දණ්ඩ නීති සංග්‍රහය යටතේ ඒකට විරුද්ධව ක්‍රියා කරන්න කියලා මා කියන්න කැමැතියි. [බාධා කිරීම්] අන්න කියනවා, ගහන එක හරි කියලා. අන්න බලමු රජයේ සේවකයන්ට,-[බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීවරුනි,- [බාධා කිරීම්]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
මේ සමෘද්ධි නිලධාරියා වැඩ කළේ සන්ධානයට. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බාධා කරන්න එපා. ඊ ළඟ කථාවේදී පිළිතුරු දිය හැකියි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
බැසිල් රාජපක්ෂ ඇමතිතුමාට වැඩ කළේ. වෙන කාටවත් නොවෙයි. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නිශ්ශබ්ද වන්න.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු කථානායකතුමනි, මම අහන්නේ එක ප්‍රශ්නයක් නේ. මේ සමෘද්ධි නිලධාරියා ගහේ බැන්ද එක හරිද වැරැදිද? අපේ මේ ගරු සභාවේ එක්කෙනෙක් එහෙම කරන එක, ඇමතිවරයෙක් එහෙම කරන එක අපි සම්පූර්ණයෙන් හෙළා දකිනවා. [බාධා කිරීම්] එහෙම නම් අර නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේකටත් අපි කොමිසමක් පත් කරන්න ඕනෑ. [බාධා කිරීම්] මේකටත් අපි කොමිසමක් පත් කරන්න ඕනෑ. [බාධා කිරීම්] කථා කරනකොට තරහ යනවා. මා අහන්නේ, අද රජයේ සේවකයන් හිතන්නේ මොකක්ද කියලායි. අද රජයේ සේවකයන් හිතන්නේ මොකක්ද? මෙහෙම ගහන එක,- [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකර කියන දේ අහ ගෙන ඉන්න.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
මම කියනවා අගමැතිතුමාට මේ ගැන ප්‍රකාශයක් කරන්න කියලා. සමෘද්ධිය භාර ඇමතිතුමා මේ ගරු සභාවට ඇවිල්ලා කියන්න මේක හරිද, වැරැදිද, මේ පිළිබඳව ගන්න පියවර කුමක්ද කියලා.

මහාධිකරණ වැඩි කිරීම පිළිබඳව මට එක ප්‍රශ්නයක් තිබෙනවා. මේක මූලික උසාවියක් නේ. මහාධිකරණය තමයි ප්‍රධාන නඩු අහන්න තිබෙන්නේ. එහෙම නම් මේ ඇති කරන මහාධිකරණයේ කේපීට විරුද්ධව නඩු දමනවාද කියලා මම අහන්න කැමැතියි. අන්න ඒකයි මම අහන්නේ. [බාධා කිරීම්] මේ රටේ හමුදාවට විරුද්ධව අවි ආයුධ ගෙනාවා නම්, මේ රටේ සල්ලි හොරකම් කළා නම්, අපේ රණ විරුවන් මරන්න ආධාර කළා නම් නඩු දමනවාද? මම අගමැති වෙලා හිටපු කාලයේ, චන්ද්‍රිකා කුමාරතුංග ජනාධිපති වෙලා හිටපු කාලයේ, මහින්ද රාජපක්ෂ මැතිතුමා හිටපු කාලයේ අපි ජාත්‍යන්තර වශයෙන් කිව්වා මේ කේපී හොයන්න කියලා. ඒ කේපී අද මේ මහාධිකරණයට ගේනවාද? [බාධා කිරීම්] සරත් ෆොන්සේකාව මහාධිකරණයට ගේන්න පුළුවන් නම්, ඇයි මේ වැඩි කරන මහාධිකරණවලට කේපී ගේන්න බැරි කියලා මම අහන්න කැමැතියි. ඔබතුමන්ලා මහින්ද චින්තනය ගැන ලොකුවට කථා කරනවා. ගරු කථානායකතුමනි, මේ ගස් බඳින එක දැක්කාම මහින්ද චින්තනයේ යුගය කියන්නේ තිරිසන් යුගයක් කියලා විතරයි මට පෙනෙන්නේ. තිරිසන් යුගයක් නොවෙයි නම්, ඒ දේ කරපු ඇමතිවරයාට විරුද්ධව ක්‍රියා කරන්න කියා ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. මීළඟට ගරු මහාචාර්ය ජී.එල්. පීරිස් ඇමතිතුමා. [බාධා කිරීම්] කරුණාකර නිශ්ශබ්ද වන්න. ගරු ලලිත් දිසානායක නියෝජ්‍ය ඇමතිතුමා වාඩි වන්න. ගරු ජී.එල්. පීරිස් ඇමතිතුමා කථා කරන්න.

[අ. භා. 2.09]

**ගරු මහාචාර්ය ජී.එල්.පීරිස් මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு பேராசிரியர் ஜீ. எல். பீரிஸ் - வெளிநாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. (Prof.) G.L. Peiris - Minister of External Affairs)
Mr. Speaker, this is a very timely piece of legislation, the object of which is to reduce the laws delays. -[*Interruption.*]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කරුණාකර තමන්ගේ ඇමතිතුමාගේ කථාවට ඇහුම්කන් දෙන්න.

**ගරු මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා**
(மாண்புமிகு பேராசிரியர் ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
Mr. Speaker, one of the fundamental problems in the country with regard to the administration of justice is the long delay that occurs in dispensing justice. The introduction of this legislation is one of several measures which the Government is taking in order to address this problem. In 2006, the Provincial High Courts were vested with appellate civil jurisdiction. At that time there was a backlog of more than 5,000 cases. Then, Mr. Speaker, in 2007, action was taken to increase the number of High Court Judges from 40 to 60. Today, we find that even that number is insufficient and the purpose of the present legislation is to increase the number of High Court Judges, as the Hon. Minister of Justice explained, from 60 to 75. I think some other measures are necessary in order to achieve this objective and I am aware that the Minister of Justice is giving his attention to further reforms in this field. One of the desirable reforms would be to put in place certain pre-trial procedures in order to identify the essential issues to cut down drastically the time that is spent in court addressing these matters. That method has been very successful in other countries and I think Sri Lanka, at this stage of our development, can benefit very substantially from the introduction of properly-structured pre-trial procedures and I am very happy that the Hon. Athauda Seneviratne is giving priority to formulating a systematic policy in this regard.

There is one other matter, Mr. Speaker, which I would like to refer to. Perhaps more than 50 per cent of the Judges serving the Republic today have been my students when I was a Professor of Law. I would like to say that the vast majority of these persons are men and women of the highest integrity who, according to their conscience, are trying to do a difficult job. It is a matter for deep regret that in the recent past there have been vitriolic attacks on Judges on the Floor of Parliament. I think this is profoundly unsatisfactory, Mr. Speaker, for several reasons. The first reason is that these are people who do not have the right of reply here. Their reputations are tarnished beyond repair. This involves a large measure of personal hardship and injustice. But, apart from that, apart from the anguish that is sustained by individuals, this has a far wider dimension which affects the vital interest of Sri Lanka at this time. If we denigrate our judiciary, if we attack our judiciary, if we lower the judiciary of this country in the esteem of Sri Lanka's people, then, that is a course of action which has very significant international repercussions. Those persons who are trying to do harm to this country will then use that situation in order to argue that international tribunals should step in because our own judiciary is inadequate and it is corrupt. All the allegations that have been made here will only strengthen the hands of those forces who wish to do this country very serious harm at this time. So, Mr. Speaker, particularly because of my background as a teacher of law - I have taught judges when they were reading for the Degree of Bachelor of Laws. I have also taught many of them when they were candidates for the Master of Laws Degree and Judges of the Supreme Court and Judges of the Court of Appeal including the Chief Justice have been my students - I think it is my duty as their teacher, not so much as a Cabinet Minister, to say that irresponsible and vicious attacks on the judiciary apart from being harsh and unjust with regard to the individuals concerned, would also inflict a very substantial measure of damage on the reputation of this country, which will serve the interests of none other than the people who wish us ill; who want to attack this country; who want to strengthen forces that are opposed to the well-being of this country and that is a course of action which Members of Parliament, whatever party they may belong to, should in my respectful submission, desist from. So, I would like to make that point with emphasis, Mr. Speaker.

[ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා]

I would also like to deal with some other issues which are of very considerable public importance at this moment and they warrant the attention of this august Assembly. It is a matter for deep regret and these are issues that straddle boundaries between political parties. They impinge vitally on the national interest. Today, languishing in our prisons, in remand custody, are a very large number of people who have lost their freedom for no other reason than their poverty. They have been condemned to pay fines. They do not have the financial resources to pay those fines, and the reason why they are deprived of their freedom is that they do not have the money to pay fines. Even in my time as Minister of Justice, I found the situation deplorable. Today, it is much worse. I think there must be an attempt to formulate certain criteria with regard to sentencing. In any case, I think it is very unsatisfactory to put a person in remand jail only because he cannot pay a fine.These are - [*Interruption.*] Yes, I think suitable measures have to be found to deal with the situation. I am not talking of a few people. I am talking of a very large number who are clogging up the prisons. This goes - [*Interruption.*] Yes, exactly and this is contrary to all the principles of sentencing policy. It is contrary to basic principles underpinning the administration of criminal justice. It criminalizes people. They are brought into close association with hardened criminals and what is most important is the social repercussions on the family. It is not so much the individual but the family that is punished. The family is deprived of resources for their mere subsistence. The wife suffers; the children suffer and the social consequences are horrendous. So, this is a matter that calls for urgent attention and I would strongly urge that all of us together, irrespective of party differences, should address this as a national issue and find pragmatic solutions to alleviate the hardship of persons who have lost their freedom simply because they do not have the money to pay the fines.

It is also necessary, Mr. Speaker, to address specific issues connected with children who find themselves as witnesses, as plaintiffs or as defendants in criminal proceedings. Particularly given the culture of Sri Lanka, the harm that befalls them may last throughout their lives. It is therefore necessary, as in some other countries, to find other ways of dealing with these situations without bringing them to court, without subjecting them to cross-examination, special procedures which respect the privacy of the child, procedures which give priority to protecting the reputation, the good name of the child in order to make sure that the future of that child is not jeopardized in any manner whatsoever.

Then, Mr. Speaker, some other matters are worth thinking about. One of these is the frequent complaint that there are too many acquittals in our country**.** It is sometimes suggested that it is difficult to control the spread of crime because it is only in a very small number of instances that persons who are indicted for serious crimes are actually found guilty and the argument is that the number of acquittals is unacceptably high. During the long period when I served as a Member of the Law Commission of Sri Lanka, it was more than 10 years when I was Professor of Law of the University of Colombo, at that time Mr. Speaker, I made sustained efforts to bring about certain changes in the Law of Evidence.

I think most people would agree that there is no logical reason to exclude confessions which are true and which are voluntary, simply because those confessions were made to a police officer. If a man commits a crime and of his own accord, without any duress, without any pressure or inducement, he confesses that crime to a police officer, or while he is in police custody, is there any logical reason at all why that confession should not be admitted as evidence against him? Unfortunately, the law of Sri Lanka in this regard has not changed since 1898. The Evidence Ordinance was enacted in 1898. The Penal Code, the Criminal Procedure Code also belong to the Nineteenth Century. Sri Lankan society has changed fundamentally since then. But, in keeping with those changes we have failed to make corresponding modifications of the Criminal Law and the Law of Evidence. In 1898, society's attitude to a police officer was basically different from what it is today. The assumption then was that a police officer would induce terror in the mind of the suspect and there is reason to believe that any confession that is made to a police officer is involuntary. But, in other jurisdictions like England and the United States, the criterion that is used is a criterion of truth and spontaneity. If a confession is voluntary, it does not matter whom the confession is made to. It can be made to a family member, it can be made to a priest, it can be made to a friend or to a police officer, it makes no difference at all; the criterion is whether the confession was true. Why are we shutting out valuable evidence which can bring about convictions of people who are guilty, people who are a danger to society? Therefore, our law is tarnished by archaic principles, principles which are no longer consistent with the conditions of contemporary society. I think therefore, these matters have to be elevated above the level of party strife and we have to take a long hard look at the nature of the laws that govern us.

We have to do that and at the same time we have to increase a number of judges. We have also to provide judges with opportunities for continuing training, especially in new fields like intellectual property, commercial law, land use and utilization, sentencing policy. In countries of the West, even judges of the highest courts have the advantage of these programmes of training from time to time. I think today it is a dire need in Sri Lanka. Our judges are basically very competent. There is no doubt about it. I think our judges, I say without fear of contradiction, Mr. Speaker, again as a teacher of these judges, that they can hold their own

with their brethren in any part of the world. They lack nothing in terms of intellectual sensitivity and perception. But, we have to equip them, we have to put at their disposal, the resources and the facilities that would enable them to discharge their responsibilities with total acceptance to the community. That is why I am myself particularly perturbed about the tenor, and the substance of some of the attacks which have been made on the Floor of this House against judges who have no right of defence. And, it is precisely those attacks that are exploited with ulterior motives by those who wish to argue that the Sri Lankan judiciary is not working. There is a lacuna; that vacuum has to be filled by the intervention of foreign tribunals. It is a dangerous path to follow and it is fraught with great danger to the independence, the good name, the integrity of the Republic of Sri Lanka. So, my plea to you, Mr. Speaker, and through you to the Members of this House is that we must today take an objective and dispassionate view of the manner in which the criminal justice system is working: what are its good points, what are the deficiencies and shortcomings and what are the practical measures that are opportune today to deal with those issues and to get the country the benefit of the criminal justice system.

With those words, Mr. Speaker, I would commend this legislation as exceedingly opportune and beneficial. I would like to congratulate my Friend, the Hon. Athauda Seneviratne, Minister of Justice and I would encourage him to go further along this road and to consider other reforms on the lines which I have indicated.
I thank you, Mr. Speaker.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Then, the Hon. M.A. Sumanthiran. දැන් ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු පියංකර ජයරත්න මහතා] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு பியங்கர ஜயரத்ன] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY SPEAKER [THE HON. PIYANKARA JAYARATNE] *took the Chair.*

[අ. භා. 2.24]

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Hon. Deputy Speaker, I am glad to participate in this Debate on the Amendment to the Judicature Act, to increase the maximum number of High Court Judges from 60 to 75.

There is no doubt that we need more judges. The Hon. Minister of Justice made a very valid point that in order to dispose of the large number of cases that are pending in courts, we need more judges. However, I would like to raise the issue as to how fast this backlog has been thus far cleared after the increase of the number from 40 to 60. It goes without saying that a mere increase in the number of judges would not help the administration or the due administration of justice. We need more than that.

I am glad the Hon. Minister of External Affairs repeatedly took ownership for the competence of our judges, that many of them have been his students. He also made a plea that the judges of our country be not subject to unreasonable attacks. As one who walks the corridors of Hulftsdorp everyday, I would have been the first to raise that concern and defend the integrity of the judiciary. Unfortunately though I am not in a position to do that and it is a sad fact that I am unable to do that, I would have very much liked to raise that cry myself and plead not to subject the judges to ridicule or comment adversely on their conduct. Persons earn respect by their conduct; it cannot just be artificially conferred on them. The society judges the character, the impartiality and the integrity of our judges by the way they go about their business, the way they act, hear cases and so on. So, if there is a belief today that one does not get justice in the courts, I am afraid our judges also have to share the due blame for that. The delay is not only in the original courts. In the original courts, particularly in civil litigation, the Hon. Minister for Justice was right in pointing out, there are long delays. Those delays have continued to be and despite well-meaning efforts by various sectors, including the Law Commission, over several years, have not abated. So, one must look a little deeper and find out what really causes these delays. I agree with the Hon. Minister of External Affairs that continuous training of judges without sounding patronizing is a *sine qua non,* and that must happen.

But, it also has something else to be addressed. On the 5th of May, in this House, I raised an issue with regard to particular proceedings that are pending in the Supreme Court now for over a year: an application that was filed on behalf of the internally displaced persons who were confined forcibly to the camps in Cheddikulam without any authority of the law. No remand order or even detention orders were made under the Emergency Regulations and about 49,000 of them still remain in those camps. The point I made in the month of May is that on an application before the Supreme Court ordinarily for leave to proceed, an order is either granted or refused on the same day. But, here is a case where for over a year now, no order has been made; no date has been given. What is the cause for the laws delays there? It has nothing to do with lack of judges, nothing even to do with the competence of the judges. We are talking about the Supreme Court here. It has got something to do with something else and I think all of us will be better off if we identify that "something else".

[ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා]

The increase in the number of High Court Judges is welcome, as I said at the outset. But, I want to make a plea to the Hon. Minister of Justice, that when more judges are appointed, that care is taken to appoint judges who are proficient in Tamil because right now, High Court Judges who are not proficient in Tamil have been sent to areas to hear the first civil appeal and all the cases are getting delayed there, not for lack of Judges. A judge is there, but he cannot read or understand the brief that comes before him. I am not saying that you must send Tamil judges to Tamil areas. No. Send judges who are proficient in Tamil to Tamil areas and judges who are proficient in the Sinhala language, to areas where the original court work and the records are maintained in the Sinhala language so that at least the salutary provision that we now have, that the first appeal is heard and determined in the province itself, can take place without undue delay. By the time it comes for a second appeal to the Supreme Court, perhaps translations will become necessary. Translations are very costly; a medium-sized appeal brief will cost about Rs. 75,000 to be translated.

So, the whole object of devolving judicial power, of enabling the provincial High Court to hear civil appeals in the first instance, is lost if the judge concerned is not competent in the language in which the court records are kept in that district or province. So, with the increase of the number of judges from 60 to 75, I hope more judges who are proficient in the Tamil language will be appointed. I say that because when we raised this matter with His Excellency the President, the response was that there are not enough Tamil-speaking judges to be appointed to these areas. So, now with the cadre being increased, certainly there is provision for the appointment of judges who can function in the Tamil language We have had many eminent Sinhalese gentlemen who were conversant in Tamil and have functioned as judges in those areas and it will be a good gesture if a Sinhala judge who is proficient in Tamil is sent to those areas. So, I make that point all over again that in the areas where a particular language is declared to be the language of court, please appoint High Court Judges particularly because they exercise original criminal jurisdiction as well as the first civil appellate jurisdiction, so that the work of the courts can go on without any undue delay.

I want to wind up also stating about the sad spectacle we saw in this House when the Hon. Leader of the Opposition was on his feet, and when he raised the issue about persons taking the law into their own hands functioning like judges, dishing out sentences like binding people to trees, there was a howl of protest from the Government Benches. All this time I thought it was only one or two individuals who behaved in this manner, who thought this was the way to go; perhaps they know no better. But, to find the entire Government Bench agreeing with this kind of lawlessness, unlawful activity, was very discouraging. This is not a matter that one can laugh about. The Hon. Minister of External Affairs also pleaded that our judges are competent, our system of justice is fine, there need not be foreign interference and so on. But, if one looks at how these things happen in our country, if one were to just read the newspapers of today, would any person from any civilized jurisdiction be satisfied that the administration of justice is being done properly in this country?

Thank you very much.

[අ. භා. 2.35]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණ අමාත්‍ය ගරු අතාවුද සෙනෙවිරත්න මැතිතුමා විසින් අද දින ඉදිරිපත් කරන ලද අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත ගැන කතා කරන්නට අවස්ථාවක් ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. ඉතාම අමිහිරි අත් දැකීම් ගණනාවක් මත තමයි ලංකාවේ නීති ක්ෂේත්‍රය ගැන අද කතා කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ලංකාවේ මහාධිකරණ සම්බන්ධයෙන් තිබෙන්නා වූ යම් වැදගත්කම්, ඒවායේ වර්ධනයන් පිළිබඳව දවස ගානේ අපට විශාල දියුණුවක් දකින්නට ලැබෙනවා. විශේෂයෙන් නඩු ගොඩ ගැහීම සම්බන්ධයෙන් ඇති වී තිබෙන ප්‍රශ්න විසඳා ගැනීම සඳහා අලුතින් අධිකරණ පිහිටුවීම්, ඒ වාගේම අලුතින් විනිශ්චයකාරවරුන් පත් කිරීම් ආදී කාරණා ගණනාවක් සිද්ධ වෙනවා. නමුත් කියන්නත් කනගාටුයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටේ මූලික නීතිය ආරක්ෂා කර ගන්න බැරි නම්, එහෙම නැත්නම් rule of law ආරක්ෂා කර ගන්න බැරි නම්, මොන අධිකරණ හැදුවත්, අලුතින් අධිකරණ පද්ධති පිහිටෙව්වත්, විනිශ්චයකාරවරුන් වැඩි වැඩියෙන් පත් කළත්, රටේ නීති ක්ෂේත්‍රය මොන තරම් වර්ධනය කෙරුවත්, පනත් කෙටුම්පත් ඉදිරිපත් කළත් මොකුත් සිද්ධ වෙන්නේ නැහැ.

මෙතැනදී මට නන්දා මාලිනීගේ ගීතයක් මතක් වෙනවා. ඒ ගීතයේ මේ විධියට තිබෙනවා, "කුමට එරට අධිකරණය නීතිය සහ විනිසුරන්." ඒ කියන්නේ අධිකරණයේ විනිශ්චයකාරවරුන්ගෙන්, නීතියෙන් ක්‍රියාමාර්ග ගන්න බැරි නම් රටක් වැඩ කරන්නේ කොහොමද කියන එක තමයි ඒ ගීතයෙන් කියැවෙන්නේ. ඉතින් අද මේ රට නීතියක් නැති - lawlessness - රටක් බවට පත් වෙමින් තිබෙනවා. මට පෙර විදේශ කටයුතු අමාත්‍ය ගරු මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමා කතා කළා. එතුමාගේ කාල වකවානුව තුළ අධිකරණ ක්ෂේත්‍රය වර්ධනය කිරීම සඳහා එතුමා යම් යම් ක්‍රියාමාර්ග අර ගෙන තිබුණා. විදේශ කටයුතු අමාත්‍යතුමා විධියට අද එතුමාට තමයි ලංකාවේ නීතිය පිළිබඳව, ලංකාව නීතියක් ක්‍රියාත්මක වන රටක්ද කියන එක පිළිබඳව පිට රටවලට ගිහින් උත්තර දෙන්න වෙලා තිබෙන්නේ.

දැන් බලන්න, ඊයේ සිද්ධ වුණු දෙය. ආචාර්ය මර්වින් සිල්වා මහතා සමෘද්ධි නිලධාරියෙක්ව ගස් බැඳලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකාවේ නීතියක් තිබෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ බොහොම පැහැදිලිව මූලික අයිතිවාසිකම් ගැන කියා තිබෙනවා. එතුමා හිටපු ගමන් "අර්ස්කින් මේ" පොත උස්සා ගෙන එනවා. ඉතින් මම කියන්නේ මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත් ළඟින් තියා ගන්නය කියායි. මොකද, ලංකාවේ නීතිය මොකක්ද කියන එක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙනවා. ඉතින් ඒක දැන ගත්තේ නැති වුණාම වන දෙය තමයි අද එතුමාට සිද්ධ වෙලා තිබෙන්නේ. එතුමා මගේ මිත්‍රයා. ඒ ගැන මම සන්තෝෂ වෙනවා. එතුමාගේ ඒ ක්‍රියාව ගැන -

**ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு(கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
Sir, I rise to a point of Order.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ. Point of Order මොකුත් නැහැ. මමයි කතා කරන්නේ. මමයි කතා කරන්නේ. ඔබතුමාට මම කරදර කළේ නැහැ නේ. කරදර කරන්නේ නැතුව ඉන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ආචාර්ය මර්වින් සිල්වා ඇමතිතුමනි, මොකක්ද ඔබතුමාගේ රීති ප්‍රශ්නය. ආචාර්ය මර්වින් සිල්වා ඇමතිතුමාට mike එක දෙන්න. ආචාර්ය මර්වින් සිල්වා ඇමතිතුමා. ඔබතුමාගේ සීට් එක පිටිපස්සේ. [බාධා කිරීමක්]

**ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
නැහැ. නැහැ. මම library එකේ හිටියේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නයට මේක අදාළ නම් ගරු මන්ත්‍රීතුමාට මම උත්තර දෙන්න ලැහැස්තියි. නයා කාපු එකාටත් විෂක් නැත්නම්, නයාටත් විෂක් නැත්නම් පැත්තක ඉන්න

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

මේ ගැන ප්‍රශ්න කිරීමට ඕනෑ නැහැ. මම -[බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා -[බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තිබෙන ප්‍රධානම ප්‍රශ්නය -[බාධා කිරීමක්] ඔබතුමා මේකට තරහා වෙන්න එපා. පොඩ්ඩක් ඉඳ ගන්න. [බාධා කිරීමක්] නිකම් එක එක කථා කියලා වැඩක් නැහැ. උඩ ගැලරියේ ඉස්කෝලේ ළමයි ඉන්නවා. ඔබතුමාට ලජ්ජාව බය නැති වුණාට, මට ලජ්ජාව බය තිබෙනවා. [බාධා කිරීමක්] මට ලජ්ජාව බය තිබෙන නිසා, නීතියක් තිබෙන නිසා තමයි මම මේ කථා කරන්නේ. තමුන්නාන්සේට ඕනෑ ඕනෑ විධියට මේ රටේ මිනිස්සුන්ව එල්ලන්න බැහැ. ඒක මතක තියා ගන්න. මේ රටේ තිබෙනවා බොහොම පැහැදිලි ආයතන සංග්‍රහයක්; මේ රටේ රජයේ නිලධාරින්ට විරුද්ධව වැඩ කරන්න අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ගයක්. ඒ අනුව නීතිමය ක්‍රියාමාර්ග ගන්න බැරි නම් තමුන්නාන්සේ මොනවා කථා කළත් අපට වැඩක් නැහැ. අපි කියන්නේ ඒකයි. මේවා කිව්වාට තරහා වෙන්න එපා. මේවාට තරහා ගිහිල්ලා හරියන්නේ නැහැ. [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කරුණාකරලා මට කථා කරන්න ඉඩ දෙන්න කියන්න. මොකද මේවා-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමා කථා කරන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ, මෙතුමා නැගිටලා කථා කරනවා. මේ බාධා කිරීමක් කරන්නේ. ඔබතුමාට බලයක් තිබෙනවා, මෙතැන කථා කරන්න ඉඩ සලසා දෙන්න. මොකක්ද මේ කරන්නේ? [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
නියෝජ්‍ය ඇමතිතුමා, එතුමා ඔබතුමාට අවස්ථාව දෙන්නේ නැහැ. නියෝජ්‍ය ඇමතිතුමා වාඩි වෙන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ සමෘද්ධි නියාමක සම්බන්ධව යම් කිසි ප්‍රශ්නයක් තිබෙනවා නම්-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, විෂයට අදාළව කථා කරන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
විෂයට අදාළව තමයි කථා කරන්නේ. මේ රටේ නීතිය. මේ රටේ rule of law. මේ අහන්න, මේ ඇමතිවරයෙක් ඉස්සරහ පේළියේ ඉන්නවා. නීතිය ගැන මෙතැන හැර අපි වෙන කොහේදීද කථා කරන්නේ? මේ මිනිස්සුන්ගේ අදහස් අපි ගිහිල්ලා කියන්නේ කොහේද? ලංකාවේ නීතියක් නැත්නම්,- [බාධා කිරීමක්] ලංකාවේ ආයතන සංග්‍රහයක් තිබෙනවා නම් ඒ ආයතන සංග්‍රහය අනුව තමයි රාජ්‍ය නිලධාරින්ට නීතිය ක්‍රියාත්මක කරන්නට ඕනෑ. රාජ්‍ය නිලධාරින්ට නීතිය ක්‍රියාත්මක කරන්නට තිබෙන අවස්ථාව නියෝජ්‍ය ඇමතිවරයකු අතට ගන්නවා නම්, ඔහුට පුළුවන් නම් රජ කාලයේ නියෝග දෙන්න, රජ කාලයේ වාගේ ගස් බඳින්න, රජ කාලයේ වාගේ දඬු කඳේ ගහන්න, රජ කාලයේ වාගේ උල තියන්න එහෙම නම් මේ රටේ නීතියක් තිබෙන්නේ කොහේද? මොනවාද මේ කථා කරන්නේ? රටේ ප්‍රජාතන්ත්‍රවාදයක් නැහැ; නීතියක් නැහැ. නියෝජ්‍ය ඇමතිවරුන්ට ඕනෑ ඕනෑ විධියට පැනලා එක එකාට ගහනවා; එක එක ආයතනවලට කඩා වදිනවා. ඊට පසුව ගිහිල්ලා රාජ්‍ය නිලධාරින්ව ගස් බඳිනවා. මොකක්ද මේ නීතිය? කොහොමද අපි මේ රටේ නීතිය ගැන කථා කරන්නේ? ඒකයි අපි අහන්නේ. [බාධා කිරීමක්] මේ සමෘද්ධි නිලධාරියා ලංකාවේ නීතිය අනුව ඔහුට ලබා ගන්න පුළුවන් නිවාඩුව තමයි අරගෙන තිබෙන්නේ. ඔහු කියන්නේ මොකක්ද? "කෙසේ වෙතත් මේ අවස්ථාවට නොපැමිණි කිහිප දෙනෙකු පිළිබඳව මර්වින් සිල්වා මහතාට තොරතුරු ලැබී තිබිණි. ඒ අනුව ක්‍රියාත්මක වූ ඒ මහතා නිදහසට කරුණු ඉදිරිපත් කරන ලෙස නොපැමිණි නිලධාරීන්ට දන්වා ඇත. නොපැමිණි නිලධාරින් සිවු දෙනෙකුගෙන් මේ පිළිබඳව කරුණු විමසා ඇති අතර එක් නිලධාරියකු පවසා ඇත්තේ, තම දරුවාට අසනීප වූ නිසා එදින එම අවස්ථාවට සහභාගී වීමට නොහැකි වූ බවයි." ඔහුට රාජකාරි නිවාඩු - official leave - ලබා ගැනීමට හැකියාවක් තිබෙනවා. රටේ රාජ්‍ය නිලධාරියකු තමන්ට රාජකාරිමය වශයෙන් ලැබිලා තිබෙන අවස්ථාව යටතේ නිවාඩුවක් ලබා ගත්තාම කවුරු හෝ නියෝජ්‍ය ඇමතිවරයකුට පුළුවන්ද ඔහුව ගස් බඳින්න? ඒකද, මේ රටේ නීතිය? අපි අහන්නේ ඒකයි. නිකම් බොරුවට කෑ ගහලා හරි යන්නේ නැහැ. අද "ලංකාදීප" පත්‍රයේ දාස හපුවලාන මහත්මයාගේ හොඳ කාටූන් එකක් පළ කර තිබෙනවා. මේ කාටූන් එකේ මේ කාරණය බොහොම පැහැදිලිව තිබෙනවා. [බාධා

[ගරු දයාසිරි ජයසේකර මහතා]

කිරීමක්] ලොකු ගස් නිකම් තිබෙනවා. මේ අනේ පොඩි ගහක් අල්ලා ගෙන, පොඩි ගහක අහිංසකයෙක් බැඳ දමලා තිබෙනවා. හරි නම් මේ වාගේ ගස් බඳින්න ඕනෑ ඔය කථා කරන නියෝජ්‍ය ඇමතිවරු. මේ වාගේ ගස් බඳින්නට ඕනෑ, ඔය නියෝජ්‍ය ඇමතිවරු. මේ වාගේ ගස් බඳින්නට ඕනෑ, ඇමතිවරු. මේ වාගේ ගස් බඳින්න ඕනෑ තව කට්ටිය ලංකාවේ ඉන්නවා. එහෙම ඉන්න කොට තමයි- [බාධා කිරීමක්] ඒකයි මා කියන්නේ. අපි කනගාටු වනවා. ඒ වෙන හේතුවක් නිසා නොවෙයි. නීතියක්, ශිෂ්ඨාචාරයක් නැති රටක් බවට මේ රට පත් වෙමින් යන තත්ත්වයක් තමයි තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යුද්ධය අවසන් වෙලා තිබෙන මේ අවස්ථාවේ ලංකාවේ නීතිය ක්‍රියාත්මක කරන්නය කියන එක තමයි හැම තැනින්ම කියැවුණේ. පසු ගිය කාල වකවානුවේ එල්ටීටීඊ සංවිධානය ගෙන ගිය ඒ සටන් ක්‍රියා මාර්ග තුළ, නැත්නම් යුද්ධය ගෙන ගිය කාලය තුළ නීතිය ක්‍රියාත්මක වුණේ නැහැ. නීතිය කඩා වැටුණාය කියලා ලංකාවට චෝදනා ආවා. දැන් යුද්ධය අවසන් වෙලා තිබෙනවා. යුද්ධය අවසන් වුණාට පසුව මොකක්ද අවශ්‍යව තිබෙන්නේ? යුද්ධය අවසන් වුණාට පසුව රටේ නීතියක් තිබෙන්න ඕනෑ. දැන් යුද්ධය අවසන් වෙලා අවුරුදු එකහමාරක් විතර වෙනවා. රටේ නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. එතකොට කවුද මේකේ අයිතිකාරයෝ බවට පත් වෙලා තිබෙන්නේ? විදේශ කටයුතු ඇමතිතුමන්ලා, ආයෝජන ප්‍රවර්ධන ඇමතිතුමන්ලා, කර්මාන්ත ඇමතිතුමන්ලා -මේ කට්ටිය ඔක්කොම- අද පිට රටවලට ගිහින් ගිහින් කථා කරනවා, විදේශ රටවලින් ලංකාවට ආයෝජන ගේන්න. මේ සුද්දෝ -ලංකාවේ වචනවලින් කිව්වොත්, තමුන්නාන්සේලාගේ වචනවලින් කිව්වොත් සුද්දෝ- මේ ආණ්ඩුව ගණන් ගන්නේ නැහැ නේ. දේශප්‍රේමීයෝ නේ, ඕනෑ වෙලා තිබෙන්නේ. ඉතින් සුද්දන්ගෙන් රටට ආයෝජන ගෙන්වා ගන්න අවශ්‍ය ප්‍රධානම දේ මේකයි. ඒ ගොල්ලෝ මේ රටට ආවාම අහන්නේ නීතියක් තිබෙනවාද කියලායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම උදාහරණයක් කියන්නම්. මේ රටට ආපු විදේශ ඒජන්තයෙක් නැත්නම් විදේශ ආයෝජකයෙක් ලංකාවේ factory එකක් දමනවා. ඒ factory එකේ යම් කිසි ආරවුලක් ඇති වෙනවා. ඒ ආරවුලේදී කට්ටිය එකට එකතු වෙලා එළියට යනවා. නැත්නම් ඔවුන් උද්ඝෝෂණය කරනවා. ඒකටත් අයිතියක් තිබෙනවා. හැබැයි බැරි වෙලාවත් නියෝජ්‍ය ඇමති කෙනෙක් ගිහිල්ලා අර සභාපතිව ගස් බැන්දොත් එහෙම, අර අධ්‍යක්ෂව ගස් බැන්දොත් එහෙම මේ රටට ආයෝජකයෝ එනවාද? සුද්දෝ එනවාද මෙහේ නියෝජ්‍ය ඇමතිවරුන්ගෙන් ගස් බන්ද ගන්න? කොයි රටේ තිබෙන නීතියක්ද මේ ක්‍රියාත්මක කරන්නේ? අපි අහන්නේ ඒකයි. ජනාධිපතිතුමන්ලා, අර නාමල් රාජපක්ෂ මහත්මයලා අරෙහේ උදේ ඉඳන් රෑ වෙනකල් උත්සාහ කරනවා මේ ආයෝජකයන්ව ගෙන්වා ගන්න. කොහෙන්ද ආයෝජකයෝ ගෙන්වා ගන්නේ? මේ ගොල්ලෝ එකතු වෙලා ගෙන්වන ආයෝජකයෝ ගස් බඳිනවා. ඉතින් තමුන්නාන්සේ කොහොමද ගිහින් කථා කරන්නේ? ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමනි, කරුණාකරලා ගිහින් තාත්තාට කියන්න මේ වාගේ නියෝජ්‍ය ඇමතිවරු තියා ගන්නේ නැතිව අයින් කරන්නය කියලා. ලංකාවට ආයෝජකයෙක් එන්නේ නැහැ. අන්තිමට කවුද මේවාට වග කියන්නේ? රටේ නීතියක් නැහැ. [බාධා කිරීම්]

අනික් කාරණය මේකයි. දැන් සංචාරක ව්‍යාපාරය ගැන කථා කරනවා. ලංකාවට සංචාරකයන්ට එන්නය කියලා ආරාධනා කරනවා. බැරි වෙලාවත් සංචාරකයෙක් කොහේ හෝ ගිහිල්ලා රෑට පාර දිගේ එන කොට නියෝජ්‍ය ඇමතිතුමා හම්බ වුණොත් ඒ මිනිහාව ගස් බඳිනවා. ඉතින් කවුද මේකට කැමැති වන්නේ? ලංකාවට සංචාරකයෝ එයිද? [බාධා කිරීමක්] කොහෙන් ගෙන්වන්නද කියන්නේ? මෙසපොටේමියාවෙන් ගෙන්වන්නද කියන්නේ? ගෙන්වන්න තිබෙන්නේ සුඩානයෙන්. සල්ලි වියදම් කරලා අලුතින් සංචාරකයන් ලංකාවට එන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි කියන්නේ මේකයි. යුද්ධයෙන් පස්සේ රටේ නීතිය ආරක්ෂා කරන්න ඕනෑ වෙලාවේ මේ රටේ අඩුම තරමේ -rule of law- නීතියක් තිබෙන්න ඕනෑ. නීතියක් තිබුණාම තමයි රටට ආයෝජකයෝ එන්නේ. [බාධා කිරීමක්] අනේ ඔබතුමා කරුණාකරලා ඉඳ ගන්න. [බාධා කිරීමක්] අනේ, කරුණාකරලා ඉඳ ගන්න මිත්‍රපාල මහත්තයෝ විකාර කථා කරන්නේ නැතිව. [බාධා කිරීමක්] මේ, පොඩ්ඩක් ඉන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඉතිහාසය ගැන කථා කළේ නැහැ. ඉතිහාසයේ ගහපු ඒවා වැරැදියි තමයි. නඩුකාරවරුන්ට ගල් ගහපු ඒවා වැරදියි. අපි අදත් ඒක පිළි ගන්නවා. මොකක්වත් ප්‍රශ්නයක් නැහැ. මා අහන්නේ මෙයයි. තමුන්නාන්සේලා ආවේ අලුත් ශ්‍රී ලංකාවක් හදන්න. අපි හිතුවේ නැහැ, අලුත් ශ්‍රී ලංකාවේ මේ වාගේ වැඩ කෙරෙයි කියලා. මේ වාගේ ගස් බඳින ඒවා. අලුත් ශ්‍රී ලංකාව හැදුවේ සමෘද්ධි නියාමකයෝ ගස් බඳින්නද? ඒවා ගැන කිව්වාම කියන්නේ ඉතිහාසයෙන්. ඉතිහාසයේ කරපු ඒවා වැරදියි. වැරදි ඒවා නිසා තමයි, අලුත් ආණ්ඩුවක් හදලා තිබෙන්නේ. ඒ ආණ්ඩුවේත් මේ වාගේ වැඩ කෙරෙන කොට තමයි මේ විධියට කථා කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දැවැන්ත ප්‍රශ්නයක් බවට මේක පත් වෙලා තිබෙනවා. මා අහන්නේ ඒකයි. මේ සමෘද්ධි නියාමක බලන්න. මේ සමෘද්ධි නියාමක මුස්ලිම් ජාතිකයෙක්. මේ සමෘද්ධි නියාමකට දරුවෝ ඉන්නවා. මේ දරුවෝ කොහොමද තමන්ගේ තාත්තාව ගස් බැඳලා ඉන්න කොට ගිහිල්ලා තමන්ගේ තාත්තාට මුහුණ දෙන්නේ? තමන්ගේ ගෙදර ගිහිල්ලා අද මාව නියෝජ්‍ය ඇමති කෙනෙක් ගස් බැන්දයි කියලා දරුවන්ට කියන්නේ කොහොමද?

තමන්ගේ දරුවෝ ටික ගිහිල්ලා "ඇයි තාත්තේ තාත්තාව ගස් බැන්දේ" කියලා ඇහුවාම කවුද මේවාට උත්තර දෙන්නේ? මොකක්ද මේ නීතිය? මේක ඔය කියපු නියෝජ්‍ය ඇමතිතුමාට කෙරුවොත් මොකද කරන්නේ? තමන්ගේ පුතා කොපමණ දුක් වෙයිද? තමුන්නාන්සේ කොපමණ දුක් වෙයිද තමුන්නාන්සේගේ පුතා ඇවිල්ලා ඔහොම කථා කෙරුවොත් එහෙම. හිතන්න, තමන්ටත් ඒ වාගේ ඉරණමක් අත් වුණොත් මොකක්ද වන්නේ කියලා. ඒකයි අපි කියන්නේ. [බාධා කිරීමක්] ඕකට කෑ ගහලා වැඩක් නැහැ. ඉඳ ගන්න කෝ. මා ඒකයි කියන්නේ. [බාධා කිරීමක්] ජනාධිපතිතුමා නියෝජ්‍ය ඇමතිතුමාව අල්ලලා ගස් බැන්දොත් එහෙම පහු වෙනිදා උදේ මාලක සිල්වා මැතිතුමාගේ තත්ත්වය කොහොමද? හිතන්න, හෙට ජනාධිපතිතුමා මර්වින් සිල්වා මැතිතුමාව අල්ලලා ගස් බඳිනවා. මාලක සිල්වා මහත්තයාට කොපමණ අමාරු වෙයිද? පව් ඒ දරුවා. ජනාධිපතිතුමා තමන්ගේ තාත්තාව අල්ලලා ගස් බැඳලා. කොහොමද තත්ත්වය? එහෙම මිනිස්සු කල්පනා කරනවා. ඉතින් මේ ගස් බඳින නීතිය නම් මේ රටේ ක්‍රියාත්මක වෙන්නේ, උල තියන නීතිය නම් මේ රටේ ක්‍රියාත්මක වෙන්නේ, අර දඬු කඳේ ගහන නීතිය නම් මේ රටේ ක්‍රියාත්මක වෙන්නේ- [බාධා කිරීමක්] මේවා වනචාරී යුගයේ පටන් ගත්ත ඒවා. අද තියෙන්නේ අලුත් ශ්‍රී ලංකාවක්. අවුරුදු කීයක් පල්ලෙහාට අපි ඇවිල්ලාද ඉන්නේ? මේ ගොල්ලෝ ආපසු මේ රටම වනචාරී යුගයට අරගෙන යන්නද හදන්නේ? ඒකයි අපි අහන්නේ. ඉතින් ඒ නිසා මා කියන්නේ මේකයි. කරුණාකරලා මේවා විහිළු කියලා හිතන්න එපා. මේ රටේ රාජ්‍ය සේවකයන්ට එක එක්කෙනාට වුවමනා විධියට අවශ්‍ය කරන ක්‍රියාදාමය, නිදහස දීලායි තිබෙන්නේ. සමෘද්ධි නියාමකලා තමුන්නාන්සේලාගේම පක්ෂයේ අය. යූඑන්පී කාරයෝ නම් කමක් නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේම, ඒකටම වැඩ කරපු සමෘද්ධි නියාමකයෝම තමයි මේ අල්ලලා ගස් බඳින්නේ. [බාධා කිරීම්] ඔව්. මට හිතෙන විධියට ගරු බැසිල් රාජපක්ෂ මහත්මයාට

ඒ සමෘද්ධි නියාමකයා වැඩ කෙරුවාද දන්නේ නැහැ. ඒ නිසා එතුමාව අල්ලලා ගස් බැන්දාද දන්නේ නැහැ. ඒක වෙනම කථාවක්.

මර්වින් සිල්වා ඇමතිතුමනි, මම ඔබතුමාට තෑග්ගක් වශයෙන් දෙනවා ආයතන සංග්‍රහය. ඔබතුමා ළඟ "අර්ස්කින් මේ" පොත තියෙනවා නේ. මා ඔබතුමාට මේ පොත දෙනවා ආදරයෙන්, ගෞරවයෙන්. මේක තියා ගන්න. [බාධා කිරීම්] කෑ ගහලා හරි යන්නේ නැහැ. මේක ගිහිල්ලා දෙන්න එතුමාට පොඩ්ඩක් කියවන්න. මෙන්න මේකේ තියෙනවා. මා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත් දෙනවා, ඔබතුමාට නීතිය පිළිබඳව තව කියවලා ඉගෙන ගන්න. ආ මෙන්න මේ පොත් දෙකම දෙන්නම්. මම හෙට උදේට දණ්ඩ නීති සංග්‍රහයත් ගෙනැල්ලා දෙන්නම්. ඒකත් කියවන්න. ඒකත් අරගෙන කියවන්න. එතකොට හරියනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා- [බාධා කිරීමක්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඉංග්‍රීසි කියවන්න පුළුවන් ද දන්නේ නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
සිංහල පොත තිබෙන්නේ. ඒ නිසා ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ රටේ නීතියක් නැති එක බොහෝම පැහැදිලියි කියන එක මම කියන්න කැමැතියි. ඒකයි මම කිව්වේ. "සියත" මාධ්‍ය ආයතනයට ගහපු එක පිළිබඳව අද ඉන්දියානු පුවත් පත්වල මොනවාද තිබෙන්නේ? ලංකාවේ ආණ්ඩුව කෙළින්ම මේකට සම්බන්ධයි කියලා තමයි ඒවායේ තිබෙන්නේ. "මෙහෙම දෙයක් සිද්ධ වුණා, හැබැයි ඒකට අපේ සම්බන්ධයක් නැහැ"යි කියලා ගිහිල්ලා ඔප්පු කරලා පෙන්වන්න ආණ්ඩුවට යුතුකමක් තිබෙනවා. සජිත් ද වාස් ගුණවර්ධන මහත්මයා ඊයේ කිව්වේ, ඒක ඇතුළේ කට්ටියට පඩි ගෙවා ගන්න බැරිව ප්‍රශ්න ඇති වෙන කොට ඒ ගොල්ලෝ තමයි ඒකට ගහලා තිබෙන්නේ කියලා. එතැනට තමයි ඒක තල්ලු වෙලා තිබෙන්නේ. ඒකයි මම නැවත වාරයක් කියන්නේ, විදේශ කටයුතු අමාත්‍යතුමාට සිද්ධ වෙනවා ගිහිල්ලා ඒවා ආරක්ෂා කරන්න. එතුමා ගිහිල්ලා පිට රටවල් එක්ක කථා කරන කොට, ජර්මනියත් එක්ක කථා කරන කොට, එංගලන්තයට ගිහිල්ලා කථා කරන කොට, ඇමෙරිකාවට ගිහිල්ලා කථා කරන කොට, බූන්ව හම්බ වෙලා, මූන්ව හම්බ වෙලා කථා කරන කොට ඒ ගොල්ලෝ අහනවා, "ඇත්ත ද ඔබතුමන්ලාගේ රටේ මිනිස්සුන්ව නියෝජ්‍ය ඇමැතිවරයෙක් ගස් බැන්දාය කියන්නේ, ඒකට මොකද කියන්නේ?" කියලා. ඒ ගැන ඒ ගොල්ලන්ට කියන්නට සිද්ධ වෙනවා. එතකොට මේක සම්බන්ධව අලුත් පොතක් ලියන්න වෙනවා. "අලුත් ශ්‍රී ලංකාව් අලුත් නීති පද්ධතිය"

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
එක් අයෙක් උපවාසයක නිරත වුණා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔව්, එක්කෙනෙක් උපවාස කළා. ඒවා ගැන කථා කරන්න මෙතුමාට පුළුවන් නේ. කොච්චර නම් තිබෙනවා ද කථා කරන්න. කට්ටිය උපවාස කරනවා, නැඟිටලා යනවා. ඒ වාගේ තත්ත්වයකට අද මෙ රට පත් වෙලා තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒකයි මම කිව්වේ. අද බලන්න, "සියත" ආයතනයට පහර දීම සම්බන්ධව තවම ආණ්ඩුවේ කථාවක් නැහැ. සද්ද නැතිව ඉන්නවා ඔක්කෝම. මාධ්‍ය ඇමැතිවරු ඉන්නවා; නියෝජ්‍ය ඇමැතිවරු ඉන්නවා. විශේෂයෙන් මේ රටේ මාධ්‍ය නිදහස ගැන කට්ටිය කථා කරනවා. ඒ අය කවුරුවත් කථා කරන්නේ නැහැ.

ඊළඟට, මුව මස් ගෙන ආපු රාජ්‍ය ආයතනයක රථයක් ලංකාවේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

නිදහස් කරනවා. ඉතින් දෙයියනේ! සිංහල බෞද්ධ රාජ්‍ය නේ මේක. සිංහල බෞද්ධ රාජ්‍යයක රාජ්‍ය ආයතනයකට අයත් වාහනයක මුව මස් ගෙන යන්න විධියක් නැහැ නේ. ඒක නිදහස් කරන්නේ කවුද? ලංකාවේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

නීතියට යන කලදසාව මොකක් ද? අපි ඒකයි අහන්නේ. නීතිය සම්බන්ධව අණපනත් ගෙන එනවා, විනිශ්චයකාරවරු වැඩි වැඩියෙන් පත් කරනවා, ඒ වාගේම,- [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ලලිත් දිසානායක නියෝජ්‍ය අමාත්‍යතුමා.

**ගරු ලලිත් දිසානායක මහතා (තාක්ෂණ හා පර්යේෂණ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - தொழில்நுட்பவியல், ஆராய்ச்சி பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Technology and Research)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රීති ප්‍රශ්නයක් වාගේම- [බාධා කිරීමක්] මෙතුමා දැන් කිව්වා

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කළාය කියා.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කියලා කියන්න එපා. චෝදනාවක් තිබෙනවා නම්, මොකක් ද ඒ චෝදනාව, ඒ නියෝගයට අදාළ මොකක් හරි අංකයක් තිබෙනවා නම් ඒකත් එක්ක කියන්න. නිකම්ම

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කියලා කියන්න එපා [බාධා කිරීමක්] නැහැ, නැහැ, එහෙම නොවෙයි. නිකම්ම චෝදනා කරන්න එපා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
තමුන්නාන්සේ බබා. නඩුව මොකක්ද කියලා දන්නේ නැහැ. මුව මස්වලට සම්බන්ධ නිසා තමයි ඔහොම කථා කරන්නේ. [බාධා කිරීම්] බලන්න මේ එක්කෙනා මුස්ලිම් සහෝදරයෙක්.

[බාධා කිරීම්] අස්වර් මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ මුස්ලිම්ද? නැඟිටලා කථා කරන්නේ ඒ ගැන. [බාධා කිරීම්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ මුස්ලිම් නායකයෙක් -අස්වර් මන්ත්‍රීතුමා- නැඟිටලා කියනවා, මුස්ලිම් සහෝදරයෙක් අල්ලා ගෙන ගස් බැඳපු එක හරි කියලා. ඉතින්, මම අහන්නේ ඒක හරිද, නැද්ද කියලායි. මම අහන්නේ ඒකයි.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order. The Hon. Member cannot make reference to the Muslim community and insult them. Be it a Muslim, a Sinhalese or a Tamil, justice should be meted out. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ඔබතුමා කථා කරන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
He is insulting the Muslims, මම නොවෙයි. මම කවදාවත් මුස්ලිම් ජනතාවට insult කරලා නැහැ. අපහාස කරලා නැහැ. ගරු අස්වර් මන්ත්‍රීතුමාගේ මේ නැඟී සිටීම තුළම,- [බාධා කිරීම්]

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඔබතුමාගේ කථාවෙන් වැරැදි වැටහීමක් ඇති වනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මොකක්ද වැරැදි වැටහීම? [බාධා කිරීම්] ඔබතුමා කරුණාකරලා වාඩි වෙන්න. ප්‍රශ්නයක් තිබෙනවා නම් කථා කරන්න වෙලාවක් තිබෙනවා නේ. අපි මෙහෙම කියමු. මුව මස් ගෙනියපු එකට තමුන්නාන්සේ සම්බන්ධයි. තමුන්නාන්සේ තමයි මුව මස් ටික අර ගෙන යන්න උපදෙස් දීලා තිබෙන්නේ. තමුන්නාන්සේ තමයි තමුන්නාන්සේගේ ගෙදරට මුව මස් ටික අර ගෙන ගිහින් තිබෙන්නේ. ඒකයි ඔය තරම් රිදිලා කෑ ගහන්නේ. [බාධා කිරීම්]

**ගරු එච්. ආර්. මිත්‍රපාල මහතා (පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எச். ஆர். மித்ரபால - கால்நடைவளர்ப்பு, கிராமிய சனசமூக அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. H.R. Mithrapala - Deputy Minister of Livestock and Rural Community Development)
මේක බොරුවක්. නඩු අංකය කියන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ වාහනය බුද්ධ ශාසන අමාත්‍යාංශයට අයිති වාහනයක්. [බාධා කිරීම්] මේ හැම පත්තරයකම,- [බාධා කිරීම්] වාඩි වෙන්න කෝ. මුව මස්වලට සම්බන්ධ නම් විතරක් කථා කරන්න. [බාධා කිරීම්] ඔව්, ඔව්.[බාධා කිරීම්] අපි ඒකත් කිව්වා. ගරු චන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමා, අපි ඒක පිළිගත්තා. අපි කියනවා ඒක වැරැදියි කියලා. ඉතිහාසයේ කරපු ඒවා වැරැදියි. තමුන්නාන්සේලාට ඕක තමයි කියන්න තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රශ්නය මේක නොවෙයි. [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, කරුණාකරලා මෙතුමන්ලාට වාඩි වෙන්න කියන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීවරුන් වාඩි වෙන්න. ගරු ලලිත් දිසානායක නියෝජ්‍ය ඇමතිතුමා කරුණාකරලා වාඩි වෙන්න.[බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මුව මස් ඕනෑ නම් ගෙනැල්ලා දෙන්නම්. [බාධා කිරීම්] වාඩි වෙන්න. ඔබතුමාට මූලාසනයෙන් කථා කරනවා. මූලාසනයෙන් කියන එක අහන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ලලිත් දිසානායක නියෝජ්‍ය ඇමතිතුමා කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -[බාධා කිරීම්] පොඩ්ඩක් වාඩි වෙලා ඉන්න කියන්න කෝ. මොකක්ද මේ වෙලා තිබෙන්නේ. ගරු ලලිත් දිසානායක මහතාට මුවෝ මරන්න පුළුවන්. අපි එහෙම කියමු. ගරු ලලිත් දිසානායක මහතාට මුවෝ අර ගෙන යන්නත් පුළුවන්; මුව මස් අර ගෙන යන්නත් පුළුවන්; ඒක නිදහස් කර ගන්න නීතිපතිතුමාට කථා කරන්නත් පුළුවන්.

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
මෙතුමා නීතිපතිතුමා ගැන සඳහන් කළා. ඒක ඉල්ලා අස් කර ගන්න ඕනෑ. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, නඩු අංකය ඉදිරිපත් කරන්න කියනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ලංකාවේ පත්තරවල ඕනෑ තරම් පළ වෙලා තිබුණා. -[බාධා කිරීම්] ගිහිල්ලා බලන්න.

**ගරු නවීන් දිසානායක මහතා**
(மாண்புமிகு நவின் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කරුණාකරලා නිශ්ශබ්ද වන්න. ගරු නවීන් දිසානායක මන්ත්‍රීතුමා.

**ගරු නවීන් දිසානායක මහතා**
(மாண்புமிகு நவின் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)

Sir, Standing Order No. 78 is very clear. I would like to quote it:

"78. The conduct of the President, or acting President, Members of Parliament, Judges or other persons engaged in the administration of justice ….."

So, very clearly the Attorney-General comes under that. Therefore, I would ask you to expunge the reference made to the Attorney-General.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දන්නවා අද නීතිපතිතුමා ඉන්නේ ජනාධිපතිතුමා යටතේ කියලා. නීතිපතිතුමා අයිති වෙලා තිබුණේ අධිකරණ අමාත්‍යාංශයට. මෙච්චර කල් එතුමා හිටියේ,- [බාධා කිරීම්]එතුමාගේ point of Order එක ඉවරයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු නවීන් දිසානායක මන්ත්‍රීතුමා.

**ගරු නවීන් දිසානායක මහතා**
(மாண்புமிகு நவின் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)

නීතිපතිතුමාගේ නම සඳහන් වුණා. 78 වන ස්ථාවර නියෝගය යටතේ එතුමාගේ නම හැන්සාඩ් එකෙන් ඉවත් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ උගත් මිත්‍රයා, නවීන් දිසානායක මැතිතුමා කථා කරපු එක ගැන මම සන්තෝෂ වනවා. හොඳයි. [බාධා කිරීම්] දැන් නීතිපතිතුමා තවදුරටත් අධිකරණ ක්ෂේත්‍රයට සම්බන්ධ කෙනෙක් නොවෙයි. එතුමාව එතැනින් ඉවත් කරලා ජනාධිපතිතුමා යටතට ගෙනියලා තිබෙනවා. අද ජනාධිපතිතුමාගේ තනි පාලනය මත තමයි මේ රටේ නීතිපති ඉන්නේ. නීතිපතිවරයාගේ ස්වාධීනත්වය කෙළෙසලා, නීතිපතිවරයාගේ ස්වාධීනත්වය විනාශ කරලා, අද පෞද්ගලිකව ජනාධිපතිවරයාට වග කියන තැනකට ලංකාවේ නීතිපතිවරයා ගෙනැල්ලා තිබෙනවා. ඒක වැරදියි. වැරදි එකක් තවමත් ආරක්ෂා කරන්න තමයි මේ ගොල්ලෝ හදන්නේ. ඒකයි තිබෙන ප්‍රශ්නය. මම කියන්න කැමැතියි.[බාධා කිරීම්]

**ගරු නවීන් දිසානායක මහතා**
(மாண்புமிகு நவின் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම Standing Orders යටතේ ඔබතුමාට මේක සඳහන් කරනවා. කරුණාකරලා ඒකට ruling එකක් අපට දෙන්න .[බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, මේකේ තිබෙන්නේ "other persons" කියලා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු නවීන් දිසානායක මන්ත්‍රීතුමා මට ඇහුණේ නැහැ. ඒක නැවත කියන්න.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, I rise to a point of Order. According to the Standing Orders, those who are in the administration of justice -

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි pointless ඒවා කථා කරලා වැඩක් නැහැ.[බාධා කිරීම්] මම ඌරු මස් ප්‍රවාහනය ගැන කථා කළේ නැහැ. මම කථා කළේ මුව මස් ප්‍රවාහනය ගැන.[බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, 78 වන ස්ථාවර නියෝගය යටතේ මෙසේ සඳහන් වනවා:

"ජනාධිපතිතුමා හෝ වැඩබලන ජනාධිපතිතුමාගේ, පාර්ලිමේන්තු මන්ත්‍රීන්ගේ, විනිශ්චයකාරවරුන්ගේ හෝ යුක්තිය පසිඳලීමෙහි නියුක්ත අන් අයගේ පැවැත්ම පූර්ණ යෝජනාවකින් හැර මතු නොකළ යුතු ය..."

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

"අන් අය" කියලායි සඳහන් කරලා තිබෙන්නේ. නීතිපති කියලා ස්ථාවර නියෝගවල කිසිම සඳහනක් නැහැ. ඒ විතරක් නොවෙයි,-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ඒ නිසා ඒ ටික අයින් කරනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඔව්, ඒක වැඩක් නැහැ. නිකම් එක එක ඒවා ගෙනෙනවා. නීතිපතිතුමාට ඔබතුමා ආදරේ එක වෙනම කථාවක්. අපිත් ආදරෙයි. ඒකේ කිසි ගැටලුවක් නැහැ. කවුරු කෙරුවත්, වැරැද්ද නම් වැරැද්ද. [බාධා කිරීම්]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා ( යෞවන කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - இளைஞர் அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Deputy Minister of Youth Affairs )
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමා කියන්න නීතිය. ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා.[බාධා කිරීම්]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා පසු ගිය කාලය පුරාම මේ පාර්ලිමේන්තුවේ දී ශ්‍රේෂ්ඨාධිකරණය, මහාධිකරණය සහ,-[බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්න. විනාඩියක් දෙන්න. තමුන්නාන්සේ මට විනාඩියක් දෙන්න මේක කියන්න. [බාධා කිරීම්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීවරයා ශ්‍රේෂ්ඨාධිකරණ, මහාධිකරණය සහ විනිසුරුවන් පිළිබඳව දිගින් දිගටම-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඒකේ රීති ප්‍රශ්නයක් නැහැ. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමාගේ mike එක off වෙලා තිබෙන්නේ. කිසි ගැටලුවක් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාට කියන්න විධියක් නැහැ. මොකද එතුමාගේ mike එක off කරලා තිබෙන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මහින්දානන්ද ඇමතිතුමා ඒක point of Order එකක් නොවෙයි. [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එහෙම තර්ජනය කරලා mike ඉල්ලන්න බැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේකෙන් තේරෙනවා,-[බාධා කිරීම්] මේකෙන් තේරෙනවා රටේ නීතිය-[බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමනි,-[බාධා කිරීම්] මොකක්ද ඔබතුමාගේ ස්ථාවර නියෝගයේ අංකය?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කාරණය කියලා අන්තිමට අංකය කියන්නම්. [බාධා කිරීම්] මෙතුමා හැම දාම,-[බාධා කිරීම්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක විහිළුවකට ගන්නට එපා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔව්. කියන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාගෙන් මේ පාර්ලිමේන්තුවේදී ඉතාම ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා. අධිකරණයට මෙහෙම ගහන්න දෙන්න එපා. මේක හොඳ දෙයක් නොවෙයි. මේක ජාත්‍යන්තර කුමන්ත්‍රණයක්. මේක පිටු පස තිබෙන්නේ ජාත්‍යන්තර කුමන්ත්‍රණයක්. මේ ලැස්ති වන්නේ වෙන දෙයකට. මේ ලැස්ති වන්නේ රට පාවා දෙන්න. මේ ලැස්ති වන්නේ අධිකරණය දූෂිතයි කියලා, අධිකරණයට විරුද්ධව ඇඟිල්ල දික් කරලා,-[බාධා කිරීම්] තමුන්නාන්සේට Standing Order එක කියන්නම්. මෙතුමා හැම දාම කරන්නේ මේක තමයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ඔබතුමා කථා කරන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කනගාටු වනවා. එතුමා ගාව ඇති පොතකුත් නැහැ. එතුමා මොකක්දෝ පොතක් උස්සා ගෙන කියවනවා. ඒකේ ඇතුළේ මොනවත් නැහැ. කරුණාකරලා ඕක ස්ථාවර නියෝග පොතද කියලා මට පෙන්වන්න. උදේ මෙතැනට දාපු පොත ඔය පෙන්වන්නේ. මේ න්‍යාය පත්‍ර පොත තමයි පෙන්වා ගෙන කියවන්නේ. කොහොමත් එතුමා ඒවා ගැන දන්නේ නැහැ. දන්නේ නැති නිසා තමයි කථා කරන්නේ. [බාධා කිරීම්] කිසිම වේලාවක මෙතුමන්ලාගේ,- [බාධා කිරීම්] මගෙන් අහ ගන්නට එපා හේමන්ත පෙරේරා ගැන.[බාධා කිරීම්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-[බාධා කිරීම්] ඉඳ ගන්න පොඩ්ඩක්. කැලණිය ටයර් සංස්ථාව ගැන අහ ගන්න එපා. [බාධා කිරීම්] අලුත් ඒවා හොයා ගෙන ඉන්නේ මම. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, - [බාධා කිරීම්] මම කාටවත් මඩ ගැහුවේ නැහැ. මම බොහොම පෞද්ගලිකව මන්ත්‍රීවරයෙක් විධියට,-[බාධා කිරීම්] නැහැ. ඒක තමයි කියන්නේ, ඒක තමුන්නාන්සේ නේ කියන්නේ. [බාධා කිරීම්] ඒක තමයි. හේමන්ත පෙරේරා ගැන කථා කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කියන්නේ මේකෙන් තේරෙනවා. මෙතුමන්ලා මේ පාර්ලිමේන්තුව තුළ හැම දාම පාවා දීම් ගැන තමයි කථා කෙරුවේ. දැන් අද රටේ නීතිය නැති එකටත් පාවා දීම ගැන තමයි කථා කරන්නේ. [බාධා කිරීම්] මොකක්ද?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
අර මනුස්සයාට භූමි තෙල් ගෙනත් දුන්නේ කවුද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඒක අහ ගන්න ඒ මනුස්සයාගෙන්. [බාධා කිරීම්] මම එදාත් කිව්වා නේ අපේ මිනිස්සු මැරෙන්න හරි සූදානම්.[බාධා කිරීම්] තමුන්නාන්සේලාගේ ඇමතිවරු වතුර බීලා ගෙදර යනවා. ඒවා හොඳයි.[බාධා කිරීම්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ පාක්ෂිකයන් මැරෙන්න හරි සූදානම්. ඒ තරම් ලැදි පාක්ෂිකයන් අපි ගාව ඉන්නවා.[බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා. [බාධා කිරීම්] ගරු ඇමතිතුමා, කරුණාකර ඉඳ ගන්න. [බාධා කිරීම්] ඔබතුමාට වැඩි පුර විනාඩි දෙකක් දුන්නා. මී ළඟට ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා.[බාධා කිරීම්]

[අ. භා. 3.02]

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රට සමාජ, ආර්ථික, දේශපාලන වශයෙන් විශාල වෙනස්කම්වලට මුහුණ දෙන යුගයක කාලෝචිත මාතෘකාවක් ඔස්සේ කාලෝචිත පනත් කෙටුම්පතක් අද දිනයේ දී මේ ගරු සභාවට ඉදිරිපත් වීම පිළිබඳව මම සතුටු වනවා. අද මේ රට ත්‍රස්තවාදයෙන් මුදවා ගෙන තිබෙනවා. ඒ නිසා ඒකීය ශ්‍රී ලංකාවක් තුළ ජීවත් වන සමාජයක් විධියට, ජනතාවක් විධියට මේ රටේ මහ ජනතාවට නීතිය හා සාමය පිළිබඳව දැඩි බලාපොරොත්තුවක්, විශ්වාසයක් තිබෙනවා. ඒ වාගේම ඒ නීතිය හා සාමය ක්‍රියාත්මක වීම පිළිබඳව දැඩි බලාපොරොත්තුවක් තිබෙනවා. විශේෂයෙන්ම වේගය, ඵලදායිතාව හා කාර්යක්ෂමතාව පිළිබඳව මේ රටේ මහජනතාවට දැඩි විශ්වාසයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණ කටයුතු ගැන අපි කථා කරන විට වර්තමාන අධිකරණ ක්‍රමය තුළ නැත්නම් වර්තමාන අධිකරණ පද්ධතිය තුළ නඩු තීන්දු ලබා දීමේදී විශාල ප්‍රමාද වීම් තිබෙන බව අපි දන්නවා. එහෙමත් නැත්නම් නඩුවක තීන්දුවක් ලබා දෙන්න -විශේෂයෙන් ඉඩම් නඩු ගත්තොත්- වසර ගණනාවක් යනවා. අපේ ගරු අමාත්‍යතුමා කිව්වා එක ඉඩම් නඩුවක -කුඹුරු නඩුවක- තීන්දුව එන කොට වසර විස්සක් ගිහිල්ලා, ඒ කුඹුරත් එතැන නැහැ කියලා.

ඒ වාගේම තමයි වංචා හා දූෂණ සම්බන්ධ නඩු තීන්දුත්. වංචා හා දූෂණය සම්බන්ධ නඩු ඉතා ඉක්මනින් විභාග කර අවසන් නොවීම නිසා අද මේ රටේ ආණ්ඩුව කෙරෙහිත් නොයෙකුත් ආයතන කෙරෙහිත් මහජනතාව තුළ තිබෙන විශ්වාසය බිඳ වැටිලා තිබෙනවා. ඒ හේතුව නිසා අද මේ රටේ මහජනතාව, මේ රටේ රජයටත් ඒ වාගේම අනෙකුත් ආයතනවලටත් ඇඟිල්ල දික් කරන යුගයක් බවට අද පරිවර්තනය වෙලා තිබෙනවා. සිවිල් නඩු ගැන කථා කරනවා නම්, ඒ නඩු වසර ගණනාවක් ඇදෙනවා. මගේ පියාත් නීතිඥයෙක්. මම නීති විද්‍යාව හදාරන්න යනකොට එතුමා මට කිව්වා, එතුමා කවමදාකවත් සිවිල් නඩුවලට පෙනී සිටියේ නැහැයි කියලා. මොකද, කිරි හරකෙක් ගත්තා වගෙයිලු. එය වසර ගණනාවක් තිස්සේ ඇදෙනවා. මේවා මහ හරවා ගන්න පසු ගිය වකවානුව තුළ නොයෙකුත් ක්‍රියා මාර්ග අරගෙන තිබෙනවා; නොයෙකුත් ක්‍රමවේද හඳුන්වලා දීලා තිබෙනවා. අභියාචනාධිකරණයේ සිවිල් බලතල මහාධිකරණයට පවරා දීමත් ඉන් එක් පියවරක් හැටියට අපට සලකන්න පුළුවන්. හැබැයි මේ මොන සංශෝධන ගෙනාවත්, මේ මොන ක්‍රියා මාර්ග ගත්තත්, මේ මොන ක්‍රියාපටිපාටි අපි අනුගමනය කළත් මේ රටේ අධිකරණ ක්‍රමයේ වේගය, ඵලදායිතාව සහ කාර්යක්ෂමතාව වැඩි කරන්න නම් ඒ හා සම්බන්ධ වුණු අනෙකුත් ආයතනවල ඵලදායිතාවත් අපි වර්ධනය කරන්න ඕනෑ. ඒ හා බැඳුණු අනෙකුත් ආයතනවල කටයුතුත් අපි කාර්යක්ෂම කරන්න ඕනෑ. විශේෂයෙන්ම පොලීසියේ විමර්ශන අංශය ගත්තොත් එහි විමර්ශන කටයුතු අපි කඩිනම් කරන්න ඕනෑ. නීතිපති දෙපාර්තමේන්තුව තුළ අද නීති උපදෙස් සඳහා ගිය කෙටුම්පත්, ලිපිගොනු දහස් ගණනක වැඩ කටයුතු අතපසු වෙලා තිබෙනවා. ඒ වාගේම නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වැනි ආයතනවල, ඒ වාගේම ඇඟිලි සලකුණු අංශය වැනි අංශවල -අධිකරණය හා සම්බන්ධ, මහජනතාව හා සම්බන්ධ, මේ රටේ සංවර්ධනය හා සම්බන්ධ ආයතනවල- කටයුතු අපි කඩිනම් කළ යුතුයි; ශීඝ්‍ර කළ යුතුයි. [බාධා කිරීමක්] එස්එම්එස් එකක්ද දන්නේ නැහැ; ඡන්දයක්ද දන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ රට අති දැවැන්ත සංවර්ධනයක් කරා ගමන් කරනවා. අද මේ රටේ ග්‍රාමීය සංවර්ධන කටයුතු ඉතාමත් වේගවත් වෙලා තිබෙනවා. මේ රට තාක්ෂණය කරා අති ශීඝ්‍රයෙන් ගමන් කරනවා. ඒ නව තාක්ෂණය නීතිය හා සාමය සම්බන්ධව කටයුතු කරන අධිකරණ පද්ධතිය තුළටත් හඳුන්වා දී ලෝකයත් සමඟ ගනුදෙනු කරන්න පුළුවන් පරිසරයක් අපි අපේ අධිකරණ පද්ධතිය තුළ නිර්මාණය කරන්න ඕනෑ. ගමට තාක්ෂණය හඳුන්වා දෙනවා වාගේම අධිකරණ පද්ධතිය තුළටත් නව තාක්ෂණය අපි හඳුන්වා දෙන්න ඕනෑ. ලෙනාඩ් වුල්ෆ් මහතාගේ "බැද්දේගම" කථාවේ කියැවෙන සියඹලා ගහක් යට ඉඳ ගෙන බබුන්ලාගේ සිනිඳුලාගේ නඩු අසා තීන්දු දුන් මීගහජඳුර, සූරියවැව වැනි ප්‍රදේශ අද සංවර්ධනය වෙලා තිබෙනවා. තව නොබෝ දිනකින් ඒ ප්‍රදේශය තුළ ඉදිවන ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනයක් තුළ ජයසූරියලා, මුරලිදරන්ලා ක්‍රිකට් ගහන යුගයක් ආරම්භ වෙනවා. [බාධා කිරීමක්] ගහනවා ගහනවා. One day's ගහනවා නේ. Twenty-Twentyත් ගහනවා. හැබැයි ඒකේ සින්දු කියන්න නැහැ. ඒ නිසා එස්එම්එස් ගහන්න බැහැ. ගමට සංවර්ධනය යනකොට මේ නීති පද්ධතිය තුළටත් ඒ අවශ්‍ය තාක්ෂණික දැනුම අපි ලබා දෙන්න ඕනෑ.

ඒ වාගේම අපි අද උතුර සහ නැඟෙනහිර ප්‍රදේශවලත් ඒ වාගේම දකුණු ප්‍රදේශයේත් අති දැවැන්ත කර්මාන්ත ප්‍රබෝධයක් ඇති කර තිබෙනවා. නව කර්මාන්ත පුර ඉදි වෙනවා. ඒ කර්මාන්තවලට සම්බන්ධ, වාණිජ ක්ෂේත්‍රයට සම්බන්ධ ගැටලු විසඳා ගැනීම සඳහා ඒ ගම්වලත් අධිකරණ ස්ථාපනය වෙන්න ඕනෑ. එතකොට තමයි ඒ ප්‍රදේශවල ජීවත් වන අපේ තරුණ තරුණියන්ට, දෙමවුපියන්ට නීතියේ පිහිට ලබා ගැනීම පහසු වන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහාධිකරණ විනිසුරුවරුන් වාගේම ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේ සංඛ්‍යාවත් වැඩි විය යුතුයි. මොකද, මහාධිකරණ විනිසුරුවරුන්ගේ සංඛ්‍යාව වැඩි වෙලා, මහාධිකරණ ප්‍රමාණය වැඩි වෙලා ඒවායේ දෙන නඩු තීන්දු ශීඝ්‍රයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට යන කොට ශ්‍රේෂ්ඨාධිකරණය තුළ යම්කිසි පසුබෑමකට ලක් වෙන්න පුළුවන්. ඒ නිසා ශ්‍රේෂ්ඨාධිකරණය තුළ අවම වශයෙන් විනිසුරුවරුන් 15 දෙනෙක්වත් සිටිය යුතුයි කියලායි අප විශ්වාස කරන්නේ. "Justice delayed is justice denied" නීතිය ප්‍රමාද වෙනකොට ඒක බලපාන්නේ මේ රටේ මහජනතාවටයි. මේ පාර්ලිමේන්තුව තුළත්, මේ පාර්ලිමේන්තුවෙන් පිටතත් කතාබහ වෙන දේවල් ඇහුවාම මා හිතනවා, මේ රටේ පාසල් පද්ධතිය තුළ නීතිය පිළිබඳව හදාරන්න පාසල් විෂය නිර්දේශයට නීතිය කියන විෂය ඇතුළත් කළ යුතුයි කියලා. නීතිය විෂයයත් පාසල් විෂයයක් හැටියට -අනෙකුත් පාසල් විෂයයන් අතරම- ඉගැන්වීම අපි ආරම්භ කළ යුතුයි. මොකද නීතිය නොදැනීම නිදහසට කාරණයක් නොවෙයි. හැබැයි, මට පෙනෙන විධියට මේ සමාජය තුළ හැසිරීම්

[ගරු නාමල් රාජපක්ෂ මහතා]

රටාව ගත්තාට පස්සේ, මේ රට තුළ සිදු වන නොයෙකුත් දේවල් ගත්තාට පස්සේ මේ රටේ ජනතාවට නීතිය පිළිබඳව මීට වඩා මනා දැනුමක් පුළුල් අවබෝධයක් ලබා දිය යුතුයි කියන විශ්වාසයේ තමයි අපි ඉන්නේ. ඒ වාගේම නීතියේ ආධිපත්‍යය රැකෙන්නට නම් අධිකරණයේ ස්වාධීනත්වය අපි ආරක්ෂා කරන්න ඕනෑ. මා හිතන්නේ, මේ පාර්ලිමේන්තු සභා ගර්භය තුළදී වුණත්, මින් පිටතදී වුණත් පටු දේශපාලන අරමුණුවලට, තමන්ට දේශපාලන වාසි ලබා ගන්න මේ රටේ නීතියේ ස්වාධීනත්වය, ස්වාධිපත්‍යය පාවා දිය යුතු නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ඒ පාවා දීම් දැඩි ලෙස හෙළා දකින්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවා වෙලා, පාර්ලිමේන්තු වරප්‍රසාද ඉදිරියට දමා ගෙන මේ රටේ අධිකරණයේ ස්වාධිපත්‍යය පාවා දෙන්න එහෙම නැත්නම් මේ රටේ නීතිය ක්‍රියාත්මක කරන මේ රටේ අධිකරණ පද්ධතිය පහත හෙළන යුගයක් අපට පෙනෙන්න තිබෙනවා. එයට විරුද්ධව අපි නැඟී සිටින්න ඕනෑ. මම විශ්වාස කරනවා, අපේ විපක්ෂයේ ඉන්න ජ්‍යෙෂ්ඨ දේශපාලන නායකයින් මේ සඳහා දැඩි අවධානයක් යොමු කරාවිය කියා. මොකද, මේක ලෙහෙසි දෙයක් නොවෙයි. මේක අපට පහසු දෙයක් නොවෙයි. අපි සංවර්ධනය කරා රටක් විධියට ගමන් කරන කොට ජාත්‍යන්තර තලයත් එක්ක අපට ගනුදෙනු කරන්න සිදු වනවා. තමන්ගේ පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවා වෙලා අධිකරණය හෑල්ලුවට ලක් කරන්න එපාය කියා අපේ ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයන්ගෙන් මම ඉල්ලීමක් කරනවා.

අධිකරණ විනිසුරුවන් ඡන්දයෙන් තෝරා පත් කර ගන්නා ලෝකයේ ඇතැම් රටවල් තිබෙනවා. ඇතැම් ප්‍රාන්ත තිබෙනවා. ඉන්දියාවේ ගත්තොත් බිහාර් ප්‍රාන්තය, ඇසෑම් ප්‍රාන්තය වාගේම ඇමෙරිකාවේ සමහර ප්‍රාන්තත් එසේ පත් කර ගන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහි තිබෙන අඩු පාඩුවව තමයි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු තෝරා පත් කරනවා වාගේ අධිකරණයට විනිසුරුවන් තෝරා පත් කර ගත්තොත් ජනතාවගේ ඡන්දය බලාපොරොත්තුවෙන්, ප්‍රසිද්ධත්වය බලාපොරොත්තුවෙන් ඔවුන් කටයුතු කරන නිසා ජනතාවට සැබෑ නීතිය හා සාමය රැකවරණය ලැබෙන්නේ නැහැය කියන චෝදනාව. හැබැයි අද අපේ ලංකාවේත් මේ තත්ත්වය තිබෙනවා. අද අප විනිසුරුවරුන් ඡන්දයකින් තෝරා පත් කර ගත්තේ නැතත් ඔවුන් ජනතාවගේ හිත දිනා ගන්න දීපු නඩු තීන්දු තිබෙනවා. ඒ වාගේම ප්‍රසිද්ධ වෙන්න දීපු නඩු තීන්දු මේ රට තුළ අපට දකින්නට තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ රටේ ත්‍රස්තවාදය හමාරයි. අද මේ රටේ උතුරේ, දකුණේ, කඳුකරයේ ක්‍රියාත්මක වන්නේ මේ උත්තරීතර සභාව තුළින් සම්මත කරන්නා වූ නීතියක්. ඒ නීතියට මේ සභාව තුළ සිටින සියලු දෙනාත්, මේ රටේ මහජනතාව සියලු දෙනාමත් අවනත විය යුතුයි. ඒ නීතියට ගරු කළ යුතුයි. අපි දන්නවා, උසාවිවලට ගල් ගහපු එක්තරා යුගයක් තිබුණා. උසාවි ගිනි තියපු, නීතිඥවරුන් ඝාතනය කරපු, විනිසුරුවරුන් ඝාතනය කරපු යුගයක් තිබුණා. පාතාලය රජ කරපු උසාවි තිබුණා. ඒ වාගේම අපේ ගරු ජනක බණ්ඩාර ඇමතිතුමාගේ පියාණන්ව එදා එවැනි අසාධාරණයකට ලක් වුණා. ඒ යුගය දැන් අවසන්. දැන් කැලෑ නීතියක් මේ රට තුළ ක්‍රියාත්මක වන්න බැහැ. මේක ඒකීය ශ්‍රී ලංකාවක්. උතුර, දකුණ, නැඟෙනහිර ඇතුළු මේ රටේ සියලුම ප්‍රදේශවල ක්‍රියාත්මක වන්න ඕනෑ මේ උත්තරීතර සභාව තුළ සම්මත කරන්නා වූ නීතියයි; මේ රට තුළ ක්‍රියාත්මක වන්නා වූ නීතියයි. ඒක තමයි අපේ අධිෂ්ඨානය විය යුත්තේ. ඒ සඳහා අපි ආකල්පමය වෙනසක් ඇති කර ගන්න ඕනෑ. මේ සභා ගර්භය තුළ සිටින සියලු මන්ත්‍රීවරුන් වාගේම-

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමන්ලා නේ ගස් බැඳපු නීති ගේන්නේ.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
යූඑන්පීඑකේ මෝටර්ස් වාගේ නේද? මෙතැන සිටින සියලුම මන්ත්‍රීවරුන් වාගේම සමස්ත ශ්‍රී ලාංකික ජනතාවම මේ ආකල්පමය වෙනසක් කරා ගමන් කරන්න ඕනෑ. තම පටු දේශපාලන අරමුණු ඉටු කර ගන්න, තම දේශපාලන මතය ප්‍රකාශ කර ගන්න මේ රටේ නීතිය, ස්වාධිපත්‍ය, ඒකීයත්වය පාවා දෙන්න එපාය කියන ඉල්ලීම කරමින් මම නිහඬ වනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. ගරු අජිත් පී.පෙරේරා මන්ත්‍රීතුමා.

[අ. භා. 3.12]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා ඉතාම හොඳ යෝජනාවක් කළා. ඒ තමයි මේ රටේ නීතිය පාසල් විෂයයක් විධියට ඉදිරිපත් කරන්න ඕනෑය කියන කාරණය. නීතිඥවරයකු හැටියට, ඒ වාගේම නීති අධ්‍යාපනයට සම්බන්ධ වෙලා ඉන්න කෙනකු හැටියට, සෑහෙන කාලයක් තිස්සේ මේ කාරණය ගැන අවධානය යොමු කරපු කෙනකු හැටියට මා ඔබතුමාගේ අවධානය මේ සඳහා යොමු කර වනවා. අපි සෞඛ්‍ය, ආගම, විද්‍යාව, ගණිතය ඉගෙන ගන්නවා වාගේ සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ මට්ටමට වෙනමම විෂයයක් විධියට නීතිය පාසල් විෂය නිර්දේශයට හඳුන්වා දීම ඉතා වැදගත්. මොකද, අයිතිවාසිකම් හා යුතුකම් මේ රටේ සෑම පුරවැසියෙක්ම දැන ගත යුතුයි. නීතිඥ වෘත්තියට පිවිසෙන අයට පමණක් නොවෙයි හැමටම තමන්ගේ වෘත්තිය කුමක් වුවත් ජීවිතයේදී තමන්ට පැවරෙන වගකීම් ඉටු කරන්න, යුතුකම් සහ වගකීම් දැන ගන්න ප්‍රමාණවත් තරම් නීතිය උගන්වන්න ඕනෑ. දියුණු රටවල එහෙම කරනවා. අපිත් මේ ක්ෂේත්‍රයේ ඉදිරියට යන්න නම් ගුණාත්මක වර්ධනයක් ඇති කර ගන්න නම් නීතිය විෂයක් විධියට ඉගැන්වීමට කටයුතු කළ යුතුයි. ඒ කාරණය පිළිබඳව අවශ්‍ය ඕනෑම සහායක් ලබා දෙන්න, ඒ ක්ෂේත්‍ර පිළිබඳව අපට තිබෙන දැනුම රජයට ලබා දෙන්න අපි සූදානම්.

අපේ ගරු අධිකරණ ඇමතිතුමා එතුමාගේ ආරම්භක කථාවේදී සඳහන් කළා, නීතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව මේ රටේ අධිකරණ පද්ධතියේ දැවැන්ත වෙනස්කමක් කරන්න ගරු අධිකරණ ඇමතිතුමාටත් එතුමාගේ අමාත්‍යාංශයටත් තිබෙන වුවමනාව ගැන. මට මතකයි මීට මාස කිහිපයකට කලින් ගරු ඇමතිතුමා සහ නියෝජ්‍ය ඇමතිතුමා පත් කළාම නීතිඥ වෘත්තියේ ඉන්න අපේ ඇතැම් මිත්‍රයෝ කිව්වා, ඇමතිතුමාත් නීතිඥයෙක් නොවෙයි නියෝජ්‍ය ඇමතිතුමාත් නීතිඥයෙක් නොවෙයි, ඒ නිසා මේක කරන්නේ කොහොමද කියා. මා ඒ අයට කිව්වා, ඇමතිතුමාත් නියෝජ්‍ය ඇමතිතුමාත් දෙදෙනාම නීතිඥයෝ නොවුණාට දේශපාලනය පිළිබඳව බොහොම පළපුරුද්දක් තිබෙන, දැන උගත්කම් තිබෙන සාමාන්‍ය මිනිසුන්ගේ ප්‍රශ්න ගැන විවෘතව බලන්න පුළුවන් තත්ත්වයක ඉන්න දෙදෙනෙක්, ඒ නිසා අන් සෑම කෙනෙකුටම වඩා එතුමන්ලා හොඳ තත්ත්වයක ඉන්නවා මේ වෙනස සිදු කරන්න කියලා. මොකද, නීති වෘත්තිය තුළ ඉන්න අය ඒ වෘත්තිය තුළ තිබෙන බැඳීම් නිසා සමහර වෙලාවට සමහර තීරණ නොගන්න පුළුවන්. ඒ නිසා දීර්ඝ කාලීන පළපුරුද්දක් තිබෙන, දේශපාලනය තුළ තිබෙන ප්‍රායෝගික කාරණා දන්නා, මිනිසුන්ගේ දුක් වේදනා ගැන හැඟීමක් තිබෙන වාමාංශික දේශපාලන පසුබිම්වලින් කාලයක් තිස්සේ පෝෂණය

වුණු ගරු ඇමතිතුමාටත් නියෝජ්‍ය ඇමතිතුමාටත් ශක්තිය ධෛර්ය ලැබෙන්න ඕනෑ මේ අර ගෙන තිබෙන පියවර ඉදිරියට ගෙන යන්න.

අධිකරණ සංවිධාන පනත සංශෝධනය කරලා මහාධිකරණ විනිසුරුවරුන්ගේ සංඛ්‍යාව 40 ඉඳලා 60 දක්වා වැඩි කළා. තවත් මදි. ඒ සංඛ්‍යාව 75 දක්වා වැඩි කරනවා. හැබැයි, මේ රටේ මහාධිකරණ 26ක් තිබුණත් ඒ මහාධිකරණ 26ට අමතරව සිවිල් අභියාචනාධිකරණ 16ක් ඇති කළත් ඒ අධිකරණ ක්‍රියාත්මක වන ආකාරය ගැන ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රායෝගිකව අවබෝධ කර ගෙන ඒවායේ ක්‍රියා දාමය පිළිබඳව අවශ්‍ය කරන පරිපාලනමය වෙනස්කම් නොකළොත් සාර්ථක ප්‍රතිඵල ලබා ගන්න හැකියාවක් ලැබෙන්නේ නැහැ.

මේ සංශෝධන පනත් කෙටුම්පතට ප්‍රස්තූත වෙලා තිබෙන මහාධිකරණවල ක්‍රියා දාමය ගැන එක්තරා විශේෂ අවධානයක් යොමු කරන්න මා කැමැතියි. මා මේ කාරණය ගැන අධිකරණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේදීත් අවධානය යොමු කළා. ඒ වාගේම මේ කාරණය ගැන ගෞරවණීය සභාවේත් විශේෂ අවධානය යොමු කරන්න සූදානම්. මහාධිකරණවල අද වන විට බරපතළ අපරාධ නඩු, මිනීමැරුම්, මිනීමැරීමට තැත් කිරීම, ස්ත්‍රී දූෂණ, ළමා අපචාර, හෙරොයින්, ගංජා නඩු විශාල ප්‍රමාණයක් එක් රැස් වෙලා තිබෙනවා. එම අධිකරණයේම තමයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් බලයට අයිති රිට් ආඥා, ඇප පිළිබඳ ඉල්ලීම් සහ ප්‍රතිශෝධන අයදුම්පත් පිළිබඳව විභාග කරන්නේ. එකම අධිකරණයක රිට් නඩුත් අහනවා; ඇප ඉල්ලුම් පත්‍රත් සලකා බලනවා; ප්‍රතිශෝධන අයදුම් පත් සලකා බලනවා. එවැනි තත්ත්වයක් තුළ කැඳවීම් නඩු ටික ඉවර කරලා අනෙකුත් රිට් ආඥා, ඇප පිළිබඳ ඉල්ලීම් සහ ප්‍රතිශෝධන අයදුම්පත් පිළිබඳ සලකා බලා මූලික ප්‍රශ්න අවසන් කරන කොට දවසේ වැඩ කරන කාලයෙන් සැහෙන ප්‍රමාණයක් ගිහිල්ලා. ඒ නිසා බරපතළ අපරාධ නඩු විභාග කරලා අවසන් කරන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා මගේ යෝජනාව මේකයි. ගරු ඇමතිතුමනි, මහාධිකරණවල අලුතින් අධිකරණ පිහිටුවීම අවශ්‍ය වන්නේ නැහැ. යන වියදම අඩු කර ගන්න පුළුවන්. ඒ දැනට තිබෙන මහාධිකරණවලම බරපතළ අපරාධ නඩු විභාග කරන අධිකරණයක් වෙනමත් රිට්, ඇප සහ ප්‍රතිශෝධන බලය ක්‍රියාත්මක කරන අධිකරණයක් වෙනමත් වශයෙන් විනිශ්චයකාරවරුන් දෙදෙනෙකුට ක්‍රියාත්මක වන්නට පුළුවන්. එහෙම කළොත් කාර්යක්ෂමතාවය වැඩි වනවා; ඉක්මනින් නඩු අසා ඉවර කරන්නට පුළුවන්. ඒ වාගේම බරපතළ අපරාධ නඩු ප්‍රමාද වීම පිළිබඳව තිබෙන්නා වූ ඒ සුවිශේෂ විවේචනයටත් පිළියමක් ලැබෙනවා. ඒ වාගේම දැනට තිබෙන අකාරයටම සිවිල් අභියාචනා සඳහා පළාත්බද මහාධිකරණ වෙනමම ක්‍රියාත්මක කර ගෙන යන්නට පුළුවන්. මේ සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් අවශ්‍ය වන්නේ නැහැ කියන එකයි මගේ අදහස. අධිකරණ සංවිධාන පනතත් පළාත්බද මහාධිකරණ පනතත් සංශෝධනය කිරීමෙන් මේ ප්‍රශ්නය විසඳා ගැනීමට හැකියාව තිබෙනවා.

එම නිසා ගරු ඇමතිතුමනි, මහාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ සංඛ්‍යාව වැඩි කිරීම ඉතාම ප්‍රගතිශීලි ඉදිරි පියවරක් කියන කාරණය ඉතාමත්ම බරපතළ විධියට අගය කරමින් ඒ පරිපාලන ක්‍රියා දාමය තවත් වැඩි දියුණු කොට මහාධිකරණවල ප්‍රමාදය අඩු කරන්නට කටයුතු කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම අධිකරණයන්හි ඇප ලබා දීම පිළිබඳව, දණ්ඩනයන් ලබා දීම පිළිබඳව අද විශේෂ ගැටලුවක් මතු වී තිබෙනවා. වසරක් ඇතුළත ගත්තොත් සමාන කරුණු ඇති නඩුවල එකම විනිශ්චයකාරවරයකු එකිනෙකට වෙනස් විධියේ දණ්ඩනයන් ලබා දෙනවා; එකිනෙකට වෙනස් විධියේ ඇප නියෝග ලබා දෙනවා. ඒ වාගේම එක අධිකරණයක සිටින විනිශ්චයකාරවරයකු ඇප පිළිබඳව දක්වන ප්‍රතිපත්තිය එකක්. අනෙක් අධිකරණයේ කටයුතු කරන විනිශ්චයකාරවරයා ඇප පිළිබඳව දක්වන ප්‍රතිපත්තිය තවත් එකක්. මහේස්ත්‍රාත් අධිකරණවල වාගේම මහාධිකරණවලත් මේ තත්ත්වය එක ලෙසම තිබෙනවා. එම නිසා ගරු ඇමතිතුමනි, අපේ විශේෂ අවධානය යොමු විය යුතු ක්ෂේත්‍රයක් තිබෙනවා. ගරු විනිශ්චයකාරතුමන්ලාට තිබෙන මේ අභිමතය බොහොම වැදගත් දෙයක්. පාර්ලිමේන්තුවේ නීති පනවා, ඒ ඒ විනිශ්චයාකාරවරයාට මේ දෙය කළ යුතුය කියා තදබල නීති නියම කිරීමෙන් මේ ප්‍රශ්නය විසඳන්නට බැහැ. ගරු මහාධිකරණ විනිශ්චයකාරවරුන්ටත් මහේස්ත්‍රාත්වරුන්ටත් දණ්ඩනයන් පැන වීම පිළිබඳව පුළුල් අභිමතයක් ලබා දිය යුතුයි. හැබැයි මේ අභිමතය නියාමනය කරන්න; මේ අභිමතය ක්‍රියාත්මක කරන ආකාරය පෙන්නුම් කරන්න ඒ අයට උපදේශ ලබා දෙන්නට ඕනෑ; guidelines ලබා දෙන්නට ඕනෑ. ලෝකයේ දියුණු රටවල විනිශ්චයකාරවරුන්ට ඔවුන්ගේ කාර්යයන් ඉටු කිරීම පිළිබඳ guidelines ලබා දෙනවා. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136(1) වන ව්‍යවස්ථාව දෙස බලන විට, මේ ප්‍රශ්නය බොහොම පැහැදිලිව කල් තියා දැක තිබෙන බව පෙනෙනවා. ඒ ව්‍යවස්ථාවේ කියනවා, ඇප පිළිබඳ රීති පන වන්න ශ්‍රේෂ්ඨාධිකරණයට පුළුවන්ය කියා. ගරු ඇමතිතුමනි, දැන් සැහෙන කාලයක් ගත වෙලා. ඇප ලබා දීම පිළිබඳව වූ රීති පැන වීම කර නැහැ. ඒ වාගේම ව්‍යවස්ථාපිත නීතියෙන් ආවරණය නොවන අනෙකුත් අපරාධ නඩුවල කාර්ය පටිපාටිය පිළිබඳ කාරණා ගැන රීති පන වන්න ශ්‍රේෂ්ඨාධිකරණයට පුළුවන්කම තිබෙනවා. නමුත් ඒ රීති තවම පනවා නැහැ. දණ්ඩනයන් පිළිබඳ මේ ප්‍රශ්නය අපේ අවධානයට ලක් කරන්න පුළුවන්.

එම නිසා ගරු ඇමතිතුමනි, ගරු අග්‍රවිනිශ්චයකාරතුමාගේ අවධානයට ලක් කර, ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ අවධානයට ලක් කර ඇප සහ දණ්ඩනයන් ලබා දීම පිළිබඳ මුළු රටේම සෑම විනිශ්චයකාරවරයකුටම පොදු වූ නියමිත, නිශ්චිත ප්‍රතිපත්ති මාලාවක් සකස් කිරීම පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණ රීති පනවන්නය කියා ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ අවධානය යොමු කරන ලෙස මා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. පාර්ලිමේන්තුව නීති පැන වීමට වඩා සුදුසු වන්නේ මේ විධියේ guidelines හදන එකයි. එය එංගලන්තයේ ක්‍රියාත්මක වනවා; ඕස්ට්‍රේලියාවේ ක්‍රියාත්මක වනවා. ඒ වාගේම දියුණු නීති ක්‍රම තිබෙන රටවල ක්‍රියාත්මක වනවා. ඒ කාරණය ගැන මා විශේෂ අවධානය යොමු කරන්නට කැමතියි.

ඒ වාගේම අපේ රටේ සිවිල් නඩුවල ප්‍රමාදය පිළිබඳව බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. ඇත්ත. අපේ ගරු ඇමතිතුමා කිව්වා, සිවිල් නඩුවක් ඉවර වන්න අවුරුදු විස්සක් ගත වනවාය කියා. මට මතකයි මා කුඩා කාලයේ මගේ මෑණියන් එක්ක එක්තරා ඉඩම් නඩුවක් පිළිබඳව; බෙදුම් නඩුවක් පිළිබඳව හොරණ දිසාධිකරණයට ගියා. ඒ නඩුව ඉවර වුණේ මම නීතිඥයකු වෙලාත් අවුරුදු පහක් ගත වුණාට පස්සේ.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா - சுற்றாடல் அமைச்சர்)
(The Hon. Anura Priyadharshana Yapa - Minister of Environment)

නඩුව වාසියට තීන්දු වුණා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

නඩුව වාසියට තීන්දු වුණා. ඒත් ගරු ඇමතිතුමනි, ඒ වන කොට ඒ නඩුවේ පාර්ශ්වකාරයෝ බොහෝ දෙනෙකුට -බෙදුම් නඩුවක ජයග්‍රාහකයෝ ගොඩාක් ඉන්නවා. එක් කෙනෙක් විතරක්

නොවෙයි- ඒ ජයග්‍රහණයේ ප්‍රතිඵල ඔවුන්ගේ ජීවිත කාලය තුළ බුක්ති විඳින්න ලැබුණේ නැහැ. ඒක මහා අවාසනාවක්. මේ ප්‍රමාදය නැති කරන්න ලංකාවේ අධිකරණ ඉතිහාසය තුළම දැවැන්ත උත්සාහයක් ගත්ත එක්කෙනා තමයි ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක මැතිතුමා. එතුමා මේ රටේ සිවිල් සහ අපරාධ නඩු ක්‍රමවල තිබෙන දෝෂ දැකලා විප්ලවීය වෙනසක් කළා, 1973 දී යුක්තිය පසිඳලීමේ පනත අරගෙන ඇවිල්ලා. අපේ නීතිඥ වෘත්තිය ඒ වෙනස දකින්න කැමැති වුණේ නැහැ. සමහර වෙලාවට ඒ වෙනස ඇති කරපු ආකාරය, ඒවා සමාජගත කිරීමට ගත්ත වැරදි ක්‍රියා මාර්ග නිසා යම් ප්‍රතිරෝධයක් ඇති වුණා වන්න පුළුවන්. ඒත් අද වෙලා තිබෙන්නේ මොකක්ද? අද සිවිල් නඩුවක් ඉදිරිපත් කිරීම ඉතාමත් සරල දෙයක් බවට පත් වෙලා තිබෙනවා. උපදෙස් ලැබුණාම, නඩුවේ අනාගතය ගැන කල්පනා කරන්නේ නැතුව, මතු වන්නා වූ ප්‍රායෝගික ප්‍රශ්න ගැන කල්පනා කරන්නේ නැතුව, තිබෙන සාක්ෂිවල ප්‍රමාණය හෝ ගුණාත්මක භාවය ගැන හිතන්නේ නැතුව ඉක්මනින් නඩුව පවරනවා. නඩුව අතරමඟ යන කොට තමයි ඒ නඩුවේ තිබෙන ප්‍රශ්න ගැන, ඒ නඩුවේ ඇති වෙලා තිබෙන ගැටලු ගැන අවධානය යොමු වන්නේ. ඒ නිසා දවසින් දවස නඩුව කල් යනවා. එක විභාග දිනයක සිට අනෙක් විභාග දිනයට මාස පහක් හයක් ගත වනවා. අපේ රටේ සෑම දිසා අධිකරණයකම තත්ත්වය එහෙමයි. මේ තත්ත්වය වළක්වා ගන්න පුළුවන් වන්නේ ගරු ජී.එල්. පීරිස් අමාත්‍යතුමා සඳහන් කරපු ආකාරයට ඒ නඩු විභාගය ආරම්භ කරන්න කලින් යම් ආකාරයකින් නඩුවට සූදානම් වීම පිළිබඳ විශේෂිත කාර්ය පටිපාටියක් - pre-trial procedure එකක්- හඳුන්වා දීමෙනුයි. මේ pre-trial procedure හඳුන්වා දීම අත්‍යවශ්‍ය වූ කාරණයක් වෙලා තිබෙනවා. එය ඉක්මනින්ම කළ යුතුයි. ඒ වාගේම එහි ප්‍රතිඵල සාර්ථක කර ගන්න නම් ඒ පිළිබඳව ප්‍රශ්න ඇති වන්න පුළුවන් සෑම ක්ෂේත්‍රයක් ගැනම හිතලා ඒවාට නීතිඥ වෘත්තිය තුළ ඇති වන්නට පුළුවන් ප්‍රතිරෝධයන් අවම කර ගන්න කටයුතු කළ යුතුයි. ඒ සඳහා අවශ්‍ය ආකල්පමය වෙනසක් ඇති කරන්නට කටයුතු කරන්නය කියලා මම ඉල්ලා සිටිනවා. ඒක ඉතාම වැදගත් දෙයක්. එවැනි කාරණාවලදී විපක්ෂය හැටියට අපි ආණ්ඩුවට සහාය දෙන්න කැමැතියි. මොකද, මේවා ආණ්ඩුවේ ප්‍රශ්නවත්, විපක්ෂයේ ප්‍රශ්නවත් නොවෙයි, මේ රටේ දුක් විඳින ජනතාවගේ ප්‍රශ්න.

අපේ ජී.එල්. පීරිස් ඇමතිතුමා බොහොම විශ්වාසයෙන් කිව්වා, මේ රටේ ඉන්න ඉහළ විනිශ්චයකාරවරු බොහොම දෙනෙක් එතුමාගේ ශෝලයෝයි කියලා. එතුමා ඒ ගැන ආඩම්බර වනවා වාගේම අපටත් ඒ ගැන ආඩම්බරයි. ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා කිව්වා, මේ රටේ විනිශ්චයකාරවරුන්ගේ දැනුම ගැන කිසිම ගැටලුවක් නැහැයි කියලා. හැබැයි ඒ සඳහන් කළ සමහර කාරණාවලට අමතරව මට යමක් කියන්න අවශ්‍යයි. අපේ රටේ විනිශ්චයකාරවරුන්ට තිබෙන ලොකුම අඩු පාඩුවක් තමයි කළමනාකරණ දක්ෂතාවේ අඩුකම. මොකද, අධිකරණ පරිශ්‍රයක ප්‍රධාන වගකීම සහිත තැනැත්තා වන්නේ ඒ අධිකරණයේ එක්කෝ දිසා විනිසුරුතුමා එහෙමත් නැත්නම් මහාධිකරණ විනිසුරුතුමා. එකම අධිකරණයේ, එකම නීතිඥ මණ්ඩලය ඉන්දැද්දී, එකම විධියේ නඩු එක නඩුකාරවරයෙක් ඉක්මනින් ගුණාත්මක භාවයෙන් යුතුව අහනවා; තව විනිශ්චයකාරවරයෙක් පත් වෙලා ආවාම නඩු ප්‍රමාද වනවා; කල් යනවා. ඒ ගැනත් කල්පනා කරලා බැලුවාම පෙනෙන දේ තමයි ඒ එක් එක් විනිශ්චයකාරවරයාගේ කළමනාකරණ දක්ෂතාව බැරෑරුම් ගැටලුවක් වන බව. ඒ වාගේම අධිකරණමය කටයුතු කෙරෙහි තිබෙන ආකල්පය පිළිබඳ බැරෑරුම් ප්‍රශ්න තිබෙනවා.

ගරු අධිකරණ ඇමතිතුමා මීට කලින් අවස්ථාවක සඳහන් කළා, විනිශ්චයකාරවරුන්ගේ ආයතනය සඳහා වෙනමම ගොඩනැඟිල්ලක් ඉදි කරලා, ඒ විනිශ්චයකාරවරුන්ගේ ආයතනය පිළිබඳ යම් ආකාරයක ස්ථාවර භාවයක් ඇති කරන්න කටයුතු කරනවායි කියලා. හැබැයි, මම කියන්න කැමැතියි, එක කාරණයක්. විනිශ්චයකාරවරුන්ගේ ආයතනයට ගොඩනැඟිල්ලක් පිහිටු වීමෙන් මේ ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ ගරු ඇමතිතුමනි. විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ තිබෙන පුහුණු පාඨමාලාවන් බොහොම යල් පැන ගිය ඒවා. ලැබෙන්නෙත් මාස දෙකක තුනක ඉතාම සුළු අවධිමත් පුහුණුවක් පමණයි. විනිශ්චයකාරවරු ඔවුන්ගේ දැනුම ලබා ගන්නේ රටේ අන්තිම දුෂ්කර පළාත්වලට, වලස්මුල්ල වාගේ ඈත පළාත්වලට ඔවුන්ගේ පළමුවන පත්වීම ලබා ගෙන ගියාට පසුවයි. ඒ දුෂ්කර අත් දැකීම් හරහා තමන්ම ඉගෙන ගන්නා ක්‍රම සහ විධි තමයි ඒ විනිශ්චයකාරවරුන් අනුගමනය කරන්නේ. ඒ නිසා මා යෝජනා කරන්න කැමැතියි විනිශ්චයකාරවරුන්ගේ ආයතනය පශ්චාත් උපාධි මට්ටමේ ආයතනයක් බවට පත් කරලා, එය ස්ථිර දේශක මණ්ඩලයක් සහිත ආයතනයක් බවට පත් කරලා, එහි පාඨමාලා වැඩි දියුණු කරලා, විනිශ්චයකාරවරුන්ගේ ගුණාත්මක භාවය වැඩි දියුණු කරන්න කටයුතු කරන්න කියලා. බොහොම ස්තුතියි.

[අ. භා. 3.29]

**ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා (මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு(கலாநிதி) மேர்வின் சில்வா - நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Mervyn Silva - Deputy Minister of Highways)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කළුතර දිස්ත්‍රික්කයෙන් අජිත් පී. පෙරේරා වැනි පඬි රුවනක් මේ පාර්ලිමේන්තුවට පත් කර එවීම පිළිබඳව එක්සත් ජාතික පක්ෂයේ එතුමාගේ ඡන්ද දායකයන්ට මම ගෞරව කරනවා. එතුමා විෂයට අදාළව කථා කළා. එතුමා බොහොම ලොකු ආදර්ශයක් දුන්නා මේ සබා ගැබට. එතුමා වාචාලයෙක් නොවෙයි, එතුමා වනචරයෙක් නොවෙයි, එතුමා හොරෙක් නොවෙයි, එතුමා දක්ෂ නීතිඥයෙක්. ඇතැම් උදවියත් එහෙම හැසිරෙනවා නම් මා හිතන්නේ මේ සභාවේ කලබැගෑනියක් නැහැ කියායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ත්‍රිකෝණය කියන්නේ කැළණිය, මහියංගනය සහ නාගදීපයටයි. ඒ ත්‍රිකෝණයේ ශුද්ධ වූ බෞද්ධ සිද්ධස්ථානය තිබෙන තැන බුදු හාමුදුරුවන්ගේ පාද ස්පර්ශය ලැබුවා විතරක් නොවෙයි, කැලණි ගඟෙන් ස්නානය කරපු තැන. ඒ වාගේම අඳන කඩ තැන්පත් කරපු වෙහෙර තිබෙන තැන. මම පවුකාරයකු නම් දුටුගැමුණු රජුගේ මී මුත්තා විසින් නිර්මාණය කරන ලද කැලණියේ චෛත්‍ය රාජයාගේ කොතේ රන් ආලේප කරන්න මට බැහැ. එහෙම කරපු මම කැලණිය ආසනය භාර ගෙන අවුරුදු තුනයි මාස දෙකක් තුළ ඒ ප්‍රදේශයේ තිබුණු හරක් මස් කඩ වැහුවා.

**ගරු මහින්දානන්ද අළුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage )
Very good.

**ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
එය වරදක්ද? අනවසර සුරාසල් වැහුවා. දඬුවම් දුන්නා.

**ගරු මහින්දානන්ද අළුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Very good.

**ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
එය වරදක් ද? මහ පාරේ තිබුණු අනවසර කඩ ඉවත් කළා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Very good.

**ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
ඒක වරදක්ද? රනිල් වික්‍රමසිංහ මැතිතුමාට අවුරුදු 13ක් ඇර ගන්න බැරි වුණු ඒ මහ වෙහෙර ඉදිරිපිට තිබුණු කැලණිසිරි පාලම මම ඇරලා දුන්නා. ඒක වරදක්ද? මා ස්වේච්ඡාවෙන් ගිහිල්ලා, ගණිකා වෘත්තිය පවත්වා ගෙන ගිය හෝටල් බලෙන් වහලා දැමීම වරදක්ද? එම හෝටල්කරුවන් මට වෛර කරනවා ඇති. ඒ සුරාසල් අයිතිකරුවන් මට වෛර කරනවා ඇති. වෛර කළත් හොඳ දේ කිරීමට මම පසුබට වන්නේ නැහැ. මට අවශ්‍යව තිබෙන්නේ පිරිසිදු, ශුද්ධ වූ කැලණියක් නිර්මාණය කිරීමටයි.

මම අද ගියා බියගම ආසනයේ අර මළ ගෙදරට. මෙය ප්‍රචාරය කළේ එක්තරා මාධ්‍ය ආයතනයක් මගේ ආසනයේය කියලා. මා ඒ මළ ගෙදරට ගියාම ඒ මළ ගෙදර හිටපු හැමෝම මාව බදා ගෙන කිව්වේ, "ඔබතුමා ආදර්ශයක් දීලා තිබෙනවා" කියන එකයි. මම කිව්වා, "මේ ආදර්ශය මම දුන්නු දෙයක් නොවෙයි. ඒ ශ්‍රේෂ්ඨ සමෘද්ධි නිලධාරියා දුන්නු ආදර්ශයක්" කියලා. එය මම දුන්නු ආදර්ශයක් නොවෙයි. මම යමක් කරන්න යන කොට එතුමා තමයි -[බාධා කිරීමක්] ඒ ලියුම මගේ ළඟ තිබෙනවා. මම එය ඉදිරිපත් කරන්නම්. ඒ මළ ගෙදර මනුස්සයා කිව්වේ, "මේ දරුවා දැන් මැරිලා. අන්න මගේ අනෙක් දරුවා -පළමු වැනි ශ්‍රේණියේ දරුවා- ඉස්පිරිතාලයේ ගෙන ගිහිල්ලා. දැන් ඔහු පණ අදිනවා blood count එක බැහැලා" කියලායි. ඒ, තමන් තුරුලු කර ගෙන ඉන්න දරුවා, තමන් කිරි දීලා හදන දරුවා, තමන් අතින් අල්ලා ගෙන ඉස්කෝලෙ ගෙන යන දරුවා, තමන්ගේ දෑස වාගේ ආරක්ෂා කරන දරුවා. අපේ මේ ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ දරුවා එක වරක් ඒ රෝගයෙන් පෙළිලා ආසිරි ආරෝග්‍ය ශාලාවේ ප්‍රතිකාර ලැබුවා. එතුමා ඒ දරුවාගේ ජීවිතය බේරා ගැනීම වෙනුවෙන් කාලය ගත කරපු හැටි මගේ ඇස් දෙකෙන් දැක්කා. ඩෙංගු රෝගය වැළඳිලා මගේ මල්ලිගේ දුවගේ අවුරුදු තුනක්වත් නැති පුතාගේ පණ ගියේ මගේ අත් දෙකේමයි Jayawardenepura Hospital එකේදි. අම්බලන්තොට තමයි ඒ ගොල්ලන් ඉන්නේ. ඒ වේදනාව මා වටා කැරකෙනවා. ඒ වේදනාව මම දන්නවා. ඒ මුළු පවුලත් එක්ක මම ඒ වේදනාව අවුරුදු ගණනක් වින්දා. මම දරුවන්ට ආදරෙයි. සමහර දේශපාලනඥයෝ දරුවන්ට ආදරේ නැහැ, ගෑනුන්ට ආදරෙයි. ගෑනුන්ට ආදරේ වන්න ඕනෑ. හැබැයි ඒ තමන්ගේ බිරිඳට. බිරිඳට වාගේම දරුවන්ටත් ආදරේ වන්න ඕනෑ. නමුත් අල්ලපු ගෙදර කාන්තාවට සහ හොරාට තියා ගෙන ඉන්න ගෑනිට ආදරේ කරලා වැඩක් නැහැ. අපි දරුවන්ටත්, බිරිඳටත් ආදරේ කරන උදවිය.

ඒ දෙමවුපියන්ගෙන් වැටෙන කඳුළු බලා ගෙන භූතාත්මවල සිටින මිනිස්සු වාගේ අපි නිකම් සිටියොත් අපට පඩිසන් දෙයි; සහ ගහයි. කැලණියට ගිහිල්ලා බලන්න. අපි එක්සත් ජාතික පක්ෂයේ දොන් ස්ටීවන් සේනානායක මැතිතුමාට ගෞරව කළ යුතුයි. එදා මැලේරියාව වෙනුවෙන් එතුමා පොලොන්නරුව, මිනිපේ වැනි පළාත්වලට ගිහිල්ලා කළ සේවය අපි අගය කළ යුතුයි. එතුමා මැලේරියාව මර්දනය කළා. ඒක නැති කළා. කවුරු හොඳ දේ කළත් අපි හොඳයි කිව යුතුයි. දැන් ඩෙංගු මරණ කොච්චරද? 200කට ආසන්න ගණනක් වෙලා තිබෙනවා. ලෙඩ්ඩු 25,000ක් සිටිනවා. ඇයි, මෙහෙම වෙන්නේ? තමන්ගේ ගෙදර පිළිකන්න තමන් ශුද්ධ කර ගන්න ඕනෑ. තමන්ගේ මිදුල පිරිසිදු කර ගන්න ඕනෑ. ඇළ ශුද්ධ කර ගන්න ඕනෑ. දේශපාලනඥයෝ ශුද්ධ කරවන්න ඕනෑ. පන්සල, පාසල, පල්ලිය, කෝවිල ශුද්ධෙන් තියන්න ඕනෑ. මහා මාර්ගය ශුද්ධෙන් තියන්න ඕනෑ. අතුරු පාරවල් ශුද්ධෙන් තියන්න ඕනෑ. මට චෝදනා කළ උදවිය මාත් එක්ක කැලණියට යන්න එන්න. එක කුණු කැල්ලක් තිබුණොත්-[බාධා කිරීමක්]

එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් දිවි පිදූ ඒ ශ්‍රේෂ්ඨ මිනිසා - මගේ මිත්‍රයා - ඒ කාලයේ මම දන්නවා. මම යූඑන්පී එකේ සිටියා නම්, හරි නම් petrol කෑන් එක ගෙනැත් දීපු එකා ගස් බඳින්න ඕනෑ. දකුණේ මිනිහෙක් මැරුණේ. ඇයි මැරුණේ? නිකම්ද? වාචාලකමට කට දොඩවනවා; නායකත්වය ඉවත් කරන්න ඕනෑය කියනවා; අරයා රජ කරවන්න ඕනෑය කියනවා. අපට පුළුවන් තාප්පයක් බඳින්න, අපට පුළුවන් කොන්ක්‍රීට් එකක් ගහන්න. නමුත් කටට කොන්ක්‍රීට් ගහන්න බැහැ. ජනතා විමුක්ති පෙරමුණ ඒ ගොල්ලන්ගේ භීෂණ කාලය තුළ හොඳ වැඩක් කළා. එදා මේ කෑ ගහන කිසි කෙනෙක් සිටියේ නැහැ. එක මහත්මයෙක් සිටියේ නැහැ. කට කැපුවා; මරලා ගස්වල බැන්ඳා. කවුරුවත් නැහැ. එහෙත් එදා අපි කථා කළා. ඒක නිසා ප්‍රේමදාස මැතිතුමාගේ ආණ්ඩුවෙන් -එතුමාගේත් සම්බන්ධය ඇතිව- මගේ මල්ලියි, නංගියි, මස්සිනායි තුන් දෙනා එක තැන මරා දැමුවා. මට වෙඩි වැදුණා. විජයදාස රාජපක්ෂ මැතිතුමන් සාක්ෂි දරනවා ඇති. මරණ තුනක් තුරුළු කර ගෙන තමයි මම මේ දේශපාලනය කරන්නේ. එම නිසා මට මොනවා කිව්වත් මම වෛර කරන්නේ නැහැ.

අනික් එක ගණිකා වෘත්තියේ යෙදෙන කෙනෙක් පතිවත ගැන කථා කිරීම විශාල වරදක්. මම Library එකේ ඉඳ ගෙන පොතක් බැලුවා. පොතේ නම මොකක්ද? නොපනත් ක්‍රියා කලාපයන් පිළිබඳ සටහන් පොත. මේකේ හොඳ කථාවක් තිබෙනවා, එක්තරා ප්‍රබුද්ධ පුද්ගලයෙක් ගැන. එතුමා කසාද බැන්ඳා. බැඳලා බිරිඳ හිල්ටන් එකේ කේක් එකක් වාගේ පැත්තකින් තැබුවා. උගත් දැනුවත් තරුණ කාන්තාවක්. මේ උගත් කෙනාට තරුණයන් පිළිබඳ වහ වැටීමක් තිබුණා. බිරිඳ ගෙදර නිවාඩු ගත කරනවා. තරුණයෝ පිළිබඳ ඇල්මක් ඇති වෙලා එතුමා තරුණයෝ පස්සේ යන්න ගියා. ගෙදර බිරිඳ හූන්දැවා; දුක් වුණා. යහමග යන්න සිටි තරුණයෝ, ඉතිහාසගත වන රටේ නායකත්වය ලබන තරුණයෝ මේ පුද්ගලයා තමන්ගේ වසඟයට ගත්තා. මේ පොත මම කියවා ගෙන යන විට තමයි මට කිව්වේ අන්න රනිල් වික්‍රමසිංහ මැතිතුමා මොනවාද කියනවා කියලා. එක පාරට මට මැවී පෙනුණු පික්චර් එක තමයි විජයදාස ලියනාරච්චි කියන ගිරුවාගම් දොළොස්දාහේ මාගම් පත්තුවේ ඉපදුණු නීතිඥවරයා තංගල්ලෙන් ගෙනැල්ලා බටලන්දේ මරා දැමූ සිද්ධිය. ජීවිත කීයක් විනාශ කළාද? තරුණයෝ කොච්චර මැරුවාද? මොකක්ද මේ වෛරය? ජනතා විමුක්ති පෙරමුණ එදා කෙළින් කථා කරපු නිසා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් එක්ක රටේ ආඥාදායකත්වයට විරුද්ධව කථා කරපු නිසා මරලා දැමුවා. ඒ දරු පවුල් අනාථ වුණා. ඒ දරු පවුල් නැති වුණා. ආදරණීය බිරිඳට එක මිනිහෙක් නොවෙයි, මිනිස්සු කිහිප දෙනෙක් එක්ක යන්න වරම් දුන්නා. මේවා හොඳද? මේවා කළ අයට දඬුවම් කිරීම වැරදිද? නැත. මම කාටවත් දඬුවම් කළේ නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා කථාව අවසන් කරන්න.

**ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව විනාඩියක් දෙන්න. අටමස්ථානය, සොළොස්මස්ථානය, පරාක්‍රම සමුද්‍රය, කලා වැව යන මේ ඓතිහාසික ස්ථාන තිබෙනවා. එදා රජවරු කිව්වා නම්

"ඔන්න මේ පරාක්‍රම සමුද්‍රය හඳාපල්ලා" කියලා තවමත් හැ‍ඳෙනවා. රජවරු තමන්ගේ නිර්භීතකම පෙන්නුවා. වැරදි කරන එකා උල තිබ්බා. රට පාවා දෙන එකා උල තිබ්බා. මේ රටේ අවුරුදු 30ක යුද්ධය යද්දී හමුදාව, පොලීසිය පාවා දීපු එක්සත් ජාතික පක්ෂයේ සමහර උදවිය ඉන්නවා.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

සුද්දාට පන්දම් ඇල්ලුවා. සදාචාර සම්පන්නකමක් නැති, දැනුත් රට රට ජනාධිපති මන්දිරයට ගිහිල්ලා සාකච්ඡා කරන කෙනෙක් හැටියට- [බාධා කිරීමක්] මා ඒ ගැන කනගාටු වනවා. ඒ විතරක් නොවෙයි, කොන්දක් නැහැ. කොන්දක් නැති නිසා ඇහේ පුස් එකක් නැහැ.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙන්න විස්තරය. මේ මම කළ වැඩක් නොවෙයි. මගේ ඍජුකම සහ වීරත්වය දැන ගෙන මේ ශ්‍රේෂ්ඨ සමෘද්ධි නිලධාරියා මට ලියුමක් ලියා තිබෙනවා. එහි මෙසේ සඳහන් වනවා. "කලාපයට ලබා දෙන ඍජු නායකත්වයට ආදර්ශයක් උදෙසා යම් කිසි වෙලාවක් සිය කැමැත්තෙන් ගසක බඳවා රටටම ඔබතුමාගේ..."- [බාධා කිරීමක්]

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඩොක්ටර් පොඩ්ඩක් ඉන්න.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

වැදගත් පවුලක කෙනෙක් හැටියට

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

වාගේ හැසිරෙන්න එපා. [බාධා කිරීම්] මම කථා කරනකම් ඉන්න. [බාධා කිරීම්] .

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහෙම කථා කරන්න දෙන්න පුළුවන්ද? එතුමාගේ ඒ ප්‍රකාශය හැන්සාඩ් වාර්තාවෙන් expunge කරන්න කියලා මා ඉල්ලා සිටිනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ස්ථාවර නියෝගවලට පටහැනි ප්‍රකාශ හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන ලෙසට මා නියෝග කරනවා.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
It should be expunged. අශීලාචාරයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
That should be expunged.

**ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
මගේ මේ කථාව අහ ගෙන ඉන්න බැහැ. මේ විරුද්ධවාදීන්ට කථා කරන්න දෙයක් නැහැ. පෙට්‍රල් දමලා මිනිහෙක් මරන්න උදවු කරපු උදවිය. පක්ෂ නායකයාත් එළවන්න හදන උදවිය. පිනට පාර්ලිමේන්තු ආපු කෙනෙක්. කිසිම වැදගත්කමක් නැති, පොතක් පතක් කියවලා නැති කෙනෙක්. මේ ගරු සභාවේ ඉන්නවා, වැදගත් උදවිය. ඒ නිසා මේ කථාවේදී විතරක් නොවෙයි, මේ ගොල්ලන් නිතරම හදනවා ජාතිවාදය අවුස්සන්න. මේ උදවිය හදනවා, බොර දියේ මාළු අල්ලන්න. ඒ ඕනෑම දෙයකට අපි ලෑස්තියි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙන්න මම ලියුමේ කොටසක් කියවන්නම්. "කලාපයට ලබා දෙන ඍජු නායකත්වයට ආදර්ශයක් උදෙසා යම් කිසි වෙලාවක් සිය කැමැත්තෙන් ගසක බඳවා රටටම ඔබතුමාගේ කීම ආදර්ශයක් වීමට කැමැත්තෙන් ඉදිරිපත් වන බව ප්‍රකාශ කරමි." මම බැන්දේ නැහැ. මම තමයි ලිහුවේ. මම බැන්දේ නැහැ. අන්න ඒ වාගේ ශ්‍රේෂ්ඨ තරුණ සමෘද්ධි නිලධාරි මහත්වරු තමයි කැලණිය ආසනයේ ඉන්නේ. ඒ වාගේ ශ්‍රේෂ්ඨ නිලධාරින් තමයි ඉන්නේ. ඒ වාගේ උදවිය තමයි ඉන්නේ. අවසාන වශයෙන් මම කියන්නේ මෙච්චරයි. නයා කාපු එකාට විෂ නැත්නම්, නයාටත් විෂ නැත්නම් පැත්තක ඉන්න කේවට්ටයාට මොකක්ද තියෙන අමාරුව? මොකක්ද තියෙන අමාරුව? මේවායින් රජය අපහසුතාවට පත් කරන්න බැහැ. මේවායින් බැහැ. දැන් නොයෙක් වෙලාවලදී මේ ගොල්ලන් සටන් පාඨ හොයා ගන්නවා. කිසිම සටන් පාඨයකින් වරදක් කරන්න බැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා අවසන් කරන්න.

**ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
අවසාන වශයෙන් කියන්න තිබෙන්නේ මේකයි. අර වැලිගම මනුෂ්‍යයා මැරුණා. පෙට්‍රල් දමලා මැරුවා. අපි සටන් පාඨ ගෙන ගියේ නැහැ. [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා අවසන් කරන්න. ඔබතුමාගේ කාලවේලාව ඉවරයි. ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා.

[අ. භා. 3.43]

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අධිකරණ සංවිධාන පනතට සංශෝධනයක් ගෙනෙන මේ වෙලාවේ අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න අවස්ථාව ලැබීම ගැන මා සන්තෝෂ වනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ අධිකරණය කිව්වාම රටේ තිබුණේ ඉතාම භය පක්ෂපාතකමක්; ගරුත්වයක්. අපි දන්නවා කෙනෙක් උසාවියකට ඇතුළු වෙද්දී ඔළුව නමා ආචාර කරලායි ඇතුළු වෙන්නේ. අදින ඇඳුම ගැන සැලකිලිමත් වෙනවා. මම දැක්කා ඊයේ-පෙරේදාත් පත්තරයක පළ වී තිබුණා උසාවියේදී ජංගම දුරකථනයක් නාද වීම නිසා රුපියල් 500ක දඩයක් ගහලා තිබුණු සිදුවීමක් පිළිබඳව. සාමාන්‍ය ගැමියෝ උසාවියට යන කොට බුලත් විටක්වත් හපන්නේ නැහැ. ඒකත් නවත්වලායි යන්නේ. උසාවිය ඉස්සරහින් යද්දී වාහනයක නලාව හැඬෙව්වොත් ඒකට දඬුවම් කරනවා. පොලීසියේ මහත්වරු ඒ අයව උසාවියට ඉදිරිපත් කරනවා. එම නිසා අපේ රටේ අධිකරණය පිළිබඳව ඉතා විශාල භයක්, ගරුත්වයක් සහ ඒ පිළිබඳ සැලකිල්ලක් තිබුණා. නමුත් අධිකරණ සංවිධාන පනතට සංශෝධන ගෙනෙන මේ වෙලාව වනකොට දේශපාලනය ගැන, නීතිය ගැන දැනුම් තේරුම් තිබෙන අය තුළ විතරක් නොවෙයි සාමාන්‍ය මිනිහෙකු තුළවත් අපේ රටේ අධිකරණ පද්ධතිය ගැන ගරුත්වයක්, විශ්වාසයක් නැති බව අපි දකිනවා. අධිකරණ පද්ධතිය අද හැල්ලු වෙලා තිබෙනවා. ඒ පිළිබඳව නිදර්ශන අද මේ පාර්ලිමේන්තුවේත් ඉදිරිපත් වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනතාව වෙනුවෙන් යුක්තිය ඉෂ්ට කිරීමේ වගකීම මේ පාර්ලිමේන්තුව විසින් පවරා තිබෙන්නේ අධිකරණයට. ඒ ගැන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත් ව, ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්නා වූ තහවුරු කරන්නා වූ සහ බලගන්වන්නා වූ යුක්තිය පසිඳලන ආයතනය වන්නේ අධිකරණය කියලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වනවා. නමුත් මේ පිළිබඳ තත්ත්වය මොකක්ද? ඒ ගැන කරුණු කිහිපයක් කියන්න මා කල්පනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණය හැල්ලු වෙච්ච කරුණු ගැන අදහස් කියන්න කලින් මම කල්පනා කරනවා, අද ගරු අධිකරණ ඇමතිතුමා ගෙනාපු මහාධිකරණ විනිසුරුවරුන් සංඛ්‍යාව වැඩි කරන තීන්දුව ගැනත් අදහසක් කියන්න. ඒක හොඳ දෙයක්. ඒකට අපේ සහයෝගය තිබෙනවා. නඩු ක්ෂේත්‍රයේ පවතින හිරවීම, තදබදය වළක්වලා සාමාන්‍ය ජනතාවට සහනයක් දෙන්න ඒ කරන දේ හොඳයි. නමුත් ඒ ගමන්ම අපි ඔබතුමන්ට මතු කරනවා මහාධිකරණ විනිසුරුවරුන් මුහුණ දීපු තත්ත්වයන් ගැන. විශේෂයෙන් ඔවුන්ගේ වැටුප් ප්‍රශ්න, විශ්‍රාම වැටුප් ප්‍රශ්න තිබෙනවා. මහාධිකරණ විනිසුරුවරුන් සංඛ්‍යාව වැඩි කළත් අද ඒ විනිසුරුවරුන්ට අවශ්‍ය මූලික නවාතැන් පහසුකම් -නිල නිවාස- ප්‍රමාණවත්ව තිබෙනවාද? මහාධිකරණ විනිසුරුවරුන් සංඛ්‍යාව වැඩි කිරීම කරන අතරේ ඒ පිළිබඳව අවධානය යොමු කළාද කියන ප්‍රශ්නයත් මා අහනවා.

ඒ විතරක් නොවෙයි. විශේෂයෙන්ම මා මතක් කරනවා, අද උතුරු නැඟෙනහිර පළාතේ සිවිල් අයිතිවාසිකම්, සිවිල් නීතිය, සාමාන්‍ය නීතිය ක්‍රියාත්මක කළ යුතු තත්ත්වයක් තිබුණත්, ඒ ජනතාව නිදහස් කර ගත්තාය කියලා කිව්වත්, සාමාන්‍ය නීතිය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වයක් නැහැ කියලා. එම නිසා මා මේ අවස්ථාවේ උතුරු නැඟෙනහිර පළාතේ සිවිල් නීතිය ක්‍රියාත්මක කරන්නය කියන බලපෑම, ඉල්ලීම කරන අතරේ වවුනියාව මහාධිකරණය ගැන ඔබතුමාගේ අවධානය යොමු කරනවා. මේ කාරණය වැරදි නම් ඔබතුමා නිවැරදි කරන්න. මා දන්නා තරමට වවුනියාව මහාධිකරණයේ අද ඉන්නේ සිංහල විනිසුරුවරයෙක්. නමුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 22වන ව්‍යවස්ථාවට අනුව උතුරු නැඟෙනහිර පළාතේ භාෂාව මොකක්ද? උතුරු නැඟෙනහිර පළාතේ පරිපාලන භාෂාව දෙමළ. අද දෙමළ ජනතාවට අයිතිවාසිකම් ලබා දීම කළ යුතු තත්ත්වයක් තුළ වුවත් ඒ ප්‍රදේශයේ අධිකරණමය කටයුතු කිරීමේදීවත් ඔවුන්ට සාධාරණ මැදිහත් වීමක් නැහැ. ඒක එම විනිශ්චයකාරතුමාගේ වරදක් නොවෙයි. එහි හිටපු දෙමළ විනිශ්චයකාරතුමා වෙනුවට අද සිංහල විනිසුරුවරයෙක් ඉන්නේ. මහාධිකරණ විනිසුරුවරුන් සංඛ්‍යාව වැඩි කරන අද මේ වෙලාවේ උතුරු නැඟෙනහිර පළාතේ ජනතාවට ඔවුන්ගේ භාෂාවෙන්, ඔවුන් භාවිත කරන භාෂාවෙන් අධිකරණ කටයුතු කර ගන්න අවශ්‍ය මැදිහත් වීම, පහසුකම දෙන්න කියන ඉල්ලීමත් මා මේ අවස්ථාවේදී කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහාචාර්ය ජී.එල්. පීරිස් ඇමතිතුමා මගේ ගුරුවරයෙක් නොවුණත්, එතුමාගෙන් ඉගෙන ගන්න නොලැබුණත් එතුමාගේ පොත පත පරිහරණයෙන් ඉගෙන ගත්ත ශිෂ්‍යයෙක් විධියට මා මේ කාරණය කියන්න ඕනෑ. මහාචාර්ය ජී.එල්. පීරිස් ඇමතිතුමා එතුමාගේ කථාවේදී කාරණයක් ඉදිරිපත් කළා. මා හිතන හැටියට එතුමා ඒ කාරණය ඉදිරිපත් කළේ ආණ්ඩුවට. එතුමා කිව්වා, "මේ විනිසුරුවරුන්ට එල්ල වන විවේචන සහ නීතිය පිළිබඳව කරන ප්‍රශ්න කිරීම නිසා අද අපි විදේශ රටවල්වලදී විවිධ තාඩන පීඩනවලට ලක් වනවා. අපේ රටට බලපෑම් කරන්න ඉන්න අයට එයින් අවස්ථාවක් ලැබෙනවා" කියලා. මා හිතන හැටියට මහාචාර්ය ජී.එල්. පීරිස් ඇමතිතුමාට ආණ්ඩුවට කියන්න තිබෙන එකක් වක්‍රාකාරයෙන් අපට කිව්වා; විරුද්ධ පක්ෂයට කිව්වා. එතුමාට මේක ආණ්ඩුවට කෙළින් කියන්න බැහැ. එතුමාගේ කථාව කියන්න ඕනෑ අපට නොවෙයි. මේ කථාව කියන්න ඕනෑ මේ ආණ්ඩුවේ අධිකරණ පද්ධතියේ හැසිරීමේ අඩු පාඩුව ගැන විවේචන ඉදිරිපත් කරන විරුද්ධ පක්ෂයට නොවෙයි; ආණ්ඩුවටයි. මේක ආණ්ඩුවට කියන්න ඕනෑ කථාවක්. ඇයි එහෙම වන්නේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය දවස්වල ආන්දෝලනයට ලක් වෙච්ච කථාවක් තිබෙනවා. අධිකරණයේ විශ්වාසවන්තභාවය, ගරුත්වය ආරක්ෂා කරමින් කටයුතු කරන විනිසුරුවරුන් විශාල ප්‍රමාණයක් ඉන්නවා. අපි ඒ අයට ගරු කරනවා. ඒ අතරේ අධිකරණය තුට්ටුවකට මායිම් නොකර, නීතිය කැලෑ නීතිය බවට පත් කරන විනිසුරුවරුනුත් මේ අධිකරණ පද්ධතියේ ඉන්නවා. ඔබතුමන්ලා ඒ ගැන දන්නවා. එහෙම උදාහරණ ඕනෑ තරම් තිබෙනවා. මෑත කාලයේ උදාහරණයක් මා කියන්නම්. මේ විනිසුරුතුමාගේ නම මා කියන්නේ නැහැ. ඒ නම කවුරුත් දන්නවා. රටම දන්නවා. මේ ළඟ දී ඒ අභියාචනාධිකරණ විනිසුරු තුමා-

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 78 වන ස්ථාවර නියෝගය යටතේ විනිශ්චයකාරවරුන්ගේ පැවැත්ම ගැන සඳහන් කරන්න බැහැ.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ඔබතුමා ඉතින්,-[බාධා කිරීමක්] අද සාකච්ඡා කරන විෂයය, අධිකරණය සම්බන්ධ එකක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාට වෙනත් රාජකාරියක් නැහැ. තම තනතුර උසස් කර ගන්න එතුමාට තිබෙන රාජකාරිය ඕක තමයි.

පොලිස් නිලධාරින්ට, අධිකරණ නිලධාරින්ට, ඒ වාගේම ප්‍රදේශයේ හිටපු හාමුදුරු නමකට වෙඩි තියන්න දහලපු විනිසුරුතුමෙක් පසු ගිය දවසක මොකක්ද කළේ? නුවරඑළියේ ශාන්තිපුර ඉඳලා තමන්ගේ ගෙදර සේවයට ආපු කාන්තාව මැයි

[ගරු අජිත් කුමාර මහතා]

මාසයේ 28 වැනි දා දූෂණය කළා. මේ පිළිබඳව ජුනි මාසයේ 28 වැනි දා ළමා හා කාන්තා කාර්යාංශයට පැමිණිල්ලක් ඉදිරිපත් කරලා තිබෙනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
හැම දාම ඔබතුමාගේ රීති ප්‍රශ්න. වෙන job එකක් නැහැ නේ. ඔබතුමා අනුන්ට රීති ප්‍රශ්න ඉදිරිපත් කරනවා. තමුන් කථා කරන්න දන්නේ නැහැ.

ඒ ගැන වෛද්‍ය වාර්තා ඉදිරිපත් කරලා තිබෙනවා. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ලලිත් දිසානායක ඇමතිතුමා ඉඳ ගන්න.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
( மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Hon. Deputy Speaker, you should not allow the Hon. Member to violate the Standing Orders. He is making direct references to the conduct of a judge who is still serving. The Hon. Member cannot make these types of vilifications against judges who are engaged in the administration of justice. He is directly accusing him of committing that sin.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම නමක් සඳහන් කළේ නැහැ. ඒ වාගේම මෙහෙම නොපණත්කම් කරන මිනිස්සු ගැන කියන්න බැරි නම් මේ පාර්ලිමේන්තුවෙන් වැඩකුත් නැහැ. අද ජී.එල්. පීරිස් ඇමතිතුමා, අපේ මහාචාර්යතුමා කිව්වා මේ රටේ විනිසුරුවරුන් පිළිබඳව කථා කිරීමෙන් අපි ලෝකය ඉස්සරහ අවමානයට ලක් වනවා කියලා. එහෙම නම් මම ඔබෙන් ඉල්ලා සිටිනවා, ඉස්සරවෙලාම මෙවැනි විනිසුරුවන් පිළිබඳව තීන්දු ගන්න කියලා. [බාධා කිරීම්] ලෝකය ඉස්සරහ අපේ රට අවමානයට ලක් කරන්නේ අපි නොවෙයි. මෙවැනි විනිසුරුවන්. ඒ නිසා මේ වාගේ නොපණත්කම් කරන, තරුණියන් දූෂණය කරලා බලපෑම් කරන ඒ විනිසුරුවන් පිළිබඳවත් තීන්දුවක් ගන්න කියලා මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණයට අපහාස කරනවා කියලා මෙතුමන්ලා කියනවා. අධිකරණයට අපහාස කරන්නේ කවුද? අද අධිකරණයට අපහාස කරන්නේ ආණ්ඩුව. ගරු කථානායකතුමා ජෙනරාල් සරත් ෆොන්සේකා මැතිතුමාට පාර්ලිමේන්තුවට එන්න අවශ්‍ය නියෝගයන් දුන්නා. ඒ නියෝගය උල්ලංඝනය කරමින් හමුදාපතිවරයා සහ අනෙකුත් නිලධාරින් පාර්ලිමේන්තු වරප්‍රසාද උල්ලංඝනය කරමින් එතුමාට පාර්ලිමේන්තුවට එන්න ඉඩ දුන්නේ නැහැ. ඒ නිසා පාර්ලිමේන්තුව හෑල්ලු කළා. [බාධා කිරීම්] ඉන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තු උපදේශක කාරක සභා කියන්නේත් පාර්ලිමේන්තු කටයුතු. මේ හවුස් එකේ ඒ ඔක්කොම කථා කරන්න බැරි නිසා තමයි වෙනම කාරක සභා කැඳවන්නේ. ඒවාත් පාර්ලිමේන්තු කටයුතු. එතුමාට ඊයේ ඒකට එන්න බැරි වුණා. මීට කලින් අවස්ථා ගණනාවක් එන්න බැරි වුණා. ඒ පිළිබඳව අධිකරණයට වාර්තා කළාට පස්සේ මහේස්ත්‍රාත් අධිකරණයත්, මහාධිකරණයත් එතුමාට පාර්ලිමේන්තුවට එන්න ඉඩ දිය යුතුය කියලා නියෝග කළා. අද අධිකරණයට අපහාස කරන්නේ කවුද? ජනාධිපතිවරයා යටතේ සිටින හමුදාපතිවරයා ඇතුළු ආරක්ෂක අමාත්‍යාංශයේ බලධාරින්. ඒ නිසා අධිකරණයට අපහාස කරන ඒ අය ගැන තීන්දුවක් ගන්න ජනාධිපතිතුමාටත්, අධිකරණ ඇමතිතුමාටත් මේ පාර්ලිමේන්තුවටත් වග කීමක් තිබෙනවා. අධිකරණවලින් දීපු තීන්දු පවා උල්ලංඝනය කරමින් අද එතුමාට මන්ත්‍රීවරයකු විධියට සහ මේ රටේ පුරවැසියකු විධියට තිබෙන අයිතිය අහිමි කර තිබෙනවා. ඒ නිසා අධිකරණයට අපහාස කරන්නේ වෙනත් කවුරුවත් නොවෙයි, මේ ආණ්ඩුව විසින්ම හසුරුවන රාජ්‍ය තාන්ත්‍රික නිලධාරින් කියන එක මම මේ අවස්ථාවේ මතක් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම මම තවත් කරුණක් ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. මේ රටේ රණ විරුවෝ ගැන අපි කථා කරනවා. හමුදා සෙබළුන් කරපු කැප කිරීම ගැන කථා කරනවා. මම මේ අවස්ථාවේ **සභාගත*** කරනවා බුත්තල පොලීසියේ නිලධාරින් හතර දෙනකු විසින් හමුදා සෙබළියක් දූෂණය කරපු කාරණයට අදාළ වෛද්‍ය වාර්තාව.

අද නීතියේ ආධිපත්‍ය බරපතළ විධියට හෑල්ලු වෙලා තිබෙනවා. නීතිය පිළිබඳව අබමල් රේණුවකවත් විශ්වාසය නැති වෙලා තිබෙනවා. මෙවැනි අසාධාරණ අශික්ෂිත, පහත් වැඩවලට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරන්න මැදිහත් වන්න කියලා මා අධිකරණ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ කාරණය මා ඔබතුමාගේ අවධනයට යොමු කරනවා.

ඒ වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දන්නවා අද රටේ විශාල ආන්දෝලනයකට ලක් වෙච්ච කාරණයක් තමයි නීතිය ක්‍රියාත්මක වීම. අද නීතිය සම්පූර්ණයෙන්ම හසුරුවන්නේ දේශපාලන අධිකාරියකින්. අද විනිසුරුවරුන්ට බලපෑම් කරනවා. තමන්ට ඕනෑ විධියට නඩු විභාග කරන්න අවශ්‍ය කටයුතු සැලසුම් කරලා තිබෙනවා. තමන්ගේ විරුද්ධවාදීන් මර්දනය කරන්න නීතියේ ආධිපත්‍ය යොදා ගන්නවා. [බාධා කිරීම්] නිදර්ශන කියන්නම්. බොහොම හොඳයි. ගරු අස්වර් මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ නිකම් කයිවාරු ගහනවා. මම නිදර්ශනයක් කියන්නම්. මෙන්න නිදර්ශනය. පොඩ්ඩක් අහ ගන්න. නිශ්ශබ්දව, පාර්ලිමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙකු හැටියට තිබෙන ගරුත්වය ආරක්ෂා කර ගෙන අහ ගන්න. [බාධා කිරීම්] බාධා නොකර අහ ගන්න. මේ පුංචි එකා කියන එක අහ ගන්න කෝ, ජ්‍යෙෂ්ඨයා. හරි, අහ ගන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද නීතිපති දෙපාර්තමේන්තුව ජනාධිපතිතුමා යටතට අරගෙන තිබෙනවා. කොහොමද අරගෙන තිබෙන්නේ? මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය යටතට. මා අහනවා, නීතිපති දෙපාර්තමේන්තුවයි, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයයි අතර තිබෙන සම්බන්ධතාව මොකක්ද කියලා. නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව අරගෙන තිබෙනවා, ජනාධිපතිතුමාගේ යටතට. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා ඇති, මීට මාස හයකට කලින් අම්බලන්ගොඩ නගරයේ ශ්‍රේෂ්ඨ ගුරුවරයකු වූ නාගරික මන්ත්‍රීවරයකු ඝාතනය කළා. ජනවාරි මාසයේ 25 වනදා ජනාධිපති ආරක්ෂක අංශයේ නිලධාරින්ගේ මැදිහත් වීමෙන් පහර දීලා අම්බලන්ගොඩ පොලීසියට භාර දුන්නා. භාර

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

දීලා දවස් කිහිපයකට පසුව පෙබරවාරි මාසයේ දෙවෙනිදා මිය ගියා. අධිකරණයට වෛද්‍ය වාර්තාවක් ඉදිරිපත් වුණා. මා ඒ නඩුව ගැන කථා කරන්නේ නැහැ. ඒ වෛද්‍ය වාර්තාවෙන් කිව්වේ, ඔහු මිය ගියේ පහර දීමෙන් කියලායි. නමුත් මාස පහක් තිස්සේ ඒ සැකකරුවන්ව අත් අඩංගුවට ගත්තේ නැහැ. තවමත් නිදැල්ලේ සිටිනවා. මෙන්න මේ රටේ නීතියට කරන බලපෑම. අහ ගන්න මන්ත්‍රීතුමනි. ඊට පසුව මොකක්ද වෙන්නේ? ජූලි මාසයේ දෙවෙනි දා අම්බලන්ගොඩ නගරයේ දාහකට අධික පිරිසක් උද්ඝෝෂණය කළා. ජූලි මාසයේ පස් වැනිදා නැවත බලපිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුව කැඳෙව්වා. මහේස්ත්‍රාත්තුමිය දෙවන වරටත් නියෝග කළා, සැකකරුවන් අත් අඩංගුවට ගන්න. මෙන්න එතකොට නීතිපති දෙපාර්තමේන්තුවෙන් එනවා, ෆැක්ස් පණිවුඩයක්. අම්බලන්ගොඩ සම්බන්ධීකරණ කමිටුවේ දී පොලිස් නිලධාරියකු ඒක ඉදිරිපත් කළා. මොකක්ද එන ෆැක්ස් පණිවුඩය? නීතිපති දෙපාර්තමේන්තුව පොලීසියට නියෝග කරනවා, පරීක්ෂණ කටයුතු වහාම නවත්වන්නය කියලා. අභියෝග කළා නේ එක නිදර්ශනයක් කියන්න කියලා. ඔන්න, එක නිදර්ශනයක්. නීතිපති දෙපාර්තමේන්තුව තිබෙන්නේ ජනාධිපති යටතේ. ජනාධිපතිතුමාගේ ගෝල බාලයන් ටිකක් සිටිනවා, නීතිපති දෙපාර්තමේන්තුවට ඇඟිලි ගහන. ඒ ගෝල බාලයන් මොකක්ද කළේ? නීතිපති දෙපාර්තමේන්තුවට බලපෑම් කරලා, පොලීසියට නියෝග කළා, පරීක්ෂණ කටයුතු වහාම නවත්වන්න කියා. දැන් ඒ නඩුව ඉවරයි, පරීක්ෂණ නැවැත්තුවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා ඇති, පසුගිය පළාත් සභා -

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
කොහොමද දන්නේ? [බාධා කිරීමක්]

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ඔබතුමාගේ රාජකාරිය හට්ටි මුට්ටි හෝදන එක නේ. ඒක කර ගෙන යන්න. මම කිව්වේ, නීතිපති දෙපාර්තමේන්තුව හසුරු වන්නේ ජනාධිපති කියලායි. ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා කිව්වා, නීතිය ගැන. එතුමාගේ පියාණන් ජනාධිපතිතුමා. අපි කියනවා, ගිහින් මතක් කරන්නය කියලා. නීතිපති දෙපාර්තමේන්තුවට වග කියන ප්‍රධානියා ජනාධිපතිතුමා නම්, නීතිපති දෙපාර්තමේන්තුවෙන් කරන ඒ සදාචාර විරෝධී, නීති විරෝධී වැඩේට විරුද්ධව කටයුතු කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට ගම්පහ දිස්ත්‍රික්කයේ දී ඝාතනය කළා, නන්දන බාලගේ සහෝදරයා. ඔහු ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාකාරිකයෙක්. නඩුවට මොකද වුණේ? හිටපු නියෝජ්‍ය ඇමතිවරයකුට චෝදනා එල්ල වුණා. අද නීතිපති දෙපාර්තමේන්තුව නඩුවට මොකද කරන්නේ? දේශපාලනය සම්බන්ධ නඩු සියල්ලම අද නීතිපති දෙපාර්තමේන්තුව තමන්ගේ අණසක යටතට අරගෙන තමන්ට වුවමනා විධියට හසුරුවනවා. නීතිපති දෙපාර්තමේන්තුව ජනාධිපතිවරයා යටතට ගත්තේ මේක නිසයි. හිටපු අධිකරණ ඇමතිතුමකු වන, ආණ්ඩුවේ වර්තමාන විදේශ කටයුතු ඇමතිතුමා වන ගරු ජී.එල්.පීරිස් මහාචාර්යතුමනි, විදෙස් රටවලට ගියාට පසුව තමුන්නාන්සේ හැල්ලුවට පත් වන්නේ -මේ රට හැල්ලුවට පත් වන්නේ- පාර්ලිමේන්තුවේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් කරන කරුණු දැක්වීම නිසාද, මේ ආණ්ඩුව කරන වැඩ නිසාද කියලා එහෙනම් අපි ඔබතුමාගෙන් අහන්න කැමැතියි. අධිකරණය දීපු තීන්දුවලට ගරු නොකර, අධිකරණයේ විනිසුරුවරුන්ට හරියට කටයුතු කරන්නට දෙන්නේ නැතිව, මහාධිකරණ විනිසුරුවරුන් 75ක් දක්වා වැඩි කළාට වැඩක් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මා ඒ කාරණය මේ ගරු සභාවේ දී මතක් කරන්නට ඕනෑ.

ඒ වාගේම අපි දන්නවා, විශ්ව විද්‍යාල ශිෂ්‍යයකු ඝාතනය කළ බව. අද ඒ නඩුත් හාමුදුරුවන්ගේ, බඩුත් හාමුදුරුවන්ගේ වෙලා. පැමිණිලිකාරයා, විත්තිකාරයා බවට පත් වෙලා. විත්තිකාරයා, පැමිණිලිකාරයා බවට පත් වෙලා. මේ රටේ අයුක්තියට ඉඩ දීලා, නීතියට, යුක්තියට කැළෑ වදින්නට ඉඩ දීලා තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය ඇමතිවරයකු වන මර්වින් සිල්වා මහත්මයා කථා කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ නීතිය ඉටු වන්නේ ඔහොමද? කැළෑ නීතිය ඉවරයි කියලා නාමල් රාජපක්ෂ මැතිතුමා කිව්වා. ඒ කථාව කරලා ඉවර වෙලා එතුමා ඇවිල්ලා මර්වින් සිල්වා මහත්මයාත් එක්ක කථා කර කර සිටියා. ඊට පසුව මර්වින් සිල්වා මහත්මයා කථා කරලා කියනවා, "ඔව්, මම එහෙම කළා තමයි" කියලා. දැන් පුදුම කථාවක් තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගාල්ල දිස්ත්‍රික්කයේ තිබුණා, සුප්‍රසිද්ධ නඩුවක්. ඒ තමයි කුලරත්න නඩුව. එම නඩුවේ අන්තිමට තීන්දු වුණේ මොකක්ද? මිනී මැරුවේ කවුද? වංගෙඩිය. දැන් සමෘද්ධි නිලධාරියා කියනවා, "මම කැමැත්තෙන් ගස් බැඳුණේ" කියලා. පුදුම කථාවක්. මේ රටේ රාජ්‍ය සේවකයා ගැන මහින්ද චින්තනයෙන් මොකක්ද කිව්වේ? රාජ්‍ය සේවකයන්ට පර්චස් 10කට වැඩි ඉඩම් කැබැලි 25,000ක් දෙනවාය කියලා කිව්වා. රාජ්‍ය සේවකයන්ට වැටුප් වැඩි කරනවාය කියලා කිව්වා, සහන දෙනවාය කියලා කිව්වා. මෙන්න දැන් රාජ්‍ය සේවකයන් ගස් බඳිනවා. මට ගමේ කෙනෙක් කිව්වේ මොකක්ද ගරු නියෝජ්‍ය කථානායකතුමනි? මේ රටේ ඩෙංගු රෝගය මර්දනය කරන්න නම් ඉස්සෙල්ලාම ගස් බඳින්නට ඕනෑ සෞඛ්‍ය ඇමතිවරුන්, ඊට පස්සේ ගස් බඳින්නට ඕනෑ මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරුන්, ඊට පස්සේ ගස් බඳින්නට ඕනෑ පළාත් පාලන ආයතන සභාපතිවරුන්, නගරාධිපතිවරුන් කියලා යි.

ඒ බවත් මතක් කරමින්, කැළෑ නීතියට විරුද්ධව මේ පාර්ලිමේන්තුවේ හඬ නඟන්නය කියා ඉල්ලා සිටිමින්, මේ ආණ්ඩුවේ වළං හෝදන, බොරු කයිවාරු ගහන, බොරු ජෝෂ්ඨකමක් පෙන්වන මේ මැති ඇමතිවරුන්ගේ ඒ සදාචාර විරෝධී ක්‍රියාවලට විරුද්ධව කටයුතු කරන්නය කියාත් ඉල්ලා සිටිමින් මගේ අදහස් කීපය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[பி.ப. 3.59]

**(ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා (නියෝජ්‍ය කාරක සභාපතිතුමා)**
(மாண்புமிகு முருகேசு சந்திரகுமார் - குழுக்களின் பிரதித் தவிசாளர்)
(The Hon. Murugesu Chandrakumar - Deputy Chairman of Committees)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நீதித்துறை திருத்தச் சட்டம் தொடர்பான இன்றைய விவாதத்திலே கலந்துகொண்டு, நீதித்துறை தொடர்பாக நான் கவனத்திற் கொண்டுள்ள சில விடயங்களைப்பற்றிக் கூற விரும்புகின்றேன். நீதி என்பது தனியே சட்டங்களால் மட்டும் வடிவமைக்கப்பட்டதல்ல. அது எங்களுடைய இதயத்திலும், எங்களுடைய வாழ்க்கையின் எல்லா அம்சங்களிலும் நிலைபெற்றிருக்க வேண்டும். அப்பொழுதுதான் நாட்டில் அமைதியும் மகிழ்ச்சியும் ஏற்பட்டு நாடு தன்னிறைவு பெறும். இந்த நாட்டிலே உள்ள மக்கள்மீது இனம், மதம், மொழி மற்றும் பிரதேசரீதியாக பாரபட்சமாகச் செயற்படுத்தப்படுகின்ற நீதித் துறை நடவடிக்கைகள் பற்றி நாம் எப்படிச் சொல்வது? இதற்கு என்ன அர்த்தம்? குறிப்பாக பாரபட்சமான, நீதிக்குறைபாடான சில நடவடிக்கைகள் காரணமாக எங்களது மக்களின் மனதிலே இருந்த குறைபாட்டின் காரணமாகவே இந்த நாடு பேரழிவுகளைக் கண்டது. இந்த நீதிக்குறைபாட்டின் காரணமான நிகழ்வுகளினாலே பல இலட்சம் உயிர்கள் பலியாகியிருக்கின்றன. இந்த நாட்டிலே

[ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා]

இதுவரை தீர்க்கப்படாமல் இருக்கின்ற பல பிரச்சினைகளுக்கு எங்களுடைய மனங்களிலும் எங்களுடைய சமூக வழக்கங்களிலும் இருக்கின்ற நீதிக் குறைபாடு தான் காரணமாகும். கடந்த அறுபது ஆண்டு காலமாக இந்த நாட்டிலே இத்தகைய குறைபாடுக ளுடனேயே ஆட்சி நடத்தப்பட்டு வந்திருக்கின்றது. ஆனால், இனிமேலும் இவ்வாறான நீதிக்குறைபாடுகள் ஏற்படுவதற்கு இடமளிக்க வேண்டாம். நாங்கள் எல்லோரும் இணைந்து இந்தக் குறைபாட்டைப் போக்குவதற்காக இக்காலகட்டத்தைப் பயன் படுத்திக் கொள்வோம்! இந்தச் சந்தர்ப்பத்திலே முன்மாதிரியான காரியங்களை மேற்கொண்டு, நமது நாட்டில் வரலாறு படைப்போம்!

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, போர் முடிந்த பின்னரும் வட பகுதியில் உள்ள மக்கள் இன்னமும் பல பிரச்சினைகளுக்கு முகங்கொடுத்தவண்ணமே இருக்கின்றார்கள். நேற்றைய தினம் இச்சபையிலே அவசரகாலச் சட்டத்தை நீடிப்பதற்கான விவாதம் இடம்பெற்றது. ஆனால் கிளிநொச்சி, முல்லைத்தீவு மாவட்டங்களில் அடுத்த மாதம் உருவாகக்கூடிய அனர்த்தங்கள் தொடர்பான அவசரகால நிலைமையைப் பற்றி நான் இன்று இங்கு குறிப்பிட விரும்புகின்றேன். அந்த மாவட்டங்களில் மீளக் குடியேறிய மக்கள் இன்னும் சில நாட்களில் அப்பிரதேசங்களில் பெய்யவிருக்கும் பருவ மழையினால் பெரிதும் பாதிக்கப்படப்போகின்றார்கள். அந்த மக்களுக்கான வீட்டு வசதிகள் இன்னமும் பூர்த்தி செய்யப்படாத நிலையிலேயே காணப்படுகின்றன. தற்காலிகமான வீடமைப்பு முயற்சிகள் இன்னமும் முழுமைபெறவில்லை. இதனால் மக்கள் பெரும் அனர்த்தத்துக்குள் சிக்கப்போகிறார்கள். அங்கே பல இடங்களில் மக்கள் தங்குவதற்குப் பாடசாலைக் கட்டிடங்கள்தானும் சீராக்கப்படவில்லை. மழை காலங்களில் பல பாடசாலைகள் இயங்க முடியாத நிலைமையிலேதான் இருக்கின்றன. ஆகவே எதிர்வரும் பருவ மழைக்காலம் அம்மக்களுக்கு மிகுந்த நெருக்கடியை ஏற்படுத்தும் அபாய நிலைமையே காணப்படுகிறது. இது அரசாங்கத்துக்கு நெருக்கடியை ஏற்படுத்தும் ஒரு முக்கியமான விடயமாகும்.

எந்த நாட்டிலும் தொடர்ந்துகொண்டிருக்கும் உள்நாட்டு நெருக்கடிகள் ஒரு காலகட்டத்தின்மேல் சர்வதேசத்தின் கவனத்தைப் பெறும் என்பதையும் பின்னர் அடுத்த கட்டமாக அது சர்வதேச அழுத்தமாக மாறும் என்பதையும் நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். அந்தவகையில் அகதிகளின் பிரச்சினையும் மீள்குடியேற்ற விவகாரமும் சர்வதேசத்தின் கவனத்துக்குரியவை என்பதை நான் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன். ஆகவே, உருவாகவிருக்கும் எந்த அனர்த்தத்துக்கும் இடமளிக்காதவகையில் நாம் நடந்துகொள்ளவேண்டும் என்பதையே நான் இங்கு கூறிவைக்க விரும்புகின்றேன். போரினால் பாதிக்கப்பட்ட மக்களை கூடியவிரைவில் உயர்வு நிலைக்குக் கொண்டு வருவதற்கான பொறுப்பை இந்தச் சபை - இந்த நாடு - நாட்டிலுள்ள அனைத்துக் கட்சிகளும் கட்சி பேதமின்றியும் பிரதேச வேறுபாடின்றியும் மேற்கொள்ள வேண்டுமென நான் இச்சந்தர்ப்பத்திலே கேட்டுக்கொள்ள விரும்புகின்றேன். இந்த ஆண்டுக்குள் அவர்களுக்கான வீட்டு வசதிகளை அளித்து மீள்குடியேற்றத்தை முழுமைப்படுத்துதல், தடுப்பு முகாம்களில் உள்ளவர்கள் அனைவரும் விடுதலை செய்யப்படுதல், அவர்களுக்கான தொழில் வாய்ப்புக்களை ஏற்படுத்திக் கொடுத்தல், அவர்கள் தங்கள் பிரதேசங்களில் வாழ்வதற்கான அடிப்படை வசதிகளை ஏற்படுத்திக் கொடுத்தல், போன்ற முக்கியமான நடவடிக்கைகளை நாம் எல்லோரும் கூடி மேற்கொண்டு, அவற்றுக்குத் தீர்வு காணவேண்டியவர்களாக இருக்கிறோம். இனப்பிரச்சினைக்கான தீர்வை நோக்கிப் பயணிக்கும் முதற்கட்ட நடவடிக்கையாகவும் ஒரு நல்ல முன்னுதாரணமான நடவடிக்கையாகவும் இவை அமையட்டும்! இது அமைதிக்கான பயணம் என்ற நம்பிக்கையையும் திருப்தியையும் எல்லோருக்கும் அளிக்கட்டும்!

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, ஒரே விடயத்தைத் திரும்பத் திரும்பக் கூறவும் விவாதிக்கவும் வேண்டிய துர்ப்பாக்கிய நிலையில் இந்தப் பாராளுமன்றம் இருக்கக்கூடாது என்று நான் இந்த மன்றைக் கேட்டுக்கொள்ள விரும்புகின்றேன். அபிவிருத்திப் பிரச்சினைகளாக இருக்கட்டும், ஜனநாயகம் தொடர்பான பிரச்சினைகளாக இருக்கட்டும், இனப்பிரச்சினை தொடர்பான விடயமாக இருக்கட்டும் அல்லது உறுப்பினர்களின் நடவடிக்கைகள் அல்லது அரசியல் கட்சிகளின் செயற்பாடுகள் தொடர்பான விடயங்களாக இருக்கட்டும். எதுவானாலும் அவற்றைப் பற்றித் திரும்பத் திரும்ப இந்த மன்றிலே விவாதிக்கின்ற ஒரு நிலை இருக்குமானால், இந்த மன்று அதன் அர்த்தத்தையும் அதனுடைய பெறுமானத்தையும் இழந்ததாகவே இருக்கும் என்பதை இங்கே சுட்டிக்காட்ட விரும்புகின்றேன். ஆகவே, நாங்கள் ஒரு புதிய மரபையும் ஒரு நல்ல நீதியான வாழ்வையும் கட்டியெழுப்ப வேண்டும் என்று கேட்டுக் கொள்கிறேன்.

இன்னொரு விடயத்தையும் நான் இங்கே கூற விரும்புகிறேன். அதாவது, இந்த மாண்புக்குரிய சபையிலே எதையும் பேசலாம், எப்படியும் பேசலாம் என்ற ஒரு போக்கு வளர்ந்துகொண்டு செல்வதைக் காணக்கூடியதாக இருக்கின்றது. கருத்துக்களை முன்வைப்பதற்கு இருக்கும் உரிமை என்பது ஜனநாயகத்தின் உயர்ந்த பெறுபேறாகும். ஆனால், அந்த ஜனநாயகத்தைத் துஷ்பிரயோகம் செய்யும்வகையில் சிலவேளைகளில் இந்த மன்றில் சிலர் கருத்துக்களை முன்வைக்கின்றார்கள். மக்களின் பிரச்சினைகளைப் பற்றிப் பேசுவதும் அந்தப் பிரச்சினைகளுக்குத் தீர்வுகாண்பதும் இந்த மன்றின் முக்கிய கடமையாகும். அதேநேரத்தில், மக்களால் தெரிவுசெய்யப்பட்ட பிரதிநிதிகள் நாம் என்ற வகையிலும், நாட்டின் சட்டத்தையும் நீதியையும் உருவாக்கும் நாட்டின் உயர்ந்த மன்றம் இது என்ற வகையிலும் நாம் அனைவரும் இங்கு முன்மாதிரியாக நடந்துகொள்ளவேண்டும் என்பதை இங்கே சுட்டிக்காட்ட விரும்புகின்றேன். நாட்டின் முக்கிய பிரச்சினைகளில் அரசியல் பேதங்களுக்கப்பால், கட்சி வேறுபாடுகளுக்கு அப்பால் எப்படி நடந்துகொள்ள வேண்டும் என்பதில் இந்த மன்று முன்னுதாரணமாக இருந்தால் நாட்டு மக்கள் அதனைப் பின்பற்றுவார்கள். ஆகவே, இந்த மன்றில் அதற்குத் தகைமையான முறையில் நடந்துகொள்வதுதான் சிறப்பு. அத்தகைய ஒரு புதிய பண்பாட்டு உருவாக்கத்துக்காக இந்த மன்றை நாம் பயன்படுத்திக்கொள்ள வேண்டும். நாடாளுமன்றத்தின் தீர்மானங்கள், இங்கு அறிவிக்கப்படுகின்ற விடயங்கள் எல்லாம் மக்களின் கவனத்துக்குரியவை. அவை நேரடியாகவே மக்களின் வாழ்வோடும் வரலாற்றோடும் சம்பந்தப்பட்டவை.

இந்த அவையில் நான் ஏற்கனவே பல தடவைகள் சுட்டிக்காட்டிய பிரச்சினைகளைப் பற்றித் திரும்ப இங்கே பேசுவதை விரும்பாத நிலையிலும் அவற்றை மீண்டும் சுட்டிக்காட்ட வேண்டிய தேவை இருக்கின்றது. காரணம் இங்கு சுட்டிக் காட்டப்பட்ட மக்களின் பிரச்சினைகள் பலவும் தீர்க்கப் படாமல் அப்படியேதான் இருக்கின்றன. இது ஏன்? அரசாங்கத்துக்கு இவற்றில் முக்கிய பொறுப்புண்டு என்ற போதிலும், இதற்குத் தனியே அரசாங்கம் மட்டும் காரணமல்ல. எனவே, சகல தரப்பினரும் அரசாங்கத்துடன் ஒத்துழைத்து, எல்லோரும் இந்த நாட்டினர் என்ற எண்ணத்தோடு முக்கிய பிரச்சினைகளுக்குத் தீர்வு காண்பதில் எல்லோரும் ஒன்றுபட்டுச் செயற்படுவதன்மூலம்தான் அவற்றைத் தீர்த்துக்கொள்ள முடியுமென்பதைக் கவனத்திற்கொள்ளவேண்டும் என்று நான் இந்த மன்றைக் கேட்டுக்கொள்ள விரும்புகின்றேன். நாம் நீதியானவர்கள் என்பதை நமது செயற்பாடுகள் நிரூபிக்கட்டும்! அப்போதுதான் நீதித்துறைக்கும் மதிப்புண்டாகும், இந்த மன்றுக்கும் பெறுமானம் இருக்கும். ஆகவே, நாம் இதைப் பற்றித் தீவிரமாகச் சிந்திப்போம், இதை நோக்கிச் செயற்படுவோம் என்று கூறி, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ස්තුතියි.

දැන් ගරු අනුර ප්‍රියදර්ශන යාපා ඇමතිතුමා. ඊට පෙර ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு சந்திரகுமார் முருகேசு] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

[අ. භා. 4.08]

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா - சுற்றாடல் அமைச்சர்)
(The Hon. Anura Priyadharshana Yapa - Minister of Environment)
How many minutes do I have, Sir?

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
You have 15 minutes.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
Thank you.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නීති කාර්යයේ ඉතාමත්ම වැදගත් ප්‍රතිසංවිධානයක් පිළිබඳව තමයි අද අපි කථා කරන්නේ. එනම්, ලංකාවේ මහාධිකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම වාගේම මහාධිකරණ විනිශ්චයකාරතුමන්ලාගේ සංයුතිය වැඩි කිරීම හරහා අධිකරණ ක්ෂේත්‍රයේ නවු ප්‍රමාදය වැළැක්වීමත්, ඒ වාගේම විශේෂයෙන්ම මෙතෙක් කල් අපේ රටේ නීතියේ ආධිපත්‍යයට යටත් නොවුණු දැන් එල්ටීටීඊ සංවිධානය පරාජය වීමෙන් පස්සේ විවෘත වෙලා තිබෙන ප්‍රදේශවල නඩු කටයුතු පහසු කිරීම සඳහාත් වන වැඩ පිළිවෙළක් වෙනුවෙන් ගරු අධිකරණ ඇමතිතුමා ඉදිරිපත් කර තිබෙන සංශෝධනය පිළිබඳව තමයි අද අපි කථා කරන්නේ.

ඔබතුමා දන්නවා මේ රටේ අධිකරණයේ ස්වාධීනතාව අපි කවුරුත් පිළිගන්නා සත්‍යයක් බව. විශේෂයෙන්ම ලංකාවේ සෑම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හරහාම -ඒ කියන්නේ 1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේත්, 1972 ජනරජ ව්‍යවස්ථාව යටතේත්, 1978 ජනාධිපති ව්‍යවස්ථාව යටතේත්- අපි මේ අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳ ඉතාම ඉහළින් කථා කර තිබෙනවා. මට පෙනෙන හැටියට මේක ඊයේ පෙරේදා අපිට ලැබුණු දායාදයක් නොවෙයි. මට පෙණුනා මේ පාර්ලිමේන්තුවේ කථා කරන සමහර මන්ත්‍රීවරු අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳව, එහෙම නැත්නම් නීතිපතිවරයාගේ පරිපාලනමය කරුණු සඳහා හෝ ජනාධිපතිතුමා යටතේ තබා ගැනීම පිළිබඳ විවිධ මතවාදයන් ප්‍රකාශ කළ ආකාරය. නමුත් මේ සියලු දෙනාම නොදන්නා කරුණක් තිබෙනවා.

මේ අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳව ලංකාවේ බොහොම දීර්ඝ ඉතිහාසයක් තිබෙනවා. මේ ඉතිහාසය ටිකක් පැහැදිලි කරන්න මම කැමැතියි. යටත් විජිත යුගයට පෙර සිටම ලංකාවේ අධිකරණ ක්‍රියාත්මක වුණා. නමුත් ඒ අධිකරණවල යටත් විජිත යුගයෙන් පස්සේ -විශේෂයෙන් බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයෙන් පස්සේ- ලංකා අධිකරණයේ ඇති වුණු කාලීන වෙනස්කම් පිළිබඳව වචනයක් දෙකක් කථා කරන්න මම කැමැතියි. මොකද මේ පාර්ලිමේන්තුව ඇතුළේ විවිධාකාර කරුණු ගැන කථා කළා. අඩු ගණනේ, නීතිපතිවරයාට නඩු කාර්යයක් අවසන් කිරීමේ බලතල තිබෙනවාය කියලාවත් සමහර නීතිඥවරු දන්නේ නැහැ. තමන් ඉදිරියට එන කරුණක් සම්බන්ධයෙන් තොරතුරු දැන ගත්තාට පස්සේ නඩුව පවත්වාගෙන යන්න බැහැය කියලා ඔහුට තේරෙනවා නම් නඩුව අයින් කිරීමේ බලතල නීතිපතිවරයාට තිබෙනවා. ඒක අද ඊයේ තිබුණු එකක් නොවෙයි. ඒක හැම දාම තිබුණා. ඉතින් ඒ අනුව මම මතක් කරන්න කැමැතියි ඉතාමත්ම වැදගත් නඩු තීන්දුවක් පිළිබඳ කාරණාව. යටත් විජිත යුගයේ ඉඳලා ආරම්භය කථා කරන කොට මට මේ ගැන කථා කරන්න වනවා. 1774 දී මැන්ස්ෆීල්ඩ් කියන නඩුකාරතුමා එංගලන්තයේ "කැම්ප්බෙල් එරෙහිව හෝල්" කියන නඩුවේදී ඉතා වැදගත් කාරණයක් කියලා තිබෙනවා. ඒ මෙන්න මේකයි: "The laws of a conquered country continue to be in force until they are altered by the conqueror".

ඒකෙන් කියන්නේ "යටත් කර ගන්නා යම් කිසි රාජ්‍යයක පවත්නා නීතිය යටත් කර ගත්ත තැනැත්තා විසින් වෙනස් කරන තුරු පැවතිය යුතුයි" කියලායි. ඒ පදනම මත තමයි ලංකාවේ එදා නීතිය පැවතුණේ. ඒ අනුව යටත් විජිත යුගයේ මුල් අවධියේදී ලංකාවේ බලපැවැත්වුණු නීතිය වුණේ එවකට බල පැවැත්වුණු නීතිය බව අපි කවුරුත් දන්නවා. එනම් රෝම-ලන්දේසි නීතියයි; ලන්දේසීන් අපිට ඉතිරි කරලා ගිය නීති පද්ධතියයි.

පළමුවෙන්ම 1796 දී ෆ්‍රෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරවරයා විසින් පනවනු ලැබූ අධිකාරි පත්‍රයක් - Charter of Justice - මඟින් ලංකාවේ පළමු ශ්‍රේෂ්ඨාධිකරණයත්, ඇපැල් මහාධිකරණයත් පිහිටුවනු ලැබුවාය කියා සඳහන් වනවා. ඒ ශ්‍රේෂ්ඨාධිකරණය සඳහා සිවිල් හා අපරාධ අධිකරණ බලතල පැවරුවාය කියන එකත් නීති ඉතිහාසයේ සඳහන් වනවා. ඒ අනුව පළාත්බද අධිකරණ පහක් කොළඹ, මාතර, පුත්තලම, යාපනය හා ත්‍රිකුණාමලයේ පිහිටු වූ බව මතක් කරන්න ඕනෑ. ඊට පසුව හිටපු මේට්ලන්ඩ් ආණ්ඩුකාරවරයාගේ කාලයේදී අධිකරණය සහ විධායකය අතර යම් සට්ටනයක් නිර්මාණය වුණා. ඒ සට්ටනය නිර්මාණය වුණේ බලතල පිළිබඳව නියමාකාර බෙදීමක් එවකට නොතිබුණු නිසායි. ඒ නිසා යම් යම් කාරණා පිළිබඳව අධිකරණමය බලතල සහ විධායකය අතර, එහෙම නැත්නම් administrator හැටියට හිටපු ආණ්ඩුකාරවරයාගේ බලතල පිළිබඳව ගැටුමක් නිර්මාණය වුණාම ඒ කාලයේ හිටපු නීති විශාරදයින් ඒක දැක්කේ ඉතාමත්ම වැදගත් පරිවර්තන අවධියක් හැටියටයි. ඒ, මේට්ලන්ඩ් ආණ්ඩුකාරවරයාගේ කාලයේදීයි. ඒ නිසා ඒ ගැටුම නිරාකරණය කර ගන්න මේට්ලන්ඩ් ආණ්ඩුකාරවරයා ඇලෙක්සැන්ඩර් ජොන්ස්ටන් කියන විනිශ්චයකාරවරයෙක් තෝරා ගත්තා. එතුමා එවකට ලංකාවේ හිටපු ශ්‍රේෂ්ඨ විනිශ්චයකාරවරයෙක්. ඔහු එංගලන්තයට ගියා. එංගලන්තයට ගියපු ඇලෙක්සැන්ඩර් ජොන්ස්ටන් විනිශ්චයකාරවරයා සම්පූර්ණයෙන්ම ඒ තත්ත්වය තේරුම් අර ගෙන එංගලන්තයේ ආණ්ඩුවට කියලා -ඒ කාලයේ එංගලන්තයේ ප්‍රධාන පරිපාලන මධ්‍යස්ථානයට කිව්වේ Whitehall කියායි. මේ කාරණාව ඒකට කියලා- ඒක නිරවුල් කර ගෙන ලංකාවේ අධිකරණ සැලැස්මත් ඇතිව ඔහු ලංකාවට ආවා. ඒ ආවේ නිකම්ම නොවෙයි, ලංකාවේ අග්‍ර විනිශ්චයකාරවරයා හැටියට පත් වීමකුත් අරගෙනයි. මේ ප්‍රතිසංස්කරණ හරහා ලංකාවේ සියලුම පළාත්වලට ශ්‍රේෂ්ඨාධිකරණ නීතිය බලපැවැත්වුණු අතර ශ්‍රේෂ්ඨාධිකරණයේ අංශ දෙකෙන් එකක් කොළඹත් අනික් අංශය යාපනයේත් ඇති කරනු ලැබුවා. ලංකාවේ පළමු වරට ජූරි සභා

[ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා]

ක්‍රමය ආරම්භ කළේත් ඇලෙක්සැන්ඩර් ජොන්ස්ටන් කියන අග්‍ර විනිශ්චයකාරවරයා 1810 දී පනවපු අධිකාරි පත්‍රය - Charter of Justice - හරහා බව අපි අමතක කරන්න නරකයි. මේ පිළිබඳව මේට්ලන්ඩ් ආණ්ඩුකාරවරයා එක්තරා විරෝධයක් දක්වපු නිසා 1811 ඔක්තෝබර් 30 දරන Charter පත්‍රය මඟින් නැවත වරක් කලින් තිබුණු තත්ත්වයම ඇති කළා. ඒ මඟින් බොහෝ දුරට අධිකරණය සහ විධායකය අතර තිබුණු ගැටුම නිමා වුණා. 1833 දී ඇති කරන ලද කැමරන් ප්‍රතිසංස්කරණ හරහා ප්‍රධාන වශයෙන් රටේ ජනතාවට වඩා පහසුවෙන් හා අඩු වියදමකින් නෛතික කටයුත්තක් කර ගැනීමට හැකි වූ අතර විනිසුරුවරුන් පරිපාලනය කිරීමේ ක්‍රම ඇති කිරීම මඟින් නීතිය වඩා විනිවිද පෙනෙන සුළු භාවයකින් සිදු වීමට ඉඩ සලසා තිබෙනවා. ඒ අනුව තමන්ට සිදු වූ අගතියක් වෙනුවෙන් ඕනෑම පාර්ශ්වයකට අභියාචනා කිරීමේ අයිතියද කැමරන් හඳුන්වා දුන් ප්‍රතිසංස්කරණවල ඉතා වැදගත් ක්‍රමයක් වෙලා තිබෙනවා. මේ අනුව අධිකරණ කලාප තුළ අධිකරණ බලය පවත්නා දිස්ත්‍රික් උසාවිද, බල අපරාධ සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයද, මුල් අධිකරණ සඳහා අභියාචනා බලතල සහිත ඇපැල් අධිකරණ ද පිහිටු වූ බව ඉතිහාසයේ සඳහන් වනවා. 1843 දී එංගලන්ත ආණ්ඩුවේ නීති පරිපාලනය වෙනස් කිරීමේ බලතල legislative කවුන්සලයට පවරා තිබුණු බව සඳහන් වෙනවා. ඒ මඟින් පළමු වරට ආණ්ඩුකාරවරයාට පමණක් සීමා වුණු බලතල ව්‍යවස්ථාදායකයට නාමිකව වුවත් පවරා දී තිබෙනවා. එසේ වුවත් එම බලතල සංශෝධනයේදී එය බලාත්මක කිරීමේ අයිතිය ශ්‍රේෂ්ඨාධිකරණය සතුව තිබුණු අයිතියක් හැටියට තවදුරටත් පැවතුණා. 1844 ජුනි 2 වැනිදා පනවන ලද letters of patent කියන අධිකාරි බලය මඟින් ව්‍යවස්ථා සභාවෙන් පනවන ලද නීති බලාත්මක වීමේ දිනය තීන්දු කිරීමේ බලතලත්, 1833 Charter පත්‍රය මුළුමනින්ම හෝ කොටස් වශයෙන් වෙනස් කිරීමේ අයිතියත් සම්පූර්ණයෙන් තීන්දු කර ව්‍යවස්ථාදායකයට බලතල පවරා තිබෙනවා. යම් කිසි පනතක් සම්මත කිරීමේදී ඒ පනත බලාත්මක කරන දිනය තීන්දු කිරීමේ අයිතියද සම්පූර්ණයෙන්ම පනවා තිබෙනවා. යටත් විජිත සමයේ ඉතාමත්ම ක්‍රමානුකූලව විකාශනය වුණු මෙම අධිකරණ බලය, අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳ මතය වඩාත් බලාත්මක වන්නේ ඩොනොමෝර් ව්‍යවස්ථාව පිහිටුවාට පසුවයි. ඩොනොමෝර් ව්‍යවස්ථාව හරහා අධිකරණය, ව්‍යවස්ථාදායකය සහ විධායකය අතර තිබෙන වෙනස සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වුණේ බ්‍රෙස්ගර්ඩ්ල් සිද්ධියත් එක්කයි. බ්‍රෙස්ගර්ඩ්ල් කියන තරුණ කොමියුනිස්ට්වාදී තරුණයෙක් ඕස්ට්‍රේලියාවේ ඉඳලා ලංකාවට ආවා. ඇවිල්ලා ඔහු වතු සමාගම්වලට බැඳුණා. වතු සමාගම්වලදී ඔහු ගත්තේ වතු අයිතිකාරයාගේ පැත්ත නොවෙයි, වතුවල ඉන්න කම්කරුවන්ගේ පැත්තයි. ඔහු එවකට ලංකාවේ තිබුණු ශ්‍රේෂ්ඨ වාමාංශික ව්‍යාපාරයට එළිපිට සහාය දුන්නා. නොරිස්සුම් සහගත ලෙස මේ දිහා බලපු ආණ්ඩුකාරවරයා ඔහුට විරුද්ධව නෙරපුම් නියෝගයක් අර ගත්තා, ඔහු ලංකාවෙන් පිට මං කරන්න. මේක ඉතිහාස කථාවක්. ලංකාවේ වාමාංශික ව්‍යාපාරයේ තරුණ දේශපාලකයින් ගණනාවකගේ නැඟිටීම සිදු වුණු වකවානුවක් 1937 අවුරුද්ද. ඒ වේලාවේ මේ අය හබයාස්කෝපුස් රිට් ආඥාවක් අධිකරණයෙන් ඉල්ලුවාම ඒ අධිකරණය විසින් ඒ නෙරපීම් නියෝගය බල රහිත කළා. ඒ මඟින් අධිකරණයේ ස්වාධීනත්වය ලංකාවේ හැම විටම පැවතුණා. බොහෝ දුරට තර්කයක් ගෙනාවොත් ලංකාවේ අධිකරණය ස්වාධීනද කියලා, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් හැටියටත් අධිකරණයේ කාලයක් වැඩ කරපු කෙනෙක් හැටියටත් මට කියන්න තියෙන්නේ අධිකරණයේ ස්වාධීනත්වය මේ රටේ ව්‍යවස්ථාවෙන් ආරක්ෂා කරලා තියෙන දෙයක් කියායි. ඒක අපි කාටවත් ගන්න බැහැ. කවුරු හරි යම් යම් සිද්ධි මත ඉඳ ගෙන මේ පිළිබඳව තර්ක කරනවා නම් මම හිතනවා මේක එතරම් හොඳ තර්කයක් නොවෙයි කියා. මට මතකයි, මීට සති කීපයකට කලින් ගරු මංගල සමරවීර මන්ත්‍රීවරයා ඉතාමත්ම දරුණු ප්‍රහාරයක් මේ රටේ අධිකරණ විනිශ්චයකාරවරුන්ට එල්ල කළා. එතුමා පැයක විතර කථාවක් කළා. ඊට පසුව ඒ පිළිබඳ නීති ක්ෂේත්‍රය ඇතුළේ ලොකු අර්බුදයක් ඇති වුණා. මට මතකයි, විශේෂයෙන්ම ශ්‍රී ලංකා නීති සංගමය මේ පිළිබඳව හෙළා දැකලා කථා කළා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පාර්ලිමේන්තුව ඇතුළේ ඉඳ ගෙන යම් කිසි විනිශ්චයකාරවරයෙකුට මොනම ආකාරයකින්වත් චෝදනා මුඛයෙන් කථා කරන්න අපි කාටවත් පුළුවන්කමක් නැහැ. එහෙම කථා කරනවා නම් ඒ පිළිබඳව නිශ්චිත ක්‍රමවේදයක් මේ පාර්ලිමේන්තු ක්‍රමය තුළ නිර්මාණය වෙලා තිබෙනවා. ඒ ක්‍රමවේදය පාවිච්චි කරන්නේ නැතුව තමන්ට හිතෙන හිතෙන දේ කථා කිරීමෙන් පාර්ලිමේන්තුවේ ඒ ක්‍රමවේදය තුළ යම් කිසි ආකාරයක කඩා වැටීමක් ඇති වෙනවා. ක්‍රමයක් කඩා වැටුණාට පසුව අපට ඒක ආපසු ගන්න බැහැ. අපේ අධිකරණ ක්‍රමය ඉතාමත්ම නිරවුල්ව අප පිළි අරගෙන තිබෙනවා, ඉතාමත් පැහැදිලි සුපිරිසිදු ක්‍රමයක් කියලා. ඒ ක්‍රමය ඇතුළේ අප දන්නවා, අපේ ආණ්ඩුව තියෙන කාලයේ ආණ්ඩුවට විරුද්ධවත් නඩු තීන්දු දීලා තියෙනවාය කියා. හැබැයි, ඒ නඩු තීන්දු දුන්නා කියලා ආණ්ඩුවේ මන්ත්‍රීවරු -අපි- කවදාවත් පාර්ලිමේන්තුව ඇතුළට ඇවිල්ලා ඊට විරුද්ධව බැණ අඬ ගැහුවේ නැහැ. අපි ඒක පිළි ගත්තා. තමන්ට එරෙහිව දෙන ඕනෑම තීන්දුවක් පිළිගන්න බැරි නම් ඒ ආණ්ඩුව හෝ විපක්ෂය හෝ මා හිතන්නේ නැහැ, සාධාරණ යුක්ති ධර්ම රීතීන් තුළ ක්‍රියා කරනවාය කියලා. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හරහා පළමුවැනි වතාවට අධිකරණයට ඇඟිලි ගසනු ලැබුවේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවයි. මට මතකයි, 1978 ජන රජ ව්‍යවස්ථාව පිහිටු වන කොට එවකට ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයවරුන් රාශියක් ආපසු පත් නොකර හිටියා. ඒ පිළිබඳ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මට උදාහරණයක් තිබෙනවා. ආචාර්ය ජයා පතිරණ මහතා ලංකාවේ හිටපු ඉතාමත්ම ප්‍රකට නීති වේදියෙක්. ඔහුව පත් කළේ නැහැ. ඒ වාගේම තව කිහිප දෙනෙක්ම හිටියා. මට මේ වේලාවේ නම් කියන්න බැහැ. ඒක තමයි එක්සත් ජාතික පක්ෂය අධිකරණ ස්වාධීනත්වයට ගහපු විශාලම පහර. ඊට කලින් හිටපු කිසිම ආණ්ඩුවක් කිසිම අවස්ථාවක අඩු ගණනේ ව්‍යවස්ථා සංශෝධනයකදී පවා ව්‍යවස්ථාව මුළුමනින්ම ඇතුළත් කිරීමේදී පවා එවැනි ක්‍රියාවක් කළේ නැහැ. ඒක තමයි, තමන්ට පරිබාහිර අයට කරපු සේවාව.

ඊළඟට මා මතක් කරන්න කැමැතියි, විශේෂයෙන්ම නෙවිල් සමරකෝන් අග්‍ර විනිශ්චයකාරතුමාට කරපු දේ. ඔහු මොන තරම් අභීත, අදීන අග්‍ර විනිශ්චයකාරවරයෙක් වුණත් ඔහුට විශාල බලපෑමක් එවකට නිර්මාණය කළා. ඒ නිසා ඇති වුණු තත්ත්වයන් මා මේ අවස්ථාවේදී විග්‍රහ කරන්නට ඕනෑ නැහැ. අධිකරණයට ගල් ගැහුවා. අධිකරණය ඉස්සරහ පෙළපාළි ගියා. පෙළපාළි ගියාම එවකට ආණ්ඩුව ඒ පෙළපාළි යෑම ජනතාවගේ අයිතියක් කියලා සැලකුවා. ඒ ක්‍රමය තුළ පැහැදිලිවම තීන්දු ගත්ත උදවියම ඇවිල්ලා අද අධිකරණය ගැන කථා කරන කොට සමහර වේලාවට මට හිතෙනවා, අපි මේ වැද්දන්ගෙන් බණ අහනවාද කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා මේ ස්වාධීනතාව පිළිබඳ කාරණාවේ දී අපි කල්පනා කරන්නට ඕනෑ, පැහැදිලිව අධිකරණය ස්වාධීනයි කියලා නිර්මාණය කරලා තිබියදී, ඒ අධිකරණ රටාව පිළිබඳව ජනතාවගේ විශ්වාසය රැකිලා තිබියදී අපි හතර පස් දෙනෙක් ඇවිල්ලා මෙතැන දී විශ්වාසයක් නැහැයි කියලා කීමෙන් කිසියම්ම දෙයක් වෙනවාය කියලා හිතන්න බැරි බව. මොකද, ඔය කථා කරන සමහර උදවිය සමහර අවස්ථාවල ක්‍රියා කරපු ආකාරය පිළිබඳවත් මට හොඳ අත් දැකීම් තිබෙනවා. ඒක අපි දන්නවා. ඒවා මේ වෙලාවේ කියන්න හොඳ නැති නිසා මම කියන්නේ නැහැ. පොතක් ලියන වෙලාවට ලියලා දමන්න තමයි මම හිතා ගෙන ඉන්නේ.

ඒ නිසා මම තමුන්නාන්සේලාට කියන්න කැමැතියි, මේ සමහර මන්ත්‍රීවරු අධිකරණ විනිශ්චයකාරවරුන්ට අපහාස වන

අන්දමින් කථා කළ බව. එක මන්ත්‍රීවරයෙක් නීතිපතිවරයාගේ නඩු කටයුත්තක් බැහැර කිරීමක් පිළිබඳව කථා කළා. අපි ඒ කාරණාව සම්බන්ධව කිසිවක් දන්නේ නැහැ; අපි ඒකට අදාළ file එක දැකලා නැහැ; අපි ඒකේ සිද්ධිය දැකලා නැහැ. අපි ඒකේ කරුණු කිසිවක් දන්නේ නැතිව ඒ නීතිපතිවරයා සතු අයිතිය පාවිච්චි කරන කොට, ඔහුට නීතියෙන් ලැබී තිබෙන බලතල පාවිච්චි කරන කොට ඒ පිළිබඳව කථා කිරීමට අපි මීට වඩා සූදානම් විය යුතුයි කියලා මම කල්පනා කරනවා.

ඊළඟට ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා කථා කළා නඩු ප්‍රමාදය ගැන. ඔව්, අධිකරණයේ නඩු ප්‍රමාදයක් තිබෙනවා. ඒකට හේතුව අධිකරණයට විශාල නඩු සංඛ්‍යාවක් තිබෙනවා. එක දවසක වැඩ කරන පැය ගණන ඇතුළත සමහර නඩු අහලා ඉවර කරන්න බැහැ. සමහර ඒවායේ හරස් ප්‍රශ්න අහන්න බැහැ. විශේෂයෙන් සිවිල් නඩුවල දී ඇති වන ප්‍රධානම ප්‍රශ්නය තමයි අවශ්‍ය ලිපි ලේඛන නොමැතිකම. ලිපි ලේඛන නොමැතිව, නඩු ඉක්මන් කරන්නය කියලා සිවිල් නඩුවල දී එක් පාර්ශ්වයකට පමණක් පක්ෂ වන තීන්දුවක් දුන්නොත් ඔබතුමා දන්නවා අනෙක් පාර්ශ්වයට විශාල අගතියක් සිද්ධ වන බව. ලංකාවේ නොබෙදූ ඉඩම් විශාල ප්‍රමාණයක් අද තිබෙනවා. අපේ ආණ්ඩුව මීට කලින් නීතියක් ගෙන ආවා නොබෙදූ ඉඩම් සඳහා වන වැඩ පිළිවෙළක් සම්බන්ධව. ඒ කියන්නේ දැනට තිබෙන ඔප්පු ක්‍රමය වෙනුවට මැණීමේ ක්‍රමයක්. ඒක සමහර පළාත්වල ක්‍රියාත්මක වුණා. නමුත්, මේක බ්‍රිතාන්‍ය යුගයේ ඉඳලා තිබෙනවා. පරම්පරාවෙන් පරම්පරාවට යන්න යන්න නොබෙදූ ඉඩ කඩම්වල උරුමක්කාරයෝ වැඩි වෙනවා. ඒ නිසා අපි ඒ පිළිබඳව ඉතාම කල්පනාවෙන් වැඩ කරන්නට ඕනෑ. මම දකින හැටියට අපරාධ නඩුවල දී පවා ඒ චූදිතයාට තමන්ගේ විත්ති වාචක ඉදිරිපත් කිරීමට තිබෙන අවස්ථා වැඩි කළ යුතුයි. අඩු කළ යුතු නැහැ. එසේ අඩු කිරීමෙන් සිදු වන්නේ අගතියක් සිදු වීමයි. මම හිතන්නේ ලෝකය පුරාම නඩු ප්‍රමාදයක් පිළිබඳව අද කථා වෙනවා. සෑම රටකම වාගේ නඩු ප්‍රමාදය අඩු කරන්නේ කොහොමද කියන එක ගැන කථා කරනවා. මොකද, මම දන්නවා බොහෝ අවස්ථාවල දී නඩු ප්‍රමාදය වළක්වන්න විනිශ්චයකාරවරු විසින් අතර මඟ දී එම නඩු සමාදාන කරන්න හදන බව. නමුත්, ඔබතුමා කිව්වා වාගේ මම විශ්වාස කරනවා මේ නඩු ප්‍රමාදය වළක්වන්න නම් අපි කළ යුත්තේ වැඩිපුර උසාවි පිහිටුවන එක, වැඩිපුර විනිශ්චයකාරවරු පත් කරන එක, වැඩිපුර අතිරේක විනිශ්චයකාරවරු පත් කරන එක ඒ වාගේම විශේෂයෙන්ම අපරාධ නඩුවල දී යම් යම් වාර්තා ලබා ගැනීම සඳහා ඉඩ ලබා දීමට කටයුතු කරන එකයි කියලා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Minister, you have one more minute.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
ඊළඟට තව ප්‍රකාශයක් කළා, නීතිය හසුරුවන්නේ දේශපාලකයන්ය කියලා. දේශපාලකයන් විසින් නීතිය හසුරුවන්නේ නැහැ. නීතිය තමන්ගේම ගමන් මාර්ගයක යනවා. අපි යම් වරදක් කළොත් ඒ වරද පිළිබඳ ක්‍රමවේදයක් තිබෙනවා. ඒ ක්‍රමවේදය බලාත්මක වන්නේ අධිකරණ තීන්දුවකින්. ඒ නිසා මම විශ්වාස කරනවා, මන්ත්‍රීවරු විධියට අපි යම් යම් විටෙක නීතියේ බලාත්මකභාවය පිළිබඳව අතිරේකව කථා කිරීම ඒ තරම් සුදුසු නැහැ කියා. ඒ නිසා මම කියන්න උත්සාහ කළේ මේ පාර්ලිමේන්තුවේ පසු ගිය කාලය තුළ නීතියේ ආධිපත්‍ය පිළිබඳ විවිධ මතවාදයන් ගෙන හැර දක්වන්න විවිධ අය කල්පනා කරලා තිබෙන එක ගැනයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සමහර අයට ඕනෑ කරන විධියට නීතිය පසිඳලන්නේ නැති වුණාම, නීතිය අර්ථ නිරූපණය වෙන්නේ නැති වුණාම ඒක තමන්ට වුණු අගතියක් හැටියට ඒ අය කල්පනා කරනවා. ඒක තමයි වැරැද්ද. අපි ප්‍රජාතන්ත්‍රවාදී නම්, අපි යම් කිසි ආකාරයක පුළුල් දෘෂ්ටියකින් යුක්ත නම් මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු හැටියට අධිකරණයේ ස්වාධීනත්වයටත්, අධිකරණ විනිශ්චයකාරවරුන්ට අගතියක් නොවන ලෙසත් ක්‍රියා කිරීමට අපි ඉටා ගත යුතුයි. ඒ නිසා මේ සම්බන්ධයෙන් අපේ ගරු ඇමතිතුමා ගෙන ආපු මේ වැඩ පිළිවෙළ ඉතාමත්ම හොඳයි. ඒ අනුව මා නියෝජනය කරන කුලියාපිටිය අධිකරණ කලාපයටත් මහාධිකරණයක් ලැබෙන බව මම දන්නවා. ඒ නිසා ඒ පිළිබඳවත් මාගේ ස්තුතිය පුද කරමින් මා මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next Speaker is the Hon. Sujeewa Senasinghe - [*Pause*.] He is not here. Then, the next Speaker is the Hon. Sri Ranga.

[பி.ப. 4.25]

**ගරු ජේ. ශ්‍රී රංගා මහතා**
(மாண்புமிகு ஜெ. ஸ்ரீ றங்கா)
(The Hon. J. Sri Ranga)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய நீதித்துறை திருத்தச் சட்டமூலத்திலே Magistrates இனரின் தொகையை அதிகரிப்பது தொடர்பாக நாங்கள் விவாதித்துக் கொண்டிருக்கின்றோம். சாதாரணமாக, criminal வழக்குகள் முதலில் Magistrate's Courtஇல் விசாரணைக்கு எடுத்துக் கொள்ளப்படுகின்றன. ஆரம்பகட்ட விசாரணைகள் முடிவடைந்த பின்னர் அவ்வழக்குகள் High Courtஇல் மேலதிக விசாரணைகளுக்காக எடுத்துக் கொள்ளப்படுகின்றன. High Courtஇல் வழங்கப்படும் தீர்ப்புக்களில் திருப்தியடையாத பட்சத்தில் அவை Court of Appealஇல் மேன்முறையீட்டுக்காகச் சமர்ப்பிக்கப்படுகின்றன. இறுதியாக அவை Supreme Court இற்குச் செல்கின்றன. இது criminal குற்றம் சம்பந்தமான வழக்குகளின் நடைமுறையாக இருக்கின்றது. இப்படியான நடைமுறைகள் இருக்கின்றபொழுது, இங்கு நாங்கள் Primary Courts மற்றும் Magistrates களை அதிகரிப்பது பற்றிப் பேசிக்கொண்டிருக் கின்றோம்.

அதேநேரம் நாங்கள் civil வழக்குகளைப் நோக்குகின்ற பொழுது, அவை முதலில் District Court இல் விசாரணைக்கு எடுத்துக் கொள்ளப்படுகின்றன. அங்கு வழங்கப்படுகின்ற தீர்ப்புக்களில் திருப்தியடையாக பட்சத்தில் அவை மேன்முறையீட்டுக்காக Civil Appeallate Court இற்குச் சென்று, இறுதியாக அவை Supreme Court இற்குச் செல்கின்றன. நாட்டிலிருக்கின்ற சட்டங்கள் எல்லாப் பாகங்களுக்கும் ஒரேவிதமாக அமுல்படுத்தப்பட வேண்டும்; அச்சட்டங்கள் எல்லோருக்கும் சமமாக இருக்கவேண்டுமென்றுதான் நாங்களும் கேட்கின்றோம். நாட்டுக்குத் தேவையான சட்டங்கள் பாராளுமன்றத்திலே ஒரேவகையில் இயற்றப்பட்டாலும் அவற்றை நடைமுறைப்படுத்துவதில் வித்தியாசம் காணப்படுகின்றது. குறிப்பாக, சாவகச்சேரி நீதவான் பிரபாகரன் அவர்கள் தொடர்பாக இந்தச் சபையிலே பல பாராளுமன்ற உறுப்பினர்கள் பேசியிருந்தார்கள். கப்பம் சம்பந்தமாக நடந்த கொலைச் சந்தேக நபர்களைச் சிறையில் அடைத்ததுதான் அவர் செய்த ஒரேயொரு குற்றமா என்று தெரியவில்லை. அதற்காக transfer order கொடுக்காமலே அவர் இடமாற்றம் செய்யப்பட்டார். தற்போது அவர் அக்கரைப்பற்றில் கடமையாற்றுகின்றார். எப்படி அவருக்கு இடமாற்றம் கொடுக்கப்பட்டது? சட்டமியற்றுகின்ற இந்த உயர்ந்த சபையிலே அந்தக் கப்பம் தொடர்பாகப் பேசப்பட்டு ஒரு கிழமைக்குள் அவர் இடமாற்றம் செய்யப்பட்டார். ஜனாதிபதியின் புதல்வர் நாமல் ராஜபக்ஷ அவர்கள் இந்த நாட்டிலே சட்டமும் ஒழுங்கும் எல்லோருக்கும் சமமாக இருக்கின்றதென்ற

[ගරු ජේ. ශ්‍රී රංගා මහතා]

அடிப்படையிலும் இயற்றப்படுகின்ற சட்டங்கள் இலங்கை முழுவதும் ஒரேவிதமாக நடைமுறைப்படுத்தப்படுகின்றதென்ற தோரணையிலும் பேசினார். அதை நாங்கள் வரவேற்கின்றோம். இந்த நாட்டிலே இருக்கின்ற ஒரு சட்டம் இலங்கை பூராகவும் ஒரேவாறு எல்லோருக்கும் ஒரேவிதமாக அமுல்படுத்தப்பட வேண்டுமென்றுதான் நாங்களும் கேட்கின்றோம். ஐக்கிய தேசியக் கட்சியின் சார்பில் பேசிய சக பாராளுமன்ற உறுப்பினர் அஜித் பெரேரா அவர்கள், தான் சார்ந்த வழங்கொன்றுக்குத் தீர்ப்பு வழங்க எவ்வளவு காலம் சென்றது என்பது பற்றிக் குறிப்பிட்டிருந்தார். நீதி அமைச்சர் அவர்கள் நீதித்துறை சார்ந்த ஒருவராக இல்லாவிட்டாலும் மக்களின் பிரச்சினைகளை நல்ல முறையில் அணுகக்கூடியவர் ஒருவரை நாம் நீதி அமைச்சராகப் பெற்றிருக்கின்றோமென்று கூறினார். அதிலும் ஒருபடி மேலே சென்று தான் ஒரு சட்டத்தரணியென்றும், அப்படிப்பட்ட ஒருவர் அமைச்சராக இருப்பதிலும் பார்க்க மக்களின் பிரச்சினைகளைத் தெரிந்த ஒருவர் அத்துறைக்கு அமைச்சராக இருப்பது வரவேற்கத் தக்கதென்றும் பேசியிருந்தார். நீதி அமைச்சர் அவர்கள் இங்கிருக்கின்றார். குறிப்பாக இன்று வட, கிழக்கிலே கப்பம் கோரும் சம்பங்கள் அளவுக்கு மீறியிருப்பது பற்றிச் சில வேளைகளில் அவருக்குத் தெரியாமல்கூட இருக்கலாமென்று நான் நினைக்கின்றேன்.

இந்த சபையிலே விவாதத்துக்கு எடுத்துக்கொள்ளப் பட்டிருக்கின்ற விடயம் என்ன? High Courts களை அதிகரிப்பது பற்றியது. Criminal குற்றங்கள் பற்றி நாங்கள் இங்கு விவாதிக்கின்றபொழுது, சம்பந்தப்பட்ட சில தீர்ப்புகளுடன் தொடர்பான அந்த நீதவான்கள் இடமாற்றம் செய்யப்படுகின்றனர். அப்படியென்றால், Courts இனை அதிகரிப்பதனூடாக எதைச் சாதிக்கப்போகின்றோம்? நிச்சயமாக கவனிக்கப்படவேண்டிய விடயம் இது. அதைவிட, தற்பொழுது அக்கிராசனத்தில் இருக்கின்ற குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களது உரையை உன்னிப்பாகக் கவனித்தேன். கடந்த 60 வருடங்களாக இந்த நாட்டிலே சட்டம் ஒழுங்கான முறையில் நடைமுறைப்படுத்தப்பட்டதாவென்று அவர் இந்தச் சபையிலே கேள்வி எழுப்பினார். இதிலிருந்து என்ன விளங்குகின்றது? அவர் அரச தரப்பு உறுப்பினராக இருந்தாலும், இனிமேலாவது ஒழுங்கான முறையில் சட்டங்களை அமுல்படுத்த இடமளிக்க வேண்டுமென்ற கூற்றினை முன்வைக்கின்றார். இதைத்தான் நாங்களும் கூறுகின்றோம். யுத்தம் முடிந்துவிட்டதென்று அரசு கூறியிருக்கிறது. ஆனால், கப்பம் மற்றும் கொலை போன்ற நடவடிக்கைகள் தொடருகின்றன. அவை நிறுத்தப்பட வேண்டும். அப்படிப்பட்டவர்களை நீதியினூடாகத் தண்டியுங்களென்று நாங்கள் பலமுறை இந்தச் சபையிலே கூறி வந்திருக்கின்றோம்.

அன்று நான் நுவரெலியா மாவட்டத்திலே தேர்தல் வேலைகளில் ஈடுபட்டிருந்தபொழுது, ஹட்டன் மாநாகரிலே கப்பம் கேட்ட 4 பேர் கைது செய்யப்பட்டார்கள். அப்படிக் கைது செய்யப்பட்டவர்களுக்கு என்ன நடந்ததென்பதைப் பற்றி இன்றுவரை எந்தவித தகவலும் இல்லை. அண்மையிலே, UDA இற்குச் சொந்தமான விடுதியை நடாத்திக்கொண்டிருந்த வவுனியா நகரைச் சேர்ந்த வர்த்தகர் ஒருவர் கடத்தப்பட்டிருக்கிறார். அவரைத் தற்பொழுது காணவில்லை. ஏனென்றால் இது சம்பந்தமாக வெளியில் வந்து சொல்வதற்குப் பயம்! எனவே, எவரும் சட்டங்களுக்கு மதிப்பளிக்க வேண்டுமென்று கூறுகின்றோம். உண்மையில் இந்த அரசியல்வாதிகளுக்கும் ஆயுதக் குழுக்களுக்கும் Magistrate's Court மூலம் உரிய தீர்ப்புக் கிடைக்கவில்லை என்றால் அவர்கள் High Courtக்குப் போகலாம். அங்கும் அவற்றில் சம்பந்தமில்லையென்றால், அல்லது அவர்களுக்கு உரிய தீர்ப்புக் கிடைக்கவில்லை என்றால் Court of Appeal க்குப் போகலாம் அல்லது Supreme Courtக்குப் போகலாம். இதைவிடுத்து நீதவான்களை இடமாற்றவதன் ஊடாக சம்பந்தப்பட்டவர்கள் சட்டங்களைத் தங்கள் கைகளிலே எடுக்கின்ற ஒரு நிலைமையே காணப்படுகின்றது. இந்த நிலைமையை மாற்ற வேண்டும். உண்மையில் இன்று மக்கள் எதை நம்பி வாழ்கின்றார்கள்? சட்டங்கள் ஏன் இயற்றப்படுகின்றன? அரசியல்வாதிகளின் குற்றங்களை மறைப்பதற்காகவா? அறிஞர் அண்ணா அவர்கள் கூறினார், "சட்டம் ஓர் இருட்டறை" என்று. உண்மையில் சட்டம் ஓர் இருட்டறையாக இருந்துவிடக்கூடாது என்பதைத்தான் நான் இந்தச் சபையிலே வேண்டிக்கொள்கின்றேன். ஒரு குற்றவாளி தண்டிக்கப்படாவிட்டாலும் பரவாயில்லை, ஒரு நிரபராதி தண்டிக்கப்படக்கூடாது என்ற வாதம்தான் சட்டத் துறையிலே முன்வைக்கப்படுகின்றது. ஆனால், இன்று சிறையிலே அடைக்கப்படுகின்ற குற்றவாளிகளை விடுதலை செய்வதற்கு, குறிப்பாக வடக்கு, கிழக்கைச் சேர்ந்தவர்களை விடுதலை செய்வதற்கு எந்த வகையான அழுத்தங்களைக் கொடுக்க முடியுமோ அந்த வகையான அழுத்தங்கள் யாவும் கொடுக்கப்பட்டு வருகின்றன. இன்று ஏனைய பிரதேசங்களுடன் ஒப்பிட்டுப் பார்க்கின்றபோது வடக்கு, கிழக்கிலே இருக்கின்ற நீதிமன்றங்களின் நீதவான்களே அடிக்கடி இடமாற்றப் படுகின்றார்கள்.

நுவரெலியா மாவட்டத்திலே நாங்கள் தேர்தலில் ஈடுபடுகின்றபோது அங்கு பொலிஸ் police entry கூட செய்ய முடியாத ஒரு நிலைமையே இருந்தது. நாங்கள் police entry ஊடாகத்தான் வழக்குகளைத் தொடரமுடியும். ஆனால், பொலிஸ் நிலையங்களில் police entry போடமுடியாது. Magistrate ஐ அதிகரித்தல் மற்றும் நீதித்துறையை ஒழுங்குபடுத்தல் என்பன வரவேற்கத்தக்க விடயம்; வரவேற்கத்தக்க முயற்சி. ஆனால், இவையெல்லாம் எழுத்தில் மட்டும் இருந்துவிடாமல் நடைமுறையிலே வரவேண்டிய தேவை காணப்படுகின்றது. மாண்புமிகு அமைச்சர் அவர்களே, குறிப்பாக வடக்கு, கிழக்கு போன்ற பிரதேசங்களில் நீதித்துறை ஒழுங்காக இருக்கின்றதா? என்பது பற்றி ஆராய்ந்து பார்க்கவேண்டிய தேவையிருக்கின்றது. இன்று கப்பம் அறவிடலானது நுவரெலியா மாவட்டம்வரை சென்றிருக்கின்றது. அதற்கான ஆதாரங்களை உங்களுக்கு தருவதற்கு நாங்கள் தயாராக இருக்கின்றோம். ஹட்டன் நகரிலுள்ள வியாபாரிகளிடமிருந்து பணம் பறிக்கப்படுகின்றது. சாதாரணமாக இன்று ஹட்டன் நகரிலுள்ள வங்கிகளிலிருந்து 2 மில்லியன் ரூபாய் பணத்தைப் பெறுவதற்கு cheque எழுதினால் - அதனூடாக பணத்தைப் பெறுதவதற்கு வாடிக்கையாளர்கள் ஒருகிழமைவரை காத்திருக்க வேண்டிய நிலைமையிருக்கின்றது. 2 மில்லியன் ரூபாய் பெறுமதியான cheque எழுதினால் அதனை தமக்கு அறிவிக்கும்படி bank கூறுகின்றது. இவ்வாறுதான் அங்குள்ள வங்கிகளிலே பணக் கொடுக்கல் வாங்கல்கள் நடைபெறுகின்றன. இவ்வாறான ஒரு சூழ்நிலையில், கப்பக்காரர்களோ 20 மில்லியன் தாருங்கள்! 30 மில்லியன் தாருங்கள்! என்று அங்குள்ள வியாபாரிகளை மிரட்டுகின்றார்கள். ஆனால், இதுவரையில் இந்த விடயம் சம்பந்தமாக எவராவது ஒருவர் -

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய நேரம் முடிவடைந்துவிட்டது.

**ගරු ජේ. ශ්‍රී රංගා මහතා**
(மாண்புமிகு ஜெ. ஸ்ரீ றங்கா)
(The Hon. J. Sri Ranga)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நான் இன்னும் இரண்டு நிமிடங்களில் எனது உரையை முடித்துக்கொள்கின்றேன்.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கு இன்னும் ஒரு நிமிடம் தரலாம்.

**ගරු ජේ. ශ්‍රී රංගා මහතා**
(மாண்புமிகு ஜெ. ஸ்ரீ றங்கா)
(The Hon. J. Sri Ranga)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, எனக்கு பத்து நிமிடங்கள் தரப்பட்டுள்ளது என நினைக்கின்றேன்.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
நீங்கள் உங்களுடைய நேரத்தில் ஒன்பது நிமிடங்கள் பேசிவிட்டீர்கள்.

**ගරු ජේ. ශ්‍රී රංගා මහතා**
(மாண்புமிகு ஜெ. ஸ்ரீ றங்கா)
(The Hon. J. Sri Ranga)
இந்த வகையில், கௌரவ நீதி அமைச்சர் அவர்கள் நீதித்துறையிலுள்ள Primary Court களையும், Magistrate களையும் அதிகரிப்பதற்கும் நீதித்துறை உரியமுறையில் இயங்குவதற்கும் நிச்சயமாக ஆதரவு வழங்கவேண்டும். சில வேளைகளிலே நீதித்துறையினர் என்ன காரணத்துக்காக நீதிபதிகளை இடமாற்றம் செய்கின்றார்கள் என்று நீதி அமைச்சருக்குக்கூடத் தெரியாமல் இருக்கலாம் என நான் நினைக்கின்றேன். ஏனெனில் Judiciary யும் நீதி அமைச்சும் தனித்தனியாகவே இயங்கிக் கொண்டிருக்கின்றன. ஆரம்ப காலகட்டங்களில் இருந்த நீதித்துறை அமைச்சர்களில் சிலர் தமது பேட்டிகளிலே, "இங்கு நாங்கள் Justice of Peace பதவிகளை வழங்குவதற்குத்தான் இருக்கின்றோம்" என்றுகூட நீதித்துறை பற்றி வர்ணித்திருந்தார்கள். ஆனால், இன்று யுத்தம் முடிவடைந்துவிட்டது என்று அரசு அறிவித்த பின்பும்கூட, இந்த நாட்டில் இருக்கின்ற சட்டம் இலங்கை பூராகவும் ஒரேவிதமாக அமுல்நடத்தப்படவில்லை. இதனை நிரூபிப்பதற்குச் சிறந்த உதாரணங்கள் உண்டு. அதாவது, கப்பம் காரணமாக பல தடவைகள் பலர் கொலை செய்யப்பட்டிருக்கின்றார்கள். பலரிடமிருந்து கப்பங்கள் பெறப்பட்டிருக்கின்றன. இன்றுவரை எந்த நீதிமன்றத்திலாவது இத்தகைய குற்றச்செயலில் ஈடுபட்ட ஒருவராவது குற்றத் தீர்ப்பு அளிக்கப்பட்டு தண்டிக்கப் பட்டிருக்கின்றாரா? எவராவது சிறையில் இருக்கிறார்களா? இந்தக் குற்றவாளிகள் எப்படி தப்பித்துக்கொண்டிருக்கிறார்கள்? இதனூடாக நீங்கள் இந்த நாடு பூராக நீதித்துறை ஒழுங்காக செயற்படவில்லை என்பதை அறிந்துகொள்ளலாம். ஹட்டன் நகரிலே கப்பம் வாங்கியவர் மட்டக்களப்பை சேர்ந்தவர்கள் என 'வீரகேசரி' பத்திரிகையின் முதல் பக்கத்தில் செய்தி வெளிவந்தது. ஆனால், இன்றுவரை அக்குற்றச் செயலில் ஈடுபட்டவர்களுக்கு எதிராக எந்தவிதமான நடவடிக்கையும் எடுக்கப்படவில்லை.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய உரையை முடித்துக்கொள்ளுங்கள்!

**ගරු ජේ. ශ්‍රී රංගා මහතා**
(மாண்புமிகு ஜெ. ஸ்ரீ றங்கா)
(The Hon. J. Sri Ranga)
இன்னும் 30 செக்கன்களுக்குள் முடித்துக்கொள்கின்றேன்.

ஏற்கெனவே அரச தரப்பிலுள்ள உறுப்பினர்கள் குறிப்பிட்டதுபோல, இலங்கை பூராகவும் நீதியை ஒழுங்காக நிலைநாட்ட வேண்டுமென்றால், தயவுசெய்து நீதித்துறையில் அரசியல் அழுத்தங்கள் பிரயோகிக்கப் படுவதைத் தடுத்து நிறுத்தி அத்துறையை ஒழுங்காக இயங்கச் செய்யுங்கள்! என்று கேட்டு, எனது உரையை முடித்துக்கொள்கின்றேன். நன்றி.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is the Hon. A.H.M. Azwer. You have 10 minutes.

[අ. භා. 4.36]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
*Bismillahir Rahmanir Raheem.*

Hon. Deputy Chairman of Committees, justice delayed is justice denied! Today, in accordance with this axiom, the Minister of Justice, the Hon. Athauda Seneviratne, has done a very meritorious act in this House.

Not for decades but for centuries, people have paid scant regard to the dispensation of justice. The long delays in courts put the clients into grave hardships. People have to travel from the Eastern Province, the Northern Province, - from all over the island - to Colombo seeking justice spending large sums of money, which they can ill-afford.

I now remember two great names, one was Justice Alhaj M.M. Abdul Cader of Jaffna fame and Justice A.M. Ameen. The Secretary-General may know them well since he himself had been on the Bench and is now serving this House well. Justice Abdul Cader, Sir, at certain circumstances, fell into trouble when he was on the Bench in Matara. The lawyers there almost waged war against him because he was so quick in entering judgments. They complained that they were not afforded sufficient time to even prepare their briefs. The same thing was true of Justice A.M. Ameen of Ahadiya fame. There are judges of this high calibre from all communities, Tamil, Sinhala, Muslim and even from the Malay and Burgher communities. Sir, successive governments have failed to bring legislations to help litigants. The Hon. Athauda Seneviratne has done a great service by bringing in this praiseworthy legislation. He seeks to establish 63 High Courts throughout the Island.

Now, there is another aspect of judiciary in this country. I refer to the Quazi Courts. I would dwell much on this subject.

Sir, the Holy Quran is a book of justice. The *Hadees* or the Teachings of the Holy Prophet is also part of Islamic law and jurisprudence. Then, there is a unique process of justice prevalent in Sri Lanka. This must be remembered, Sir. I remember even the Hon. Dinesh Gunawardena once pointed out in this House, that the laws of the Holy Quran and Sunnah have been incorporated into the law of the land. Legislations have been enacted from time to time for this. That is why I say

[ගරු අල්හාජ් ඒ. එච්. එම්. අස්වර් මහතා]

that our country is unique in this respect. In certain other countries, Islamic Laws exist separately from the established law of the land.

The Marriage and Divorce (Muslim) Act was passed in Parliament in 1951 but was implemented with effect from 1954. It is common ground that a set of laws and procedures codified in this Act which was enacted 59 years ago need certain modifications, in keeping with the changes in social and economic conditions, which the Muslim community has experienced since the latter half of the 20th Century, while of course, keeping in mind that the Shariah Laws are based on the Holy Quran, as I said before, the Sunnah of Prophet Muhammed *Sallallahu Alaihiwasallam*, the consensus of his companions and analogical decisions of the jurists.

Then, Sir, it is recorded in history that despite severe religious persecutions during the period of the Portuguese and the Dutch suzerainty over the Maritime Provinces of Sri Lanka, people were being converted from one religion to another - proselytization - Muslims never gave up their religion. They fled to the hill country. What did the Sinhala kings do? They embraced the Muslims, gave them land and other giftts necessary for them to live harmoniously and peacefully with the large majority of the Sinhala community in this country. This is a fact that must be told to the whole world. It must be reminded and re-reminded that we are part and parcel of this country. We lived amicably and peacefully with the rest of the people, even in places like the Eastern Province and the Northern Province.

It is recorded in history, as I told you, that during the period of the Dutch and the Portuguese suzerainty over the Maritime Provinces of Sri Lanka, the Muslims continued to enjoy the freedom to follow the uncodified customary laws, and for this purpose the religious schools, more fully described as "*Madrasas*", had been of great assistance. These *Madrasas* have been given another connotation in the modern world by the Western Powers. They call the *Madrasas*, the "dens of terrorists". Definitely, it is not so. *Madrasas* are places of teaching religious laws. සිංහලෙන් කියනවා නම්, *Madrasas* කියන්නේ දහම් පාසල්. Only religious laws are taught there. Even I had been to a *Madrasa*. Sir, those days, when we were small, we were sent to a *Lebbe* in a *Madrasa* to study the Holy Quran : "අලිෆ්, බේ, තේ, සේ" - ( ا ب ت ث ). *Lebbe Ummas* - lady teachers taught in these places. I was taught by a Malay *Lebbe Umma* - lady teacher. They were not qualified *Moulavis*, but they taught the basic Principles of Islam and the Holy Quran to children.

Then, here is a great lady, Dr. Lorna Devarja, who, in her book, "The Muslims of Sri Lanka - One Thousand Years of Ethnic Harmony 900-1915" in paragraph 3 of page 35 though gives credence to this state of affairs, goes on to stress that due to harassment at the hands of the uncompromising Portuguese and the Dutch - they were the people who harassed the Muslims. Even today, the Western Power is doing this to us. That is what we call, "Western conspiracy" which harms all the ethnic groups and even the elected Government of this country - the guidance from these *Madrasas* started dwindling and there was no proper implementation of Shariah Laws prior to 1770.

Since even the Muslim lawyers possessed very scant knowledge of the principles of Muslim Law regarding succession et cetera and obtaining opinions of experts also proved unreliable, in 1912 the Supreme Court decided to consult standard textbooks on questions of law when the code was silent. Writing in the Ceylon Law Recorder 1919, Justice M.T. Akbar, one of the eminent Sri Lankans who even helped Lord Soulbury to find a picturesque place to build the Peradeniya University - even a Hall has been named in his honour in the Peradeniya Campus - however characterized it as a calamity from the point of view of the development of Muslim Law in Ceylon.

Then, Sir, the Government for fear of criticism of interfering with the Muslim laws -

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
( குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Minister, you have one more minute.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
( மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I have 10 minutes.

Sir, I would like to table* a document titled "History of Muslim Personal Law Reforms of Sri Lanka" by Alhaj S.M.A. Jabbar, ex-Chairman of the Quazi Board of Review.

From time to time, there have been clarifications and modifications in the Islamic law and in the dispensation of justice as far as the Muslim Marriage and Divorce Act of 1951,the Quazi Court and Wakf Boards are concerned. Also, I have a book here with me, Sir. I must mention about it. Yesterday, I met the Special Commissioner of the Colombo Municipal Council, Mr. Omar Kamil. He handed over the Al-Ameen Law Report to me. In it, it is very clearly mentioned that Muslim Mosques and Charitable Trusts or Wakfs Act, No. 51 of 1956 has been included in this codification. It is very helpful and is of assistance to the busy practitioners, judges, mosques

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

trustees and administrators to keep abreast of the amendments that have from time to time been made to this Act since its enactment, says Mr. Saleem Marsoof, Supreme Court Judge and a very enlightened Jurist in this country, who is also a President's Counsel.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Please wind up, Hon. Member.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
That Report was written, I must say, by Mr. M.H. Gouzul Ameen. It is very well codified. What I would request from the Hon. Minister at this moment is that the Quazi Courts - since they are now judicial appointments - be upgraded; their status be raised up. They must be given proper clerical assistance like any other judges in any court in this country. Sometimes, they function in garages and places like that. It is not in keeping with the status of the law and the dignity of their office. Therefore, I would also very seriously urge the Hon. Minister to look into this aspect and help to uplift the Quazi Courts, so that the Quazis will also be on par with the officers who are dispensing justice in this country.
Thank you, Sir.

[අ. භා. 4.46]

**ගරු වෛද්‍ය ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා නීතිඥයෙක් නොවුණත්, අධිකරණ සේවයට සම්බන්ධ නොවුණත් මහජන නියෝජිතයෙක් ලෙසත්, ඒ වාගේම වෛද්‍යවරයෙක් ලෙසත් ඉතාම සතුටු වනවා, ඉතාම වැදගත් විවාදයක් වූ අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වූ මේ විවාදයට සහභාගී වන්න මට අවස්ථාවක් ලැබීම ගැන.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය වකවානුව තුළ අපේ රටේ අධිකරණ පද්ධතිය පිළිබඳව රටේ ජනතාවගේ තිබුණේ පුදුම විශ්වාසයක්, ගෞරවයක්. සමහර වෙලාවට අපේ රටේ ජනතාව විනිසුරුතුමෙක් ඉදිරිපිට කථා කරන්නේ, -විශේෂයෙන්ම ගම්වල ජනතාව- "පින් කරන හාමුදුරුවනේ; නඩුකාර උන්නාන්සේ." කියලා. අපේ අධිකරණ පද්ධතිය පිළිබඳව ඒ වාගේ විශ්වාසයක් තිබුණා; ගෞරවයක් තිබුණා. අපේ රටේ සමස්ත ජනතාවට විශාල විශ්වාසයක් තිබුණා, අධිකරණ පද්ධතිය තුළින් තමන්ට සාධාරණය, යුක්තිය හා නීතිය ඉටු වෙයි කියලා. අද ඒ විශ්වාසයට මොනවාද වෙලා තිබෙන්නේ?

මේ පාර්ලිමේන්තුවේ නවක, පසු පෙළ මන්ත්‍රීවරයෙක් වන ගරු නාමල් රාජපක්ෂ මැතිතුමා අද සඳහන් කළා,"කැලේ නීතිය ක්‍රියාත්මක නොවිය යුතුයි. රටේ ස්වාධීන අධිකරණය ක්‍රියාත්මක විය යුතුයි." කියලා. අනිත් පැත්තෙන් ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය ඇමතිවරයෙක් කියනවා, "නැහැ, කැලේ නීතිය ක්‍රියාත්මක විය යුතුයි." කියලා. ගස් බඳින්න ඕනෑ කියනවා. අද ගස් බඳිනවා. ගස් බැඳපු මිනිහා ලිපියක් ඉදිරිපත් කරනවා, මම කැමැත්තෙන් ගස් බන්දවා ගත්තා කියලා. මේක මහ පුදුම විහිළුවක්. ගරු අධිකරණ ඇමතිතුමනි, නියෝජ්‍ය ඇමතිතුමනි, ඊළඟට එල්ලුම් ගහට නියම වුණු මිනිහාත් කියාවි, මම එල්ලුම් ගහට කැමැත්තෙන් බෙල්ල දෙනවා කියලා. ගරු අධිකරණ ඇමතිතුමනි, මම යෝජනා කරන්න කැමැතියි, අපි අපේ රටේ උසාවි වසා දමමු කියලා. අධිකරණ පද්ධතියක් අවශ්‍ය නැහැ. දැන් ඔබතුමා උත්සාහ කරනවා අපේ රටේ උසාවි, මහාධිකරණ වැඩි කරන්න. විනිසුරුවරුන් වැඩි කරන්න. ඇයි, මොනවාටද? වැඩක් නැහැ නේ. දැන් අපේ ඇමතිවරු, නියෝජ්‍ය ඇමතිවරු නඩුත් අහලා, තීන්දුවත් දීලා, දඬුවමත් දෙනවා. අපේ නියෝජ්‍ය ඇමති ගරු රෙජිනෝල්ඩ් කුරේ මැතිතුමනි, එහෙම රටකට විනිසුරුවන් අවශ්‍ය නැහැ. කරුණාකරලා අපේ රටේ අධිකරණ පද්ධතිය වසා දමලා, විනිසුරුවන් සියලු දෙනාටම පඩි ඇතිව, ගෞරවාන්විතව ජීවත් වන්න පුළුවන් විධියට නේවාසිකව ඉන්න අවශ්‍ය කටයුතු සලසා දෙන්න. තමුන්නාන්සේලා දැන් එවැනි පනතක් ගෙනෙන්න. මොකද, ඒක තමයි දැන් මේ ආණ්ඩුවෙන් සිදු වන්නේ.

අද අධිකරණ පද්ධතිය පිළිබඳව අපේ රටේ ජනතාවගේ තිබෙන විශ්වාසය කඩා වැටිලා. අද ස්වාධීන රාජ්‍ය සේවා කොමිසම නැහැ. ස්වාධීන පොලිස් කොමිසම නැහැ. විනිසුරුවරුන්ට, අධිකරණයට කරුණු වාර්තා කරන්නේ කවුද? වාර්තාවන් - reports - ඉදිරිපත් කරන්නේ කවුද? අපේ රටේ පොලීසියයි. අද පොලීසිය දේශපාලනීකරණය වෙලා ඉවරයි. අද ස්වාධීන පොලිස් කොමිසම නැහැ. මේ මෑත ඉතිහාසයේ ආසන්නතම සිදු වීම තමයි රුහුණු විශ්වවිද්‍යාලයේ සුසන්ත බණ්ඩාර ශිෂ්‍යයාගේ මරණය. මේ පිළිබඳව පොලිස්පතිවරයා කරුණු ඉදිරිපත් කරනවා. ඒ කරුණුවල සත්‍ය හා අසත්‍යතාව පිළිබඳව, පොලීසියේ හැසිරීම පිළිබඳව රටේ ජනතාවට පැමිණිලි කරන්න තිබෙන්නේ ස්වාධීන පොලිස් කොමිසමට. ගරු අධිකරණ ඇමතිතුමනි,මා මේ පාර්ලිමේන්තුවේ අවුරුදු 16ක් අඛණ්ඩව සිටින මන්ත්‍රීවරයෙක් හැටියට, පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා මා පිළිබඳව කරන ලද ප්‍රකාශයක් සම්බන්ධව එදා තිබුණු ස්වාධීන පොලිස් කොමිසමට මම කරුණු ඉදිරිපත් කළා. ස්වාධීන පොලිස් කොමිසම අපක්ෂපාතීව, ස්වාධීනව ඒ පිළිබඳව පරීක්ෂණයක් පැවැත්වූවා. ඉන් පසුව පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයාට කිව්වා, නිර්දේශ කළා ආචාර ධර්ම පද්ධතියක් හදන්න කියා. මෙන්න මෙහෙමයි මිනිසුන් තුළ, රටේ ජනතාව තුළ යුක්තිය, නීතිය පිළිබඳව විශ්වාසය ගොඩ නඟන්නට පුළුවන් වන්නේ. අද යුක්තිය, නීතිය කැලෑ වැදිලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම වෛද්‍යවරයෙක්. කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයෙන් වෛද්‍ය උපාධිය ලබා ගෙන අවුරුදු 14ක් කොළඹ ජාතික රෝහලේ වෛද්‍යවරයෙක් හැටියට මම කටයුතු කළා. මම විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් ලෙස කල් ඉකුත් වූ රුධිර පාර විලයන පිළිබඳව බඩුත් එක්ක හොරු අල්ලා දුන්නා. ඒ විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් ලෙස. ලංකාවේ තරම් ලේ පරිත්‍යාග කරන පරිත්‍යාගශීලීන් ඉන්න රටක් ලෝකයේ නැහැ. ලෝකයේ කිසිම රටක් නැහැ. කැමැත්තෙන් ඇවිල්ලා ලේ දෙනවා. එහෙම තිබෙන රටක මේ ලේ පරිත්‍යාගශීලීන්ගේ ජීවිත අනාරක්ෂිත තත්ත්වයට පත් කරමින්, අසාධ්‍ය රෝගීන්ගේ ජීවිත අනාරක්ෂිත තත්ත්වයට පත් කරමින් කල් ඉකුත් වූ රුධිර පාර විලයන කට්ටල භාවිතා කිරීම පිළිබඳව මම බඩුත් එක්ක හොරු අල්ලා දුන්නාම ජාතික ලේ බැංකුවේ අධ්‍යක්ෂවරියගේ වැඩ තහනම් කළා. මාස ගණනක් වැඩ තහනම් වෙලා සිටියා. අවසානයේ මොකක්ද වුණේ? කිසිම වග විභාගයක් නැහැ. කිසිම වග උත්තරයක් නැහැ. කිසිම පරීක්ෂණයක් නැහැ. කිසිම විනය පරීක්ෂණයක් නැහැ. අහිංසක මිනිස් ජීවිත ලක්ෂ ගණනක් අනතුරට දමපු කෙනාව, අර ආචාර්ය මර්වින් සිල්වා මහත්මයා කියන ආකාරයට - නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා නොවෙයි- උළ තියන්නට ඕනෑ. නමුත් වරදක් කළ මේ අධ්‍යක්ෂවරියට රටේ පවතින නීතිය අනුව කිසිම පරීක්ෂණයක් නැහැ. මේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ මන්ත්‍රීවරු මේ ගැන ප්‍රශ්න

[ගරු වෛද්‍ය ජයලත් ජයවර්ධන මහතා]

කළාම මොකක්ද කිව්වේ? "මෙම අධ්‍යක්ෂවරියට විරුද්ධව විනය පරීක්ෂණයක් කරන්න අපට හැකියාවක් නැහැ, රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් නැහැ" කියලායි. මෙන්න අපේ රටේ මිනිස් ජීවිතවලට වන අසාධාරණය. රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් නැති නිසා ජීවිත ලක්ෂ ගණනක් අනාරක්ෂිත තත්ත්වයට පත් කළ අධ්‍යක්ෂවරියට විරුද්ධව විනය පරීක්ෂණයක් කරන්න බැහැ; දඬුවම් කරන්න බැහැ. එහෙව් රටක ඉඳ ගෙන තමයි අපි අද මේ අධිකරණ පද්ධතිය ගැන කථා කරන්නේ. මේ සංශෝධන ගෙන එන්නේ මෙහෙම තිබෙන රටක ඉඳ ගෙන තමයි. ස්වාධීන පොලිස් කොමිසමක් නැහැ, ස්වාධීන රාජ්‍ය සේවා කොමිසමක් නැහැ.

ගරු අධිකරණ ඇමතිතුමනි, අද මානව හිමිකම් කොමිසම කෝ? අද මානව හිමිකම් කොමිසමේ සභාපතිවරයා, කොමසාරිස්වරු පත් කරලා තිබෙනවාද? රටේ ජනතාවගේ මානව හිමිකම් ආරක්ෂා කරන්න තිබෙන තැන. ගමේ ඉන්න ජේම්ස් අයියාට, නන්දාවතීට, ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් දාන්න ලක්ෂ ගණන් මුදල් නැති අහිංසක දුප්පත් මිනිසුන්ට යන්න තිබෙන තැන. මානව හිමිකම් කොමිසම අද සම්පූර්ණයෙන්ම අකර්මණ්‍යයි. ඉතින් ඔබතුමා උසාවි වැඩි කරන්න උත්සාහ කරනවා; විනිසුරුවන් වැඩි කරන්න උත්සාහ කරනවා. මේක සාධාරණද? මේක සාධාරණද කියලා කල්පනා කරලා බලන්න. විශේෂයෙන්ම අද උතුරු-නැඟෙනහිර ප්‍රදේශවල අධිකරණය පිළිබඳව විශාල ප්‍රශ්න තිබෙනවා. නැවත පදිංචි කළ අයගේ ඉඩම් ආරවුල් පිළිබඳව -[බාධා කිරීමක්] ඔබතුමාගේ කථාවේදී ඔබතුමා උත්තර දෙන්න.

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
මම කථා කළා.

**ගරු වෛද්‍ය ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)

ඒ පිළිබඳව ප්‍රශ්න තිබෙනවා. මේ අධිකරණ පද්ධතිය පිළිබඳව ජනතාවට විශ්වාසයක් ඇති කරන්න. ජනතාවට ඒ පිළිබඳව ගෞරවණීය විශ්වාසයක් ඇති කරන්න. තමුන්නාන්සේ ඉස්සෙල්ලාම ආකල්පමය වෙනසක් ඇති කරන්නට ක්‍රියා කරන්න. එසේ නැතිව ගමක් ගමක් ගානේ උසාවි දැම්මත්, ගමක් ගමක් ගානේ විනිසුරුවන් පත් කළත් මේ වැඩේ කරන්න නම් බැහැ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒක කෙරෙන්නේ නැහැ. රටේ රජ කරන්නේ කැලේ නීතිය නම් මොකද වන්නේ? අද නීතිය අතට අර ගෙන, මැති ඇමතිවරු නීතිය අතට අර ගෙන මිනිසුන්ව ගස් බඳිනවා. රජයේ සේවකයින්ව ගස් බඳිනවා. ඩෙංගු පාලනය කළ යුතුයි. රජයේ නිලධාරියෙක් යම් වරදක් කරලා තිබෙනවා නම්, තමන්ගේ වගකීම පැහැර හැර තිබෙනවා නම් ඒ පිළිබඳව ක්‍රියා කරන්න පුළුවන් ක්‍රියා පටිපාටියක් අපේ රටේ තිබෙනවා. AR, FR තිබෙනවා. විනය පරීක්ෂණ තිබෙනවා. රාජ්‍ය සේවා කොමිසමක් ශක්තිමත්ව ක්‍රියාත්මක වන්නට ඕනෑ. එහෙම වුණොත් පමණයි රටේ නීතිය පිළිබඳව ජනතාවගේ විශ්වාසයක් ඇති වන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හෙට අනිද්දා වන කොට ගමේ ඉන්න දේශපාලන ගණන්කාරයෝ නඩු අහලා, ගමේ ඉඳ ගෙන නඩු තීන්දු දෙන්න පටන් ගනීවි. එදා එල්ටීටීඊ සංවිධානයේ උසාවි පිළිබඳව මොකක්ද කිව්වේ? මොකක්ද කිව්වේ? අද තමුන්නාන්සේලා කුමරන් පද්මනාදන්ව ආරක්ෂා කරනවා. විමල් වීරවංශ ඇමතිතුමා අද මෙතැන හිටියා නම් මම බොහොම සතුටු වනවා. එතුමා කියන්නේ මොනවාද? සාධාරණීකරණය කරන්න උත්සාහ කරන්නේ කොහොමද? යක්කුන්ගෙන් හරි අපි වැඩ ගන්නවා; කුමරන් පද්මනාදන්ගෙනුත් දැන් අපි වැඩ ගන්නවා කියනවා. ගරු ඇමතිතුමනි, එහෙත් එල්ටීටීඊ ක්‍රියාකාරකම්වලට සම්බන්ධයි කියලා තරුණ තරුණියෝ 11,000ක් තවම සිරගත කරලා තබා ගෙන ඉන්නවා. ගරු අධිකරණ ඇමතිතුමනි, කේපීට එක නීතියක් -කුමරන් පද්මනාදන්ට එක නීතියක්- සහ අනෙකුත් තරුණ තරුණියන්ට තවත් නීතියක් ක්‍රියාත්මක වන රටකයි අපි අධිකරණය ගැන කථා කරන්නේ. කේපී ට දෙන්න ඕනෑ ඒ පුද සත්කාරකම් දෙන කොට, ගිහිල්ලා බලන්න, වැලිකඩ බන්ධනාගාරයේ, අපේ බන්ධනාගාරවල අද වන තුරු කිසිම නඩු නිමිත්තක් නැති කී දාහක් ඉන්නවාද කියලා. මා මෙය වග කීමෙන් යුතුවයි කියන්නේ. මම දන්නවා නීතිපති දෙපාර්තමේන්තුවේ, අධිකරණ අමාත්‍යාංශයේ නිලධාරින් මෙතැන ඉන්නවා කියලා. කරුණාකරලා තමුන්නාන්සේ යවා බලන්න. කී දෙනෙක් ඉන්නවාද? සිය ගණනක් ඉන්නවා. අවුරුදු එකක්, දෙකක්, තුනක්, හතරක්, පහක් නොවෙයි, දහයක්, එකොළහක් තිස්සේ ඔවුන්ට කිසිම නඩු නිමිත්තක් නැහැ; there is no indictment. සමහර නඩු පටන් අරගෙන අවුරුදු ගණන් ප්‍රමාද වනවා. අපි ජනතාවගේ විශ්වාසය දිනා ගන්න උත්සාහ කරන්නේ මෙහෙමද? මේ රටේ ත්‍රස්තවාදයට නැවත වරක් හිස ඔසවන්නට ඉඩ නොතබන්නට මෙහෙමද අපි ක්‍රියා කරන්නේ? මේක බරපතළ ප්‍රශ්නයක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම අද මේ පාර්ලිමේන්තුවේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ගැන අපි කථා කරනවා. මේක තමයි නීති සම්පාදනය කරන උත්තරීතර සභාව. අපි මන්ත්‍රීවරුන්ට ඉංග්‍රීසියෙන් කියන්නේ මොකක්ද? Legislators; නීති සම්පාදකවරු. පාර්ලිමේන්තුවක ආණ්ඩු පක්ෂයක් තිබෙනවා, විපක්ෂයක් තිබෙනවා. විපක්ෂයට ඉන්නවා විපක්ෂ නායකවරයෙක්. රනිල් වික්‍රමසිංහ මැතිතුමාද, චන්ද්‍රාණි බණ්ඩාර මැතිනියද, ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමාද කියන එක නොවෙයි තිබෙන ප්‍රශ්නය. පුද්ගලයෙක් ගැන නොවෙයි ප්‍රශ්නය තිබෙන්නේ. විපක්ෂ නායකවරයෙක් ඉන්නවා. රටේ විධායක ජනාධිපතිවරයෙක් ඉන්නවා. අද ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රටේ ව්‍යවස්ථා සංශෝධනයක් පිළිබඳව, නීති කෙටුම්පත් සංශෝධනයක් පිළිබඳව සාකච්ඡා කරන්න විපක්ෂ නායකවරයාට ආරාධනා කරනවා. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් තුළ පාර්ලිමේන්තු ක්‍රමයක් ක්‍රියාත්මක වන පාර්ලිමේන්තු රාමුවක් තුළ ජනාධිපතිවරයාගේ ආරාධනය පිළි අරගෙන විපක්ෂ නායකවරයා සාකච්ඡා කරන්න යනවා. ජනාධිපතිතුමාත්, විපක්ෂ නායකතුමාත් බොහොම විවෘතව මේ පිළිබඳව සාකච්ඡා කරපු බව වාර්තා වෙලා තිබෙනවා. අද අපේ රටේ ත්‍රෛනිකායක මහා නායක ස්වාමීන් වහන්සේලා ප්‍රධාන ගෞරවණීය අන්‍ය ආගමික පූජක උතුමන්ලා, රටේ විද්වතුන් බලාපොරොත්තු වන්නේ මොකක්ද? රටේ ජාතික ප්‍රශ්න විසඳද්දී හැකියාවක් තිබෙනවා නම් ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ පොදු මතයක් -පොදු එකඟතාවක් -ඇති කර ගන්න. එහෙම නැත්නම් එකඟ නොවන්නත්, එකඟ වන්නත් - even to disagree or to agree - මේක තමයි පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මට පුදුම කල කිරීමක් ඇති වුණා, කනගාටුවක් ඇති වුණා. මර්වින් සිල්වා නියෝජ්‍ය ඇමතිතුමා අද මොකක්ද කිව්වේ? රැට රෑට හොරෙන් ගිහිල්ලා විපක්ෂ නායකවරයා ජනාධිපතිතුමාත් එක්ක සාකච්ඡා කරනවා කිව්වා. මේක මොන තරම් නින්දිත කථාවක්ද? මේ රටට කියන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රටේ වග කිව යුතු විධායක ජනාධිපතිවරයා සහ රටේ වග කිව යුතු විපක්ෂ නායකවරයා රටේ ප්‍රශ්න පිළිබඳව, නීතිය පිළිබඳව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම පිළිබඳව කථා කරන කොට පාර්ලිමේන්තු සභා ගර්භයේදී ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන්, ඇමතිවරුන්ගෙන් මේ විධියට නින්දා අපහාස අහන්නට සිදු වනවා නම් විපක්ෂයේ මන්ත්‍රීවරුන් හැටියට අපටත් අයිතියක්, යුතුකමක්, වග කීමක් තිබෙනවා විපක්ෂනායකතුමාට කියන්න, මීට පස්සේ මෙවැනි හැල්ලුවීමකට ලක් වන්න එවැනි සාකච්ඡාවලට යන්න එපාය කියා. අපේ හාමුදුරුවනේ, අපටත් තිබෙනවා ආත්ම ගෞරවයක්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පාර්ලිමේන්තු

වරප්‍රසාද පාවිච්චි කරලා රටේ ජනාධිපතිවරයාගේ ආරාධනාවට විපක්ෂනායකවරයා ගියාම මේ විධියට අපහාස කරනවා නම්, ජනතාව නියෝජනය කරන විපක්ෂයක් හැල්ලුවට ලක් කරනවා නම්, ඒ විපක්ෂයට නින්දා කරනවා නම්, අපහාස කරනවා නම්, විපක්ෂයේ මන්ත්‍රීවරුන් හැටියට අපටත් සිදු වනවා විපක්ෂය වෙනුවෙන් තීන්දුවක් ගන්න. අපිත් පොල් ගාලා ආපු අය නොවෙයි. රටේ ජනතාවගේ ඡන්දයෙන් -මා නියෝජනය කරන ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාවගේ ඡන්දයෙන්- පුරා අවුරුදු 16ක් අඛණ්ඩව මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් මම. මා ප්‍රතාපවත් දේශපාලන පවුලකට අයිති කෙනකු නොවෙයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රටේ සාමාන්‍ය පවුලක ඉපදිලා, ගමේ සාමාන්‍ය පාසලට ගිහිල්ලා, සිංහල මාධ්‍යයෙන් උසස් පෙළ කරලා, කොළඹ වෛද්‍ය විද්‍යාලයට ඇතුළු වන කොට මම දැන ගෙන සිටියේ "Yes" සහ "No" කියන වචන දෙක පමණයි. අපි එහෙම ඇවිත් මේ සමාජයේ පිළි ගැනීමට ලක් වුණු අයයි.

දැන් රටේ යුද්ධයත් ඉවරයි. අවුරුදු 30ක් තිබුණු යුද්ධය ඉවරයි. එහි සම්මානය කවුරු ගත්තත් ප්‍රශ්නයක් නැහැ. අපට රටක් අවශ්‍ය වනවා. අපේ රටේ ප්‍රධානම ආයතන තුන තමයි විධායකය, ව්‍යවස්ථාදායක සහ අධිකරණය.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, you have two minutes more.

**ගරු වෛද්‍ය ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
අධිකරණ පද්ධතිය මේ ආකාරයට හැල්ලුවට ලක් කරනවා නම්, රටේ කැලෑ නීතිය ක්‍රියාත්මක කරන්න උත්සාහ කරනවා නම්, මිනිසුන්ව ගස් බඳිනවා නම් මේ පනත් කෙටුම්පතට සංශෝධනයක් හැටියට පාර්ලිමේන්තුවට මා යෝජනා කරන්න කැමැතියි සියලුම අධිකරණ බලතල මේ රජයේ මැති ඇමතිවරුන්ට දෙන්නය කියා. ගරු අධිකරණ ඇමතිතුමනි, නඩු ඇසීමේ බලතල, සාක්ෂි විමර්ශනය කිරීමේ බලතල සහ නඩු අවසානයේ දඬුවම් කිරීමේ බලතලත් මේ පාලක පක්ෂයේ මැති ඇමතිවරුන්ට දෙන්න. විනිසුරුවරු අවශ්‍ය වන්නේ නැහැ.

**ගරු එච්. ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச். ஆர். மித்ரபால)
(The Hon. H.R. Mithrapala)
ලිඛිතව ඉදිරිපත් කරන්න.

**ගරු වෛද්‍ය ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
මොකටද ලිඛිතව ඉදිරිපත් කරන්නේ? මේ පාර්ලිමේන්තුවේ බොහොම විවෘතවයි මම කියන්නේ. අධිකරණය වහලා දමමු.

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
ලිඛිතව ඉදිරිපත් කරන්න.

**ගරු වෛද්‍ය ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
ඒකත් කරනවා දැන් ගරු ඇමතිතුමනි, ඒක දැන් කෙරෙනවා.

**ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා (බුද්ධ ශාසන හා ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன - பௌத்த சாசன, மத அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. M.K.A.D.S. Gunawardana - Deputy Minister of Buddha Sasana and Religious Affairs)
සංශෝධන ගේන්න.

**ගරු වෛද්‍ය ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
අයියෝ! තමුන්නාන්සේ මේ සංශෝධන ගැන කථා කරනවා. මර්වින් සිල්වා නියෝජ්‍ය ඇමතිතුමා රජයේ නිලධාරින්ව ගස් බඳිනවා. ලජ්ජා නැද්ද? ඒකත් කෙරුවේ ලිඛිතව දීලාද?

**ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා**
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன)
(The Hon. M.K.A.D.S. Gunawardana)
ගස් බැන්දත් හැඳෙන්නේ නැති සමහර අය ඉන්නවා මෙතැන.

**ගරු වෛද්‍ය ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
හරියට හරි. කට බොරු කිව්වත් දිව බොරු කියන්නේ නැහැ. හැබැයි, ගුණවර්ධන මැතිතුමනි, නාමල් රාජපක්ෂ මැතිතුමා ඒක අනුමත කරන්නේ නැහැ. එතුමා බොහොම පැහැදිලිව එතුමාගේ කථාවේදී කියලා තිබෙනවා රටේ කැලෑ නීතිය ක්‍රියාත්මක කරන්න එපා කියලා. එතුමා රටේ ජනාධිපතිතුමාගේ සහජාත පුත්‍රයා. [බාධා කිරීමක්]ඒක දැන් ඔබතුමාත් අනුමත කරන්නේ නැතුව "නැහැ"යි කියන්න බැහැ නේ. ඔබතුමාත් බොහොම ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්. යුක්තිගරුක සාධාරණ මන්ත්‍රීවරයෙක්.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
අර මනුස්සයා තනියම ගිහිල්ලා ගස් බැඳ ගෙන.

**ගරු වෛද්‍ය ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
ඒක තමයි මන්ත්‍රීතුමා මම දැන් කිව්වේ. එයා තනියම ගස් බැඳ ගෙන. මේක පුදුම ලෝකයක් නේ. හම්බන්තොට දිස්ත්‍රික්කයේත් එහෙම අය ඉන්නවාද දන්නේ නැහැ. හම්බන්තොට දිස්ත්‍රික්කයේත් හෙට අනිද්දා වන කොට තනියම ගිහිල්ලා ගස් බැඳ ගන්න අය ඉදීවිද දන්නේ නැහැ. මේ වාගේ දේවල් බොහොම ලස්සනයි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, please wind up. Your time is over.

**ගරු වෛද්‍ය ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේවා අපි නිකම් උසුළු විසුළු කළ යුතු ඒවා නොවෙයි. රටේ අධිකරණ පද්ධතිය ගැන ජනතාවගේ විශ්වාසයක් තිබෙනවා. මම මගේ කථාවේදී කිව්වේ ඒකයි. "පින් කරන හාමුදුරුවනේ!" කියලා අපේ රටේ අහිංසක මිනිස්සු විනිසුරුවන්ට ආමන්ත්‍රණය කරන්නේ තමුන්ගේ යුක්තිය, නීතිය, සදාචාරය, සාධාරණය අධිකරණයෙන් ඉටු වනවා දකින්නයි. එහෙම දෙයක් අද දකින්න නැහැයි කියන එක ඉතා කනගාටුවෙන් වුණත් ප්‍රකාශ කරනවා.

[ගරු වෛද්‍ය ජයලත් ජයවර්ධන මහතා]

පාලිත තෙවරප්පෙරුම මන්ත්‍රීතුමා මේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ මන්ත්‍රීවරයෙක්. ගරු නියෝජ්‍ය අධිකරණ ඇමතිතුමනි, එතුමාට විරුද්ධව නඩු නිමිත්තක් තිබෙනවා. එතුමා තමුන්නාන්සේගේ දිස්ත්‍රික්කයයි නියෝජනය කරන්නේ. කරුණාකර නීතිපති දෙපාර්තමේන්තුවට උපදෙස් දෙන්න ඒ මන්ත්‍රීවරයා පිළිබඳව තිබෙන වාර්තා හැකි ඉක්මනින් අධිකරණයට ඉදිරිපත් කරන්න කියලා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ තත්ත්වය මේක නම් රටේ, ගමේ සාමාන්‍ය පුරවැසියා ගැන කුමන කථාද ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Chandima Weerakkody. Before that, will an Hon. Member propose the Hon. Alhaj A.H.M. Azwer to take the Chair?

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා (සෞඛ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன - சுகாதார அமைச்சர்)
(The Hon. Maithripala Sirisena - Minister of Health)

I propose that the Hon. Alhaj A.H.M. Azwer do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. ALHAJ A.H.M AZWER *took the Chair.*

[අ. භා. 5.06]

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)

Mr. Presiding Member, this is a very important amendment to the Judicature Act. Perhaps all of you may be aware, prior to 2007 people from all over the country had to come to Colombo to an Appellate Court. This Government, as a government that has understood the grievances of the poor litigants living in far away places, decided to bring in an amendment and start civil appellate courts. Civil Appellate Courts were set up in 2008. You may be aware that final orders given to cases by District Courts as far back as in 1994 were pending determination in the Court of Appeal. But, with this amendment, those cases that were filed in the Court of Appeal were transferred from the Court of Appeal to the relevant provincial civil appellate courts. As a result, tenant cultivators and various people who had land problems who suffered due to inordinate delay in determinations, are now in a position to obtain relief. In 2008, the number of High Court Judges was increased from 40 to 60 and by this amendment that number will be go up to 75. I must say that this will not only benefit litigants but also our judicial system and the profession. But, of course in implementing this amendment merely by increasing the number of judges to 75, we cannot deliver the expectations of the litigants and the general public of this country. This is only a single step of a long and massive process of the Government to set up provincial civil appellate courts and other institutes.

We have to think of the recruitment of mudliyars, other staff and also setting up of buildings. It is indeed a costly affair. Also, I must say that there are other practical difficulties that the profession and the system are faced with due to decentralization. The Hon. Minister has already drawn his attention to most of these problems. On days when these matters were heard by the Court of Appeal, the most important cases were recorded and reported. But now, since these cases are heard in the respective areas, there may be some inconsistency in the judgments given by the various civil appellate courts. That, on the one hand, helps advancement of law. But, practically to-date, there is no system to report these cases for the benefit of the litigants to get the benefit of such decisions given by various appellate court judges. Therefore, I propose that a system be introduced to report these judgments and communicate to the members of the profession and to the general public. This Government has not only considered the aspirations and expectations of the general public and the litigants. Now the war has come to an end. Sri Lanka is one of the safest countries to invest. Sri Lanka is now one of the safest countries for tourists. For investments to come into the country, we are ready with labour, unskilled and skilled. We are ready to provide electricity; we are ready to provide water and other facilities. Ample land is available. We have won investor confidence. But, at the same time we must think of a proper, effective legal framework and a system.

Now, the Government is contemplating. We are in the process of amending our laws in order to suit development of commerce and industry. As at now, jurisdiction of Intellectual Property Act is restricted to Colombo. The jurisdiction of Companies Act is restricted to the Colombo Commercial High Court and the jurisdiction of Admiralty Jurisdiction Act is restricted to the Colombo High Court No. 1 and arbitration enforcement can only be exercised by the Colombo High Court No. 1.

As you may all know, Hambantota Port is almost complete and 60 per cent of construction of Oluvil Port has also been completed. The Galle Port expansion is taking place. It is the right time now to decentralize admiralty jurisdiction in order to facilitate investors and industry. The Commercial High Court should also go to the villages and to the provinces to promote industry and commerce. We have now given thought and in time to come, these also will be implemented by this Government.

Simplification of procedures is a must. Long years back, during the kings' time, we had a system of legal administration. During that time, cases were heard and the decisions were given the same day. We had our own way; we had our own system. But unfortunately, since we decided to follow the Roman-Dutch Law, English Law and various other laws that are practised elsewhere in the world, laws delays started. Unfortunately, during the past so many years, when amending laws, we have always reprinted in verbatim various pieces of laws followed by various other countries. It is now the right time for us to make use of Sri Lankan legal expertise when amending Sri Lankan law.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, it is the right time to wind up also.

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
Yes. I will wind up within a few minutes.

Today, so many Members of the Opposition were criticizing the judiciary and the Attorney-General's Department. As a former member of the Attorney-General's Department, I must say this. The Hon. Member was referring to the Attorney-General giving instructions to withhold inquiry. Hon. Member, it is part of the Attorney-General's role to advise police in any criminal matter when IB extracts are referred to the Attorney-General. Hon. Presiding Member, the process has to stay till the Attorney-General's opinion is given; advice is given. So, these are simple things and anyone aggrieved can make representations to the Attorney-General. The Attorney-General being a quasi-judicial officer, is vested with these powers.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, please wind up.

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
I appeal to the Members of the Opposition to speak responsibly. If there is an instance where you are not satisfied of a judgment, criticize that judgment constructively. Do not attack or sling mud against judges. Thank you.

[අ. භා. 5.18]

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැදගත් පනතක් සම්බන්ධව මෙම උත්තරීතර සභාවේදී කථා කරන්න ලැබීම ඉතාමත් වටිනා අවස්ථාවක් විධියටයි මා සලකන්නේ. රටක් ගැන විශ්වාසය ඇති වන තවත් ආයතනයක් විධියට මට අධිකරණය හඳුන්වන්න පුළුවන්. අතිගරු ජනාධිපතිතුමා අපේ රට එල්ටීටීඊ කුරිරු ත්‍රස්තවාදයෙන් නිදහස් කරලා, රට එක්සේසත් කරලා වේගවත් සංවර්ධනයක් කරා යන ගමනේදී -ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්ය කරා ගෙන යන ගමනේදී- අධිකරණයේ කාර්යක්ෂමතාව සහ අධිකරණය කෙරෙහි පවතින විශ්වාසය ඉතාමත් වැදගත් වනවා. විශේෂයෙන්ම මේ පනත මඟින් අපේ අධිකරණ ක්‍රමය සම්බන්ධයෙන් ඉතා වැදගත් ඉදිරියකට යෑමක් සිදු කිරීමට බලාපොරොත්තු වනවා. විශේෂයෙන්ම අධිකරණ සංවිධාන පනත, කලින් තිබුණු උසාවි ආඥාපනත, යුක්තිය පසිඳ ලීමේ පනත වැනි පනත් අපේ රටේ අධිකරණ පෙරාවලිය ගෙන යන්න සහාය වුණා. අපි දන්නවා, 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත අවස්ථා ගණනාවකදී සංශෝධනය වුණු බව. අද දින විවාදයට ගැනෙන මේ සංශෝධන පනත් කෙටුම්පත මඟින් අප රටේ තියෙන ගැටලුවක් විසඳා ගන්න, ප්‍රමාදයකින් තොරව නඩු කටයුතු ඉදිරියට ගෙන යන්න, ඉතාමත් රුකුලක්, ශක්තියක් ලැබෙන බව විශේෂයෙන්ම මා කියන්න ඕනෑ. ඒ වාගේම ජනතාවට වඩාත් සරලව සහ ඉතාමත් පහසුවෙන් ප්‍රවේශ විය හැකි මාර්ගයක් නව අධිකරණ පිහිටුවීම, නව විනිසුරුවන් පත් කිරීම තුළින් සිද්ධ වනවා. විශේෂයෙන්ම මහාධිකරණ විනිශ්චයකාරවරුන් පත් කිරීම මඟින් අද අපේ රටේ මහාධිකරණවල ගොනු කර තිබෙන අධිචෝදනා සම්බන්ධ නඩු කඩිනමින් විභාග කර අවසන් කරන්නට පුළුවන් වනවා. ඒ වාගේම මෙහිදී ඇප අයදුම් පත්‍ර විමර්ශනය කිරීම විශේෂ තැනක් ගන්නවා. ඒ වාගේම වාණිජ කටයුතුවලදී අදාළ වන Commercial High Court සම්බන්ධයෙන් විශාල ගැටලු තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඉක්මනින් ප්‍රතිකර්ම සලසා ගන්න ඒ පාර්ශ්වකරුවන්ට හැකි වනවා. කම්කරු විනිශ්චය සභාවලින් දෙන තීන්දු සම්බන්ධයෙන් අභියාචනා කිරීමට පුළුවන් වනවා. ඒ වාගේම ප්‍රාථමික නඩු සම්බන්ධයෙන් ප්‍රතිශෝධන බලය වැනි බලතල ලබා දුන්නා. 2007 අවුරුද්දේ පළාත් සභා විෂයෙහිලා ගැනෙන ඒ රිට් අයදුම්පත්‍ර ඒ වාගේම 2007 වර්ෂයේ පිහිටුවන ලද පළාත්බද සිවිල් මහාධිකරණය මඟින් මේ රටේ නීති ක්ෂේත්‍රයේ පැවැති විශාලතම ගැටලුවක් විසඳා ගන්න අපේ රජයට හැකි වෙලා තිබෙනවා. ඒ නිසා මහාධිකරණ විනිශ්චයකාරවරුන් සංඛ්‍යාව වැඩි කිරීම තුළින් දැනට පවතින තත්ත්වයට වඩා වැඩි කාර්යක්ෂම සේවයක් අධිකරණය තුළින් අපේ රටේ ජනතාවට ලබා දීමට හැකි වනවා.

විශේෂයෙන්ම මා කියන්න ඕනෑ පසු ගිය කාල සීමාවේ උතුරු නැඟෙනහිර පළාත්වල එල්ටීටීඊ උසාවි තිබුණ බව. දැන් ඒ උසාවි ඉවත් කරලා මේ රටේ සාමය ඇති කර තිබෙනවා. දැන් ඒ ප්‍රදේශවල අපේ රටේ නීතිය ක්‍රියාත්මක වෙනවා. ඒ තුළින් ඒ ජනතාවට සහන ලබා ගන්න අවස්ථාව ලැබී තිබෙනවා. මේ ඉතාම වටිනා අවස්ථාවක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අම්පාර දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට තේරී පත් වුණු මන්ත්‍රීවරියක හැටියටත් ඒ වාගේම නීතිඥවරියක හැටියටත් අම්පාරේ, කල්මුනේ මහාධිකරණය පිහිටුවීම ගැනත් මා ස්තුතිවන්ත වෙන්න ඕනෑ. අම්පාර මහාධිකරණයේ දෙමළ භාෂාව කථා කරන ජනතාවගේ නඩු විශාල ප්‍රමාණයක් එකතු වෙලා තිබුණා. 2008 අවුරුද්දේ කල්මුනේ ප්‍රදේශයේ මහාධිකරණයක් පිහිටුවලා දෙමළ භාෂාව කථා කරන ඒ ජනතාවට කාර්යක්ෂමව තම නඩු විසඳා ගන්න අපේ රජයෙන් අවස්ථාවක් ලබා දුන්නා. ඒක සුවිශේෂී අවස්ථාවක්. නමුත් මා විශේෂයෙන් මේ කාරණයත් කියන්න ඕනෑ. මා ගරු අධිකරණ අමාත්‍යතුමා සමඟත් මේ ගැන කථා කළා. දෙමළ භාෂාව කථා කරන ජනතාවට තම නඩු විසඳා ගන්න සුවිශේෂී අවස්ථාවක් ලබා දීලා ඔවුන්ට ඒ සහනය ලබා දුන්නා. නමුත් දීඝවාපිය ප්‍රදේශයේ සිංහල භාෂාව කථා කරන ජනතාවත් මේ අධිකරණ කලාපයට ඇතුළත්වීම තුළ යම් ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා ගරු අමාත්‍යතුමාටත්, මේ ගරු සභාවටත් මා යෝජනාවක් ඉදිරිපත් කරනවා, සිංහල භාෂාව කථා කරන ඒ ජනතාව සිංහල භාෂාවෙන් වැඩ කරන අධිකරණ කලාපයකට

[ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය]

සම්බන්ධ කරලා ඔවුන්ගේ කටයුතු තම භාෂාවෙන් විනිවිදභාවයකින් යුතුව කර ගෙන යන්න අවස්ථාවක් සලසා දෙන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාති උසාවි ගැන ඔබතුමාත් කථා කළා. මුස්ලිම් කාන්තාවන් වෙනුවෙන් කාති උසාවි පිහිටුවීම ගැන කාන්තාවක් හැටියට මා ඉතාමත් සතුටු වනවා. කාති උසාවි පිහිටුවීම තුළින් කල්මුනේ ප්‍රදේශයේ මුස්ලිම් කාන්තාවන්ට විශාල රැකවරණයක් සහ සහනයක් ලබා දෙන්නත් අපේ රජයට හැකියාව ලැබුණා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමිය, දැනටත් එහේ කාති උසාවි තිබෙනවා. මම කිව්වේ ඒවායේ තත්ත්වය උසස් කරන්න කියලායි.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
මේ කාති උසාවි පිහිටුවීමත් අපේ දිස්ත්‍රික්කයේ ජනතාවට කරන ලද ලොකු උදව්වක් විධියටයි මා සලකන්නේ.

අධිකරණ සංවිධාන පනත සංශෝධනය කරන මේ අවස්ථාවේදී, මහාධිකරණ විනිශ්චයකාරවරුන් 60 සිට 75 දක්වා වැඩි කරන අවස්ථාවේදී අධිකරණය සම්බන්ධයෙන් යෝජනා කිහිපයක් කරන්න මා බලාපොරොත්තු වනවා. ගරු මහාචාර්ය ජී.එල්. පීරිස් අමාත්‍යතුමාත්, ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාත්, ගරු අජිත් පෙරේරා මන්ත්‍රීතුමාත් මේ උත්තරීතර සභාවට අධිකරණය සම්බන්ධයෙන් හොඳ යෝජනා ඉදිරිපත් කළා.

අධිකරණයේ කටයුතුවල කාර්යක්ෂමතාව වැඩි කිරීමේදී විශේෂයෙන්ම රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ, ඇඟිලි සලකුණු රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ, සැක කටයුතු ලේඛන පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ කටයුතු වාගේම අධිකරණ වෛද්‍ය නිලධාරින්ගේ කාර්යපටිපාටිය විධිමත් කරලා, ඒ කටයුතු කාර්යක්ෂම කරලා අප බලාපොරොත්තු වන මේ ඉලක්කයට යන්නට විශේෂයෙන්ම අපේ රජයේ අවධානය යොමු වන්න ඕනෑ.

ඒ වාගේම අල්ලස් සම්බන්ධයෙන් කථා කරද්දී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙන් පවරන නඩු විසඳන්නට මහාධිකරණයට බලය ලබා දුන්නොත් මීට වඩා ඒ කටයුතු කාර්යක්ෂම කරන්න පුළුවන් කියා මා විශ්වාස කරනවා.

ඒ වාගේම පීඩාකාරී ආයුධ පනත, විදුලිබල මණ්ඩල පනත, පුරාවස්තු පනත වැනි පනත්වලට අදාළ කරුණු සම්බන්ධයෙන් ඇප දීමේ බලය මහාධිකරණවලට ලබා දීමේ හැකියාවක් තිබෙනවා. ඒ වාගේම අපේ නියම සංකල්පය ක්‍රියාත්මක කරන්න නම් මානව හිමිකම් සම්බන්ධයෙන් මූලික විමර්ශනයක්වත් කරන්න මහාධිකරණයකට අවස්ථාව ලබා දීම ඉතාමත් සුදුසුයි කියන යෝජනාව මම ඉදිරිපත් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි.

දැන් ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා - [නැත]

Then, the Hon. Lalith Dissanayake - [*Pause.*] Not here. The next speaker is the Hon. Perumal Rajathurai.

[பி.ப. 5.29]

**ගරු පෙරුමාල් රාජදුරයි මහතා**
(மாண்புமிகு பெருமாள் ராஜதுரை)
(The Hon. Perumal Rajathurai)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நீதித்துறை (திருத்தச்) சட்டமூலம் இந்தச் சபையிலே விவாதத்துக்கு எடுத்துக் கொள்ளப்பட்டுள்ளது. மேல் நீதிமன்ற நீதிபதிகளின், அதாவது High Court Judges - எண்ணிக்கையை அறுபதிலிருந்து எழுபத்தைந்தாக உயர்த்துவதற்கு வகைசெய்யும் விதத்திலேயே இந்தச் சட்டமூலம் முன்வைக்கப்பட்டுள்ளது. ஆனால், இன்று எனக்கு முன்னர் இந்தப் பாராளுமன்றத்திலே பேசிய நுவரெலியா மாவட்டப் பாராளுமன்ற உறுப்பினர் கௌரவ ஸ்ரீ றங்கா அவர்கள் Magistrates - அதாவது நீதவான்களின் எண்ணிக்கையையும் Primary Courts - ஆரம்ப நீதிமன்றங்களின் எண்ணிக்கையையும் அதிகரிப்பதற்கான சட்டமூலம் சம்பந்தமாகவே இன்று விவாதம் நடைபெறுகின்றது என்ற ஒரு பிழையான கருத்தை முன்வைத்தார். இங்கு தெரிவிக்கப்படுகின்ற விடயங்கள் முழுவதும் ஹன்சாட் இல் பதிவுசெய்யப்படும். எனவே, இவ்வாறு தவறான கருத்துக்களை முன்வைப்பது ஒரு பிழையான நடைமுறை. இங்கு எதையும் பேசலாம் என்பதைவிட, கொடுக்கப்பட்ட விடயம் தொடர்பிலான கருத்துக்களையே முன்வைக்க வேண்டும் என்று நான் கேட்டுக் கொள்கின்றேன். தொடர்ந்து எனது உரையைச் சிங்களமொழியில் நிகழ்த்த விரும்புகின்றேன்.

මහාධිකරණ විනිසුරුතුමන්ලාගේ සංඛ්‍යාව වැඩි කිරීම සඳහා අධිකරණ සංවිධාන පනතට කරනු ලබන සංශෝධන පිළිබඳව අදහස් දැක්වීමට මට අවස්ථාවක් ලබා දීම පිළිබඳව ප්‍රථමයෙන්ම මාගේ ස්තුතිය ඔබතුමාට මම පිරිනමනවා.

අවුරුදු පහළොවකට අධික කාලයක් නුවරඑළිය දිස්ත්‍රික්කයේ විවිධ අධිකරණවල නීතිඥයකු ලෙසද, වසර අටකට වැඩි කාලයක් නුවරඑළියේ වැඩ බලන මහේස්ත්‍රාත්වරයකු ලෙසද මම කටයුතු කර තිබෙනවා. ඒ නිසා කොළඹින් ඈත ප්‍රදේශයක යුක්තිය ඉටු වීමේ ක්‍රියාවලිය සිදු වන ආකාරය ගැන මට හොඳ ප්‍රායෝගික අවබෝධයක් තිබෙනවාය කියලා මා හිතනවා. කලකට ඉහත නුවරඑළිය ප්‍රදේශය වැනි කොළඹින් ඈත ප්‍රදේශයක කෙනකුට වුවත් තමන්ගේ අභියාචනා නඩුවක් අසන්න කොළඹට එන්න සිද්ධ වුණා. නුවරඑළිය දිසා අධිකරණයේ තීන්දුවකට අභියාචනා කරන්න වුවත් කොළඹ අභියාචනාධිකරණයට එන්න සිද්ධ වුණා. මේ නිසා එක පැත්තකින් නඩු ගොඩ ගැහුණා. අනෙක් පැත්තෙන් අභියාචනා නඩු ඇසීම හා තීන්දු දීම ප්‍රමාද වුණා. දිසා අධිකරණ නඩු තීන්දුවක් අභියාචනා කළාම ඒක අහන්න පටන් ගත්තේ අවුරුදු හයකට විතර පස්සේ. තීන්දුව දෙන්න අවුරුදු ගණනක් ගියා. එතකොට නඩුවල පාර්ශ්වකරුවන්ට කොළඹ එන්නට ගිය වියදම්, ගත වුණ කාලය ආදිය කරදරයක්. සිවිල් අභියාචනාධිකරණ ක්‍රියාත්මක කිරීම නිසා මේ රටේ ජනතාවගේ යුක්තිය පසිඳලීමේ කාර්ය ගොඩක් පහසු වුණා. කොළඹින් ඈත කට්ටියට ගොඩක් ලොකු සහනයක් ලැබුණා. ඒ පිළිබඳව අතිගරු ජනාධිපතිතුමාටත් මෙම රජයටත් අපගේ ප්‍රසාදය සහ ස්තුතිය පළ කළ යුතුයි.

පනතකින් සිවිල් අභියාචනාධිකරණය හැඳින්වූවා වාගේම ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිසරයකුත් හදන්න සිද්ධ වුණා. එහි එක් අංශයක් තමයි ගොඩනැඟිලි, උපකරණ හා සේවකයන් ආදිය. අනෙක් අංගය තමයි අභියාචනාධිකරණ මහාධිකරණ විනිසුරුතුමන්ලාගේ සංඛ්‍යාව වැඩි කිරීම. මුලින්ම අභියාචන මහාධිකරණ විනිසුරුතුමන්ලා හතළිස් දෙනකු පත් කිරීම සිද්ධ වුණා. ඊට පසුව 2007 වසරේදී මෙම ගරු සභාව තීරණය කළා එම ප්‍රමාණය 60 දක්වා වැඩි කිරීමට. අද දින එකී මහාධිකරණ විනිසුරුතුමන්ලාගේ සංඛ්‍යාව තවත් 15කින් වැඩි කිරීමට ඒ කියන්නේ 75 දක්වා වැඩි කිරීමට මෙම සභාවේ අවසර පතලා තිබෙනවා. මෙය අත්‍යවශ්‍යම කටයුත්තක් කියන එක ගැන

විවාදයක් නැහැ. මේ රටේ අපි සියලු දෙනාටම යුක්තිය ඉටු විය යුතුයි, නීතිය රැකවරණය හැම දෙනාටම ලැබිය යුතුයි කියලා හිතනවා. මේ ගැන හිතනවා නම් මේ ගැන විවාදයක් නැහැ. මීට පෙර අභියාචනාධිකරණය අහපු නඩුවලින් සියයට 75ක් පමණ සිවිල් අභියාචනා අධිකරණයට දැන් භාර දීලා තිබෙනවා. දැන් සිවිල් අභියාචනා අධිකරණ විනිසුරුතුමන්ලා අහන්නේ පෙර අභියාචනාධිකරණ විනිසුරුතුමන්ලා අහපු නඩුමයි. එසේ නම් පෙර අභියාචනාධිකරණ විනිසුරුවරුන්ගෙන් ඉටු වුණ සේවයම දැන් අපි මේ මහාධිකරණ විනිසුරුවරුන්ගෙන් බලාපොරොත්තු වනවා. එවැනි සේවයක් ඒ මහාධිකරණ විනිසුරුතුමන්ලාගෙන් ලබා ගැනීමට නම් එයට සරිලන පහසුකම් එම විනිසුරුතුමන්ලාට හා එම අධිකරණවලට ලබා දිය යුතුයි. රජයේ හා අධිකරණ අමාත්‍යාංශයේ යුතුකමක් තමයි එවැනි පහසුකම් ලබා දීම. වෙනත් විධියකට කියනවා නම් අභියාචනාධිකරණ විනිසුරුවරුන්ට හා අභියාචනාධිකරණයට ඇති පහසුකම් මහාධිකරණ විනිසුරුවරුන්ට හා මහාධිකරණවලට ලබා දිය යුතුයි. මේවාට නවීකරණය කරන ලද අධිකරණ ශාලා, පුස්තකාල පහසුකම්, අලුත් නීති ග්‍රන්ථ පරිශීලනයට අවස්ථා, පරිගණක පහසුකම් විශේෂයෙන්ම අන්තර්ජාල පහසුකම් අයත් විය යුතුයි. ප්‍රායෝගික තත්ත්වය වන්නේ දැනට සියයට 80ක් පමණ මහාධිකරණවල මෙම පහසුකම් නොමැති වීමයි. එසේ නම් අප හැම දෙනාම එකතු වී වඩාත් දියුණු අධිකරණ ක්‍රමයක් රට පුරාම සකස් කළ යුතුයි. ඒ පිළිබඳ ප්‍රමුඛ වගකීම තිබෙන්නේ අධිකරණ අමාත්‍යාංශයටයි. පළාත්බද මහාධිකරණ පිහිටු වීමෙන් පසු ගිය අවුරුදු තුන ඇතුළත අපේ රටේ විශාල නඩු ප්‍රමාණයක තීන්දු ප්‍රකාශයට පත් කර තිබෙනවා. මේ අවස්ථාවේදී අධිකරණ පද්ධතිය පුළුල් කිරීමෙන්, පළාත් මට්ටමෙන් සිවිල් මහාධිකරණ ඇති කිරීමෙන් කොළඹින් බැහැර දුර පළාත්වල සිටින දුප්පත් ජනතාවට විශාල සහනයක් ලැබී තිබෙන බව සැකයෙන් තොරව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

[අ. භා. 5.35]

**ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම වැදගත් කාලෝචිත පනත් කෙටුම්පතක් වන අධිකරණ සංවිධාන (සංශෝධන ) පනත් කෙටුම්පත මේ ගරු සභාවේ දෙ වන වර කියැවීමේ විවාදය පැවැත්වෙන මේ අවස්ථාවේදී ආණ්ඩු පක්ෂය වෙනුවෙන් අදහස් ප්‍රකාශ කිරීමට මටද අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාටත්, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාටත් මා ස්තූතිවන්ත වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවමත් අපේ රටේ අධිකරණ පද්ධතිය කෙරෙහි අපේ රටේ ජනතාවගේ විශාල විශ්වාසයක් තිබෙනවා. ගරු ජයලත් ජයවර්ධන මන්ත්‍රීතුමා කථා කරද්දී එතුමා ප්‍රකාශ කළේ අධිකරණ පද්ධතිය කෙරෙහි ජනතාවගේ කලින් ගරුත්වයක් තිබුණා, දැන් ඒ ගරුත්වය නැත කියන හැඟීමක් ඇති වන ආකාරයටයි. නමුත් තවමත් අපේ රටේ අධිකරණ ක්‍රමය පිළිබඳව අපේ රටේ ජනතාව දැඩි විශ්වාසයකින් ඉන්නවාය කියන එක මේ ගරු සභාවේදී පැහැදිලිව කිය යුතු කාරණයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණය ඉදිරියට මේ රටේ ජනතාව තමන්ගේ ප්‍රශ්න විසඳා ගන්න යනවා. පුද්ගලයින් - පුද්ගලයින් අතර ප්‍රශ්න, තමන්ට රජයෙන් යම් අසාධාරණයක් වුණෝතින් ඒ අසාධාරණයට පිහිටක් ලබා ගන්න අපේ රටේ ජනතාව අධිකරණය ඉදිරියට යනවා. තමන් බලාපොරොත්තු වන යුක්තිය ඉෂ්ට කරවා ගන්න යන කොට එතැනදී ජනතාවට කඩිනම් සහනයක් ලබා දෙන්නට ඕනෑ. සහනය, ප්‍රතිකර්මය නැත්නම් යුක්තිය ඉෂ්ට වීම ප්‍රමාද වුණොත් ජනතාවගේ -යුක්තිය ඉෂ්ට කරවා ගැනීමට බලාපොරොත්තු වන පුද්ගලයාගේ- අපේක්ෂාව ඉෂ්ට වන්නේ නැහැ. එම නිසා ප්‍රජාතන්ත්‍රවාදය අගයන ඕනෑම රජයක වගකීම වන්නේ තමන්ගේ ජනතාවට සේවය කිරීම උදෙසා ඉතාම කඩිනම් ප්‍රතිකර්මයක් ඒ සඳහා ලබා දීමයි. ඒ සඳහා අප ගරු අධිකරණ ඇමතිතුමාට ස්තූතිවන්ත වනවා. අද මහාධිකරණ විනිශ්චයකාරවරු සංඛ්‍යාව වැඩි කර ඉතාම ඉක්මනට අපේ රටේ ජනතාවට යුක්තිය ඉෂ්ට කරවා දෙන්නට අවශ්‍ය කටයුතු කිරීම පිළිබඳව අප ස්තූතිවන්ත වන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඕනෑම රාජ්‍යයක යුක්තිය පසිඳලන ආකාරය සහ ඒ සඳහා යොදා ගෙන තිබෙන සංවිධාන ක්‍රම, ඒ රටේ ශීලාචාරකමේ තරම පෙන්වනවාය කියා හැරල්ඩ් ලැස්කි නම් දේශපාලන න්‍යායාචාර්යවරයා කියා තිබෙනවා. අපේ රජයෙන් අද මේ ගරු සභාවට මේ සංශෝධන පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙන්නේ, මේ රටේ යුක්තිය පසිඳලීම ඉක්මන් කරන්නයි. 2006 වර්ෂයේදී පළාත්බද මහාධිකරණ පිහිටු වන්නට කලින් සිවිල් අභියාචනා බලය මහාධිකරණයට තිබුණේ නැහැ. එම නිසා අපේ ගම්වල ඉන්න අහිංසක මිනිසුන්ට සිද්ධ වුණා, සිවිල් අභියාචනයක් අරගෙන කොළඹට එන්න. සිවිල් අභියාචනාධිකරණයේ සිවිල් නඩු අතිවිශාල ප්‍රමාණයක් ගොඩ ගැසී තිබුණු බව අප දන්නවා. එම නිසායි පළාත්බද සිවිල් මහාධිකරණ පිහිටුවා ඒ බලය මහාධිකරණයට ලබා දුන්නේ. එතැනදී හුදෙක් මේ මහාධිකරණ විනිශ්චයකාරතුමන්ලා වැඩි කළ පමණින්ම බලාපොරොත්තු වන කාරණය සිදු වන්නේ නැහැ කියන එක මා මේ ගරු සභාවේත්, අපේ ගරු අධිකරණ ඇමතිතුමාගේත් අවධානයට යොමු කරන්නට ඕනෑ. උදාහරණයක් හැටියට ගාල්ල සිවිල් අභියාචනාධිකරණය ගැන කථා කළොත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැනට අවුරුද්දක සිට ගාල්ල සිවිල් අභියාචනාධිකරණයේ නඩු විභාගයට ගන්නේ නැහැ. මොකද, එක විනිශ්චයකාරවරයකුගේ අඩුවක් නිසා. විනිශ්චයකාරවරුන් වැඩි කරනවාත් සමඟම, මේ නීති ක්‍රම සකස් කරනවාත් සමඟම අවශ්‍ය කරන පහසුකම් ලබා දෙන්නත් ඕනෑ. ගාල්ලේ සිවිල් අභියාචනාධිකරණය පිහිටුවලා තිබෙන්නේ මහාධිකරණ විනිශ්චයකාරතුමාගේ නිල නිවසේ. මම ඒ කාරණය මේ ගරු සභාවේ අවධානයට යොමු කරනවා. මේ සියලු දේවල් කරන්නේ අපේ රටේ ජනතාවගේ සුභ සිද්ධිය සඳහා. ඒ නිසා අවශ්‍ය කරන පහසුකම් අපේ ගරු විනිසුරුතුමන්ලාට ලබා දීලා ඒ අයගේ ගරුත්වය ආරක්ෂා වන ආකාරයට වැඩ කටයුතු කෙරෙන්නෙ ඕනෑ. මේ යෝජනාව ඉතාම කාලෝචිතයි කියන කාරණය මා කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කලින් තිබුණා කොට් උසාවි. කොට්, ඊනියා සාම ගිවිසුමට මුවා වෙලා මේ රටේ කැල්ලක් නොනිල ආකාරයට පාලනය කළා. අද අපේ රටේ එකම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි ක්‍රියාත්මක වන්නේ. එකම නීති පද්ධතියක් විතරයි ක්‍රියාත්මක වන්නේ. ඒ නිසා අද අවශ්‍යතාවක් වෙලා තිබෙනවා, ඒ පළාත්වලත් මහාධිකරණ පිහිටුවලා මහාධිකරණ විනිසුරුතුමන්ලා පත් කිරීමට. ඒ නිසා මේක ඉතාම හොඳ කාලෝචිත යෝජනාවක්. මා ඉස්සෙල්ලා කිව්වා වාගේ අපි ගරු ඇමතිතුමාට කියනවා, ගරු විනිසුරුතුමන්ලාගේ ගෞරවය ආරක්ෂා වන විධියට මේ කටයුත්ත කෙරෙන්න ඕනෑ බව.

විපක්ෂයේ අපේ ගරු මන්ත්‍රීතුමන්ලා අද දිගින් දිගටම අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳව කථා කළා. අද මේ රටේ නීතිය වල් වැදිලාය කියලා කිව්වා. අද මේ රටේ නීතියේ පාලනයක් නැහැ කියලා කිව්වා. මම දන්නේ නැහැ විපක්ෂයේ අපේ ගරු මන්ත්‍රීතුමන්ලා මැරිලා ඉපදිලාද කියලා. මැරිලා ඉපදුණු ආකාරයට තමයි එතුමන්ලා කථා කළේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා දන්නවා, අපේ ගරු අනුර ප්‍රියදර්ශන යාපා ඇමතිතුමා කිව්වා වාගේ 1977 එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ එදා ශ්‍රේෂ්ඨාධිකරණයේ හිටපු සමහර විනිශ්චයකාරතුමන්ලා ශ්‍රේෂ්ඨාධිකරණයට පත් කළේ නැති බව. ඒ වාගේම අපි දන්නවා, අද මහා ලොකුවට මානව හිමිකම් ගැන කථා කරන විපක්ෂයේ උදවිය මොකක්ද එදා කළේ කියා

[ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මා හිතන විධියට ඒ කාලය වන කොට ඔබතුමාත් එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධ වෙලා ඉන්න ඇති. 1982 ජන මත විචාරණය අවස්ථාවේ දරමිටිපොළ රතනසාර හාමුදුරුවෝ ප්‍රමුඛ බෞද්ධ භික්ෂූන් වහන්සේලා, ක්‍රිස්තියානි පූජකතුමන්ලා "පැවිදි හඬ" කියන සංවිධානය පිහිටුවා ගෙන ඒ ජන මත විචාරණයට විරුද්ධව විශාල ව්‍යාපාරයක් ගෙන ගියා. එතැනදී අත් පත්‍රිකා විසිදහසකට ආසන්න ප්‍රමාණයක් අත් අඩංගුවට ගත්තාට පස්සේ දරමිටිපොළ රතනසාර හාමුදුරුවෝ මානව හිමිකම් උල්ලංඝනය වීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් පැවරුවා. එතැනදී දණ්ඩනයක් නියම කළා, රුපියල් 10,000ක. ඊට අමතරව ඒ සඳහා ක්‍රියාත්මක වෙච්ච පොලිස් අධිකාරිවරයා සම්බන්ධයෙන් විනයානුකූලව ක්‍රියා කරන්නය කිව්වා. මොකක්ද එදා පැවැති එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කළේ? එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කළේ ඒ නිලධාරියාට උසස් වීමක් ලබා දීලා දණ්ඩනය වශයෙන් ගෙවන්න කියපු රුපියල් 10,000 ආණ්ඩුවෙන් ගෙව්ව එකයි. ඒ වාගේම තමයි 1983 තුන්වැනි මාසයේ 08 වැනි දා, එනම් අන්තර්ජාතික කාන්තා දිනයේ විවියන් ගුණවර්ධන මැතිනිය ඇමෙරිකානු තානාපති කාර්යාලයට ගිහිල්ලා සන්දේශයක් භාර දීලා එන අවස්ථාවේදී පොලීසියෙන් එතුමියට පහර දීලා, එතුමිය අත් අඩංගුවට ගැනීමත්. ඒ සම්බන්ධයෙන් මානව හිමිකම් නඩුවක් පවරපු අවස්ථාවේදී ඒ නඩුව විභාග කළේ සෝසා, රත්වත්තේ සහ කොලින් තෝමේ කියන ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරතුමන්ලා. එතුමන්ලා පැහැදිලිව කිව්වා, විවියන් ගුණවර්ධන මැතිනියගේ මානව අයිතිවාසිකම් උල්ලංඝනය වෙලා තිබෙනවාය, එතුමියට රුපියල් 2,500ක වන්දියක් ගෙවන්නය කියලා. මොකක්ද රජය කළේ? ඒ රජය කරපු දේ තමයි ඒ වන්දිය රජයෙන් ගෙවපු එක මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වන්දිය රජයෙන් ගෙවලා ඒ පොලිස් නිලධාරියාටත් උසස් වීමක් දෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ තීන්දුව දෙන්නේ ජූනි මාසයේ 08 වැනි දා. 1983 ජූනි මාසයේ 08 වැනි දා ඒ තීන්දුව දුන්නාම ජූනි මාසයේ 09 වැනි දා ඒ පොලිස් නිලධාරියාට උසස්වීමත් දෙනවා. එතැනින් නැවතුණේ නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ගරු ජයලත් ජයවර්ධන මැතිතුමා කිව්වා "නඩුකාර උන්නාන්සේලා" කියලායි විනිශ්චයකාරවරුන්ට ආමන්ත්‍රණය කළේ කියා. ජූනි 11 වැනි දා එක්සත් ජාතික පක්ෂයේ මැරයෝ ඒ නඩුකාර උන්නාන්සේලාගේ ගෙවල් ඉස්සරහට ගිහිල්ලා තර්ජනය කළා; ගල් ගැහුවා. නමුත් අප පැහැදිලිව විපක්ෂයෙන් අහන්න කැමැතියි අද ඒ වාගේ වාතාවරණයක් අපේ රටේ තිබෙනවාද කියලා. අද අපේ රටේ නීතිය වල් වැදිලා තිබෙන්නේ කොහොමද කියන ප්‍රශ්නය අප අහන්නට ඕනෑ. ඒ වාගේම මම තව එක කාරණයක් ඔබතුමාගේ අවධානයට යොමු කරන්න ඕනෑ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථාව අවසාන කරන්න.

**ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා අද මේ රටේ පවතින අධිකරණ පද්ධතිය තුළ අග්‍ර විනිශ්චයකාරතුමාට අතිවිශාල බලයක් හිමි වෙලා තිබෙන බව. නමුත් අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා කිසිම අවස්ථාවක අග්‍ර විනිශ්චයකාරතුමා පත් කිරීමේදී කිසියම් හෝ දේශපාලන බලපෑමක් කළේ නැහැ. අද ඔබතුමා දන්නවා, හිටපු අග්‍ර විනිශ්චයකාරතුමා විශ්‍රාම යන විට ශ්‍රේෂ්ඨාධිකරණයේ හිටපු ජ්‍යෙෂ්ඨතම විනිශ්චයකාරතුමා තමයි අශෝක සිල්වා මැතිතුමා. එතුමා පත් කළා. නමුත් එහෙම නොකර බාහිරින් ගෙනැල්ලා අග්‍ර විනිශ්චයකාරවරු පත් කර රටේ ජනාධිපතිවරයාට අවශ්‍ය ආකාරයට අධිකරණ හැඩගස්වා ගත් ආකාරයන්වලට පූර්වාදර්ශයන් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජාතික පක්ෂය අද මේ රටේ නීතිය පාලනයක් ගැන කථා කරනවා; විනයක් ගැන කථා කරනවා. නමුත් තමන්ගේ පක්ෂයේ විනයක් නැති, තමන්ගේ පක්ෂයේ මන්ත්‍රීවරු හැඩගස්වා ගන්න බැරි පක්ෂයක් තමයි අද අපේ රටට කියන්නේ, අපේ ආණ්ඩුවට කියන්නේ මේ රටේ නීති පාලනයක් ඇති කරන්නය කියලා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ස්තුතියි.

ඊළඟට ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා.

[අ. භා. 5.45]

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ දවස්වල වැඩි වැඩියෙන් කථා වන මාතෘකාවක් බවට අධිකරණය පත් වෙලා තිබෙනවා. අපේ අධිකරණවල අඩු පාඩුකම් තිබෙන අවස්ථාවක, නඩු විශාල සංඛ්‍යාවක් ගොඩගැසී තිබෙන අවස්ථාවක අධිකරණ අමාත්‍යතුමා විසින් අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම එක අඩියක් ඉස්සරහට තැබීමක් වශයෙන් මම දකිනවා. 1978 අධිකරණ සංවිධාන පනත කලින් කලට සංශෝධන වෙලා තිබෙනවා; අපේ රටට සරිලන ආකාරයෙන් අපේ ජනතාවට ගැළපෙන ආකාරයෙන් සංශෝධනවලට භාජනය වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ආණ්ඩු පක්ෂයේ ඇමතිවරු මෙන්ම මන්ත්‍රීවරු මේ අධිකරණ පද්ධතිය ගැන අධිකරණය ක්‍රියාත්මක වීම ගැන නොයෙකුත් අදහස් දැක්වූවා. විනිසුරුවන් මේ ආකාරයෙන් වැඩි කිරීම සම්බන්ධයෙන් මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන අවස්ථාව වන විට හයදහස් ගණනක් නැත්නම් හත්දහස් ගණනක් වාගේ නඩු ප්‍රමාණයක් මහාධිකරණවල, සිවිල් අධිකරණවල ගොඩගැහිලා තිබෙනවා. ඉතා හොඳ කාර්ය භාරයක් මේ සමහම මෙයට අවශ්‍යයි. මේ නඩු කල් යනවා. නීතිඥවරයකු වශයෙන් මම දන්නවා, බොහෝ වෙලාවට දවල් 12.30ට 1ට 2ට නොයෙකුත් හේතු මත උසාවි වැඩ නවත්වන බව. අපි විනිසුරුවරුන් පත් කරනවා වාගේම නීතිඥවරු වශයෙන් ඒ විනිසුරුවරුන්ට සහායක් ලබා දෙන්න ඕනෑ. ඒ වාගේම ව්‍යවස්ථාදායකයේ නීති සම්පාදනය කරන්නන් වශයෙන් සහායක් ලබා දෙන්න ඕනෑ. සිවිල් අධිකරණවලට නොවෙයි, අපරාධ අධිකරණවලට නම් ගොඩක් වෙලාවට එන්නේ අනිවාර්යයෙන්ම දුප්පත් මිනිස්සු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහේස්ත්‍රාත් අධිකරණයකට ගිහිල්ලා බැලුවොත් පෙනෙයි, ඉඳලා හිටලා අපි වාගේ දේශපාලනඥයෙක් ඉන්නවා, නීතිපති දෙපාර්තමේන්තුවෙන් යම් කිසි වරදකට ලක් කළ. එහෙම නැත්නම් ගොඩක් වෙලාවට පිටුපස්සට හැරිලා බැලුවොත් අපට පෙනෙන්නේ අධිකරණවල ඉන්නේ ඉතා දුගී දුප්පත් ජනතාව බවයි. වැඩි පිරිසක් ඉන්නේ ගොඩක් වෙලාවට හොර මධ්‍යසාර පෙරීම සම්බන්ධයෙන්. නැත්නම් ගංජා දුම් වැටියක් පාවිච්චි කිරීම සම්බන්ධයෙන්. එහෙම නැත්නම් අල්ලපු වත්තෙන් කෙහෙල් ඇවරියක් කපලා, එහෙම නැත්නම් පික්පොකට් ගහලා. මෙන්න මේ වාගේ ඉතාමත් දුගී දුප්පත් ජනතාව පත් වන වැරදිවලට තමයි අපේ මහේස්ත්‍රාත් අධිකරණවල සියයට 98ක් සියයට 99ක් පමණ පිරිස දකින්නට ලැබෙන්නේ.

අපේ මහාචාර්ය ජී.එල්.පීරිස් ඇමතිතුමා මේ අවස්ථාවේ මෙහි ඉඳීවි කියා මම බලාපොරොත්තු වුණා. මහාචාර්ය ජී.එල්. පීරිස් ඇමතිතුමා නීති සම්පාදනය වාගේම නීතිය උගන්වන

මහාචාර්යවරයෙක් වශයෙන් කටයුතු කළා. අපේ අධිකරණවල විනිශ්චයකාරතුමන්ලා ඒ වාගේම ඊට අදාළ බොහෝ පිරිස් එතුමාගෙන් අධ්‍යාපනය ලබා තිබෙනවා. එතුමා ඒ අවස්ථාවේදී - විපක්ෂය විසින් අධිකරණයේ යම් යම් අඩු පාඩු ඒ වාගේම විනිසුරුවන් සම්බන්ධයෙන් යම්කිසි අඩු පාඩු දැක්වූ අවස්ථාවේදී- කිව්වා, ඒ දැක්වීම නුසුදුසුය කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යම් කිසි අවස්ථාවක අපි වරදක් දකිනවා නම් ඒ වරද අපි හරියාකාරව පෙන්වා දෙනවා නම් ඒක තමයි අධිකරණයට අපි කරන ගෞරවය. චන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමාත් සඳහන් කළා, අපට ඕනෑම අධිකරණ ක්‍රියාවලියක්, අධිකරණ තීන්දුවක් සම්බන්ධයෙන් කථා කිරීමේ හා විවේචනය කිරීමේ අයිතිය තිබෙනවා කියා.

හැබැයි ලංකාවේ අමුතුම සංස්කෘතියක් ගොඩ නැඟීගෙන යනවා, අධිකරණය සම්බන්ධයෙන් කිසිම අදහසක් දක්වන්න බැහැ, ඒක අධිකරණයට අපහාස කිරීමක්ය කියලා. මේක ඉතාමත් වැරදියි. අපි අපේ නීතිය හරියාකාරව රටේ පවත්වාගෙන යන්න ඕනෑ නම් ඊට අදාළ විවේචන සාධාරණ වශයෙන් -මඩ ගහන්න නොවෙයි.- ඉදිරිපත් කරන්න පුළුවන් හැකියාව, ඒවා භාර ගන්න පුළුවන් හැකියාව අපේ රටේ තිබෙන්න ඕනෑ. ඒ, විශේෂයෙන්ම පාර්ලිමේන්තුවේ. අද ආණ්ඩු පක්ෂයෙන් ඇඟිල්ල දික් කරනවා එක්සත් ජාතික පක්ෂ පාලන කාලයේ ගල් ගැහුවා කියලා. ගල් ගැසූ පිරිසක් හිටියා නම් ඒක වැරදියි. ඒ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කරලා දඬුවම් දෙන්න ඕනෑ. මීට පෙර කථා කරපු ගරු මන්ත්‍රීතුමා, මමත් එක්කම නීති විද්‍යාලයේ නේවාසිකාගාරයේ හිටපු කෙනෙක්; නීතිඥවරයෙක්. එතුමා හොඳ නිදසුනක් දුන්නා. එතුමා කිව්වා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ විනිසුරුවන් දුන්නු තීන්දු සම්බන්ධයෙන් සාධාරණ තීන්දු දුන්නා කියලා. මෙන්න මේ ගැනයි අපි කියන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පක්ෂයක් වශයෙන් යම් යම් වැරදි කරන්න පුළුවන් දේශපාලනික වශයෙන්. අද, පාලිත තෙවරප්පෙරුම මැතිතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්. මාස නවයක් හිරේ. මොකක්ද එතුමා කරපු වරද? ආණ්ඩුවේ අමාත්‍යවරයකුගේ වාහනයක බෝම්බයක් තිබුණා කියලා පණිවිඩයක් ලැබී තිබෙනවා පොලීසියට. පොලීසිය තොරතුරු වාර්තා කරලා තිබෙනවා ඒ වාහනයේ බෝම්බය තිබුණා කියලා. පාලිත තෙවරප්පෙරුම මැතිතුමාට කිසිම සම්බන්ධයක් නැහැ මේ වාහනය.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, please refrain from mentioning about that case. It is *sub judice*.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
The name, is it?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
The name or even the case - the incident - because it is *sub judice.* You have been making a good speech. Carry on, Hon. Member.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධයෙන් මම විවාදයකට පාත්‍ර වන්න, භාජනය වන්න අදහස් කරන්නේ නැහැ. ඒ සම්බන්ධයෙන් මට අදහස් ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ නීතිමය පදනම මට අදහස් ඉදිරිපත් කිරීමට ඒ සම්බන්ධයෙන්. කෙසේ වෙතත් ඔබතුමාගේ අණ පරිදි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කිසිම ආකාරයකින් සම්බන්ධයක් නැති, කිසිම ආකාරයකින් ඒ වරදකට සම්බන්ධ නැති පුද්ගලයෙක් -පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්- මාස නවයක් හිරේ ඉන්නවා. මෙතැන අපට අධිකරණ අමාත්‍යවරයාත් අනෙකුත් ඇමතිවරුනුත් කථා කරලා කියනවා මේ රටේ නීතිය ඉතා සාධාරණයි, මේ රට ආසියාවේ ආශ්චර්ය බවට පත් කිරීමට අවශ්‍ය නීති පනත් ඒ වාගේම ඒවා පිළිපදින ආකාරය සාධාරණයි කියලා. කොහොමද මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාධාරණ වන්නේ? මේකේ උසාවියේ නඩුවක් පවරන්න නම් විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් වන්න ඕනෑ. ආණ්ඩු පක්ෂයේ එක ඇමතිවරයකුට, මන්ත්‍රීවරයකුට විරුද්ධව නීතිපති දෙපාර්තමේන්තුවෙන් පියවරක් ගන්නවාද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කියන්නේ මෙයයි. විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් වන්න පුළුවන්. අපි නීතිඥවරු. අපට අසාධාරණය පෙනෙන්න බැහැ කොයි පක්ෂයෙන් වුණත්. මෙතුමන්ලා මේ සඳහන් කරන ආකාරයට මේ රටේ නීතිය පවත්වනවා නම් අපට මේ ගැන කථා කරන්න අවශ්‍යතාවක් නැහැ. මම එංගලන්තයේ අධිකරණයක මාස දෙකක් විතර වැඩ කළා ජ්‍යෙෂ්ඨ නීතිඥවරයකු එක්ක. ඇමෙරිකාවේ අධිකරණයක මාස දෙකක් විතර වැඩ කරන්න හැකියාව ලැබුණා. ඒ අවස්ථාවේදී අපට දකින්න පුළුවන් වුණු හොඳම නිදසුන තමයි පාට, ජාති, ආගම් භේදයෙන් තොරව තීන්දු ලබා ගැනීමේ හැකියාව ඒ අධිකරණවල තිබීම. හැබැයි අද අපේ අධිකරණවල කනගාටුදායක කරුණක් තමයි මෙන්න මෙය. පුද්ගලයා කවුද, චෝදනා ලබන ඒ පුද්ගලයා අනුව තමයි බොහෝ වෙලාවට පොලීසිය ක්‍රියාත්මක වන ආකාරය, ඒ වාගේම නීතිපති දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වන ආකාරය තීන්දු වන්නේ. දැන් ඊට වැඩිය භයානක අවස්ථාවක් මේ රටේ ඇති වෙලා තිබෙනවා. එනම් නීතිපති දෙපාර්තමේන්තුවත් ජනාධිපතිතුමා යටතට පවත්වා ගෙන තිබෙනවා. එහෙම නම් අපි රජයේ සේවකයෙක් වශයෙන් ගිහිල්ලා නීතිපතිතුමාට යම්කිසි නීතිමය කරුණක් සම්බන්ධයෙන් අවධානය යොමු කළාම එතුමා අවසර ගන්නේ ජනාධිපතිතුමාගෙන්, මෙතුමාට අපි bail දෙනවාද, මෙතුමාට අපි ඇපයක් දෙනවාද නැද්ද කියලා. ඉතින් මේක භයානක තත්ත්වයක් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා මා හිතන්නේ නැහැ ඒක හරි කියලා. ජනාධිපතිතුමාගෙන් උපදෙස් ගන්නවාය කියන එක පවසන්නේ නැතිව හිටියොත් හොඳයි.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
නැහැ. ඒක මට උත්තර දෙන්න පුළුවන් කතාවක්. ඒකේ අයිතිය තිබෙනවා, මට කියන්න. මොකද ඒ ආයතනය ජනාධිපතිතුමා යටතේයි තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආකාරයෙන් මේක කථා කරන්න හොඳ නැහැ වාගේම මේක කරන්නත් හොඳ නැහැ. මේකේ භයානකකම ඒකයි. අපි කථා කරන්නේ නැහැ මේ සම්බන්ධයෙන්. හැබැයි අපට සිදු වනවා. මොකද? ඒ සිදු වන්නේ දේශපාලන බලපෑම් මත තමයි. ඒකට අධිකරණයේ විනිසුරුවන්ට නොවෙයි අපි වරද දමන්නේ. මේකට අපිත් වග කියන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා අධිකරණ විනිසුරුවන් ඉතාමත් අමාරු ජීවිතයක් ගත කරන්න ඕනෑ බව. එතුමන්ලාට පෞද්ගලික සම්බන්ධකම් තියා ගන්න බැහැ; සාමාන්‍ය ජීවිතයක් ගත කරන්න බැහැ; සැඳෑ සම්භාෂණවලට යන්න බැහැ. මේකට අපත් උදවු කරන්න ඕනෑ, අධිකරණයේ විනිසුරුවන්ට තමන්ගේ ගෞරවය

[ගරු සුජීව සේනසිංහ මහතා]

ආරක්ෂා කර ගෙන සේවය කරන්න. මන්ත්‍රීවරුන් වශයෙන්, නීතිඥවරුන් වශයෙන්, සාමාන්‍ය ජනයා වශයෙන් අපිත් යම් කිසි ආකාරයෙන් උදවු කරන්න ඕනෑ. සාමාන්‍යයෙන් මනුෂ්‍යයෝ තමයි ගරු විනිශ්චයකාරවරුන් බවට පත් වන්නේ. පොළඹවන්න හොඳ නැහැ, දේශපාලනික වශයෙන් නැත්නම් වෙනත් ආකාරයෙන්. එතුමන්ලාගේ රාජකාරිය කරන්න ඒ අවස්ථාව ලබා දෙන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි රටේ නීතිය ගැන කථා කරන කොට හැම වෙලාවේම දේශපාලනය වර්තමානයේ නීතියට එකතු වන බව කියන්න ඕනෑ. මෙන්න මේක තමයි අපේ රටේ නීතියේ තිබෙන අඩු පාඩුව. නීතිය ක්‍රියාත්මක වන ආකාරයේ තමයි අඩු පාඩුකම් තිබෙන්නේ. නීතියේ අඩු පාඩුකම් නැහැ. නීතිය හොඳට ලියා තිබෙනවා. රෝම - ලන්දේසි නීතිය, විශේෂ නීති, ප්‍රධාන වශයෙන් අපේ ලංකාවේ පෞරාණික නීති, උඩ රට නීතිය, තේසවලාමේ නීතිය, මුස්ලිම් නීතිය තිබෙනවා. රෝම - ලන්දේසි නීතිය, ඊට පස්සේ ඉංග්‍රීසි නීතිය, ඇමෙරිකාවේ නීතිය, දැන් කැනඩා නීතිය යන මේ සියලු දේවල් එකතු වෙලා අපේ නීතිය ඉතා ලස්සණට සම්පාදනය වෙලා තිබෙනවා. හැබැයි ප්‍රශ්නය තිබෙන්නේ මේ නීති ක්‍රියාත්මක වන ආකාරයේයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක නොවීම තුළින් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය හා යහ පාලනය කඩා වැටී තිබෙන බව ඔබතුමා දන්නවා. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කරන්නේ නැත්තේ ඇයි? දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කිරීම තුළින් මේ රට ආසියාවේ ආශ්චර්යය කරන්න තිබෙන බාධාව මොකක්ද? ජනාධිපතිතුමා මෙච්චර රටට ආදරය කරන, නීතියට ගරු කරන, සාමයට ගරු කරන නායකයකු නම්, දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට ඉඩ දීමට ඇති බාධාව මොකක්ද? අපි අහන්නේ ඒකයි. ආගමෙන්, ජාතියෙන්, ඕනෑම දේශපාලන පක්ෂයකින් තොරව නීතිය ක්‍රියාත්මක විය යුතුයි. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මේ රටේ නීතියෙන් සම්පාදනය වූ දෙයක්.

මෙහිදී අධිකරණය වාගේම පොලීසිය ගැනත් කියන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය දවස්වල පොලීසියේ සිදු වුණේ මොකක්ද කියලා අපි දන්නවා. ඔබතුමා දන්නවා, පසු ගිය ජනාධිපතිවරණයේදී ඇත්තටම මේ ප්‍රශ්නය අඩු වුණා කියලා. ඊට කලින් මැතිවරණයේදී එක්සත් ජාතික පාක්ෂිකයන්ට පොලීසියට පැමිණිල්ලක් දමා ගන්න හැකියාවක් ලැබුණේ නැහැ. ඔවුන්ගේ පැමිණිලි භාර ගත්තේ නැහැ. රටේ නීතිය ගැන ඔබතුමා දන්නවා. පැමිණිල්ලක් තිබෙනවා නම් අනිවාර්යයෙන්ම ඒ පැමිණිල්ල භාර ගන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ කිරීම පිළිබඳව පොලීසියට තීන්දු කරන්න පුළුවන්. හැබැයි පැමිණිල්ල භාර ගන්න ඕනෑ. අපි මේ කථා කරන ශ්‍රී ලංකාවේ, ආසියාවේ ආශ්චර්යය කරන්න බලාපොරොත්තු වන රටේ පැමිණිල්ලක් දමන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. එහෙම නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ තිබෙන නීතිය මොකක්ද? පක්ෂ වෙනස් වන්න පුළුවන්. අපි ආණ්ඩු බලයේ ඉඳලා, අපි අතින් වරදක් වුණා නම් ඒ සම්බන්ධයෙනුත් අපි පක්ෂයක් වශයෙන් සමාව ඉල්ලනවා. හැබැයි අද කාලය වෙනස්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය අවුරුදු විස්ස, තිහ තුළ කරපු දේවල් ගැන පුනපුනා කියමින්, ඒවායේ අඩු පාඩු සොයසොයා ඉන්න අවස්ථාවක් නොවෙයි මේ තිබෙන්නේ. අපි එකතු වෙලා මේ රට හදන්න ඕනෑ. මේ ප්‍රශ්නය අපේ පවුලේ කාට හෝ කෙනකුට, අපේ අම්මාට, අපේ තාත්තාට, අපේ අයියාට සිදු වුණා නම්, ඒ අය හිරේ වැටුණා නම්, අසාධාරණ ලෙස යම් කිසි ආකාරයේ දෙයක් ක්‍රියාත්මක වුණා නම්, තමන්ට තේරෙයි මේක කොච්චර අසාධාරණද කියලා. ඊට පස්සේ මේවායේ ප්‍රතිඵල එන්නේ සාමාන්‍ය උද්ඝෝෂණ වශයෙන් නොවෙයි. පසු ගිය අවස්ථාවල ඇති වුණා වාගේ කැරලි ආකාරයෙන් තමයි මේ උද්ඝෝෂණ එළියට එන්නේ. මොකද, ජනතාවට ඇති වන ඒ පීඩනය දරා ගන්න බැරි තත්ත්වයක් ඇති වනවා. එහෙම නම් ඒ තත්ත්වය ඇති වන එක අපි අනිවාර්යයෙන්ම නවත්වා ගන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නීතිය ගැන කථා කරද්දී විශේෂයෙන්ම අපේ රටේ ප්‍රශ්න විසඳන්න නම් ඉදිරියේදී අනිවාර්යයෙන්ම විශේෂ නීති, පනත් කෙටුම්පත් සාදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ඕනෑ. විශේෂයෙන්ම තේසවලාමේ නීතිය සම්බන්ධයෙන් අධිකරණ ඇමතිතුමාගේ අවධානය මා යොමු කරනවා. මා හිතන හැටියට තේසවලාමේ නීතිය නිසා අපට -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව තව මිනිත්තුවකින් අවසන් කරන්න.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

තේසවලාමේ නීතිය අනිවාර්යයෙන්ම වෙනස් කළ යුතුයි. මොකද, ඒ විශේෂ නීතිය නිසා සිංහල, මුස්ලිම් හා අනිකුත් ජනතාවට යාපනය ප්‍රදේශයේ පදිංචි වීමේ අපහසුතාවක් තිබෙනවා. ඉඩමක් විකිණීමේදී තමන්ගේ පවුලට, ඊට පස්සේ තමන්ගේ නෑයින්ට පමණක් ඒ දේපොළ පරිහරණය කිරීමේ අයිතියක් ලබා දෙන නීතියක් අනුව තමයි ඒ තේසවලාමේ නීතිය හැදිලා තිබෙන්නේ. ජාතික සමගිය ඇති කරන්න ඕනෑ නම් සියලු දෙනාටම රටේ ඕනෑම තැනක ජීවත් වීමේ හැකියාව මේ නීතිවලින් ලබා දෙන්න ඕනෑ. මෙය ඉතා යල් පැන ගිය නීතියක්. අපේ රටේ ඉදිරි අනාගතය, ඒ වාගේම රටේ සංවර්ධනය සඳහා මේ වාගේ විශේෂ නීතිවල වෙනස්කම් කරන්න ඕනෑ. කාලය මදි නිසා මේ නීතිය සම්බන්ධයෙන් මීට වඩා කථා කරන්න මා සූදානම් වන්නේ නැහැ. කෙසේ වෙතත් ඊට අවශ්‍ය අණ පනත් ඉදිරිපත් කරනවාත් සමඟම ආණ්ඩු පක්ෂයේ ඇමතිවරු කථා කරපු ආකාරයට මේ රටේ නීතිය ක්‍රියාත්මක වන්නේ නැති බවත්, නීතිය ගස් බැඳලා ඇති බවත් කියන්න ඕනෑ. මා හිතන හැටියට ඇමතිතුමාට නොවෙයි ඒ චෝදනාව එල්ල කරන්න ඕනෑ; මේ රට පාලනය කරන ආණ්ඩුවටයි. මේ වාගේ ක්‍රියාකාරකම් සිදු වනවා. ඇමතිවරුන්ගෙන් මේ වාගේ වැරැදි සිද්ධ වන්න පුළුවන්. හැබැයි ඒ පිළිබඳව ක්‍රියාත්මක නොවන එකයි මේ රටේ පාලනයේ තිබෙන දුර්වලකම. එහෙම නම් ඒ දුර්වලකමත් දුරු කර ගන්න නම් නායකත්වය කෙළින් ඉන්න ඕනෑ. තමන්ගේ කෙනෙක් යම් කිසි වරදක් කළා නම් ඒ වරදට යම් කිසි දඬුවමක් දීලා එය හරිගස්සා ගන්නේ නැත්නම්, අපට දකින්න ලැබෙන්නේ ඔය කථා කරන ආසියාවේ ආශ්චර්ය නොව ආසියාවේ මළ කඳ බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ඊළඟට ගරු ලලිත් දිසානායක නියෝජ්‍ය ඇමතිතුමා.

[අ. භා. 5.59]

**ගරු ලලිත් දිසානායක මහතා (තාක්ෂණ හා පර්යේෂණ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - தொழில்நுட்பவியல், ஆராய்ச்சி பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Technology and Research)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1815 ඉංග්‍රීසි අධිරාජ්‍යවාදීන්ට මේ රට යටත් වුණාට පස්සේ 1972 සමගි පෙරමුණු ආණ්ඩුවක් යටතේ අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තමයි අධිකරණයේ පූර්ණ ස්වාධීනත්වය ලැබුණේ. ඊට පස්සේ නැවත වතාවක් මේ රට අවුරුදු 33ක් ප්‍රභාකරන්ගේ ත්‍රස්තවාදයට යටත් වෙලා තිබුණා. තමුන්නාන්සේට මතක ඇති පසු ගිය කාලයේ ගිවිසුම් මඟින් මායිම් ගම්මාන ඇති කරලා මේ රටේ උතුරු ප්‍රදේශයේ වෙනම අධිකරණ පද්ධතියක් ක්‍රියාත්මක වුණු බව. ඊළාම් අධිකරණය තිබුණා. ඊළාම් පොලිස්පති නඩේෂන්. නමුත් අද අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ මේ රටේ එක අධිකරණ පද්ධතියක් ක්‍රියාත්මක වීම ගැන අපි සතුටු වනවා. මහාධිකරණය ගැන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පැහැදිලිවම සඳහන් වනවා, අපරාධ අධිකරණ බලය ක්‍රියාත්මක කරන්නා වූද, නීතියෙන් පිහිටුවන ලද්දා වූද, ඉහළම මුල් අවස්ථා අධිකරණය ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණයයි කියලා. ඒ අනුව පාර්ලිමේන්තුව විසින් නීතියෙන් නියම කරනු ලබන අධිකරණ බලතල අධිකරණයට තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි සතුටු වනවා අද මේ මහාධිකරණ ප්‍රමාණය 60 සිට 75 දක්වා වැඩි කරලා ප්‍රායෝගිකව යුක්තිය ඉටු කරලා නීතිය අනුව ඉක්මන් විසඳුම් ලබා දීලා ජනතාවට සහනයක් ලබා දෙන්නට කටයුතු කිරීම ගැන. මම දන්නවා මේ සංශෝධනයට ප්‍රථම මාතලේ කෙනකුට නඩුවක් තිබෙනවා නම් මහනුවර මහාධිකරණයට එන්න ඕනෑ. නුවරඑළියේ කෙනෙක් එන්න ඕනෑ, මහනුවරට. නමුත් අද මේ සංශෝධන තුළින් මාතලේටත් මහාධිකරණයක් ඇති වනවා. ඒ වාගේම නුවරඑළියටත් මහාධිකරණයක් ඇති වනවා. ඇත්තෙන්ම ඒ ප්‍රදේශවල ජනතාවට, ඒ සේවාදායකයන්ට, සමස්තයක් වශයෙන් මේ රටේ පුරවැසියාට ඒකෙන් ලොකු සේවාවක්, සහනයක් ලැබෙනවා.

ඒ වාගේම අපේ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා කථා කළා අධිකරණයේ ස්වාධීනත්වය, පොලීසිය සහ නීතිය ගැන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා 1983 ජූනි 13 වැනි සඳුදා "ඩේලි නිව්ස්" පුවත්පතට. එහි මෙන්න මෙහෙම සඳහන් වනවා:

"Demonstrations outside judges' residences : CJ to discuss with judges"

මේ 1978 ජේ.ආර්. ජයවර්ධන මහත්තයාගේ කාලයේ නීතිය ක්‍රියාත්මක වුණ හැටි. එහි තවදුරටත් මෙහෙම සඳහන් වනවා:

"Mr. Justice Percy Colin Thome said about 200 persons demonstrated opposite his house at Layards Road shouting obscenities. They were moving about and one of them picked up a huge stone to throw it at the residence when he was restrained by two others."

ඒ විතරක් නොවෙයි. පොලීසිය ගැන කථා කරනවා. පොලීසිය පැමිණිලි ලියා ගන්නේ නැතිලු. 1978 සුප්‍රිම් උසාවියේ නඩුකාරතුමෙක් ගැන මෙන්න මෙහෙම කියනවා:

"The strangest thing according to this judge was that when he, his wife, son and even friends in the neighbourhood telephoned the police the answer was 'wrong number' or 'not in his seat'."

එහි මේ විධියටත් සඳහන් වනවා.

"…my wife managed to speak to Mrs. Joseph, the acting IGP's wife."

කවුද මේවා කියන්නේ? යුක්තිය ආරක්ෂා කරනවාය කියන එක්සත් ජාතික පක්ෂය එදා මේ රට පාලනය කළේ මෙහෙමයි. නඩුකාරයන්ට "හූ" කියලා, නඩුකාරයන්ගේ ගෙවල් ඉස්සරහට ගිහිල්ලා කෑ කෝ ගහලා කටයුතු කරපු හැටි අපට මතකයි. එදා තත්ත්වය එහෙමයි. නමුත් අද ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා. එදා හිටපු ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා සති දෙක තුනක නිවාඩුවක් දුන්නා. ඒ විතරක් නොවෙයි. එදා හයිඩ් පාර්ක් එකේ තිබුණ අපේ විපක්ෂයේ පළමුවැනි රැස්වීම කඩාකප්පල් කරලා දැම්මා. අපේ මිනිස්සුන්ට ගහලා එලෙව්වා. අද ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා. ප්‍රජාතන්ත්‍රවාදය ගැන අපට උගන්වන්න හදනවා. අපේ ලොහාන් රත්වත්තේ මන්ත්‍රීතුමා රිමාන්ඩ් භාරයේ ඉන්න කොට අපි බලන්න ගියා. තාත්තත් එක්ක හිටියේ හිරේ. තාත්තා හිටපු ඇමති. ගෙදර හිටියේ. ඒ අයට නඩු දැම්මා. අද මේ මන්ත්‍රීවරු ගැන කථා කරනවා. එල්ලුම් ගහ ක්‍රියාත්මක කරන්න ලෑස්ති ගෙනැල්ලයි තිබුණේ. එදා මොකද වුණේ? ලොහාන් රත්වත්තේ මන්ත්‍රීතුමා ඒ ගැන දන්නවා. ලොහාන් රත්වත්තේ මන්ත්‍රීතුමා මට කිව්වා, එදා එතුමාගේ තාත්තාව වැසිකිළියට අර ගෙන ගියේ කරේ එල්ලා ගෙන කියලා. එහෙම දුක් වින්දා. ගැහුවේ අපට. අපි ඒවා දන්නවා. ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන මන්ත්‍රීවරයෙක් අද මහ ලොකුවට කියනවා, මන්ත්‍රීවරයෙක් හිරේ ඉන්නවා කියලා. ගරු මන්ත්‍රීතුමනි, එක මන්ත්‍රීවරයෙක් නොවෙයි. අපේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු සියයකට වැඩිය රිමාන්ඩ් එකේ හිටියා. ප්‍රාදේශීය සභා ඡන්දයට නාම යෝජනා පත්‍ර භාර දෙන්න සමහරුන්ට බැරි වුණා. මොකද, බොරු චෝදනා එල්ල කරලා අර අවුරුදු දෙකක කාලය තුළ හිර කරලා දැම්මා. නීතිපතිතුමා ගැන කථා කරනවා. තමුන්නාන්සේලාගේ මේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ජේ.ආර්. ජයවර්ධන මහත්මයාට හොඳයි. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54 වන ව්‍යවස්ථාවේ එය පැහැදිලිව තිබෙනවා. ආයෙත් කථා කරන්න දෙයක් නැහැ. [බාධා කිරීමක්] මොකක්ද? ඔය නීතිපති ගැන වැරැදි විධියට තොරතුරු දෙන්නට එපා. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තමුන්නාන්සේලාගේ ලොක්කා -ජේ.ආර්. ජයවර්ධන මහත්මයා- තමයි හැදුවේ. එම ව්‍යවස්ථාවේ සඳහන් වනවා, නීතිපතිවරයා ද, යුද හමුදාවේ, නාවුක හමුදාවේ, ගුවන් හමුදාවේ සහ පොලිස් හමුදාවේ ප්‍රධානයෝ ද ජනාධිපතිවරයා විසින් පත් කළ යුතුය කියලා. ඉතින් ආයෙත් මොකක්ද මේ ගැන කියන්නේ? ඒක ජේ.ආර්. ජයවර්ධනට හොඳ නම් රට බේරා ගත්ත අපේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට නොහොඳ වන්නට බැහැ නේ. මේ නීතිපතිතුමාව පත් කරන්නට හොඳ නම්,- [බාධා කිරීමක්] ඒ වාගේම කැබිනට් මණ්ඩලයේ සියලුම අමාත්‍යාංශ ජනාධිපතිතුමා යටතට පවරා ගන්නට පුළුවන්. එහෙම කරලා නැහැ. ඉතින් මේක වැරැදි ක්‍රමයට, නීතිපතිතුමාවත් ජනාධිපතිතුමා යටත් කර ගෙන ඉන්නවාය කියලා පෙන්වන්නටයි යන්නේ. එහෙම දෙයක් නැහැ.

අද දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාත් කරුණු දැක්වීමක් කළා. අපට වරප්‍රසාද තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නමුත් වරප්‍රසාදවලට යටත් වෙලා අපි වැරැදි විධියට කටයුතු කරන්නට හොඳ නැහැ. නීතිපතිතුමා ගැන එතුමා චෝදනා කළා. අපි කිව්වා, නීතිපතිතුමා මොකක්ද කර තිබෙන වැරැද්ද, ඒ වරදට අදාළව නඩු පවරා තිබෙනවා නම් නඩු අංකය ආදී ඒ විස්තර කියන්න කියලා. නමුත් මොනවත් කිව්වේ නැහැ. මේ මුව මස් ගැන මොකක්ද කථාවක් කියලා, නිදහස් කළාය කියලා කිව්වා. එහෙම නොවෙයි, චෝදනාවක් කරනවා නම් හරියට ඒ චෝදනාව කරන්නට ඕනෑ. වරප්‍රසාදවලට යටත් වෙලා, වැරැදි අර්ථ කථනයන් දෙන්නේ නැතිව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මේ රටේ සියලු දෙනාටම නීතිය නියම ආකාරයෙන් ක්‍රියාත්මක වන තත්ත්වයක් අද අපි ඇති කර තිබෙන බව මා පැහැදිලිව කියනවා.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ඔය-

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

තමුන්නාන්සේ කථා කරන්නට එපා. තමුන්නාන්සේලා මේ නීතිය ගැන කථා කරනවා. එදා මිනිස්සුන්ගේ හැඳුනුම්පත් ටික එකතු කර ගත්තා. [බාධා කිරීම්] අපට එදා ගෙදරක ඉන්න දුන්නේ නැහැ. යුද හමුදාවේ, පොලීසියේ නිලධාරින් මරලා දැම්මා. ඒ සියලු දෙනාවම මරලා දමලා අද මේ ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන්නට එනවා. [බාධා කිරීම්] තමුන්නාන්සේලා මොකක්ද කරන ප්‍රජාතන්ත්‍රවාදය? තමුන්නාන්සේලාට ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන්නට අයිතියක් නැහැ. මේ රටේ නීතිය සම්පූර්ණයෙන්ම අවනීතිය බවට පත් කළේ තමුන්නාන්සේලායි. එදා ගෙයින් ගෙට ගිහිල්ලා identity cards එකතු කළා. අහිංසක ජනතාව මරා දැමුවා. අද මහ ලොකුවට ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන්නට එනවා. [බාධා කිරීම්] නීතිය, අවනීතිය බවට පත් කළේ තමුන්නාන්සේලා. කැළෑ නීතිය මේ රටට ගෙනාවේ තමුන්නාන්සේලායි. [බාධා කිරීම්] අපි කියනවා, ඩෙංගු රෝගය හැදිලා මිනිසුන් මැරෙන කොට සමෘද්ධි නියාමක ගස් බඳින එක වැරැදියි කියලා. අපි ඒක අනුමත කරන්නේ නැහැ. ඒ සිද්ධිය ගැන නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා. ගස් බඳින එක නීතියක් නොවෙයි. අපි ඒක අනුමත කරන්නේ නැහැ. නමුත් එතුමා ගස් බැඳලා නැහැ. ඒ සමෘද්ධි නියාමක කළ ප්‍රකාශය සඳහන් ලිපිය ගෙනත් දුන්නා. තමුන්නාන්සේලා වැරැදි දේවල් වැරැදි විධියට ගෙනැල්ලා, වැරැදි අර්ථ කථනයන් දීලා කථා කරන්නට යන්න එපා. [බාධා කිරීම්]

අද මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ඇති කර තිබෙනවා. මේ රටේ සීමා ගම්මාන අද නැහැ නේ. රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාගේ කාලයේ තිබුණා, සීමා ගම්මාන. රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාගේ කාලයේ මේ රටේ තිබුණා, නඩේසන්ගේ කොටි පොලීසිය. යාපනයේ වෙනම අධිකරණ පද්ධතියක් තිබුණා. නමුත් අද මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ, අතාවුද සෙනෙවිරත්න අධිකරණ ඇමතිතුමා යටතේ අද එහෙම අධිකරණ පද්ධතියක් නැහැ. අධිකරණ ඇමති අතාවුද සෙනෙවිරත්න මැතිතුමා යටතේ තිබෙන්නේ එක අධිකරණයයි. නමුත් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලයේ, රනිල් වික්‍රමසිංහ මහත්මයා පාලනය කරන කාලයේ අධිකරණ පද්ධති දෙකක් තිබුණා, ප්‍රභාකරන්ගේ ඊළාම් අධිකරණයත් එක්ක. අද මහ ලොකුවට ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා. අද උදේ රනිල් වික්‍රමසිංහ විපක්ෂ නායකතුමා කථා කළා. දැන් එතුමාට මේවා අමතකයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්ත්‍රී දූෂකයන්ට සාමදාන විනිශ්වයකාර පත්වීම් දුන්නා. ඒවා ගැන කථා කරන්නේ නැහැ. අද මේ ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා. ප්‍රජාතන්ත්‍රවාදය ගැන අපට උගන්වන්න එනවා. ඒ නිසා මා පැහැදිලිව කියනවා, අපේ නායකතුමා -අතිගරු ජනාධිපතිතුමා- මේ රටේ අද ප්‍රජාතන්ත්‍රවාදය ඇති කර තිබෙනවාය කියලා. නීතිපතිතුමාව පාලනය කරනවා ලු; නීතිපතිතුමාව තියා ගෙන ඉන්නවා ලු; නීතිපතිතුමාගෙන් උපදෙස් ගන්නවා ලු. නැහැ. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තිබෙන නීතිය තමයි එතුමා ක්‍රියාත්මක කරන්නේ. මේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ජේ.ආර්. ජයවර්ධනට හොඳ නම්, ඒකෙ තිබෙන බලතල අරගෙන ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ කාලයේ, රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ කාලයේ, ඩී.බී. විජේතුංග ජනාධිපතිතුමාගේ කාලයේ, චන්ද්‍රිකා බණ්ඩාරනායක ජනාධිපතිතුමියගේ කාලයේ මේ රටේ විසඳන්නට බැරිව තිබුණු ත්‍රස්තවාදය නැති කරන්ට අද පුළුවන් වුණේත් මේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේම තමයි. එතුමාත් කළේ ඒකමයි. එහෙම නම් ඒක ජේ.ආර්. ජයවර්ධනලාට හොඳ නම් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට මොකද ඒක නරකක් වන්නේ? එතුමා මේ රටේ පාලකයා. අපි කියන්නේ, මේ විධායක ජනාධිපති ක්‍රමය යටතේ එතුමා මේ රට නියම ආකාරයට නියම තැනට අරගෙන ගිහින් තිබෙනවාය කියන එක පැහැදිලියි කියලායි.

ලබන 15 වනදා හම්බන්තොට වරායට වතුර පුරවනවා. තමුන්නාන්සේලා එන්න, බලන්න. ඒ විධියට වතුර පුරවලා ගොඩබිමක කෘත්‍රිමව හදන ලෝකයේ පළමුවන වරාය. දේශීය තාක්ෂණය යොදා ගෙන කෘත්‍රිමව මේ විධියට වතුර පුරවලා හදන ලෝකයේ ප්‍රථම වරාය. මේවා බොරු කියලා කිව්වා. ණය ලබා ගන්නේ ඒවාටයි. අද එය හදලා ඉවරයි. 15 වනදා අපි ඒ වරාය ආරම්භ කරනවා. මේ රටේ විශාල වශයෙන් සංවර්ධනයක් ඇති කරලා තිබෙනවා. නොරොච්චෝලේ ගල් අඟුරු විදුලි බලාගාර ව්‍යාපෘතිය, චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ කාලයේ පැත්තකට දමලා තිබුණා. නමුත් අද මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව යටතේ නොරොච්චෝලේ ගල් අඟුරු විදුලි බලාගාර ව්‍යාපෘතිය ආරම්භ වෙලා තිබෙනවා. ඉතින් මේ විධියේ දැවැන්ත සංවර්ධනයක් සිදු වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම මේ අධිකරණ පද්ධතියත් අද මේ රටට ගැළපෙන විධියට, ගැළපෙන ආකාරයට සකස් කරමින් යනවා. සිවිල් නඩුවිධාන සංග්‍රහයේ සංශෝධනයන් එනවා. ඒ නඩු පැවරීමේදී මා හිතන්නේ ලක්ෂ 5 වෙනුවට ලක්ෂ 100ක් දක්වා ඒකේ සීමාව ඉහළට අරගෙන ගිහිල්ලා තිබෙනවා. මේ රටේ ජනතාව අධිකරණය ඉදිරියට ගියාම ඔවුන්ට ඒ නියම යුක්තිය ඉටු වන ආකාරයට කටයුතු කරන්න අවශ්‍ය පසුබිම අද සකස් කර තිබෙනවා. ඒ නිසා මේක වැරැදි විධියට අර්ථකථනය කරන්න එපාය කියන එක අපි විපක්ෂයට කියනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

හොඳයි, බොහොම ස්තුතියි.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

විනිශ්වයකාරතුමෙක් ගැන මේ මන්ත්‍රීතුමා කථා කළා. විනිශ්වයකාරවරයාගේ නම කිව්වේ නැහැ. අඩු ගණනේ නඩුව ගැන කිව්වේ නැහැ. බොරුවට චෝදනා කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අසාධාරණයක් වුණාම අපිට යන්න තිබෙන එකම තැන තමයි අධිකරණය. ඒ නිසා තමන්ගේ දේශපාලන වරප්‍රසාදවලට යටත් වෙලා ඒ අධිකරණය ගැන වැරැදි විධියට කථා කරන්න එපාය කියන ඉල්ලීම මා කරනවා. අපේ කෑගල්ල දිස්ත්‍රික්කයෙන් බිහි වුණු, ඉතාම හොඳ අත්දැකීම් තිබෙන අපේ දේශපාලන නායකයා -අතාවුද සෙනෙවිරත්න ඇමතිතුමා- අද අධිකරණ අමාත්‍යවරයා හැටියට ගෙන එන මේ සංශෝධනය ඉතාම ඵලදායී සංශෝධනයක් බව ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. මීළඟට ගරු රෙජිනෝල්ඩ් කුරේ නියෝජ්‍ය ඇමතිතුමා.

[අ. භා. 6.10]

**ගරු රෙජිනෝල්ඩ් කුරේ මහතා (අධිකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரெஜினோல்ட் குரே - நீதி பிரதி அமைச்சர்)
(The Hon. Reginold Cooray - Deputy Minister of Justice)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණයේ ස්වාධීනත්වය හා මහජනතාවගේ හිත සුව පිණිස අද මුළු දවස පුරාම අපේ කන් පිරී ඉතිරී යන තරමේ ධනාත්මක සහ නිෂේධාත්මක විවේචනවලට අපිට ඇහුම්කන් දෙන්න පුළුවන් වුණා. මේ කරන ලද හැම කථාවකින්ම අවධාරණය වුණු ප්‍රධාන කාරණය තමයි ජනතාවට නීතියේ සාධාරණය, යුක්තිය ඉටු විය යුතුයි කියන කාරණය. ඒක ඉතාම සරල, මට සිලිටු, ලෙහෙසි, පහසු නිගමනයක්. ඒකට විරුද්ධ වන කිසිවෙකුත් ඇත්තේ නැහැ. නමුත්

ඒ ඉටු කරන්නට යන ක්‍රියාවලිය, එය ඉටු කිරීමට දරන වෙහෙස ඒ තරම්ම සරල, පහසු, ලෙහෙසි දෙයක් වන්නේ නැහැ. රාග, ද්වේශ, ක්ලේශ, මෝහ කියන මේ සියලු අඩුලුහුඩුකම්වලින් යුතු මිනිසුන් සමහර වෙලාවට දෙවියන්ගෙන් සාධාරණය ඉල්ලා සිටිනවා. සමහර වෙලාවට ඉර හඳෙන් ඉල්ලා සිටිනවා. බොහෝ අය කියනවා, "ඉර හඳ හරිම සාධාරණයි" කියලා; "ජාති, කුලමල, පන්ති, ආගම් භේද ආදියෙන් තොරව ඉර හැමටම එක සේ පායනවා, හඳ එක සේ පායනවා" කියලා. නමුත් පන්ති සහිත සමාජයක, විෂම සමාජයක, දුක් විඳින මිනිසුන් ඉන්න සමාජයක පායන මේ ඉරත්, හඳත් අසාධාරණයි. වහින වෙලාවට සත් මහල් ප්‍රාසාදවල, සිරියහන් ගබඩාවල ජීවත් වන කුමාර කුමාරිකාවෝ, "බැඳගෙන වැහැපන්" කියලා ප්‍රාර්ථනා කරනවා. මොකද තවදුරටත් ඔවුන්ට හොඳට නිදා ගන්න. නමුත් ඒ වර්ෂාවටම කිරි කපන ළඳක්, දළු කඩන ළඳක් වේදනාවෙන් අඬනවා, "අද මේ ටික කර ගන්න බැරි වුණෝතින් මට ජීවත් වෙන්න බැහැ" කියලා. ඒ නිසා මේ නීතියේ සාධාරණය, යුක්තිය ඉර හඳෙන් පැතීමෙන් අපට කවදාවත් ලැබෙන්නේ නැති හින්දා, දෙවියන්ගෙන් ලබන ඒ සාධාරණය, යුක්තිය එහා ලෝකයට -මනෝ ලෝකයට- භාර දෙන නිසා මිහි පිට -මහ පොළොවේ- යථාර්ථයේ සාධාරණය මිනිසුන් විසින්ම මිනිසුන්ට ලබා දීමේ ක්‍රියාවලිය අපි අධිකරණ ක්‍රියාවලියක් මඟින් ඉෂ්ට කර ගන්න බලාපොරොත්තු වෙනවා. එහෙත් ඒ අධිකරණයේත් ඒ විනිසුරුවරුත්, ඒ නීතිඥයෝත්, ඒ නීතියේ පිළිසරණ පතා ගෙන යන උදවියත් ශාන්තුවරයින් සහ ශුද්ධවන්තයින් නොවන නිසා ඔවුන්ගේ අතිනුත් අනන්ත අප්‍රමාණ අඩුලුහුඩුකම් සිද්ධ වෙන්න පුළුවන්. ඒ නිසා අපි නීතිය අත් හරින්නේ නැහැ.

මේ නීතියේ ක්‍රියාත්මක අඩුලුහුඩුකම් හා වැරදි පිළිබඳව අද මෙතැනදී කීප දෙනෙකු අතරින් කියවුණා. මේ ආණ්ඩුවෙන්, පසු ගිය ආණ්ඩුවෙන්, ඊට පෙර ආණ්ඩුවෙන් ලංකාවේ පැවැති තාක් කල් -ලංකාවේ විතරක් නොවෙයි ලෝක ඉතිහාසයේ පවා- අසාධාරණකම්, වැරදි සිද්ධ වෙච්ච අවස්ථාවල් තිබෙනවා. ඒ එක සිදුවීමක් උපමා කොට ගනිමින් මුළු මහත් අධිකරණ ක්‍රියාවලිය, මුළු මහත් නෛතික ක්‍රියාවලිය හෑල්ලුවට ලක් කරලා ඒ නිසා කිසිදු වැඩක් නොවේ යැයි කියනවා නම් අපි කළ යුතු වන්නේ මේ සියලු දේ අත් හැරීම නොවෙයි. අප විසින් කළ යුතුව පවතින්නේ එවැනි වැරදි ප්‍රායෝගික ලෝකයේ සිදු වන්නට ඉඩකඩ තිබෙන බව දැන දැන, ඒවාට යටත් නොවී, ඒවායින් පසු නොබැස නැවත නැවතත් ඉදිරියට ඒ කටයුත්ත කර ගෙන යාමයි. අවුරුදු තිස් ගණනක් තිස්සේ මේ රටේ නීතිය වල් වැදුණේ අහඹුවක් හැටියට එහෙන් මෙහෙන් කලාතුරකින් සිදු වන සිදුවීමක් හැටියට නොවෙයි. මේ රටේ උතුරු නැඟෙනහිර විතරක් නොවෙයි මුළු ලංකාවේම නීතිය මහා පරිමාණයෙන් ලවක් දෙවක් නැතුව, රැයක් දවාලක් නැතුව අමු අමුවේ විනාශ කරනු ලැබුවා. ඒ ත්‍රස්තවාදය, අන්තවාදය, මූලධර්මවාදය, තමන්ගේ මතවාදය කර ගෙන අනුන් මත පටවන්න ගිය ඒ තිරශ්චීන දුර්දාන්ත මිනීමරු ක්‍රමය මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා විසින් නැවත ශිෂ්ටාචාර ශිෂ්ට සම්පන්න ශීලාචාර ක්‍රමයකට ගෙනාවා. ඒ නිසා තමයි අද අපි මේ නීතිය, අවනීතිය ගැන කතා කරන්නේ. මේ පාර්ලිමේන්තුව ඇතුළේ කී දෙනෙක් කතා කෙරුවාද, කී දෙනෙක් නිහඬව සිටියාද, කී දෙනෙක් හෘද සාක්ෂියට විරුද්ධව කතා කෙරුවාද කාත්තන්කුඩි පල්ලියේ, ශ්‍රී මහා බෝධිය අබියස, දළදා මැඳුර අබියස, හන්දිවල, බස්නැවතුම් පොළවල්වල අභිංසක ජීවිත දහස් ගණනින් විනාශ වනකොට? එදා ඒවා ගැන කතා කරන්න පුළුවන් කෙනෙක් සිටියේ නැහැ. අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ දර්ශනය අනුව ගරු අතාවුද සෙනෙවිරත්න අමාත්‍යතුමා අපට කළ හැකි උපරිමය වේගයෙන් ඉස්සරහට කර ගෙන යෑමට අද කටයුතු ආරම්භ කර තිබෙනවාය කියන එක මම තමුන්නාන්සේලාට කියන්න ඕනෑ.

අවසානවකට වාගේ පසු ගිය වකවානුව තුළ අපේ අධිකරණ අමාත්‍යාංශයේ කටයුතු මෙහෙයවන්න අමාත්‍යවරයකු සිටියාද කියන එක පිළිබඳ ගැටලුවක් තිබුණා. හිටපු ඇමතිතුමා බරපතළ ලෙස රෝගාතුර වී සිටියා. ඒ නිසා එම කටයුතු සොයා බලන්න ගියේ නැහැ. නීතිය වුණත් නිදැල්ලේ, අයාලේ ඔහේ ගලා ගෙන යන්න ගියොත් ඒ ගැන පරීක්ෂණයක්, අධීක්ෂණයක් සිදු නොවුණොත් නීතියත් වල් වදින්න ඉඩ තිබෙනවා. ඒ නිසා දැන් අපි මේ ගැන සන්තෝෂයෙන් කියන්න ඕනෑ. ඔය නොයෙකුත් නොයෙකුත් සිදුවීම්වලට අමතරව මහජන නියෝජිතයන් හැටියට ජනතාව අද අපට ඇවිල්ලා කියන ප්‍රධානතම ගැටලුව මොකක්ද? ඉදිරිපත් වෙලා තිබෙන ප්‍රධාන ගැටලුව තමයි නීතිය ප්‍රමාද වීම නිසා නීතියෙන් අපේක්ෂා කරන්නා වූ යුක්තිය සාධාරණය යල් පැන ගිය, වැඩක් නැති, හිස් පුස්සක් බවට පත් වෙලා තිබෙනවාය කියන එක. ඒ නිසා අපි උසාවි හදලා, නීති තනලා ඒ ඔක්කොම කරලාත් නීතියේ ප්‍රමාද වීම් සිදු වනවා නම් ඇති වැඩක් නැහැ කියන නිගමනයට පැමිණිලා, විශාල වැඩ පිළිවෙළක එක කොටසක් හැටියටයි ගරු ඇමතිතුමා මේක ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේක අවසානයත් නොවෙයි. මේක සම්පූර්ණ දෙයත් නොවෙයි. මේක මුළු දේත් නොවෙයි. නඩු ගොඩ ගැසීම නිසා ජනතාවට සිදු වන පීඩාව අවම කිරීමට ආරම්භ කරන ලද ප්‍රථම පියවර හැටියටයි අප මෙය හඳුන්වන්නේ. මේ පිටුපස තවත් කරුණු රාශියක් හඹා එන බව ඉතා සන්තෝෂයෙන් කියන්න ඕනෑ. අද හුඟක් අය කිව්වා උසාවි වැඩි කෙරුවාට වැඩක් නැහැ, විනිසුරුවරුන් වැඩි කෙරුවාට වැඩක් නැහැ මේවා ක්‍රියාත්මක කිරීමේදී තවත් අඩු ලුහුඩුකම් තිබෙනවා කියලා. අපි ඒ විවේචනය පිළිගන්නවා. අපි ඒක නැහැ කියන්නේ නැහැ. නමුත් අපි කොතැනින් හෝ ආරම්භ කළ යුතුව පවතිනවා. ආරම්භ නොකරන දෙයක් ගැන කතා කරලා ඇති වැඩක් නැහැ. ඒ නිසා අපි ඉතා නිවැරදි ආරම්භයක් දීලා තිබෙනවා. නඩු විභාග ප්‍රමාද වීමේ හේතුව අපි ගැඹුරින් තේරුම් අර ගෙන තිබෙනවා. පසු ගිය දවස්වල නිලධාරීන් සමඟ, නීතිඥයන් සමඟ, විනිසුරුවරුන් සමඟ, අගවිනිසුරුතුමා සමඟ ඇමතිතුමා තමන්ගේ මුළු කාලය ගත කරමින් කළ දීර්ඝ සාකච්ඡාවකින් පසුව රෝග නිධානයට හේතු සියල්ල සොයා ගෙන තිබෙනවා. ඒ නිසා මේක, ආරම්භක පියවරක් හැටියට මේ ගොඩ ගැසී ඇති නඩු කන්ද වසර දෙකක් ඇතුළත තුනී කරන්නට ගත්තු උපාය උපක්‍රමයක් පමණයි. නමුත් මේක මෙයින්ම කෙළවර වෙන්නේ නැහැ. මේ නඩු කන්ද අවසාන කෙරුවත් මේ තිබෙන රෝග නිධානවලට ප්‍රතිකාර නොදුන්නොත් නැවත නැවත කඳු ගොඩ ගැහෙනවා ඇති. ඒ නිසා ඒ කඳු සුද්ධ කරන්නත් අවශ්‍ය වන වැඩ පිළිවෙළ සකස් කර තිබෙනවාය කියන එක අපි තමුන්නාන්සේලාට කියන්න ඕනෑ.

මේ නඩු ප්‍රමාද වීමට බල පෑ ප්‍රධාන කාරණාව තමයි නඩුවක් ගෙන යන්නට අවශ්‍ය නිසි වාර්තා නිසි කලට නොලැබීම. රස පරීක්ෂක වාර්තාව, මිනුම්පති වාර්තාව, පාර්ශ්වකරුවන්ගේ නොපැමිණීම, පොලිස් නිලධාරීන්ගේ අධික රාජකාරි නිසා නඩු සඳහා නොපැමිණීම, නීතිපති දෙපාර්තමේන්තුවේ ප්‍රමාදය, නඩු සංඛ්‍යාවේ අධික බව, නීතිඥ මහත්වරුන්ගේ කාර්ය බහුලත්වය යන මෙකී නොකී සියලු කාරණා මේ නඩු ප්‍රමාද වීමට බලපානවා. ඒ නිසා ඒ සම්බන්ධයෙන් ඇමතිතුමා අගවිනිසුරුතුමා සමඟ සාකච්ඡා කරලා, "දුන්න දුනුගමුවේ - ඊතල කිතලගමුවේ රාළ මීගමුවේ - මුවෙක් හැඩුවයි සබරගමුවේ" කිව්වා වාගේ දහ පොළේ තියා ගෙන මේවා විසඳන්නේ නැතුව මාස දෙකකට, එහෙම නැත්නම් මාස තුනකට වතාවක් මේ නඩු ප්‍රමාද වීමට හේතු වන සියලුම අය, සියලුම ආයතන අගවිනිසුරුතුමා සමඟ එක තැනකට ගෙනැල්ලා, ඇයි මේවා ප්‍රමාද වෙන්නට හේතුව, මේ ප්‍රමාදය නැති කරන්න කළ යුත්තේ මොනවාද කියා සාකච්ඡා කරන්න තීන්දු අරගෙන තියෙනවා. රස පරීක්ෂක වාර්තා ගැන මෙතුමා එදා උපදේශක කාරක සභාවේදීත් ප්‍රශ්න කළා. අනුක්‍රමික අංකයක් දෙමින් තමයි, මේ සියලු නඩුවලට යන්නේ. එතැනදී කුඩු, බෝම්බ පිළිබඳව වාගේම මහා පරිමාණයේ අපරාධවලටත් අංකයක් ලැබෙනවා. කළඳක, මංචාඩියක වරදක් කරලා තිබුණු එක්කෙනාටත් ඒක ලැබෙනවා. ඒ නිසා මෙතුමා එවේලේම තීන්දුවක් දුන්නා, මේවායේ තිබෙන බරපතළ ස්වභාවය අනුව, මේ

[ගරු රෙජිනෝල්ඩ් කුරේ මහතා]

සුළු දේවල්වලට අවුරුදු 5ක්, 6ක් නඩු ඇදි ඇදී තියෙන එක වළක්වන්නට ඉක්මනින් පියවර ගන්න කියලා. මෙතුමා ඒ නිර්දේශය දීලා තියෙනවාය කියන එක මම තමුන්නාන්සේලාට කියන්නට ඕනෑ.

ඒ වාගේම උසාවි වැඩි කිරීම, ඒ සඳහා විනිසුරුවරුන් පත් කිරීම, බලය විමධ්‍යගත කිරීම තුළ ඒ උසාවිවලට එම බලය බෙදා හැරීම පිළිබඳව දැන් අපි සාකච්ඡා කරමින් යනවා. ඒ අනුව පළාත්බද අධිකරණවලට මේ බලය දීමෙන් කොළඹට ඇවිල්ලා මේ ප්‍රශ්න විසඳන්න තියෙන අමාරුව, දුෂ්කරතාව නැති කරලා පහසුවෙන් නීතිය කරා ළඟා වීමට අවශ්‍ය දේවල් කරන්න කටයුතු කරමින් යනවා. ඒ වාගේම අපේ අවධානය යොමු වෙලා තිබෙනවා නීතියේ වරද නිසාම සිදු වන ප්‍රමාදයන් ගැන. ඒ නිසා අපි නීති ප්‍රතිසංස්කරණ කොමිසමට අපේ අදහස් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා, අවශ්‍ය විශ්ලේෂණ කරමින් ඒ අඩු පාඩු සකස් කරන්න අවශ්‍ය පියවර ගන්නා ලෙසට.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාගේ කථාව සමාප්ත කිරීමේ වේලාවයි දැන්.

**ගරු රෙජිනෝල්ඩ් කුරේ මහතා**
(மாண்புமிகு ரெஜினோல்ட் குரே)
(The Hon. Reginold Cooray)
අවසාන වශයෙන් කියන්නේ මේකයි. අපි මේ සියලු දේ කළා නොවෙයි. අපි මේ කළේ අවසාන දේ නොවෙයි. මේක මහා දුර දිග ගමනක ඉතා අමාරු දුෂ්කර කාර්යයක ආරම්භයක්, ශක්තිමත් ආරම්භයක්, ප්‍රබල ආරම්භයක්, අවිවාදිත ආරම්භයක් පමණයි. මේ ගමන ඉදිරියටත් කර ගෙන යනවාය කියන පොරොන්දුව දෙමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා. බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." -[ ගරු අතාවුද සෙනෙවිරත්න මහතා ]***

*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக" [ மாண்புமிகு அதாவுத செனெவிரத்ன ]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Athauda Seneviratne]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[ මූලාසනාරූඪ මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*
*[தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*
*[MR. PRESIDING MEMBER in the Chair.]*

***1 සිට 3 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகத்திலிருந்து 3ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 1 to 3 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.***
*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*
*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported without Amendments.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
I move,

"That the Bill be now read the Third time."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන් වන වර කියවා සම්මත කරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read the Third time, and passed.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

## රාජ්‍ය සේවක විශ්‍රාම වැටුප් විෂමතා
## அரச ஊழியர் ஓய்வூதிய முரண்பாடு
## PENSION ANOMALIES OF PUBLIC SERVANTS

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයේ යෙදී සිට විශ්‍රාම ලබා සිටින රාජ්‍ය සේවකයින්ට ඔවුන්ගේ විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් ඇති වී තිබෙන බරපතළ වැටුප් විෂමතා ඉවත් කරන ලෙස සමස්ත රාජ්‍ය සේවකයින් තම ඉල්ලීම් රජයට ඉදිරිපත් කර ඇත.

රජයේ සේවක විශ්‍රාම වැටුප් විෂමතා පිළිබඳ මෙම සභාවේදී 2007 ජනවාරි මස සාකච්ඡා වුවත් 2010 වර්ෂය වන තෙක් එම ප්‍රශ්නය විසඳා නොමැති බැවින් ගරු සභාවේ අවධානය සඳහා එම යෝජනාව නැවත ඉදිරිපත් කිරීමට මම අපේක්ෂා කරමි.

1997 ජනවාරි 01 වන දින දක්වා විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කළ අතර ඊට පසු 2004 හා 2006 වර්ෂවලදී රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනය අවස්ථා

දෙකක් සිදු කර ඇත. මෙම අවස්ථා දෙකේදීම විශ්‍රාමිකයින්ගේ වැටුප කිසිම ආකාරයකින් සංශෝධනයට ලක් නොවීය.

විශ්‍රාම වැටුප් සකස් කිරීම සඳහා පිළිගත් ප්‍රතිපත්තියක් තිබිය යුතු බවට 2000 වර්ෂයේදී පත් කළ සේනාරත්න ජනාධිපති කමිටුව හා 2002 වර්ෂයේදී පත් කළ ඒකනායක අමාත්‍ය කමිටුව මඟින් සවිස්තරව සොයා බලා නිර්දේශ ඉදිරිපත් කර ඇති අතර, එම කමිටු දෙකම යෝජනා කරන්නේ රාජ්‍ය සේවයේ වැටුප් වැඩිවීම් සිදු වන අවස්ථාවලදී යෝජිත වැටුපෙන් සියයට 70ක් විශ්‍රාම වැටුප වශයෙන් ගෙවීමට කටයුතු කළ යුතු බවය.

මීට අමතරව රජයේ සේවකයින්ට ලබා දෙන ජීවන වියදම් දීමනාව කිසිදු අඩුවකින් තොරව විශ්‍රාමික නිලධාරින්ට ලබා දෙන ලෙසත්, රජයේ සේවකයින්ට ලබා දෙන අනෙකුත් වරප්‍රසාද විශ්‍රාමික නිලධාරින්හටත් ලබා දෙන ලෙසත්, දැනට පවතින වැටුප් විෂමතා ඉවත් කිරීම හා විශ්‍රාමික නිලධාරින් සඳහා ජාතික වැටුප් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන ලෙසත් සභාව කල් තැබීමේ අවස්ථාවේදී මම යෝජනා කරමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය සේවකයන්ගේ විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය වසර 100කට වඩා පැරණි යි. දීර්ඝ කාලයක් එය මැනවින් ක්‍රියාත්මක වුණා. නමුත් වර්තමාන තත්ත්වය දෙස බැලුවාම, බලවත් විෂමතාවන් ගණනාවක් තිබෙනවා. ඒකට ප්‍රධාන වශයෙන් හේතු 3ක් දක්වන්න පුළුවන්. රාජ්‍ය සේවකයන්ගේ වැටුප සංශෝධනය කරන අවස්ථාවල දී ඊට අනුරූප වන අයුරින් රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ වැටුප් සංශෝධනය සිදු වී නැහැ. ඒ වාගේම විශ්‍රාම වැටුප් සකස් කිරීමේ දී අනුගමනය කර ඇති විවිධ ආකාරයේ ගණන් බැලීමේ ක්‍රම නිසාත් මෙම විෂමතාව බිහි වෙලා තිබෙනවා. තවත් අවස්ථාවන්වල දී විශේෂිත කණ්ඩායම්වලට වරප්‍රසාද ලැබෙන ආකාරයේ විශ්‍රාම වැටුප් ගණන් බැලීම නිසාත් මෙම විෂමතාව වර්ධනය වෙලා තිබෙනවා. දැනට ශ්‍රී ලංකාව තුළ විශ්‍රාම වැටුප් ලබන රාජ්‍ය සේවකයන්ගේ ප්‍රමාණය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 2009 දත්ත සහ සංඛ්‍යා ලේඛනවලට අනුව 4,61,478යි. දිස්ත්‍රික්ක මට්ටමේ සංඛ්‍යා ලේඛන අඩංගු එම පිටපත හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

ඒ වාගේම සමස්ත ජනගහනයෙන් දළ වශයෙන් සියයට 2කට වැඩි ප්‍රමාණයක විශ්‍රාමික ජනතාවක් අපේ රටේ ජීවත් වෙනවා. එම විශ්‍රාමිකයන්ගේ ප්‍රමාණය වැඩි වීමත් සමඟ ඔවුන් මුහුණ දෙන ආර්ථික, සමාජයීය ප්‍රශ්න තුළින් ඒ අය නඟන හඬ නිසා එම විශ්‍රාමික ප්‍රජාව දේශපාලන පක්ෂවලට අමතක කළ නොහැකි වැදගත් කොට්ඨාසයක් බවට පත් වී තිබෙනවා. විශේෂයෙන්ම පසු ගිය ජනාධිපතිවරණ දෙකෙහිදීම -2005 දීත්, 2010 දීත්- වර්තමාන ජනාධිපතිතුමා එතුමාගේ දර්ශනයට අනුව, විශේෂයෙන්ම විශ්‍රාමික ප්‍රජාවට පොරොන්දු රැසක් ඉදිරිපත් කළා. මේ අවස්ථාවේ දී මම එය උපුටා දක්වන්නට කැමැතියි. මම කැමැතියි එතුමාගේ "දිනවුම ශ්‍රී ලංකා" දර්ශනයේ "ජ්‍යෙෂ්ඨ පුරවැසි බුහුමන්" වැඩසටහන, මේ සභාවට ඉදිරිපත් කරන්නට. එහි මේ විධියට කියැවෙනවා:

"තම ජීවිතය දරුවන් වෙනුවෙන්, රට දැය වෙනුවෙන් කැප කළ ජ්‍යෙෂ්ඨ පුරවැසියනට තනි වෙන්නට මම ඉඩ නොතබමි.

රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි කිරීම්වලට සාපේක්ෂව විශ්‍රාම වැටුප් ද වැඩි කිරීමට පියවර ගන්නෙමි.

දැනට විශ්‍රාම වැටුප් ලබන සියලු සේවා කාණ්ඩයන් හි පවතින විෂමතා ඉවත් කොට විශ්‍රාමිකයන්ගේ ආත්ම ගෞරවය ආරක්ෂා වන අන්දමට විශ්‍රාම වැටුප් ක්‍රමය සංශෝධනය කරමි.

දෘෂ්ටි ආබාධ සඳහා අවශ්‍ය ඇස් කණ්නාඩි නොමිලේ ලබා දීමට පියවර ගනිමි."

**** කථාව අවසානයේ පළ කර ඇත.***
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech*

එහි ඉතිරි කොටස මා **සභාගත*** කරනවා.

ඒ වාගේම 2010 ජනාධිපතිවරණයේ දී ඉදිරිපත් කළ "මහින්ද චින්තන - ඉදිරි දැක්ම" වැඩ සටහනෙහි, විශේෂයෙන්ම "විශ්‍රාම දිවියට අත් වැලක්" යන මාතෘකාව යටතේ එතුමා මෙසේ සඳහන් කරනවා:

- "විශ්‍රාම වැටුප් ලබා ගැනීමේ ක්‍රියාවලියේ දී ජ්‍යෙෂ්ඨ පුරවැසියන් මුහුණ පාන දුෂ්කරතා සහ රස්තියාදුවීම් වළක්වා ගැනීම සඳහා විශ්‍රාම වැටුප නිවසටම ලැබෙන ක්‍රමයක් ක්‍රියාත්මක කරමි.
- 2006ට පෙර විශ්‍රාම ලැබූ සියලුම රජයේ සේවකයන්ගේ විශ්‍රාම වැටුප 2006 වැටුප් ක්‍රමයට ගැලපෙන අයුරින් සකස් කොට මීළඟ අය වැයේ සිට ක්‍රියාත්මක කරමි.
- විශ්‍රාමික රජයේ සේවකයින්ට සෞඛ්‍ය පහසුකම් වෙනුවෙන් ඖෂධ සහ වෛද්‍ය ගාස්තු සඳහා වර්ෂයකට රුපියල් 10,000ක් වන සෞඛ්‍ය රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දෙන්නෙමි."

ඒ වාගේම ගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කළ 2010 ජනවාරි මස 12 දිනැති එම ලිපියේ 5 වන ඡේදයෙහි මෙසේ සඳහන් වෙනවා:

"විශ්‍රාමික ඔබ සැමට රට සංවර්ධනය කිරීමේ ක්‍රියාවලියේ දී දේශනාත්මක භූමිකාවක් නිරූපණය කරමින් ගෞරවාන්විතව සක්‍රිය දායකත්වයක් ලබා දීම සඳහා ඉඩකඩ සැලසීමට පියවර ගනිමි. එහි දී 2006 ට පෙර විශ්‍රාම ලැබූ සියලුම රජයේ සේවකයන්ගේ විශ්‍රාම වැටුප 2006 වැටුප් ක්‍රමයට ගැලපෙන අයුරින් සකස් කොට මීළඟ අය වැයේ සිට ලබා දීමට ද, විශ්‍රාමික රජයේ සේවකයන්ට සෞඛ්‍ය පහසුකම් වෙනුවෙන් ඖෂධ හා වෛද්‍ය ගාස්තු සඳහා වර්ෂයකට

රු.10,000/-ක් වන සෞඛ්‍ය රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීමට ද කටයුතු කරමි."

වර්තමාන රජය මේ ආදී වශයෙන් පසු ගිය ජනාධිපතිවරණයේදී විශ්‍රාම වැටුප් විෂමතාව ඉවත් කරන්නට පොරොන්දු මාලාවන් රැසක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම යුගයේ අවශ්‍යතාව වෙලා තිබෙන මේ විශ්‍රාම වැටුප් විෂමතාව අහෝසි කරන්නට වර්තමාන ආණ්ඩුව කටයුතු කරන්නට ඕනෑ.

2004 හා 2006 වර්ෂවලදී රාජ්‍ය සේවයේ අවස්ථාවන් දෙකකදී වැටුප් සංශෝධනය වෙලා තිබෙනවා. 2003.12.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/2003 යටතේ වැටුප් සංශෝධනයෙන් හා 2004.12.27 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 9/2004 යටතේ වැටුප් සංශෝධනයෙන් වැටුප් වැඩි වීම් ක්‍රියාත්මක වෙලා තිබෙනවා. ඒ වාගේම 2006 අප්‍රේල් 25 වන දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 යටතේ 2006 ජනවාරි 01 දින සිට රාජ්‍ය සේවයේ වැටුප් වැඩි වීමක් කළ අතර, මෙම වැටුප් ක්‍රමය මත විශ්‍රාම ගිය අය හා එම දිනයට පෙර විශ්‍රාම ගිය රාජ්‍ය සේවකයින්ගේ විශ්‍රාම වැටුප අතර බරපතළ විෂමතාවක් ඇති වෙලා තිබෙනවා. එම නිසා 2006 ජනවාරි 01 වන දිනට පෙර විශ්‍රාම ගිය අයට බලවත් ආර්ථික සහ මානසික අසහනයකට පත් වීමක් අද සිදු වෙලා තිබෙනවා. මේ විෂමතාව නිවැරදි කරන්නට ඉල්ලීම් රැසක් ඉදිරිපත් වුණත් මේ වන තෙක් ඒ සඳහා සක්‍රිය ක්‍රියාදාමයක්, ප්‍රායෝගික වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙලා නැහැ. විශේෂයෙන්ම සමාන සේවයකට අසමාන ලෙස සැලකීම තුළින් මේ ඇති වෙලා තිබෙන වැටුප් විෂමතාව අසාධාරණ බව අපි හැමෝම පිළිගන්නවා. එය වහාම අහෝසි කළ යුතුයි. 1997 වසර තෙක් පැවති වැටුප් විෂමතාව අහෝසි කිරීමෙන් අපි හැමෝම පිළි අරගෙන තිබෙනවා, මේ වැටුප් විෂමතා ප්‍රශ්නයටත් පැහැදිලි

****  පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
**  Placed in the Library.*

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

විසඳුමක් ලබා දීම වර්තමාන ආණ්ඩුවේ වග කීමක් කියලා. මේකට විසඳුම මොකක්ද? 2006 ජනවාරි 01 වන දිනට පෙර විශ්‍රාම ගිය රජයේ සේවකයින්ගේ විශ්‍රාම වැටුප, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006ට අනුරූප වන අයුරින් සකස් කර දීමට වහාම නීති සම්පාදනය කළ යුතුයි කියලා මම මේ අවස්ථාවේදී යෝජනා කරනවා. විශේෂයෙන්ම අපි උදාහරණයක් හැටියට කිව්වොත්, බස්නාහිර පළාත් සභාවේ හිටපු ප්‍රධාන ලේකම් ආර්.ඩබ්ලිව්. පියසේන මහතා මේ වන විට විශ්‍රාම ගත වෙලා ඉන්නවා. මේ වන විට එතුමාට රුපියල් 20,000ක වැටුප් විෂමතාවකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම රාජ්‍ය කළමනාකරණ සේවයේ වැටුප් විෂමතාව ගත්තොත් එය මසකට රුපියල් 4,000ක මුදලක් බවට පත් වෙලා තිබෙනවා. මේ වැටුප් විෂමතා ඉවත් කරනවා වාගේම, මම විශ්වාස කරනවා මේ ප්‍රශ්නයට තිරසාර විසඳුමක් ලබා දෙන්නට නම් ජාතික විශ්‍රාම වැටුප් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන්නට වර්තමාන රජය උත්සුක විය යුතුයි කියලා.

විශ්‍රාමික ප්‍රජාවට ලැබෙන විශ්‍රාම වැටුප කාලීන වශයෙන් ගත් කල ප්‍රමාණවත් නොවන බව අපි හැමෝම දන්නවා. ඒකට ප්‍රධාන හේතුව වැටුප් විෂමතාවයි. විශේෂයෙන්ම රාජ්‍ය සේවකයින්ට සහ විශ්‍රාමිකයින්ට අදාළ වන ජාතික වැටුප් ප්‍රතිපත්තියක් සැකසීමට පියවර නොගැනීම හේතුවෙන් විටින්, විට සිදු වන්නේ රාජ්‍ය සේවය තුළ තිබෙන වෘත්තීය සමිතිවල බලපෑම මත එක කොටසකට පමණක් වැටුප් වැඩි වීමකි. එසේ බලපෑම් කළ නොහැකි විශ්‍රාමිකයින්ට සොච්චම් වැටුපක් ලබා දීමයි. 1997 වැටුප් විෂමතාව අහෝසි කළත් 2006 වන විට එය වඩා වැඩි විෂමතාවක් බවට නිර්මාණය වෙලා තිබෙනවායි කියන එක කාටත් නොරහසක්. එසේ නම් රාජ්‍ය සේවයේ විශ්‍රාමිකයින්ට සහ රාජ්‍ය සේවකයින්ට වැටුප් විෂමතාවක් ඇති නොවී, සාධාරණයක් ඉෂ්ට කරන්නට ජාතික වැටුප් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන්නට ඕනෑ.

2000 සේනාරත්න ජනාධිපති කමිටුව හා 2002 ඒකනායක අමාත්‍ය කමිටුව යන කමිටු දෙකෙන්ම යෝජනා කර තිබෙනවා, වැටුප් වැඩි වීම් සිදු වන අවස්ථාවලදී සියයට හැත්තෑවක විශ්‍රාම වැටුප මාණ්ඩලික තනතුරු සඳහාත් සියයට හැත්තෑ පහක වැටුප ඊට පහළ ශ්‍රේණි සඳහාත් ගෙවීමට කටයුතු කළ යුතුයි කියලා. එම නිර්ණායකයන් පාදක කර ගෙන ජාතික වැටුප් ප්‍රතිපත්තියක් නිර්මාණය වුණොත් අනාගතයේදී මේ ප්‍රශ්න බොහෝ දුරට විසඳන්නට අපට පුළුවන්කම ලැබෙයි කියා මම විශ්වාස කරනවා.ඒ වාගේම රාජ්‍ය සේවකයන්ට ගෙවනු ලබන ජීවන වියදම් දීමනාව කප්පාදුවකින් තොරව විශ්‍රාමිකයන්ටත් ලබා දිය යුතුයි කියලා මම යෝජනා කරනවා. ජීවන වියදම් දීමනාව මුළු රාජ්‍ය ක්ෂේත්‍රයටම ලැබෙනවා; අපි වාගේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටත් ලැබෙනවා. විශේෂයෙන්ම උද්ධමනය සඳහා ලබා දෙන සහනයක් හැටියටයි මේ ජීවන වියදම් දීමනාව ලබා දෙන්නේ. නමුත් විශ්‍රාමික ප්‍රජාවට මේ ජීවන වියදම් දීමනාවෙන් සියයට පනහක ප්‍රමාණයක් පමණයි ලැබෙන්නේ. අද වන විට රාජ්‍ය සේවකයන්ට වාගේම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටත් රුපියල් 5,250ක මුදලක් ජීවන වියදම් දීමනාව වශයෙන් ලැබෙන කොට, විශ්‍රාමිකයන්ට ලැබෙන්නේ එයින් සියයට පනහක මුදලක්. මම දන්නා තරමින් ලෝකයේ කිසිම තැනක මේ වාගේ දෙයක් සිදු වන්නේ නැහැ. අපේ අසල්වැසි රට වන ඉන්දියාවේත් ඒ ලබා දෙන ජීවන වියදම් දීමනාව සම්පූර්ණයෙන්ම විශ්‍රාමිකයන්ට ලබා දෙනවා.

ඒ වාගේම මේ යෝජනාවට අමතරව විශේෂයෙන්ම විශ්‍රාමික ප්‍රජාව පිළිබඳවත් අදහස් කීපයක් ඉදිරිපත් කරන්නට මා කැමැතියි. පසු ගිය දවස්වල ජ්‍යෙෂ්ඨ පුරවැසි ප්‍රසාද පොලී දීමනාව යම් කප්පාදුවකට ලක් කරලා, බැංකු පොලියට අමතරව ලබා දෙන සියයට 20ක මුදල ඉවත් කරන්නට මේ වර්තමාන ආණ්ඩුව කටයුතු කළා. එම ක්‍රියාව තුළින් බලවත් අසාධාරණයක් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ටත්, විශ්‍රාමික ප්‍රජාවටත් සිදු වෙලා තිබෙනවා කියන එකත් මම ප්‍රකාශ කරන්න කැමැතියි. මේ මහා වරද ඉක්මනින්ම නිවැරදි කරන්න කියලා මා මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම විශ්‍රාමිකයන්ගේ ආරක්ෂාව තහවුරු කරන්නට මෙතෙක් තිබුණු සෑම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තුළින්ම ඒ ශක්තිය, රැකවරණය ලබා දීලා තිබෙනවා. නමුත් කනගාටුවෙන් හෝ කියන්නට ඕනෑ, 78 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේදී මේ අරමුණු අන්තර් ග්‍රහණය වෙලා නැහැ කියලා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යම් සංශෝධනයක් සිදු වනවා නම්, 78 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සිදු වුණු ඒ අඩු පාඩුවත් නිවැරදි කරන්න කියලා මම ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම චන්ද්‍රිකා බණ්ඩාරනායක ජනාධිපතිතුමියගේ කාල වකවානුව තුළ විශ්‍රාමිකයන් වෙනුවෙන් සියලු පහසුකම් සහිතව වෙනම විශ්‍රාමික නිකේතනයක් කැලණිය, වෙදමුල්ල ප්‍රදේශයේ ඉදි කරලා තිබෙනවා. නමුත් අද මේ ආයතනය පාලනය වන්නේ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන්. අද මේ ආයතනය පාලනය වන්නේ විශ්‍රාමිකයන්ගෙන් බැහැරවයි. විශ්‍රාම භාර අරමුදලට මේ ආයතනය භාර දීමට කටයුතු කරන්න කියලා ගරු අමාත්‍යතුමාගෙන් ඉතාමත්ම කරුණාවෙන් මේ අවස්ථාවේදී මා ඉල්ලීමක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එසේ නම් මේ යෝජනාව හරහා විශේෂයෙන්ම දැඩි අසහනයකට, දැඩි කලකිරීමකට පත් වී සිටින අපේ විශ්‍රාමික ප්‍රජාවට යම් සහනයක් ලබා දෙන්න කියලා ගරු අමාත්‍යතුමාගෙනුත්, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගෙනුත් මම ඉල්ලීමක් කරනවා. මේ යෝජනාව ඉතාමත්ම සද්භාවයෙන් ඉදිරිපත් කරපු යෝජනාවක්. මේ යෝජනාවේ මුඛ්‍ය අරමුණ වන්නේ, විශ්‍රාමික ප්‍රජාවට ලබා දිය යුතු සියලු ආර්ථික ශක්තිය, සියලු සමාජයීය ශක්තිය ලබා දීලා විශ්‍රාමික ප්‍රජාවටත් සමාජයේ ලබා දිය යුතු ඒ උත්තරීතර ස්ථාවරය ලබා දෙන්නට කටයුතු කිරීමයි. එසේ කටයුතු කරන්න කියලා මම බොහොම ඕනෑ කමින් ගරු අමාත්‍යතුමාගෙනුත්, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගෙනුත් ඉල්ලීමක් කරමින් ඉතාමත්ම ඉක්මනින් මේ යෝජනා ක්‍රියාත්මක කරන්නට ඔබතුමාට හැකියාව ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වනවා.

***සභාමේසය මත තබන ලද ලියවිල්ල :***
*சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணம்:*
*Document tabled:*

No of Pensioners - 2009

| Head | D.ss | No.of Pensioners |
|---|---|---|
| 255 | Colombo | 85,519 |
| 256 | Gampaha | 76,202 |
| 257 | Kalutara | 32,761 |
| 258 | Kandy | 39,496 |
| 259 | Matale | 10,270 |
| 260 | Nuwara Eliya | 7,054 |
| 261 | Galle | 26,629 |
| 262 | Matara | 17,775 |
| 263 | Hambantota | 7,988 |
| 264 | Jaffna | 11,264 |
| 265 | Mannar | 1,020 |
| 266 | Vavuniya | 2,235 |
| 267 | Mulativu | 402 |
| 268 | Kilinochchi | 580 |
| 269 | Batticaloa | 5,684 |
| 270 | Ampara | 5,638 |
| 271 | Trincomalee | 4,755 |
| 272 | Kurunagala | 35,886 |
| 273 | Puttalam | 10,858 |
| 274 | Anuradhapura | 16,088 |
| 275 | Polonnaruwa | 5,898 |
| 276 | Badulla | 15,194 |
| 277 | Monaragala | 6,567 |
| 278 | Ratnapura | 13,838 |
| 279 | Kegalle | 20,702 |
| | Foreigen Pensiones | 1,175 |
| | Total | 461,478 |

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

Mr. Presiding Member, I wish to second the Adjournment Motion, which is on a very important subject. Many of the Government servants are eagerly waiting until these anomalies are eradicated.

I would also like to point out that the 20 per cent bonus interest that was promised to the senior citizens as an election pledge just before the Presidential Election; that senior citizens over 60 years would have a 20 per cent bonus on their interest, was paid for six months and from the 1st of July, it has been suspended. There are many pensioners who withdrew their monies from different institutions in which they had deposited money and brought that to the banks with the expectation of getting this 20 per cent bonus interest. But today, they are crying that they have been misled. The election promise which was given by the President has been violated. This is a very serious situation, Sir. They are making representations to us asking us to urge the Government to continue this bonus scheme from August.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා (රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன - பொது நிருவாக, உள்நாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. W.D.J. Senewiratne - Minister of Public Administration and Home Affairs)

May I reply if the Hon. Member permits me?

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

Yes.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

This bonus interest that was given for nearly one year -

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

For six months. It started in January.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

It will be continued.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

Are you giving an assurance?

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

Yes. There had not been an official announcement.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

I do not know. But, it was paid and then stopped. It was stated in your policy report.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

There was a press report which stated that it will be stopped. But, the Government does not want to stop it; it will continue.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

The news report I saw was that the President had told the Central Bank to submit a report with regard to the payment of this interest. Nowhere did it say that the it is going to be resumed, unless the Hon. Minister is giving an assurance.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

The Government is goint to continue with that concept.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

That is a promise given by you.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

I must tell you that the Government has not taken a decision to stop it.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

Then, are you paying it for July?

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

We are considering continuing it.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

That is the point. - [*Interruption.*] Please give an assurance in this House because the pensioners are eagerly waiting to get this additional income, despite the anomalies that are existing in the pension scheme.

The second matter I want to point out is with regard to the Golden Key depositors' money. Most of these pensioners who got their commuted pension went and dumped the money in the Golden Key. There was a

[ගරු ජෝන් අමරතුංග මහතා]

Supreme Court decision that the assets of Golden Key should be liquidated and the depositors' money should be settled. Under phase I, they have paid one Rupees one lakh each. Now, nearly 20 months have lapsed since the collapse of that institution; but only 100,000 has been paid to them. The question is that -

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
It is completely irrelevant.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
No, no, these are pensioners' monies. So, do not say it is irrelevent.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
You cannot canvass it here. This is completely irrelevant. This is a matter that is completely outside the purview of it.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
If you analyse the depositors, the majority of them are pensioners. Since the Adjournment Motion concerns pensioners, I am mentioning it and you may take it into consideration. Now, 20 months have lapsed but they have not been paid off. There is no attempt being made to liquidate the assets.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
The fact is, people have gone and deposited their money with a private individual.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, you have only half a minute more.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
That is a transaction between the depositor and the banker.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
Yes, I agree.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
You have to accept it. [*Interruption.*] The Government has nothing to do with that.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
No, no. There is a responsibility by the Central Bank to ensure that these institutions pay out the money of the depositors. There is a Supreme Court decision -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, your time is running out.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
Yes, I know. These are the two matters that I would like to raise. Please resume the 20 per cent bonus interest, on one side, and make sure that the Golden Key depositors get their money by liquidating their assets, on the other.

Thank you.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Dilan Perera please. You have 10 minutes.

**ගරු ඩිලාන් පෙරේරා මහතා (රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு டிலான் பெரேரா - பொது நிருவாக, உள்நாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Dilan Perera - Deputy Minister of Public Administration and Home Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා එතුමාගේ සභාව කල් තබන යෝජනාව ඉදිරිපත් කරලා අවසානයේදී කිව්වා, මේ යෝජනාවේ මුඛ්‍ය පරමාර්ථය වෙන කිසිවක් නොව, විශ්‍රාමිකයන්ට ලැබෙන්නා වූ ඒ විශ්‍රාම වැටුපේ විෂමතා ඉවත් කර ගැනීමයි කියලා. මමත් කල්පනා කරනවා ඒක එහෙම විය යුතුයි කියලා. විශේෂයෙන්ම අද ඇති වෙලා තිබෙන අර්බුද දිහා බැලුවාම කෙනෙක් සිතන්නට පුළුවන් තමන්ගේ පක්ෂයේ ඉන්නා කෙනෙක් විශ්‍රාම යැවීම සඳහා කර ගෙන යන්නා වූ අරගලයේ කොටසක් හැටියටයි මේ යෝජනාව එළියට බැස්සේ කියලා. [බාධා කිරීම්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුව කියන්නට ඕනෑ ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාට- [බාධා කිරීම්]

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
ජය වේවා! ජය වේවා!

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please!

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

විශ්‍රාම වැටුපේ විෂමතාව පිළිබඳව කථා කරන ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා තමන්ගේ සභාව කල් තැබීමේ යෝජනාවේ සියල්ල අඩංගු කරලා, ඉතාම ඕනෑකමින් වැදගත්ම අංගයක් ඉවත් කළා. [බාධා කිරීම්]මොකක්ද ඉවත් කළ වැදගත්ම දේ? ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිවරයාව සිටි කාලයේ ඒ ආණ්ඩුවෙන් තමයි විශ්‍රාම වැටුපේ විෂමතා කෙසේ වෙතත් රාජ්‍ය අංශයේ විශ්‍රාම වැටුප සම්පූර්ණයෙන් අහෝසි කළේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

ඒක වැඩක් නැහැ.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

ඒක වැඩක් තිබෙනවා. විශ්‍රාම වැටුපේ ඉතිහාසය, අතීතය දිගින් දිගටම කථා කළ ගරු ප්‍රේමදාස මන්ත්‍රීතුමා ඉතාම ඕනෑකමින් පරිස්සම් වුණා එතුමාත් නියෝජ්‍ය ඇමතිවරයාව සිටි කාලයේ තමන්ගේ ආණ්ඩුව විසින් විශ්‍රාම වැටුප අහෝසි කළා කියන කාරණය හංගන්නට. ඇත්ත කථාව ඒකයි. ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැතිවරයාව සිටි කාලයේ ගරු ප්‍රේමදාස මන්ත්‍රීවරයා ඒ ආණ්ඩුවේ සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිවරයා වී සිටියා. ඒ ආණ්ඩුව රාජ්‍ය සේවකයාගේ විශ්‍රාම වැටුප අහෝසි කළා; නැවැත්වූවා. ඒ විශ්‍රාම වැටුප නැවත රාජ්‍ය සේවකයාට ලබා දෙන්න කටයුතු කළේ අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපතිවරයා වූ පසුවයි. මහින්ද චින්තනය යටතේ තමයි, සම්පූර්ණයෙන්ම කප්පාදු කළ රාජ්‍ය සේවකයාගේ විශ්‍රාම වැටුප නැවත රාජ්‍ය සේවකයාට ලබා දෙන්න කටයුතු කළේ. අන්න ඒ කාරණය ගරු ප්‍රේමදාස මන්ත්‍රීතුමා තමන්ගේ කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කිරීමේදී ඉතාම ඕනෑකමින් අමතක කළා. එතැනදී මට පේනවා එතුමා පටු දේශපාලන වාසියක් ගැනීමේ වුවමනාවෙන් තමයි ඒක කළේ කියලා. ඒක අමතක වන්න බැහැ. ජේ.ආර්. ජයවර්ධන මහත්මයාට 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හැදීමේදී විශ්‍රාමිකයන් පිළිබඳව අමතක වුණා කියන කාරණය මතක් වුණා නම්, තමාම නියෝජ්‍ය අමාත්‍යවරයාව සිටි කාලයේ, විශ්‍රාම වැටුපේ විෂමතාව නොවෙයි, මුළු විශ්‍රාම වැටුපටම කෙළවන්නට, මුළු විශ්‍රාම වැටුපම නවත්වන්නට තමන්ගේ ආණ්ඩුව කටයුතු කළාය කියන කාරණය අමතක වන්නට බැහැ. මන්ත්‍රීතුමාට ඒක එහෙම වුණා. මහින්ද චින්තනය ක්‍රියාත්මක වන විට තමයි විශ්‍රාම වැටුප නැවත රාජ්‍ය සේවකයන්ට දෙන්න ඕනෑයි කියන කාරණය තේරුම් අර ගෙන ඒ කාරණයට ආණ්ඩුව මැදිහත් වුණේ. අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා යටතේ තමයි විශ්‍රාමිකයන්ගේ ජීවන වියදම් දීමනාව යම් ප්‍රමාණයකට ගෙව්වේ. ඇත්ත, යම් විෂමතාවක් තිබෙනවා. රාජ්‍ය සේවකයන්ට ගෙවන්නා වූ විශ්‍රාම වැටුපට අනුකූලව ඒ ජීවන වියදම් දීමනාව ගෙවිය යුතුව තිබෙනවා. එය ගෙවන්නට මෙම ආණ්ඩුව ක්‍රියා කරමින් පවතිනවා. ඒ විතරක් නොවෙයි. පසු ගිය මාසයේ පාර්ලිමේන්තුව රැස් වුණ වේලාවේදී විශ්‍රාමිකයන් විතරක් නොවෙයි, අපේ වැන්දඹුවන් සහ අනත්දරුවන් පිළිබඳවත් ලංකාවේ දැනට තිබෙන අණපනත්වල විෂමතාවන් අයින් කරන්නට අවශ්‍යම කරන යෝජනා මේ පාර්ලිමේන්තුවට ගෙනාවා. ඒ නිසා මේ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව විශ්‍රාමිකයන් ආරක්ෂා කරනවා විතරක් නොවෙයි, විශ්‍රාමිකයන් වැන්දඹුවන් සහ අනත්දරුවන් සම්බන්ධයෙන් ලංකාවේ අණපනත්වල තියෙන්නා වූ විවිධ විෂමතාවන් ඉවත් කරන්නටත් අවශ්‍ය කරන වැඩ පිළිවෙළවල් ඉතාමත් ඉක්මනින් ක්‍රියාත්මක කර තිබෙනවා. ඒ ක්‍රියාත්මක වීම තමයි පසු ගිය මාසයේ පාර්ලිමේන්තු රැස්වීම්වාරවලදී අපි දැක්කේ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 225 දෙනාම ඒ පිළිබඳව අගය කරමින් කථා කළේ ඒ නිසායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රජය විශ්‍රාමිකයන් ආරක්ෂා කරනවා විතරක් නොවෙයි විශ්‍රාමිකයන්, වැන්දඹුවන් සහ අනත්දරුවන් සම්බන්ධයෙන් මතු වෙලා තිබෙන විෂමතාවන්ට අවශ්‍ය කරන නීතිරීති හදලා ඉතාමත් ඉක්මනින් ඒවා පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සම්මත කර ගැනීමේ කාර්ය භාරයත් ඉටු කර තිබෙනවාය කියන එක මා මේ වෙලාවේ මතක් කර දෙන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා මේ යෝජනාව අස්සේ "ගෝල්ඩන් කී" කතන්දරේත් ඇදලා ගත්තා. "ගෝල්ඩන් කී" කියන්නේ පෞද්ගලික ආයතනයක්. සමහර අය තමන්ගේ කැමැත්තෙන්ම ගිහිල්ලා ඒ ආයතනයේ මුදල් තැන්පත් කර තිබෙනවා. අපි දන්නා විධියට සමහර අය ඒ ආයතනයේ මුදල් තැන්පත් කර තිබෙන්නේ රජයට ආදායම් බදු ගෙවන එකෙන් වැළැකීම සඳහායි. සමහර ආයතනවල එහෙම මුදල් තැන්පත් කළාම රජයට ආදායම් බදු ගෙවන එක පැහැර හරින්න පුළුවන්. ඒ නිසා සමහර අය ස්වේච්ඡාවෙන් ගිහිල්ලා -ආණ්ඩුව කියලා නොවෙයි- යම් යම් තැන්වල මුදල් තැන්පත් කරනවා. ඒ තැන්පත් කරපු මුදල් පිළිබඳව ආණ්ඩුවට වග කීමක් නැති වුණත් ආණ්ඩුව මැදිහත් වෙලා ඒ අය වෙනුවෙන් කටයුතු කිරීමේ කාර්ය භාරයක නියැළී ඉන්නවා. එසේ නියැළී ඉඳීමේ කාර්ය භාරයත් යම් ප්‍රමාණයකට දැන් සාර්ථක වෙලා තිබෙනවා. තව ප්‍රමාණයක් සාර්ථක කර ගත යුතුව තිබෙනවා. ආණ්ඩුව බලහත්කාරයෙන් ඒ අයව එතැනට යොමු කළේ නැහැ. ඒ කාරණය මේ විශ්‍රාම වැටුප් පිළිබඳ යෝජනාවට කිසිම සම්බන්ධයක් නැහැ. ගෝල්ඩන් කී ආයතනයේ මුදල් තැන්පත් කරන්නය කියා කවුරුවත් කියා නැහැ. රජයට ආදායම් බදු ගෙවන එකෙන් බේරෙන්න ඕනෑ නිසා සමහර අය එම ආයතනයේ මුදල් තැන්පත් කර ඇති බවට කථාවක් තිබෙනවා. ඒ කෙසේ වෙතත් එසේ මුදල් තැන්පත් කර ඇති අයගේ මුදල් සම්බන්ධයෙන් ආණ්ඩුව නිල වශයෙන් මැදිහත් වීමක් කළ යුතු නොවුණත්, ආණ්ඩුවක් හැටියට සෑම පුරවැසියකුගේම අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටිය යුතු නිසා ආණ්ඩුව ඒ සම්බන්ධයෙනුත් යම් මැදිහත් වීමක් කර තිබෙනවා. ඒ මැදිහත් වීම්වල ප්‍රතිඵල අපට පෙනෙන්නට තිබෙනවා. තව ඉතුරුවක් තිබෙනවා. ඒ අය ගැනත් ආණ්ඩුව බලන්නට ඕනෑ. ඒ කරපු මැදිහත් වීම් පිළිබඳව මතක් කරමින් ඊළඟ කොටසත් ඉටු කරන්නය කියන කාරණය තමයි හරි නම් කිව යුතු වන්නේ. නමුත් කරපු මැදිහත් වීම් පිළිබඳව කථා කරන්නේ නැතිව ඉතුරු ටික කරන්නය කියන කාරණයත්, අහෝසි කරපු විශ්‍රාම වැටුප පිළිබඳව කථා නොකොට විශ්‍රාම වැටුප් විෂමතාව ඉවත් කරන්නය කියා යෝජනාවක් ගෙනාවා වාගේ තමයි.

කාලයක් තිස්සේ මමත් මේ සභාවේ ඉන්නවා. විශේෂයෙන්ම මේ අලුත් පාර්ලිමේන්තුව තුළ වෙනදාට වඩා වැඩියෙන් පාර්ලිමේන්තුවේ විවාදවලට සම්බන්ධ වෙමින් විවිධ ක්ෂේත්‍ර පිළිබඳව සභාව කල් තැබීමේ යෝජනා ගෙන එමින් විපක්ෂයේ සිටින ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා බොහොම ක්‍රියාකාරීව පාර්ලිමේන්තුවේ කටයුතුවලට මැදිහත් වන බවක් අපට පෙනෙන්නට තිබෙනවා. ඒ ගැන මම සතුටු වෙනවා. මොකද, මෙතෙක් කාලයකට එතුමා එහෙම සම්බන්ධ වෙනවා මා දැක නැහැ. මෙතෙක් මා දැක තිබෙන්නේ එතුමා පාර්ලිමේන්තුවේ උපදේශක කාරක සභාවලට විතරක් සම්බන්ධ වෙලා කථා කරනවා පමණයි. නමුත් මේ විධියට ක්‍රියාකාරීව එතුමාගේ මැදිහත් වීම හරහා එතුමා පෙන්වන්නේ අර මහර එක්සත් ජාතික පක්ෂ බල මණ්ඩලය තුළ මතු වුණු කාරණා පිළිබඳව සැබෑ ලෙසම එතුමාත් උනන්දුයි කියන කාරණය ද එහෙම නැත්නම් වෙනත් කාරණයක්ද කියන ප්‍රශ්නය ජනතාවට මතු වෙනවා. සභාව කල් තැබීමේදී මෙවැනි යෝජනා ගෙන එන කොට ඒ කාරණයට සම්බන්ධ විෂය මුඛ්‍ය පරමාර්ථය කර ගත යුතුයි. තමන්ගේ පක්ෂය ඇතුළේ තිබෙන කවල් එක, පක්ෂය ඇතුළේ තිබෙන අර්බුදය මේ විශ්‍රාමිකයන්ගේ කර පිටින් ගිහිල්ලා විසඳා ගැනීමට මේ යෝජනාව තුළින් උත්සාහයක් දරනවා නම් ඒ පිළිබඳවත් අපගේ බලවත් විරෝධය පළ කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මී ළඟට ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශ්‍රාමිකයන්ගේ වැටුප් විෂමතා පිළිබඳව මේ පාර්ලිමේන්තුවට යෝජනාවක් ඉදිරිපත් කිරීම ගැන මා ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. විශ්‍රාමිකයන් කියන්නේ විශාල සේවයක් කළ පිරිසක්ය කියන එක අද මේ රජය පිළිගෙන නැහැ. මෙහිදී 4,60,000කට වැඩි පිරිසක් අවුරුදු 25ක් 30ක් තිස්සේ කරපු සේවය අගය කිරීමක් නැහැයි කියන එක ඉතාම පැහැදිලියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1997 ඉඳලා අවුරුදු 13ක් තිස්සේ විශ්‍රාම වැටුප් විෂමතාවක් තිබෙනවා. එය රටේ ප්‍රධාන ප්‍රශ්නයක් වුණු නිසා තමයි අතිගරු ජනාධිපතිතුමා "මහින්ද චින්තන" ප්‍රතිපත්ති ප්‍රකාශය තුළිනුත්, "මහින්ද චින්තන-ඉදිරි දැක්ම" තුළිනුත් මේ පිළිබඳව ප්‍රකාශනයක් ඉදිරිපත් කළේ. ඒ ගැන මීට කලින් මේ ගරු සභාවේදී ප්‍රකාශ කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි. අපි දන්නවා, පාර්ලිමේන්තු මැති ඇමතිවරුන්ට, ජනාධිපතිතුමාට විශ්‍රාම වැටුප් ලැබෙද්දී වැටුප් විෂමතාවක් නැහැ කියන එක. එය අහෝසි වෙලා ඔවුන්ට වර්තමානයේ තිබෙන ක්‍රමය අනුව විශ්‍රාම වැටුප් ලැබෙනවා. එහෙම නම් මේ රට ආරක්ෂා කරපු, මේ රටට සේවයක් කරපු ඒ රාජ්‍ය සේවකයාටත් වැටුප් විෂමතාවක් විශ්‍රාම වැටුප් ලැබීමේදී තිබිය යුතු නැහැ. එය වෙනස් කළ යුතුයි. ඒ වාගේම ඔවුන්ගේ ජීවන වියදම් දීමනාව ගැන විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. 2009.11.19 වැනි දා කැබිනට් මණ්ඩලය ගත්තු තීරණයකට අනුව ජීවන වියදම් දීමනාව වශයෙන් රුපියල් 750ක් ලබා දෙන්න තීරණය කළා. නමුත් එය නැවත අඩකින් කප්පාදු කළා. ඒ නිසායි මා කිව්වේ මේ රජය විශ්‍රාමිකයන් අවතක්සේරු කරලා පැත්තකට දමලා තිබෙනවාය කියා. ඒ වාගේම "මහින්ද චින්තන" ප්‍රතිපත්ති ප්‍රකාශය තුළිනුත්, "මහින්ද චින්තන-ඉදිරි දැක්ම" තුළිනුත් කියපු ප්‍රකාශයන්ට අමතරව 2010 ජනවාරි මාසයේ 10 වැනි ඉරිදා අතිගරු ජනාධිපතිතුමා ප්‍රසිද්ධ පුවත් පත්වලට තමන්ගේ අත්සනින් ලිපියක් ඉදිරිපත් කළා. රාජ්‍ය සේවකයන් ගැන ලිපියක් ඉදිරිපත් කළා. විශ්‍රාමිකයන් ගැන ලිපියක් ඉදිරිපත් කළා. ඒ ලිපි ඉදිරිපත් කළේ සෙනෙහසින්. ඒ ඉදිරිපත් කරන ලිපිවල තිබුණේ "සෙනෙහසින් ඉදිරිපත් කරමි" කියලායි. එමඟින් කිව්වා, විශ්‍රාම වැටුප් විෂමතාව ඉදිරි අය වැයෙන් අහෝසි කරනවාය කියා. ඒක "මහින්ද චින්තන-ඉදිරි දැක්ම" ප්‍රකාශනයෙන් කිව්වා. ඒ කියන්නේ මේ පසු ගිය අය වැයෙන්. "අද නොවේ හෙට". ඒක තමයි අපි කිව්වේ, මේක බාලගිරි දෝෂය වාගේයි කියලා. ජනාධිපතිවරණයට ඉදිරිපත් වන කොට කිව්වා අය වැයේදී ගේනවාය කියලා. දැන් කියනවා 2011 වර්ෂයේදී ගේනවාය කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

එම පොරොන්දුව මාධ්‍යවලින් -පුවත්පත්වලින්- ඉදිරිපත් කරන කොට යටින් අත්සන යොදන්න කලින් කිව්වා, "මෙය හුදෙක් පොරොන්දු මල්ලක් නොවෙයි" කියලා. එහෙම කියලා තමයි

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

මෙය පොරොන්දු මල්ලක් සහ පච මල්ලක් බව මා පාර්ලිමේන්තු අය වැය විවාදයේදී මතක් කළා. එය පච මල්ලක් බවට පත් කරලා තිබෙනවා. ඒ කෙසේද කියනවා නම්, එතුමා පුවත්පත්වලින් ප්‍රකාශයට පත් කළා වාගේම ජනවාරි 14 වැනි දා විශ්‍රාමිකයන් හත් දහසක්, අට දහසක් පමණ ජනාධිපති මන්දිරයට ගෙන් වූවා. එම පොරොන්දුව 10 වැනි දා පත්තරේට දමලා 14 වැනි දා ඒ අයව ජනාධිපති මන්දිරයට ගෙන්වලා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

තමන් ඉන්න තැනට ගෙන්වලා පොරොන්දු වුණා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඒසේ පොරොන්දු වුණා. නමුත් "මෙය හුදෙක් පොරොන්දු මල්ලක් නොවෙයි" කියලා කරපු ප්‍රකාශය

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

පත් වෙලා තිබෙනවා. අය වැයේදී වචනයක්වත් කථා කෙරුවේ නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! That will be expunged. ස්ථාවර නියෝගවලට පටහැනිවයි කථා කරන්නේ.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
කමක් නැහැ. ඔබතුමා තීන්දුවක් ගන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
කමක් නැහැ නොවෙයි. එහෙම කථා කරන්න එපා.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
කට කැවත් ඇත්ත කියන්න ඕනෑ. ඔබතුමා කරන දෙයක් කරන්න කියලා ඉල්ලා සිටිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "මෙය හුදෙක් පොරොන්දු මල්ලක් නොවේ" කියලා කිව්වා. නමුත් එය බොරු පොරොන්දුවක් බවට පත් කළා. [බාධා කිරීමක්]

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ගෙදරට ගෙනැල්ලා කිව්වා. මාධ්‍යවලින් කිව්වා. නමුත් අය වැයේදී එක වචනයක්වත් ඉදිරිපත් කළේ නැහැ. ඒ නිසා මම යෝජනා කීපයක් කරනවා. පළමුවැනි යෝජනාව-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
You are discussing the conduct of His Excellency. Therefore, that will be expunged. Your time is also over.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
විශ්‍රාම වැටුප් විෂමතාව ඉවත් කරන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
It is a statement.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
මම කියන්නේ ගරු මන්ත්‍රීතුමනි,-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

No. It is not a statement. You are referring to his conduct. Your time is over. තමුන්නාන්සේගේ වේලාවත් ඉවරයි.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

මම විනාඩියෙන් අවසන් කරන්නම්. පත්තරවලට කිව්ව එක කෙරිලා නැහැ. ඒ කියපු එක ඉෂ්ට කළේ නැති එකට කියන්නේ බොරු පොරොන්දුවද, නැද්ද කියන එක ගැන සිංහල ශබ්ද කෝෂය බලන්න ඕනෑ. විශ්‍රාම වැටුප් විෂමතාව ඉවත් කරන්න කියලා මා යෝජනා කරනවා. ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ විධියට විශ්‍රාම වැටුප් විෂමතාව ඉවත් කරන්න. ජීවන වියදම් දීමනාවක් දෙන්න. ඒ වාගේම විටින් විට වැටුප් විෂමතාවන් ඉවත් කරන කොට විශ්‍රාම වැටුප් විෂමතාව ඉවත් කර නොදී ඒ සඳහා ජාතික සැලැස්මක් හදන්න. ඒ වාගේම "මහින්ද චින්තන" ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන්, "මහින්ද චින්තන-ඉදිරි දැක්ම" ප්‍රකාශනයෙන්, මාධ්‍යවලට දුන්න ඒ ප්‍රකාශනයෙන් සහ ජනාධිපති මැදුරට ගෙන්වලා ලබා දුන්නු ඒ පොරොන්දුව ඉෂ්ට කරන්න. ඒක බොරු පොරොන්දුවක් බවට පත් කරන්න එපා කියන ඉල්ලීම මා මේ අවස්ථාවේදී කරනවා. බොහොම ස්තුතියි.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සජිත් ප්‍රේමදාස ගරු මන්ත්‍රීතුමා විසින් මේ සභාවට ඉදිරිපත් කරපු යෝජනාව මම හිතනවා පැති කීපයකින් වැදගත් වනවාය කියා. ප්‍රධාන වශයෙන්ම මා මතක් කරන්න ඕනෑ මගේ නියෝජ්‍ය ඇමතිතුමා කිව්ව පරිදි මේ යෝජනාව ගෙන එන්නට එතුමාට හිත දෙන්නට හේතූන් කිහිපයක් තිබෙන බව. එතුමා ප්‍රකාශ කළ පරිදි අද සජිත් ප්‍රේමදාස මහත්මයා මෙතෙක් අමතක කරලා තිබුණු ප්‍රශ්න ගොඩාක් දැන් පාර්ලිමේන්තුවට ගෙනෙනවා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඒක හොඳයි නේ.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

ඒක තමයි මා කිව්වේ ඒක හොඳයි කියා. මේ ප්‍රශ්න මුල් කර ගෙන එතුමා ජනතාවට පෙන්වන්න හදනවා ජනතාවගේ ප්‍රශ්න ගැන අද එතුමාගේ අවධානය යොමු වනවා, ඒ පක්ෂයේ අනෙකුත් නායකයන්ගේ අවධානය යොමු නොවන යම් යම් පැතිකඩයන් ගැන එතුමා උනන්දු වනවාය කියන කාරණා. මා විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, එක්සත් ජාතික පක්ෂයේ මූලික ප්‍රතිපත්තියට ප්‍රතිවිරුද්ධ වැඩ පිළිවෙළකට අද එතුමා ප්‍රවේශ වනවාය කියා. මොකද, මේ රටේ රජයේ සේවකයින් ගැන, රජයේ සේවකයින්ගේ විශ්‍රාම වැටුප් ගැන, රජයේ සේවකයින්ගේ අයිතිවාසිකම් ගැන සැලකිලිමත් වූ පක්ෂයක් නොවෙයි එක්සත් ජාතික පක්ෂය. ඒ අය 2002 ඉඳලා 2004 දක්වා බලයේ ඉන්න කොට රජයේ සේවකයින්ට කොහොමද සැලකුවේ කියා අපි දන්නවා. රජයේ සේවකයාගේ විශ්‍රාම වැටුප කැපුවා. එදා ඒ අය දායකත්ව විශ්‍රාම වැටුප කියා එකක් ගෙනාවා. රජයේ සේවකයින්ගේ පඩියෙන් යම්කිසි ප්‍රතිශතයක් අඩු කරලා ඒ අඩු කරන ප්‍රතිශතය අරමුදලක් වශයෙන් තියා ගෙන ඒකෙන් තමයි එදා ඒ ගොල්ලෝ විශ්‍රාම වැටුප ගෙවීම කළේ. ඒ විතරක් නොවෙයි. එදා ඒ අයට වුවමනා වුණා, රජයේ සේවාව කප්පාදු කරන්න. එදා දසලක්ෂයක් වුණු රජයේ සේවක සංඛ්‍යාව හයලක්ෂය දක්වා අඩු කරන්න විවිධ යෝජනා ගෙනාවා. මේවාට විශාල ජනතා විරෝධයන් පැන නැඟීම නිසා මේවා අත් හැර දමන්න සිදු වුණා. නමුත් රජයේ සේවකයින්ට එක සත පහක ප්‍රයෝජනයක් වන යෝජනාවක් ක්‍රියාත්මක කරන්න ඒ ආණ්ඩුව කාලයේ කටයුතු කළේ නැහැ.

එදා විශ්‍රාම වැටුප නැති කළා පමණක් නොවෙයි. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් මේ රටේ වැඩ කරන ජනතාවට විශේෂයෙන්ම රජයේ සේවකයින්ට විශ්‍රාම වැටුප් ලබා ගැනීමේ අයිතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කළා. එදා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් වුණු ප්‍රතිපාදනයක් තමයි මේ රටේ රජයේ සේවය කරන සියලු දෙනාටම විශ්‍රාම වැටුපක් ලබා ගැනීමේ මූලික අයිතිය. මේක නැති කළා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්. එදා නීතිගත වෙලා තිබුණු, එදා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් වෙලා තිබුණු -මේක තමුන්නාන්සේත් පිළිගත්තා. මා සන්තෝෂ වනවා පක්ෂ භේදයෙන් තොරව තමුන්නාන්සේත් ඒක ඇත්ත කිව්වා.- ඒ විධිවිධානය 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඉවත් කළා. ඉවත් කරලා නීතිමය වැදගත්කමක් තිබුණු ඒ රජයේ සේවක අයිතිය -නීතිමය වශයෙන් විශ්‍රාම වැටුප් ලබා ගැනීමට තිබුණු අයිතිය- එදා අහිමි කළා.

මා මෙතැනදී තවත් කාරණයක් මතක් කරන්න ඕනෑ. මා හිතන්නේ මේක මමත් කියවන්න ඕනෑ, එතුමාත් මේක කියෙව්වා, මහින්ද චින්තනයේ රජයේ සේවකයින්ට විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධව ඒ වාගේම රජයේ සේවකයින් සම්බන්ධව සඳහන් වෙලා තිබුණු ප්‍රකාශය. එහි "ජ්‍යෙෂ්ඨ පුරවැසි බුහුමන්" වැඩසටහන යටතේ මෙහෙම සඳහන් වනවා:

> "තම ජීවිතය දරුවන් වෙනුවෙන්, රට දැය වෙනුවෙන් කැප කළ ජ්‍යෙෂ්ඨ පුරවැසියනට තනි වෙන්නට මම ඉඩ නොතබමි.
>
> රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි කිරීම්වලට සාපේක්ෂව විශ්‍රාම වැටුප් ද වැඩි කිරීමට පියවර ගන්නෙමි.
>
> දැනට විශ්‍රාම වැටුප් ලබන සියලු සේවා කාණ්ඩයන් හි පවතින විෂමතා ඉවත් කොට විශ්‍රාමිකයන්ගේ ආත්ම ගෞරවය ආරක්ෂා වන අන්දමට විශ්‍රාම වැටුප් ක්‍රමය සංශෝධනය කරමි."

මේ විධියට එදා මහින්ද චින්තනයෙන් -ඒ ප්‍රකාශනයෙන්- එදා රටට ප්‍රකාශ කරපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා 2005 නොවැම්බර් මාසයේ මේ රටේ ජනාධිපති වෙලා එතුමා මොකක්ද කළේ? 2006 අය වැය වාර්තාව ඉදිරිපත් කරලා මේ රටේ ආණ්ඩු කිහිපයකට ක්‍රියාත්මක කරන්න බැරි වූ වැටුප් විෂමතාවන් එහෙම නැත්නම් විශ්‍රාම වැටුප් විෂමතාවන් නැති කරන්න පියවර ගත්තා. ඒ පිළිබඳව මුළු රටේම ගෞරවය එතුමාට හිමි වන්න ඕනෑ. එතුමා

[ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා]

2006 අය වැය වාර්තාව ඉදිරිපත් කරලා 1997 ජනවාරි 01 වන දා වන තෙක් තිබුණු විෂමතාවන් නැති කළා. එහෙම නැති කිරීම සඳහා එතුමා ක්‍රියා මාර්ගයක් අනුගමනය කළා. ඊට ඉස්සෙල්ලා විශ්‍රාම ගිය සියලු දෙනාම 1997 ජනවාරි 01 වන දා සේවයේ යෙදී සිටියාය කියන උපකල්පනය මත කටයුතු කරලා විශ්‍රාම වැටුප් විෂමතාව නැති කරලා ඒ සියලු දෙනාටම එදා සේවයේ හිටපු ආකාරයට විශ්‍රාම වැටුප් ගෙව්වා. මේක ඒ වෙලාවේ හැටියට විශාල මුදලක්. ඒ විෂමතාව අනුව ඒ සඳහා රුපියල් මිලියන 3750ක් විතර වැය කරන්න සිද්ධ වුණාය කියා මා හිතනවා.

පසු ගිය මැතිවරණයේදී එතුමා ඉදිරිපත් කළා මහින්ද චින්තන ඉදිරි දැක්ම. මහින්ද චින්තන ඉදිරි දැක්ම තුළිනුත් එතුමා ප්‍රකාශ කළා දැනට තිබෙන විශ්‍රාම වැටුප් විෂමතාවන් නැති කරනවාය කියා. දැන් ඒ සම්බන්ධව කටයුතු කර ගෙන යනවා. මම පැහැදිලි වග කීමක් ඇතිව කියන්නට ඕනෑ දැන් මේ සම්බන්ධව සාකච්ඡා වට ගණනාවක් පැවැත් වුව බව. මමත් සහභාගි වුණා මීට සති දෙකකට පෙරාතුව සියලු වෘත්තීය සමිති කැඳවා කරපු සාකච්ඡාවකට. මම හිතනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේත් එදා ඒ සාකච්ඡාවට හිටියාය කියලා. එහිදී ඉදිරියේදී බලාපොරොත්තු වන පඩි වැඩි වීම් ගැන, ඒ වාගේම විශ්‍රාම වැටුප්වල තිබෙන විෂමතාවන් නැති කිරීම ගැන දීර්ඝ වශයෙන් සාකච්ඡා කළා. කරුණාකරලා හිතන්න එපා, "ඉදිරි දැක්ම" වැඩ පිළිවෙළට මැතිවරණ පොරොන්දු හැටියට මේවා ඇතුළත් කරලා මිනිසුන්ගේ ඡන්ද අරගෙන ඒවා අමතක කළාය කියලා. එදා සමහර විට අපේ ආණ්ඩුවලට, ඒ වාගේම 2004 සිට 2005 වන තෙක් තිබුණු ජනතා විමුක්ති පෙරමුණත් සහභාගි වෙච්ච අපේ ආණ්ඩුවට, ඒ වාගේම 2001 සිට 2004 වන තෙක් තිබුණ එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවට අමතක වෙලා කිසිම ක්‍රියා මාර්ගයක් නොගත්ත විශ්‍රාම වැටුප් විෂමතාව, 1997 ජනවාරි පළමුවන දින වන සිට නැති කරන්න, එදා 2006 ජනාධිපති ධුරයට පත් වෙච්ච වහාම කටයුතු කළේත් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමායි කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනෑ.

මේ අවස්ථාවේ මම විශේෂයෙන් මතක් කරනවා, අද එතුමා පැහැදිලිව ප්‍රකාශ කරලා තිබෙන ප්‍රතිපත්තියක්. ඒ තමයි, 1997 ජනවාරි පළමුවන දා පදනම් කර ගෙන විශ්‍රාම වැටුප් විෂමතාවන් නැති කළා වාගේ 2006 ජනවාරි පළමුවන දා වැටුප පදනම් කර ගෙන ඊට පෙර ඇති වෙලා තිබෙන විෂමතාවන් සියල්ලම නැති කරන්නත් දැන් කටයුතු කර ගෙන යන එක. ඒක නිසා මම හිතන හැටියට මේ රටේ විශ්‍රාමිකයන්ට පසු ගිය අවුරුදු පහ තුළ මේ රජය යටතේ දෙන ලද සහනයන්, මේ රජය යටතේ දෙන ලද විශ්‍රාම වැටුප් වැඩි වීම් කිසිම රජයකින් කවදාකවත් දීලා නැහැ.

මම මෙතැනදී මතක් කරන්නට ඕනෑ, පසු ගිය රජය අහිමි කළ රාජ්‍ය සේවකයින්ගේ විශ්‍රාම වැටුප් හිමිකම් යළි ලබා දීම මේ ජනාධිපතිතුමා බලයට පත් වුණු වහාම කළ බව.

ඒ වාගේම රජයේ සේවකයන්ට ගෙවනු ලබන ජීවන වියදම් දීමනාව පදනම් කර ගෙන ඉන් හරි අඩක් ජීවන වියදම් දීමනාවක් ලෙස විශ්‍රාමිකයන්ට ගෙවීමට කටයුතු කළා. මෙම දීමනාව 2009 නොවැම්බර් සිට මාසිකව රුපියල් 2,375 දක්වා ඉහළ නැංවීමට කටයුතු කළා. දැන් මාසයකට රුපියල් 2,375ක් ගෙවනවා. මම පිළිගන්නවා, මේක රජයේ සේවකයන්ට දැනට ගෙවන ජීවන වියදමෙන් සියයට 50ක මුදලක් බව. නමුත් මෙයත් ඉතා විශාල මුදලක් කියන එක මතක් කරන්නට ඕනෑ.

2008 සිට සෑම වසරකම ඔක්තෝබර් මාසයේ 08 වන දා, "ජාතික විශ්‍රාමික දිනය" වශයෙන් නම් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබා දී තිබෙනවා. කෙනෙක් විශ්‍රාම ගියාම ඔහු කිසිම වැඩක් නොකරන පින් පඩියක් ගන්න මනුස්සයෙක් වශයෙන් සැලකූ යුගයක් තිබුණා. එදා ඒ අය ගැන කිසිම තැකීමක් කළේ නැහැ. ඒ අයට ගෞරවයක්, නම්බුවක් දුන්නේ නැහැ. ඒ අයට මාසය අවසානයේදී යම් කිසි මුදලක් විශ්‍රාම වැටුප වශයෙන් තිබුණා. එහි තිබුණ යම් යම් ඌනතාවන් නැති කරන්න, ඒවා ගැන කථා කරන්න කවුරුත් පෙලඹුණේ නැහැ. නමුත් ඒවා ගැන පළමුවෙන්ම කථා කළේ මේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා එතුමාගේ මැතිවරණ ප්‍රකාශන තුළින්ය කියන එක මේ අවස්ථාවේදී මතක් කරන අතර, ඒ කරපු කථා සියල්ලම ක්‍රියාවට නංවන්නත් එතුමා කටයුතු කරලා තිබෙනවාය කියන එකත් මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනෑ.

ජ්‍යෝෂ්ඨ විශ්‍රාමික පුරවැසියාට "දේශමාන්‍ය ජ්‍යෝෂ්ඨ පුරවැසි ජනාධිපති සම්මානය" පිරිනැමීමත් එතුමා ආරම්භ කළා. ඒ වාගේම සේවයේ යෙදී සිටියදී සිදු වන හදිසි අනතුරුවලින් ආබාධිත වන හෝ මිය යන රාජ්‍ය නිලධාරින් සඳහා වසර 10ක මූලික වැටුප විශේෂ වන්දි මුදලක් වශයෙන් ගෙවන්නත් තීන්දු කරලා දැන් එය ක්‍රියාත්මක වනවා. යම් කිසි සේවකයකු සේවය කරන අතරතුර ඔහු යම් කිසි ආපදාවකට ලක් වෙලා, ඔහුගේ ජීවිතය විනාශ වුණොත් ඔහුට ලැබෙන විශ්‍රාම වැටුප්වලට අමතරව අවුරුදු දහයක මූලික වැටුප එකවර වන්දි මුදලක් වශයෙන් ගෙවන්නටත් තීන්දු කරලා දැනට ඒක ක්‍රියාත්මක කර ගෙන යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි ඔබතුමාට කියන්නට ඕනෑ උපසේවා පොලිස් නිලධාරින් ගැන. එතෙක් උපසේවා පොලිස් නිලධාරින් ගැන කථා කළා පමණයි. "මේ අය ස්ථිර සේවයට ඈඳා ගන්නට ඕනෑ, ඒ වාගේම මේ අයට ස්ථිර සේවයේ ඉන්න අනෙකුත් පොලිස් නිලධාරින්ගේ අයිතිවාසිකම් දෙන්නට ඕනෑ" කියමින් අපි දශක ගණනාවක් කථා කළා. නමුත් කිසිම කෙනෙක් පියවරක් ගත්තේ නැහැ. නමුත් පසු ගිය කාලයේ අපට පුළුවන්කම ලැබුණා, උපසේවා පොලිස් සේවය සම්පූර්ණයෙන්ම ස්ථිර පොලිස් සේවයට සම්බන්ධ කරලා ඒ අයට ස්ථිර සේවකයන්ට ලැබෙන විශ්‍රාම වැටුප ලබලා දෙන්න. පොලිස් සහායක සේවාවේ සියලු නිලධාරින් ස්ථිර විශ්‍රාම වැටුප් ලබන තත්ත්වයට පත් කරන්නත් පුළුවන්කම ලැබුණා.

වෛද්‍ය සහතික රහිතව පොලිස් කාන්තාවන්ට වසර 20ක සේවා කාලයකින් විශ්‍රාම යන්නට අවස්ථාව හිමි කර දීමට කටයුතු කළා. වෛද්‍ය හේතූන් මත තමයි කෙටි කාලයකින් විශ්‍රාම යන්නට වෙනත් අයට පුළුවන්කම ලැබෙන්නේ.

නමුත් කාන්තාවන් පොලීසියට බැඳුනාම, අවුරුදු 20ක සේවා කාලය පෙන්වීමෙන් පසුව වෛද්‍ය හේතූන් නොපෙන්වා ඇයට විශ්‍රාම යන්න අවකාශ ලැබෙන ප්‍රතිපත්තියක් දැන් අප අනුගමනය කරනවා. ඒ වාගේම පූර්ණ වශයෙන් ආබාධිත වූ පොලිස් නිලධාරින්ට වයස අවුරුදු පණස් පහ දක්වා ගෙවන වැටුපට හා එම සේවා කාලයට අදාළව විශ්‍රාම වැටුප් සංශෝධනය කරනවා. මේ රජය මේ ආකාරයට සහනයන් රාශියක් ලබා දුන්නා.

කැබිනට් තීන්දුවක් මඟින් 2010 ජනවාරි 1 වන දා සිට මේ රටේ සියලුම සන්නද්ධ හමුදාවල සේවකයින්ගේ විශ්‍රාම වැටුප ඒ අය ලබන වැටුපෙන් සියයට අසූපහ දක්වා වැඩි කළාය කියන එක මා මතක් කරන්නට ඕනෑ. මෙතෙක් ඒක සිද්ධ වෙලා තිබුණේ නැහැ. මේ විධියට ලෝකයේ කිසිම තැනක දෙනවාය කියලා මා හිතන්නේ නැහැ. ඉන්දියාව සියයට සියයක් ජීවන වියදම් දීමනාව දෙනවා කියලා ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා කිව්වා. නැහැ. සෑම රටකම, විශේෂයෙන් ආසියාතික රටවල ගෙවන්නේ විශ්‍රාම යන විට ලබමින් සිටි මූලික වැටුපෙන් සියයට පණස් පහටත් හැට පහටත් අතර මුදලක්. දැනටමත් අපි සමහර ශ්‍රේණිවල විශ්‍රාම වැටුප සියයට අසූපහ දක්වා වැඩි කරලා තිබෙනවා. සියයට අසූපහක් කියන්නේ, විශ්‍රාම යන විට ලබමින් සිටි මූලික වැටුපෙන් සියයට අසූපහක්. හැම ක්ෂේත්‍රයකම සේවය කරන විශ්‍රාම වැටුප් හිමි සේවකයින් දැනටමත් සියයට 70 ඉක්මවා යන විශ්‍රාම වැටුපක් ලබනවා.

ඒ වාගේම මැතදී මේ පාර්ලිමේන්තුවට වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප සංශෝධනය කරන්න පනතක් ගෙනාවා. එයට තමුන්නාන්සේලා සියලු දෙනාම සහයෝගය දුන්නා. අදත් අපි ඒ ගැන ස්තුතිවන්ත වනවා. මොකද, ඒක මේ රටේ විශ්‍රාම හිමි සේවකයන්ට විශාල සහනයක් ලබා දෙන කටයුත්තක් නිසා. ඒ වාගේම ඒක අද අපේ රටේ පවතින සමාජ තත්ත්වය අනුව වැන්දඹුවන්ට විශාලම සහනයක් ලබා දෙන කටයුත්තක්. අද වැන්දඹුවන් විශාල වශයෙන් ඉන්නවා. ඒ අයට විශ්‍රාම වැටුපක් ලබා ගන්නට පුළුවන්කමක් තිබුණේ නැහැ. ඒ අයට ලබා ගන්නට පුළුවන්කම ලැබුණේ මිය ගිය පුද්ගලයා අවුරුදු පණස් පහ වනතුරු ලබන පඩිය පමණයි. නමුත් අපි ඒක වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුපක් බවට පරිවර්තනය කරන්න කටයුතු කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, තරුණ භාර්යාවන්ට තමන්ගේ පුරුෂයා නැති වුණාම කනවැන්දුම්කමේ ඉන්න වුවමනා නැහැ. ඒ අයට නැවත විවාහ වන්නට පුළුවන්. ඉස්සෙල්ලා තිබුණු විධියට ඒ අය විවාහ වුණොත් අර ස්වාමිපුරුෂයා නිසා ලැබුණු වේතනය නැති වුණා. නමුත් අපි ගෙනා සංශෝධනය නිසා, තමුන්නාන්සේලා සහයෝගය දීපු සංශෝධනය නිසා අද ඒ අයට නැවත විවාහ වන්නට පුළුවන්කම ලැබෙනවා. ඒ අනුව කලින් මිය ගිය ස්වාමියාට ලැබෙන විශ්‍රාම වැටුපෙන් සියයට පණහක් ඒ අයට ලැබෙනවා. සියයට පණහක් මිය ගිය ස්වාමිපුරුෂයාගේ දරුවන් සිටිනවා නම් ඒ දරුවන්ට ලැබෙනවා. ඒ වාගේ විශාල වෙනසක් අද මේ ක්ෂේත්‍රය තුළ ඇති කරලා තිබෙනවා.

ජනතා විමුක්ති පෙරමුණේ මා මිත්‍ර මන්ත්‍රීතුමනි, මා කනගාටු වනවා. ඇත්ත වශයෙන්ම එදා බස් ගිනි තියලා කඩ සාප්පු ගිනි තියලා ඒවායේ වැඩ කළ සේවකයන්ට ජීවත් වීමේ මාර්ග නැති කරපු ජනතා විමුක්ති පෙරමුණ අද විශ්‍රාම වැටුප් ගැන කථා කරනවා. එදා ජනතාවගේ ජීවත්වීමේ මාර්ග නැති කළා. එදා කෙනකුට පාරේ යන්න බැහැ. එදා බස් රථයක්, පෞද්ගලික වාහනයක් ගෙන යන්න බැහැ. ඒ අය තහනම් කළ දවසක පෞද්ගලික බස් එකක් මගීන් අරගෙන යනකොට මගේ නිවස ඉස්සරහපිටදී ඒ බස් එක නවත්වලා ගල්කටස් එකකින් වෙඩි තියලා මහ දවාලේ ඒ රියැදුරාව මරලා දැම්මා. අද විශ්‍රාම වැටුප් ගැන කථා කරනවා.

මේවා ගැන වැඩිය කථා කළ යුතුය කියා මා හිතන්නේ නැහැ. නමුත් මා මේ අවස්ථාවේදී මේ කාරණය මතක් කරන්න ඕනෑ. පසු ගිය කාලයේ විශ්‍රාම වැටුප් ක්ෂේත්‍රය තුළ මෙම රජය කළ සේවාව අපේ රටේ ඉතිහාසයේ කිසිම රජයක් විසින් කරලා නැහැ. ඒ වාගේම අතිගරු ජනාධිපතිතුමා මේ රටේ විශ්‍රාමික ජනතාව වෙනුවෙන් කිරීමට පොරොන්දු වුණු සේවාවන් බොහෝ දුරට කරලා අවසානයි. එතුමා ප්‍රකාශ කර තිබෙන පරිදි 2006 ජනවාරි 1 වන දා ගත් වේතනය පදනම් කර ගෙන විශ්‍රාම වැටුප්වල තිබෙන ඌනතාවයන් නැති කරන්නත් ඉදිරියේදී කටයුතු කරනවාය කියන කාරණය මේ අවස්ථාවේදී ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 7.10 ට, 2010 අගෝස්තු 05 වන බ්‍රහස්පතින්දා අ. භා.1.00 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி. ப. 7.10 மணிக்கு பாராளுமன்றம், 2010 ஓகஸ்ட் 05, வியாழக்கிழமை பி.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Adjourned accordingly at 7.10 p.m. until 1.00 p.m. on Thursday, 05th August, 2010.*

# ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
## வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
## WRITTEN ANSWERS TO QUESTIONS

1 වන ප්‍රශ්නය - 0183/'10

2 වන ප්‍රශ්නය - 0184/'10

3 වන ප්‍රශ්නය - 0185/'10

4 වන ප්‍රශ්නය - 0186/'10

ලිඛිත පිළිතුරු අපේක්ෂාවෙන්ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා විසින් අසා ඇති අද දින න්‍යාය පත්‍රයේ සඳහන් ඉහත අංක දරන ප්‍රශ්නවලට පිළිතුරු දීමට අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු දි. මු. ජයරත්න මහතා මාස නවයක් කල් ඉල්ලා ඇත.

## ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය: ගම නැගුම ජාතික සවිය
### லுனுகம்வெஹெர பிரதேச செயலாளர் பிரிவு : கமநெகும ஜாதிக சவிய
### LUNUGAMWEHERA DIVISIONAL SECRETARY'S DIVISION : GAMA NEGUMA JATHIKA SAVIYA

0187/'10

5. **ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගම නැගුම ජාතික සවිය සඳහා 2006, 2007, 2008 සහ 2009 වර්ෂවල වෙන් කරන ලද මුදල වාර්ෂිකව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අදාළ වර්ෂවල යටිතල පහසුකම්, ජීවනෝපාය හා අධ්‍යාත්මික සංවර්ධනය සඳහා සකස් කරන ලද ව්‍යාපෘති;

(ii) එම ව්‍යාපෘතිවල නම්;

(iii) ක්‍රියාත්මක කරනු ලබන ග්‍රාම නිලධාරි කොට්ඨාස;

(iv) ව්‍යාපෘති සඳහා වෙන් කරනලද මුදල සහ වියදම් කළ මුදල;

(v) ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව;

(vi) ප්‍රජා දායකත්වය;

(vii) ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලැබූ ලියාපදිංචි සමිති;

කවරේද යන්න වාර්ෂිකව, එක් එක් ව්‍යාපෘතියට අදාළව, වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ව්‍යාපෘති අවසන් කිරීමෙන් පසු ඒ සඳහා වග කියන කාල සීමාවක් තිබේද;

(ii) එසේ නම්, එම කාල සීමාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) லுனுகம்வெஹெர பிரதேச செயலாளர் பிரிவில் 'கமநெகும ஜாதிக சவிய' திட்டத்துக்கென 2006, 2007, 2008 மற்றும் 2009 ஆம் ஆண்டுகளில் வருடாந்தம் ஒதுக்கப்பட்ட தொகை யாதென்பதை அவர் இச்சபைக்குச் சமர்ப்பிப்பாரா?

(ஆ) (i) குறிப்பிட்ட வருடங்களில் உட்கட்டமைப்பு வசதிகள், ஜீவனோபாயம், ஆத்மீக அபிவிருத்தி ஆகியவற்றுக்கான கருத்திட்டங்கள்,

(ii) அக்கருத்திட்டங்களின் பெயர்,

(iii) செயற்படுத்தப்படுகின்ற கிராம அலுவலர் பிரிவு,

(iv) கருத்திட்டத்துக்கென ஒதுக்கப்பட்ட தொகை / செலவிடப்பட்ட தொகை,

(v) தொகை, நலன் பெறும் குடும்பங்களின் எண்ணிக்கை,

(vi) சமூகப் பங்களிப்பு,

(vii) கருத்திட்டங்களைச் செயற்படுத்திய பதிவு செய்யப்பட்ட சங்கம்

ஆகியவை யாவையென்பதை ஒவ்வொரு கருத்திட்டம் தொடர்பிலும் வருடாந்த அடிப்படையில் வெவ்வேறாக அவர் இச்சபைக்கு சமர்ப்பிப்பாரா?

(இ) (i) கருத்திட்டத்தின் நிர்மாண வேலைகள் முடிவுற்ற பின்பு இது தொடர்பாக உத்தரவாதமளிக்கப்படும் ஒரு காலப்பகுதி உள்ளதா என்பதையும்,

(ii) அவ்வாறாயின், அக்காலப் பகுதி யாது என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Economic Development:

(a) Will he inform this House separately of the annual allocations made for Gama Neguma Jathika Saviya in Lunugamwehera Divisional Secretary's Division in the years 2006, 2007, 2008 and 2009 ?

(b) Will he submit to this House, on annual basis, with relevance to each Project, separately-

(i) the projects designed for infrastructure, livelihood and spiritual development in the relevant years;

(ii) the name of the project ;

(iii) Grama Niladhari Division where it is implemented;

(iv) the amount allocated for the Project/the amount spent;

(v) number of beneficiary families;

(vi) community contribution; and

(vii) the registered society by which the project was implemented ?

(C) Will he state -

(i) whether there is a guarantee period, once construction work of the project is completed; and

(ii) if so, the length of that period ?

(d) If not, why ?

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා (ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා)**

(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ - பொருளாதார அபிவிருத்தி அமைச்சர்)

(The Hon. Basil Rohana Rajapaksa - Minister of Economic Development)

(අ) ඔව්.

1. අමාත්‍යාංශය මගින් සෘජුව වෙන් කරන ලද මුදල

| වර්ෂය | වෙන් කරන ලද මුදල රු. |
|---|---|
| 2006 | 3,950,000.00 |
| 2007 | 30,084,880.20 |
| 2008 | 9,300,000.00 |
| 2009 | 33,553,200.00 |

2. අමාත්‍යාංශය යටතේ පවතින දක්ෂිණ සංවර්ධන අධිකාරිය මගින් වෙන කරන ලද මුදල

| වර්ෂය | වෙන් කරන ලද මුදල රු. |
|---|---|
| 2006 | - |
| 2007 | 3,895,250.01 |
| 2008 | 2,880,000.00 |
| 2009 | 3,987,379.80 |

(ආ) ඇමුණුම් අංක 01 න් අමාත්‍යාංශ සෘජු මුදල් වෙන් කිරීම්වලට අදාළව ද, ඇමුණුම් අංක 02 න් ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය මගින් මුදල් වෙන් කරන ලද ව්‍යාපෘති ලේඛණය ද දැක්වේ.

(i) ඇමුණුම අංක 01 හා ඇමුණුම අංක 02 හි තීරු අංක 01 න් දැක්වේ.

(ii) ඇමුණුම අංක 01 හා ඇමුණුම අංක 02 හි තීරු අංක 02 න් දැක්වේ.

(iii) ඇමුණුම අංක 01 හා ඇමුණුම අංක 02 හි තීරු අංක 03 න් දැක්වේ.

(iv) ව්‍යාපෘති සඳහා වෙන් කරන ලද මුදල

ඇමුණුම අංක 01 හා ඇමුණුම අංක 02 හි තීරු අංක 04 න් දැක්වේ.

ඇමුණුම අංක 01 හා ඇමුණුම අංක 02 හි තීරු අංක 05 න් දැක්වේ.

(v) ඇමුණුම් අංක 01 හා ඇමුණුම් අංක 02 හි තීරු අංක 06න් දැක්වේ.

(vi) ඇමුණුම් අංක 01 හා ඇමුණුම් අංක 02 හි තීරු අංක 07න් දැක්වේ.

(vii) ඇමුණුම් අංක 01 හා ඇමුණුම් අංක 02 හි තීරු අංක 08 න් දැක්වේ. (ලියාපදිංචි සමිති මගින් ක්‍රියාත්මක කරනු නොලබන ව්‍යාපෘති ප්‍රාදේශීය ලේකම් හෝ දක්ෂිණ සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්ම කර ඇත.)

(ඇ) (i) වගකීමේ කාලසීමාවක් සහිත ව්‍යාපෘති මෙන්ම, වගකීමේ කාලසීමාවක් නොමැති ව්‍යාපෘති ද ක්‍රියාත්මක කර ඇත.

(ii) ඇමුණුම් අංක 01 හා ඇමුණුම් අංක 02 හි තීරු අංක 09 න් දැක්වේ. (වගකීමේ කාල සීමාවක් නොමැති ව්‍යාපෘති සඳහා ඇතුළත් කොටුව හිස්ව හෝ නැත ලෙසට සඳහන් කර ඇත.)

(ඈ) අදාළ නොවේ.

(அ) ஆம்

அமைச்சின் நேரடி ஒதுக்கீட்டிலிருந்து

| வருடம் | ஒதுக்கீடு—ரூபாவில் |
|---|---|
| 2006 | 3,950,000.00 |
| 2007 | 30,084,880.20 |
| 2008 | 9,300,000.00 |
| 2009 | 33,553,200.00 |

அமைச்சின்கீழ் உள்ள தென்பிராந்திய அபிவிருத்தி அதிகாரசபையினால் வழங்கப்பட்ட ஒதுக்கீடு

| வருடம் | ஒதுக்கீடு—ரூபாவில் |
|---|---|
| 2006 | - |
| 2007 | 3,895,250.01 |
| 2008 | 2,880,000.00 |
| 2009 | 3,987,379.80 |

(ஆ) இணைப்பு 01 இல் அமைச்சினால் நேரடியாக ஒதுக்கப்பட்ட ஒதுக்கீடுகளில் விபரங்கள் காட்டப்பட்டுள்ளன. இணைப்பு 02 தென்பிராந்திய அபிவிருத்தி அதிகார சபையினால் ஒதுக்கீடு செய்யப்பட்ட கருத்திட்டங்கள் நிரலிடப்பட்டுள்ளன.

(i) இணைப்பு 01 இணைப்பு 02 இல் இலக்கம் 01 இல் தரப்பட்டுள்ளது.

(ii) இணைப்பு 01 இணைப்பு 02 இல் இலக்கம் 02 இல் தரப்பட்டுள்ளது.

(iii) இணைப்பு 01 இணைப்பு 02 இல் இலக்கம் 03 இல் தரப்பட்டுள்ளது.

(iv) கருத்திட்டங்களிற்கான ஒதுக்கீடு தொடர் இலக்கம் 04 இணைப்பு 01 இணைப்பு 02 இலும் செலவு விபரம் இணைப்பு 01 இணைப்பு 02 இல் இலக்கம் 05 இலும்

(v) இணைப்பு 01 இணைப்பு 02 இல் இலக்கம் 06 இல் தரப்பட்டுள்ளது.

(vi) இணைப்பு 01 இணைப்பு 02 இல் இலக்கம் 07 இல் தரப்பட்டுள்ளது.

(vii) இணைப்பு 01 இணைப்பு 02 இல் இலக்கம் 08 இல் தரப்பட்டுள்ளது. (பதிவு செய்யப்பட்ட ஸ்தாபனங்கள் நடைமுறைப்படுத்தப்படாத கருத்திட்டங்கள் பிரதேச செயலாளரினாலும் தென்பிராந்திய அபிவிருத்தி அதிகாரசபையாலும் நடைமுறைப்படுத்தப் படுகின்றன.)

(இ) (i) கால அளவு உத்தரவாதம் அளிக்கப்பட்ட கருத்திட்டங்களுக்கும் கால அளவு உத்தரவாத அளிக்கப்படாத கருத்திட்டங்கள் நடைமுறைப் படுத்தப்பட்டன.

(ii) இணைப்பு 01 இணைப்பு 02 இல் இலக்கம் 09 இல் தரப்பட்டுள்ளது. (கால உத்தரவாதம் அளிக்கப்படாத கருத்திட்டங்களுக்கு அதற்கென ஒதுக்கப்பட்ட கூட்டில் இல்லை என அல்லது வெற்றிடமாக விடப்பட்டுள்ளது.)

(ஈ) பொருத்தமில்லை.

(a) Yes

(i) Direct allocation from the Ministry

| **Year** | **Allocation - Rs** |
|---|---|
| 2006 | 3,950,000.00 |
| 2007 | 30.084,880.20 |
| 2008 | 9,300,000.00 |
| 2009 | 33,553,200.00 |

(ii) Allocation by the Southern Development Authority under the Ministry

| **Year** | **Allocation - Rs** |
|---|---|
| 2006 | -- |
| 2007 | 3.895,250.01 |
| 2008 | 2,880,000.00 |
| 2009 | 3,987,379.80 |

(b) The Annex 01 shows the details pertaining to direct allocation made by the Ministry while Annex 02 gives the list of projects for which allocation were made by the Sri Lanka Southern Development Authority.

(i) Given in Folio 01 in Annex 01 and Annex 02.

(ii) Given in Folio 02 in Annex 01 and Annex 02.

(iii) Given in Folio 03 in Annex 01 and Annex 02.

(iv) Allocations for Projects - Folio 04 in Annex 01 and Annex 02.

Expenditure - in Folio 05 in Annex 01 and Annex 02.

(v) Given in Folio 06 in Annex 01 and Annex 02.

(vi) Given in Folio 07 in Annex 01 and Annex 02.

(vii) Given in Folio 08 in Annex 01 and Annex 02. (Projects which are not implemented by the registered societies are implemented by the Divisional Secretary or the Southern Development Authority)

(c) (i) Project with guarantee period as well project with no guarantee period have been implemented.

(ii) Given in Folio 09 in Annex 01 and Annex 02. In case of projects with no guarantee period, the relevant cage is marked No or left blank..

(d) Does not arise.

ජාතික සවිය ගම නැගුම වැඩසටහන - 2006

හම්බන්තොට දිස්ත්‍රික්කය

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :- ලුනුගම්වෙහෙර

වෙන් කළ මුදල රු :- 3,950,000.00

ඇමුණුම අංක 01

| | 1 | 2 | 3 | | 4 | 5 | 6 | 7 | 8 | 9 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| අ.අ. | වැඩසටහන | ව්‍යාපෘතියේ නම | ග්‍රාම නිළධාරී කොට්ඨාශය | ඇස්තමේන්තු ගත මුදල රු. | වෙන් කරන ලද මුදල රු. | වියදම් කළ මුදල රු. | ප්‍රතිලාභී පවුල් ගණන | ප්‍රජා දායකත්වය රු. | ක්‍රියාත්මක කළ ලියාපදිංචි සමිතිය | නිමවීමෙන් පසු වගකියන කාල සීමාව |
| 1 | යටිතල | ජනසභා ලේකම් කාර්යාලය | මිහිඳුපුර | 1,500,000.00 | 1,500,000.00 | 239,485.80 | 350 | - | ග්‍රා:සං: අභයපුර | මාස 03 |
| 2 | යටිතල | නැණසල මධ්‍යස්ථානය | මිහිඳුපුර | 450,000.00 | 450,000.00 | 63,020.25 | 350 | - | ග්‍රා:සං: මිහිඳුපුර | මාස 03 |
| 3 | යටිතල | මිහිඳුපුර මැද පාර බෝක්කු සහිතව කොන්ක්‍රීට් කිරීම | මිහිඳුපුර | 2,000,000.00 | 2,000,000.00 | 225,993.86 | 3,590 | - | DC3$4$5 බෙදුම් ඇල ගොසං | මාස 03 |
| 4 | යටිතල | මිහිඳුපුර මැද පාර පැති බැම්ම ඉදි කිරීම | මිහිඳුපුර | | | 134,880.20 | 350 | - | DC3$4$5 බෙදුම් ඇල ගොසං | මාස 03 |
| | | | | 3,950,000.00 | 3,950,000.00 | 663,380.11 | 4,640 | - | | |

ජාතික සවිය ගම නැගුම වැඩසටහන - 2007

හම්බන්තොට දිස්ත්‍රික්කය

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ලුණුගම්වෙහෙර

වෙන් කළ මුදල රු 30,084,880.20

ඇමිණුම අංක 01

| 1 | | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |
|---|---|---|---|---|---|---|---|---|---|
| | වැඩසටහන | ව්‍යාපෘතියේ නම | ග්‍රාම නිලධාරී කොට්ඨාශය | වෙන් කරන ලද මුදල රු: | වියදම් කළ මුදල | ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව | ප්‍රජා දායකත්වය රු: | ක්‍රියාත්මක ලියාපදිංචි කළ සමිතිය | නිමවීමෙන් පසු වග කියන කාල සීමාව |
| 1 | යටිතලපහසුකම් | මිහිඳුපුර නැණසල මධ්‍යස්ථානය ඉදි කිරීම | මිහිඳුපුර | 450,000.00 | 63,023.25 | 1863 | | ග්‍රා:සං: අභයපුර | මාස 03 |
| 2 | එම | මිහිඳුපුර ග්‍රාම ලේකම් කාර්යාලය ඉදි කිරීම | මිහිඳුපුර | 1,500,000.00 | 239,458.79 | 1863 | | ග්‍රා:සං: මිහිඳුපුර | මාස 04 |
| 3 | එම | මිහිඳුපුර මැද පාර කොන්ක්‍රීට් කිරීම (පෙට්ටි බෝක්කුව සහිතව) | මිහිඳුපුර | 2,000,000.00 | 225,993.86 | 1863 | | DC3$4$5 බෙදුම් ඇල ගොසං | මාස 05 |
| 4 | එම | මිහිඳුපුර මැද පාර පැතිබැම්ම ඉදි කිරීම | මිහිඳුපුර | | 134,880.20 | 1863 | | DC3$4$5 බෙදුම් ඇල ගොසං | මාස 06 |
| 5 | එම | 1 අදියරට අදාල ව්‍යාපෘති | | 134,880.20 | 134,880.20 | | | | මාස 07 |
| 6 | එම | ඇලවේලි ප්‍රතිසංස්කරණය කු.ග.03 ගෙග 5 යාය කොටස පගෙ 52 ඇල ප්‍රතිසංස්කරණය කිරීම | | 2,000,000.00 | 134,880.20 | 90 | | කුග3 DC5 බෙදුම් ඇල ගොසං | මාස 08 |
| 7 | එම | F.C.44 , F.C.45,F.C.46 ඇල ප්‍රතිසංස්කරණය කිරීම | මහානාගපුර | | 566,706.97 | | | කුග3 DC5 බෙදුම් ඇල ගොසං | මාස 09 |
| 8 | එම | F.C.47 ල පගෙග48ලපගෙග49 ඇල ප්‍රතිසංස්කරණය කිරීම | | | 577,367.52 | | | කුග3 DC5 බෙදුම් ඇල ගොසං | මාස 10 |
| 9 | එම | කරඹවැව ඉ.අංක 170 සිට බෙබි මහතාගේ කඩේ ළඟ ඇති පාර කි.මී.1.5 කොන්ක්‍රීට් කිරීම | කරඹවැව | 2,000,000.00 | 1,419,305.01 | 100 | | සමෘද්ධි සමිතිය කරඹවැව | මාස 11 |
| 10 | එම | සුසානභූමිය නිර්මාණ හන්දිය දක්වා හරස්පාර කොන්ක්‍රීට් කිරීම මීටර් 400 | සද්ධාතිස්සපුර | 2,000,000.00 | 1,380,108.17 | 40 | | සමෘද්ධි සමිතිය සිනිමුන්න | මාස 12 |
| 11 | එම | අංක 555 / 639 හා අභ්‍යන්තර මාර්ග සංවර්ධනය | සාලියපුර | 2,000,000.00 | 576,422.92 | 80 | | සමෘද්ධි සමිතිය සිනිමුන්න | මාස 13 |
| 12 | එම | වැලිගත්ත හන්දියෙන් ගම තුළට ඇති මාර්ගය කොන්ක්‍රීට් කිරීම | වැලිගත්ත | 2,000,000.00 | 697,606.85 | 150 | | සමෘද්ධි සමිතිය වැලිගත්ත | මාස 14 |
| 13 | එම | වැලගත්ත වැවේ වැව්බැම්ම ප්‍රතිසංස්කරණය හා රොන් මඩ ඉවත් කිරීම | රඹුක්වැව | 2,000,000.00 | 1,261,850.93 | 130 | | සමෘද්ධි සමිතිය වැලිගත්ත | මාස 15 |
| 14 | එම | යාය 05 කි.මී.0.5 කොන්ක්‍රීට් කිරීම 1අදියර 2 අදියර | රණසිරිපුර | 2,000,000.00 | 1,914,430.95 | 28 | | ග්‍රාසමෘ සමිතිය රණසිරිපුර | මාස 16 |
| 15 | එම | දෙගල්දෙහිර පෝෂිත ඇල ප්‍රතිසංස්කරණය | දේවීරම්වෙහෙර | 2,000,000.00 | 393,123.68 | 50 | | රණවර්ණාව ජදුර සමෘ සමිතිය | මාස 17 |
| 16 | එම | කැන්දගස්මංකඩ ප්‍රධාන මාර්ගය කි.මී.400 ක් කොන්ක්‍රීට් කිරීම | කැන්දගස්මංකඩ | 2,000,000.00 | 1,395,825.84 | 400 | | සමෘද්ධි සමිතිය කැන්දගස්මංකඩ | මාස 18 |
| 17 | එම | ප්‍රධාන බස්නා ඇල 04 හාරා සකස් කිරීම | සිනිමුන්න | 2,000,000.00 | 524,966.51 | 20 | | සමෘද්ධි සමිතිය පුංචිඅප්පුජදුර | මාස 19 |
| 18 | එම | ඉදිකොලේවැව ප්‍රතිසංස්කරණය කිරීම හා ගොවිපලක් ආරම්භ කිරීම | රණවර්ණාව | 2,000,000.00 | 416,060.42 | 150 | | ග්‍රා:සං:සමිතිය රණවර්ණාව | මාස 20 |
| 19 | එම | 2 අදියරට අදාල ව්‍යාපෘති | | | | | | | මාස 21 |
| 20 | එම | ඇලවේලි ප්‍රතිසංස්කරණය කු.ග.03 ගෙග 5 යාය කොටස පගෙ 50 ඇල ප්‍රතිසංස්කරණය කිරීම | | 2,000,000.00 | 424,013.33 | 90 | | කුග3 DC5 බෙදුම් ඇල ගොසං | මාස 22 |
| 21 | එම | F.C.53 F.C.54, F.C.55 ඇලවේලි ප්‍රතිසංස්කරණය කිරීම | මහානාගපුර | | 519,616.00 | 90 | | කුග3 DC5 බෙදුම් ඇල ගොසං | මාස 23 |
| 22 | එම | F.C.56,F.C.57,F.C.58 ඇලවේලි ප්‍රතිසංස්කරණය කිරීම | | | 561,803.00 | 90 | | කුග3 DC5 බෙදුම් ඇල ගොසං | මාස 24 |
| 23 | එම | වැලිගත්ත හන්දියේ මගී පාලම ඉදි කිරීම 1අදියර 2 අදියර | වැලිගත්ත | 2,000,000.00 | 1,512,527.89 | 150 | | සමෘද්ධි සමිතිය වැලිගත්ත | මාස 25 |
| | | | | 30,084,880.20 | 15,074,852.49 | | | | |

[illegible]

## හම්බන්තොට දිස්ත්‍රික්කය

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ලුණුගම්වෙහෙර
වෙන් කළ මුදල 30,900,000.00

ඇමුණුම අංක 01

| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |
|---|---|---|---|---|---|---|---|---|---|
| | වැඩසටහන | ව්‍යාපෘතියේ නම | ග්‍රාම නිලධාරී කොට්ඨාශය | වෙන් කරන ලද මුදල රු: | වියදම් කළ මුදල | ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව | ප්‍රජා දායකත්වය රු: | ක්‍රියාත්මක කිරීමට පියවර ගත් සමිතිය | නිමවීමෙන් පසු වග කියන කාල සීමාව |
| 1 | යටිතල පහසුකම් | ඉඩම් අංක 825-822 කෑෂි පාර කොන්ක්‍රීට් කිරීම | සමන්පුර | 1,000,000.00 | 612,259.11 | 150 | 94,662.54 | සමෘද්ධි සමිතිය - සමන්පුර | මාස 03- |
| 2 | යටිතල පහසුකම් | වැලිගත්ත තංගල්ල හාල් මෝල අසලින් පටන්ගන්නා පළමු හරස් පාර කොන්ක්‍රීට් කිරීම | රඹුක්වැව | 1,000,000.00 | 825,093.15 | 225 | 79,285.44 | සමෘද්ධි සමිතිය - සිරිබිපුර | මාස 03- |
| 3 | ජීවනෝපාය සං | උද්‍යාන වාරි ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම | අබයපුර | 1,000,000.00 | 749,757.31 | 25 | 199,858.45 | බෙදුම්ඇළ ගො : සං | මාස 03- |
| 4 | යටිතල පහසුකම් | ජනසවි ගම්මානයේ හා ග්‍රාම ලේකම් කාර්යාල භූමියේ මාර්ග ප්‍රතිසංස්කරණය හා ග්‍රාම ලේකම් කාර්යාල භූමියේ වැට ඉදිකිරීම | මිහිඳුපුර | 1,000,000.00 | 703,279.87 | 350 | 58,622.40 | සමෘද්ධි සමිතිය - මිහිඳුපුර | මාස 03- |
| 5 | යටිතල පහසුකම් | අතුරු මාර්ගවල නියුම් පයිප්ප බෝක්කු 15 ක් ඉදිකිරීම හා ප්‍රතිය කිරීම | අග්බෝපුර | 1,000,000.00 | 370,706.87 | 175 | 196,732.73 | සමෘද්ධි සමිතිය - අග්බෝපුර | මාස 03- |
| 6 | ජීවනෝපාය සං | කරඹවැව-ගඩොල් කැපීමේ ව්‍යාපෘතිය (චක්‍රීය ණය පදනම) | කරඹවැව | 1,000,000.00 | 1,000,000.00 | 30 | - | සමෘද්ධි බැංකුව - වීරවිල | මාස 03- |
| 7 | ජීවනෝපාය සං | ධීවර හා ගඩොල් කැපීමේ ව්‍යාපෘතිය (චක්‍රීය ණය පදනම) | පඬුවිගම. | 1,000,000.00 | 1,000,000.00 | 30 | - | සමෘද්ධි බැංකුව - දෙවිරම්වෙහෙර | මාස 03- |
| 8 | ජීවනෝපාය සං | කැඩුම්කඩ සකස් කිරීම සඳහා පැති බැම්මක් ඉදිකිරීම. | පුංචි අජ්පු ජඳුර. | 1,000,000.00 | 397,040.19 | 350 | 193,772.52 | සමෘද්ධි සමිතිය - පුංචිඅජ්පුජඳුර | මාස 03- |
| 9 | යටිතල පහසුකම් | පන්සල අසල කෑෂි පාර කොන්ක්‍රීට් කිරීම | පහළ මත්තල | 1,000,000.00 | 867,057.21 | 122 | 81,854.44 | සමෘද්ධි සමිතිය - පහළ මත්තල | මාස 03- |

| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |
|---|---|---|---|---|---|---|---|---|---|
| | වැඩසටහන | ව්‍යාපෘතියේ නම | ග්‍රාම නිලධාරී කොට්ඨාශය | වෙන් කරන ලද මුදල රු: | 2009.11.30 ට වියදම් කළ මුදල | ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව | ප්‍රජා දායකත්වය රු: | ක්‍රියාත්මක කිරීමට පියවර ගත් සමිතිය | නිමවීමෙන් පසු වග කියන කාල සීමාව |
| 10 | ආධ්‍යාත්මික සංවර්ධන | මහඅලුත්ගම්ආර සාරධර්ම වැඩිදියුණු කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම | මහඅලුත්ගම් ආර | 10,000.00 | 10,000.00 | 100 | 3,500.00 | ග්‍රාම නිලධාරී | මාස 03- |
| 11 | ආධ්‍යාත්මික සංවර්ධන | අඩු ආදායම් සහිත පවුල්වල දරුවන් හා දෙමාපියන් දැනුවත් කිරීම | ප්‍රාංලේ: කොට්ඨාශය | 20,000.00 | | 150 | | ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී | මාස 03- |
| 12 | ආධ්‍යාත්මික සංවර්ධන | කඩින්කඩ පාසල් යන දරුවන්ට පාසල් උපකරණ ලබාදීම | ප්‍රාංලේ: කොට්ඨාශය | 43,200.00 | 43,272.00 | 36 | | ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී | මාස 03- |
| 13 | යටිතල පහසුකම් සං: | පොදු සුසානභූමිය වටා වැට ගැසීම ගේට්ටුව හා සුසානාගාරය ඉදිකිරීම | ලුනුගම්වෙහෙර නව නගරය | 400,000.00 | 87,500.00 | 350 | 57,322.95 | ප්‍රාදේශීය සභාව - ලුනුගම්වෙහෙර | මාස 03- |
| 14 | යටිතල පහසුකම් සං: | සේනපුර මැද පාර ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම | සේනපුර | 400,000.00 | 387,199.18 | 150 | 37,985.27 | ප්‍රාදේශීය සභාව - ලුනුගම්වෙහෙර | මාස 03- |
| 15 | යටිතල පහසුකම් සං: | 70 වෙ පාර කොන්ක්‍රීට් කිරීම | දෙවිරම්වෙහෙර | 400,000.00 | 394,156.47 | 135 | 36,818.56 | ප්‍රාදේශීය සභාව - ලුනුගම්වෙහෙර | මාස 03- |
| 16 | යටිතල පහසුකම් සං: | සාලියපුර පන්සලේ සිට හන්දිය දක්වා දිවෙන මාර්ගය කොන්ක්‍රීට් කිරීම (අදියර වශයෙන්) | සාලියපුර | 400,000.00 | 411,298.54 | 40 | 40,285.05 | ප්‍රාදේශීය සභාව - ලුනුගම්වෙහෙර | මාස 03- |
| 17 | යටිතල පහසුකම් සං: | ගොවිජනසේවා මධ්‍යස්ථානයට යන පාර කොන්ක්‍රීට් කිරීම බර වාහන වලට ඔරොත්තු දෙන සේ | සද්ධාතිස්සපුර නව නගරය | 400,000.00 | 404,154.64 | 1500 | 39,057.00 | ප්‍රාදේශීය සභාව - ලුනුගම්වෙහෙර | මාස 03- |
| 18 | යටිතල පහසුකම් සං: | 2008 වසරේ ජාතික සවිය මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම | සිංහපුර | 400,000.00 | 374,815.23 | 60 | 39,283.28 | ප්‍රාදේශීය සභාව - ලුනුගම්වෙහෙර | මාස 03- |
| 19 | යටිතල පහසුකම් සං: | 2008 වසරේ ජාතික සවිය මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම | සමන්පුර | 400,000.00 | 392,587.57 | 120 | 38,543.69 | ප්‍රාදේශීය සභාව - ලුනුගම්වෙහෙර | මාස 03- |
| 20 | යටිතල පහසුකම් සං: | පැලැස්ස පාර කොන්ක්‍රීට් කිරීම | පුංචි අජ්පු ජඳුර | 400,000.00 | 399,431.71 | 300 | 41,534.55 | ප්‍රාදේශීය සභාව - ලුනුගම්වෙහෙර | මාස 03- |
| 21 | යටිතල පහසුකම් සං: | ග්‍රාම නිලධාරී කාර්යාලය ඇති ඉඩම් අංක 600 දක්වා වූ පාර කොන්ක්‍රීට් කිරීම | පරාක්‍රමපුර | 400,000.00 | 409,117.58 | 68 | 36,865.91 | ප්‍රාදේශීය සභාව - ලුනුගම්වෙහෙර | මාස 03- |

| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |
|---|---|---|---|---|---|---|---|---|---|
| | වැඩසටහන | ව්‍යාපෘතියේ නම | ග්‍රාම නිලධාරී කොට්ඨාශය | වෙන් කරන ලද මුදල රු: | වියදම් කළ මුදල | ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව | ප්‍රජා දායකත්වය රු: | ක්‍රියාත්මක ලියාපදිංචි කළ සමිතිය | නිමවීමෙන් පසු වග කියන කාල සීමාව |
| 20 | යටිතල පහසුකම් | අංක 555 - 639 අතුරු මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම - 1 හා 2 අදියර | කාලියපුර | 1,000,000.00 | 849,725.05 | 80 | 102,956.92 | සමෘද්ධි සමිතිය - කාලියපුර | මාස 03- |
| 21 | යටිතල පහසුකම් | අංක 496 - 496 අතර කෑම් පාර කොන්ක්‍රීට් කිරීම | සද්ධාතිස්සපුර නව නගරය | 1,000,000.00 | 922,167.84 | 70 | 86,326.69 | සමෘද්ධි සමිතිය - සද්ධාතිස්සපුර නව නගරය | මාස 03- |
| 22 | යටිතල පහසුකම් | 18 වංගුව(කණුව) ප්‍රධාන කෑම් පාර ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම | සැන්දගල්මංකඩ | 1,000,000.00 | 896,101.29 | 95 | 85,625.82 | සමෘද්ධි සමිතිය - සැන්දගල්මංකඩ | මාස 03- |
| 23 | යටිතල පහසුකම් | යෝජිත පඩික්කම්වල ගොවි ගම්මානයේ මාර්ග ඉදිකිරීම | මහාමායාපුර | 1,000,000.00 | 932,182.46 | 158 | 89,770.94 | ප්‍රාදේශීය සභාව ලු/වෙහෙර | මාස 03- |
| 24 | යටිතල පහසුකම් | දිවුල්ගස් හන්දිය පාර කොන්ක්‍රීට් කිරීම | විරවිල් ආර | 1,000,000.00 | 193,088.00 | 150 | 81,854.44 | සමෘද්ධි සමිතිය - විරවිල්ආර | මාස 03- |
| 25 | යටිතල පහසුකම් | උකාකුළුවැව උඩපාර කොන්ක්‍රීට් කිරීම | බෝගහවැව | 500,000.00 | 462,425.96 | 150 | 44,140.43 | සමෘද්ධි සමිතිය - බෝගහවැව | මාස 03- |
| 26 | යටිතල පහසුකම් | මහවැව කුඹුරුයායට යන පාර දෙපස පැතිබැම්ම ඉදිකර හියුම් පයිප්ප දැමීම | අගුණකොළවැව | 500,000.00 | 425,858.96 | 65 | 49,749.26 | සමෘද්ධි සමිතිය - අගුණකොළවැව | මාස 03- |
| 27 | යටිතල පහසුකම් | ඉණුවැරණිය වැවේ සොල් සහ පයිප්ප ඉදිකිරීම | උඩමත්තල | 500,000.00 | 264,047.38 | 70 | 58,250.30 | සමෘද්ධි සමිතිය - දෙවිරම්වෙහෙර | මාස 03- |
| 28 | යටිතල පහසුකම් | භූමි අංක 141 ඉදිරිපිට බැම්ම ඉදිකිරීම | ඉත්තන්වෑකඩ | 500,000.00 | 468,835.34 | 50 | 114,552.15 | සමෘද්ධි සමිතිය ඉත්තන්වෑකඩ | මාස 03- |
| 29 | ජීවනෝපාය සං: | මුවන්වැව අසල කෑම් ළිඳ හා උස්සාන ජල යෝජනා ක්‍රමය | මුවන්වැව | 500,000.00 | 43,444.75 | 35 | 95,881.40 | සමෘද්ධි සමිතිය - මුවන්වැව | මාස 03- |
| 30 | යටිතල පහසුකම් | නව නගරය ප්‍රවේශ මාර්ගය මීටර 60 කොන්ක්‍රීට් කිරීම | විරවිල | 500,000.00 | 452,004.33 | 50 | 42,343.56 | සමෘද්ධි සමිතිය විරවිල | මාස 03- |
| 31 | යටිතල පහසුකම් | අංක 661 සිට බෙරලිහෙල විහාරස්ථානය දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීම | බෙරලිහෙල | 500,000.00 | 459,654.18 | 250 | 42,967.09 | සමෘද්ධි සමිතිය බෙරලිහෙල | මාස 03- |

| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |
|---|---|---|---|---|---|---|---|---|---|
| | වැඩසටහන | ව්‍යාපෘතියේ නම | ග්‍රාම නිලධාරී කොට්ඨාශය | වෙන් කරන ලද මුදල රු: | වියදම් කළ මුදල | ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව | ප්‍රජා දායකත්වය රු: | ක්‍රියාත්මක ලියාපදිංචි කළ සමිතිය | නිමවීමෙන් පසු වග කියන කාල සීමාව |
| 32 | යටිතල පහසුකම් | ජනසවිගම ප්‍රජාශාලා මාර්ගය කොන්ක්‍රීට් කිරීම | දුටුගැමුණුපුර | 500,000.00 | 471,951.79 | 112 | 40,491.22 | සමෘද්ධි සමිතිය දුටුගැමුණුපුර | මාස 03- |
| 33 | යටිතල පහසුකම් | අංක 35 ඉඩමේ සිට මාර්ගය කොන්ක්‍රීට් කිරීම | ජයගම | 500,000.00 | 431,124.97 | 110 | 41,148.87 | සමෘද්ධි සමිතිය ජයගම | මාස 03- |
| 34 | ජීවනෝපාය සං: | ලුණුගම්වෙහෙර නව නගරයේ අත්‍යන්ත්‍ර පේෂ කර්ම මධ්‍යස්ථානය සඳහා විදුලිය හා පානීය ජලය ලබාදීම - විදුලිය පානීය ජලය ලබාදීම ගොඩනැගිල්ල වයරින් කිරීම හා ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම | ලුණුගම්වෙහෙර නව නගරය | 150,000.00 | 107,057.49 | - | - | සමෘද්ධි සමිතිය - පුංචිඅප්පුපුර | මාස 03- |
| 35 | ජීවනෝපාය සං: | පඩවිගම ධීවර සමිතිය සඳහා ඔරු සහ දැල් ලබාදීම. [චක්‍රීය ණය පදනම යටතේ] | පඩවිගම | 300,000.00 | 300,000.00 | - | - | සමෘද්ධි බැංකුව - දෙවිරම්වෙහෙර | මාස 03- |
| 36 | යටිතල පහසුකම් | ලුණුගම්වෙහෙර ජල ව්‍යාපෘතියේ අවශ්‍ය උපාංග ලබාදීම. (ජල මීටර ] | මහඅලුත්ගම් ආර | 400,000.00 | 399,510.00 | - | - | ජල සම්පාදන මණ්ඩලය | මාස 03- |
| 37 | යටිතල පහසුකම් | බෙරලිහෙල පැතුම් කාන්තා ගොඩගොවිතැන් සංවිධාන සඳහා රැස්වීම් ශාලාව ඉදිකිරීම. | බෙරලිහෙල | 400,000.00 | 353,444.43 | - | - | බෙරලිහෙල පැතුම් කාන්තා ගොඩගොවිතැන් සංවිධානය | මාස 03- |
| 38 | ජීවනෝපාය සං: | නිවාස ණය ව්‍යාපෘතිය (චක්‍රීය ණය පදනම යටතේ) | ලුණුගම්වෙහෙර | 1,150,000.00 | 1,150,000.00 | - | - | සමෘද්ධි බැංකු සංගමය බෙරලිහෙල/දෙවිරම් | මාස 03- |
| | | | | **30,900,000.00** | **22,316,593.78** | **3,578.00** | **2,734,212.26** | | |

ජාතික සවිය ගම නැගුම වැඩසටහන - 2009
හම්බන්තොට දිස්ත්‍රික්කය

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ලුණුගම්වෙහෙර

වෙන් කළ මුදල රු: **33,553,200.00**

ඇමුණුම අංක 01

| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |
|---|---|---|---|---|---|---|---|---|---|
| | වැඩසටහන | ව්‍යාපෘතියේ නම | ග්‍රාම නිලධාරී කොට්ඨාශය | වෙන් කරන ලද මුදල රු: | 2009.11.30 ට වියදම් කළ මුදල | ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව | ප්‍රජා දායකත්වය රු: | ක්‍රියාත්මක ලියාපදිංචි කළ සමිතිය | නිමවීමෙන් පසු වග කියන කාල සීමාව |
| 1 | ජීවනෝපාය සංවර්ධන | බුන්දල හන්දිය ඉඩම් සඳහා උස්සාන. ජල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම (අදියර 01) | වැලිගත්ත | 500,000.00 | 396,093.61 | 35 | 23,632.39 | සමෘද්ධි සමිතිය - වැලිගත්ත | මාස 03- |
| 2 | ජීවනෝපාය සංවර්ධන | ස්වයං රැකියා සඳහා චක්‍රීය ණය වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම | කරඹවැව | 450,000.00 | 450,000.00 | 20 | - | සමෘද්ධි බැංකු සංගමය- විරවිල | මාස 03- |
| 3 | ජීවනෝපාය සංවර්ධන | සිරිතිපුර හා රඹුක්වැව ඒකාබද්ධ උස්සාන ජල ව්‍යාපෘතියේ නල එලීම / මෝටරය හා උපාංග සවි කිරීම | සිරිතිපුර | 500,000.00 | 715,324.82 | 20 | 36,999.27 | ඇත්සරණියගම ග්‍රාසං සමිතිය | මාස 03- |
| 4 | ජීවනෝපාය සංවර්ධන | සිරිතිපුර හා රඹුක්වැව ඒකාබද්ධ උස්සාන ජල ව්‍යාපෘතියේ නල එලීම | රඹුක්වැව | 500,000.00 | | 20 | | | මාස 03- |
| 5 | ජීවනෝපාය සංවර්ධන | ස්වයං රැකියා සඳහා චක්‍රීය ණය වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම | විරවිල් ආර | 100,000.00 | | 15 | | සමෘද්ධි බැංකු සංගමය - දෙවිරම්වෙහෙර | මාස 03- |
| 6 | ජීවනෝපාය සංවර්ධන | වගා බිම් ආරක්ෂාව සඳහා ගොවීන්ට කටු කම්බි ලබා දීම (චක්‍රීය ණය ක්‍රමයක් ලෙස) | පඩවිගම | 100,000.00 | 440,000.00 | 30 | | සමෘද්ධි බැංකු සංගමය - දෙවිරම්වෙහෙර | මාස 03- |
| 7 | ආධ්‍යාත්මික සංවර්ධන | පාසල් හැරගිය දරුවන් සඳහා ධනාත්මක චින්තන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම | පඩවිගම | 10,000.00 | 9,955.00 | 75 | 3,500.00 | ග්‍රාම නිලධාරී | මාස 03- |
| 8 | ආධ්‍යාත්මික සංවර්ධන | මත්තල මහඅලුත්ගම්ආර වසම් සඳහා සාරධර්ම වැඩිදියුණු කිරීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම | පහල මත්තල | 10,000.00 | 10,000.00 | 75 | 3,500.00 | ග්‍රාම නිලධාරී | මාස 03- |
| 9 | ආධ්‍යාත්මික සංවර්ධන | ජාතික සමගිය ඇතිකිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම | රණසිරිපුර | 10,000.00 | 10,000.00 | 225 | 3,500.00 | ග්‍රාම නිලධාරී | මාස 03- |

| 1 | | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |
|---|---|---|---|---|---|---|---|---|---|
| | වැඩසටහන | ව්‍යාපෘතියේ නම | ග්‍රාම නිලධාරි කොට්ඨාශය | වෙන් කරන ලද මුදල රු: | 2009.11.30 ට වියදම් කළ මුදල | ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව | ප්‍රජා දායකත්වය රු: | ක්‍රියාත්මක ලියාපදිංචි කළ සමිතිය | නිමවීමෙන් පසු වග කියන කාල සීමාව |
| 10 | ආධ්‍යාත්මික සංවර්ධන | මහඅලුත්ගම්ආර සාරධර්ම වැඩිදියුණු කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම | මහඅලුත්ගම් ආර | 10,000.00 | 10,000.00 | 100 | 3,500.00 | ග්‍රාම නිලධාරි | මාස 03- |
| 11 | ආධ්‍යාත්මික සංවර්ධන | අඩු ආදායම් සහිත පවුල්වල දරුවන් හා දෙමාපියන් දැනුවත් කිරීම | ප්‍රා.ලේ: කොට්ඨාශය | 20,000.00 | | 150 | | ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි | මාස 03- |
| 12 | ආධ්‍යාත්මික සංවර්ධන | කඩින්කඩ පාසල් යන දරුවන්ට පාසල් උපකරණ ලබාදීම | ප්‍රා.ලේ: කොට්ඨාශය | 43,200.00 | 43,272.00 | 36 | | ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි | මාස 03- |
| 13 | යටිතල පහසුකම් සං: | පොදු සුසානභූමිය වටා වැට ගැසීම ගේට්ටුව හා සුසානාගාරය ඉදිකිරීම | ඉහුගම්වෙහෙර නව නගරය | 400,000.00 | 87,500.00 | 350 | 57,322.95 | ප්‍රාදේශීය සභාව - ලුණුගම්වෙහෙර | මාස 03- |
| 14 | යටිතල පහසුකම් සං: | සේනපුර මැද පාර ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම | සේනපුර | 400,000.00 | 387,199.18 | 150 | 37,985.27 | ප්‍රාදේශීය සභාව - ලුණුගම්වෙහෙර | මාස 03- |
| 15 | යටිතල පහසුකම් සං: | 70 වෙ පාර කොන්ක්‍රීට් කිරීම | දෙබරවෙහෙර | 400,000.00 | 394,156.47 | 135 | 36,818.56 | ප්‍රාදේශීය සභාව - ලුණුගම්වෙහෙර | මාස 03- |
| 16 | යටිතල පහසුකම් සං: | සාලියපුර පන්සලේ සිට හන්දිය දක්වා දිවෙන මාර්ගය කොන්ක්‍රීට් කිරීම (අදියර වශයෙන්) | සාලියපුර | 400,000.00 | 411,298.54 | 40 | 40,285.05 | ප්‍රාදේශීය සභාව - ලුණුගම්වෙහෙර | මාස 03- |
| 17 | යටිතල පහසුකම් සං: | ගොවිජනසේවා මධ්‍යස්ථානයට යන පාර කොන්ක්‍රීට් කිරීම බර වාහන වලට ඔරොත්තු දෙන සේ | සද්ධාතිස්සපුර නව නගරය | 400,000.00 | 404,154.64 | 1500 | 39,057.00 | ප්‍රාදේශීය සභාව - ලුණුගම්වෙහෙර | මාස 03- |
| 18 | යටිතල පහසුකම් සං: | 2008 වසරේ ජාතික සවිය මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම | සිංහපුර | 400,000.00 | 374,815.23 | 60 | 39,283.28 | ප්‍රාදේශීය සභාව - ලුණුගම්වෙහෙර | මාස 03- |
| 19 | යටිතල පහසුකම් සං: | 2008 වසරේ ජාතික සවිය මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම | සමන්පුර | 400,000.00 | 392,587.57 | 120 | 38,543.69 | ප්‍රාදේශීය සභාව - ලුණුගම්වෙහෙර | මාස 03- |
| 20 | යටිතල පහසුකම් සං: | පැලැස්ස පාර කොන්ක්‍රීට් කිරීම | පුංචි අප්පුජඳුර | 400,000.00 | 399,431.71 | 300 | 41,534.55 | ප්‍රාදේශීය සභාව - ලුණුගම්වෙහෙර | මාස 03- |
| 21 | යටිතල පහසුකම් සං: | ග්‍රාම නිලධාරි කාර්යාලය ඇති ඉඩම් අංක 600 දක්වා වූ පාර කොන්ක්‍රීට් කිරීම | පරාක්‍රමපුර | 400,000.00 | 409,117.58 | 68 | 36,865.91 | ප්‍රාදේශීය සභාව - ලුණුගම්වෙහෙර | මාස 03- |
| 22 | යටිතල පහසුකම් සං: | ඉඩම් අංක 69 සිට 131 දක්වා පාර කොන්ක්‍රීට් කිරීම 01 අදියර | මිහිඳුපුර | 400,000.00 | 220,180.30 | 200 | 41,944.39 | ප්‍රාදේශීය සභාව - ලුණුගම්වෙහෙර | මාස 03- |
| 23 | යටිතල පහසුකම් සං: | ජනපද නිලධාරි කාර්යාලය ඉදිරිපිට පාර ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම | රණසිරිපුර | 400,000.00 | 385,664.89 | 225 | 37,522.24 | ප්‍රාදේශීය සභාව - ලුණුගම්වෙහෙර | මාස 03- |
| 24 | යටිතල පහසුකම් සං: | පන්සල ඉදිරිපිට පාර කොන්ක්‍රීට් කිරීම | රණවර්නාව | 400,000.00 | 321,262.90 | 350 | 37,985.27 | ප්‍රාදේශීය සභාව - ලුණුගම්වෙහෙර | මාස 03- |
| 25 | යටිතල - පහසුකම් සං: | පඩික්කම්වල ගම්මානයේ බෝක්කු 07 ඉදිකිරීම | මහානාගපුර | 400,000.00 | 405,572.02 | 155 | 75,724.46 | ප්‍රාදේශීය සභාව - ලුණුගම්වෙහෙර | මාස 03- |
| 26 | යටිතල පහසුකම් සං: | සමුපකාරය ඉදිරිපිට පෙට්ටි බෝක්කු 01 ක් සමග මාර්ගය කොන්ක්‍රීට් කිරීම(50ව) | අභයපුර | 400,000.00 | 242,279.86 | 75 | 62,271.34 | ප්‍රාදේශීය සභාව - ලුණුගම්වෙහෙර | මාස 03- |
| 27 | යටිතල පහසුකම් සං: | මහඅලුත්ගම්ආර වම් ඉවුර ප්‍රධාන පාරේ මහඅලුත්ගම්ආර හමුවන ස්ථානයේ වගුරු කොටස කොන්ක්‍රීට් කිරීම | මහඅලුත්ගම් ආර | 400,000.00 | | 200 | 44,500.70 | ප්‍රාදේශීය සභාව - ලුණුගම්වෙහෙර | මාස 03- |
| 28 | යටිතල පහසුකම් සං: | ජන උද්‍යාන ගම්මානයේ තෝරාගත් ස්ථාන සඳහා පෙට්ටිබෝක්කු ඉදිකිරීම | සද්ධාතිස්සපුර | 400,000.00 | 313,495.02 | 175 | 72,371.70 | ප්‍රාදේශීය සභාව - ලුණුගම්වෙහෙර | මාස 03- |
| 29 | යටිතල පහසුකම් සං: | ජුල්ගස්හන්දිය උඩවැව පාරේ මග සැගුමෙන් කොන්ක්‍රීට්කර ඇති පාරේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම | වීරවිල් ආර | 400,000.00 | | 300 | 39,844.83 | ශිවිසුමු අත්සන් කර නැත | මාස 03- |
| 30 | යටිතල පහසුකම් සං: | පහල මත්තල පෙර පාසල් ගොඩනැගිල්ලේ දැල් ගැසීම හා කාමර 02 ක් ඉදිකිරීම | පහල මත්තල | 400,000.00 | 80,000.00 | 269 | 47,115.09 | ග්‍රා : සං සමිතිය පහලමත්තල | මාස 03- |
| 31 | යටිතල පහසුකම් සං: | ක්‍රීඩාපිටිය අසල සිට අංක 345 හා 358 ඉඩම දක්වා සහ එතැන් සිට කරඹවැව දක්වා ඇලක් කැපීම හා පැති බැම් ඉදිකිරීම | අග්බෝපුර | 400,000.00 | 207,016.17 | 100 | 110,611.61 | සමෘද්ධි සමිතිය - අග්බෝපුර | මාස 03- |
| 32 | ජීවනෝපාය සංවර්ධන | වැලිගත්ත නව නගරයේ ඇතිකට්වක හා ඇල මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | වැලිගත්ත | 500,000.00 | - | 75 | | සමෘද්ධි සමිතිය - වැලිගත්ත | මාස 03- |
| 33 | ජීවනෝපාය සංවර්ධන | පඩික්කම්වල වැව අසල වීරවිල්ආර අමුණ ගංවතුරින් කැඩීගිය කොටස කොන්ක්‍රීට් කිරීම | මහානාගපුර | 500,000.00 | - | 150 | | සමෘද්ධි සමිතිය - | මාස 03- |
| 34 | ජීවනෝපාය සංවර්ධන | පහල මත්තල දකුණ ඉවුර ප්‍රධාන ඇලේ සිට අංක 7-8 ඉඩම් 02 අතර ප්‍රධාන ඇලට යටින් අත්වලොසින් එකක් ඉදිකිරීම | පහල මත්තල | 500,000.00 | - | 100 | | සමෘද්ධි සමිතිය - මහානාගපු | මාස 03- |
| 35 | ජීවනෝපාය සංවර්ධන | සිරිබිපුර හා රඹුක්වැව ඒකාබද්ධ උස්සන ජල ව්‍යාපෘතියේ නල එලීම | සිරිබිපුර | 500,000.00 | - | 40 | 140,684.72 | ග්‍රාසං: සමිතියර සිරිබිපුර | මාස 03- |
| 36 | ජීවනෝපාය සංවර්ධන | සිරිබිපුර හා රඹුක්වැව ඒකාබද්ධ උස්සන ජල ව්‍යාපෘතියේ නල එලීම | රඹුක්වැව | 500,000.00 | | | | ග්‍රාසං: සමිතිය ඇත්කරනියම | මාස 03- |
| 37 | ජීවනෝපාය සංවර්ධන | සේනපුර කටුපිල වැව මගින් උස්සන ජල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම | සේනපුර | 500,000.00 | - | 40 | | සමෘද්ධි සමිතිය - සේනපුර | මාස 03- |
| 38 | ජීවනෝපාය සංවර්ධන | සාමකාරමික එළිය ණය ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම | සිංහපුර | 100,000.00 | 100,000.00 | 15 | | සමෘද්ධි බැංකු සංගමය - | මාස 03- |
| 39 | ජීවනෝපාය සංවර්ධන | පඩවිගම වැවේ දොර දෙක අලුත්වැඩියා කිරීම හා ස්පිල් ඇල ඉතිරි කොටස ප්‍රතිසංස්කරණය කිරීම | පඩවිගම | 500,000.00 | 75,000.00 | 35 | 45,721.73 | ශ්‍රියා යොවි සංවිධානය | මාස 03- |
| 40 | ජීවනෝපාය සංවර්ධන | ස්වයං රැකියා සඳහා එළිය ණය ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම | දෙබරවෙහෙර | 100,000.00 | 100,000.00 | 10 | | සමෘද්ධි බැංකු සංගමය - දෙබරවෙහෙර | මාස 03- |
| 41 | ජීවනෝපාය සංවර්ධන | ස්වයං රැකියා සඳහා එළිය ණය ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම | සාලියපුර | 100,000.00 | 100,000.00 | 10 | | සමෘද්ධි බැංකු සංගමය - බෙරලිහෙල | මාස 03- |
| 42 | ජීවනෝපාය සංවර්ධන | ස්වයං රැකියා සඳහා එළිය ණය ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම | සද්ධාතිස්සපුර නව නගරය | 100,000.00 | 100,000.00 | 10 | | සමෘද්ධි බැංකු සංගමය - බෙරලිහෙල | මාස 03- |

| 1 | | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |
|---|---|---|---|---|---|---|---|---|---|
| | වැඩසටහන | ව්‍යාපෘතියේ නම | ග්‍රාම නිලධාරී කොට්ඨාශය | වෙන් කරන ලද මුදල රු: | 2009.11.30 ට වියදම් කළ මුදල | ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව | ප්‍රජා දායකත්වය රු: | ක්‍රියාත්මක ලියාපදිංචි කළ සමිතිය | නිමවීමෙන් පසු වග කියන කාල සීමාව |
| 43 | ජීවනෝපාය සංවර්ධන | ස්වයං රැකියා සඳහා චක්‍රිය ණය ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම | පුංචිඅප්පුජදුර | 100,000.00 | 100,000.00 | 10 | | සමෘද්ධි බැංකු සංගමය - දෙවිරම්වෙහෙර | මාස 03- |
| 44 | ජීවනෝපාය සංවර්ධන | ස්වයං රැකියා සඳහා චක්‍රිය ණය ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම | පරාක්‍රමපුර | 100,000.00 | 100,000.00 | 10 | | සමෘද්ධි බැංකු සංගමය - බෙරලිහෙල | මාස 03- |
| 45 | ජීවනෝපාය සංවර්ධන | ස්වයං රැකියා සඳහා චක්‍රිය ණය ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම | රණවරණාව | 100,000.00 | 100,000.00 | 10 | | සමෘද්ධි බැංකු සංගමය - දෙවිරම්වෙහෙර | මාස 03- |
| 46 | ජීවනෝපාය සංවර්ධන | ස්වයං රැකියා සඳහා චක්‍රිය ණය ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම | සද්ධාතිස්සපුර | 100,000.00 | 100,000.00 | 10 | | සමෘද්ධි බැංකු සංගමය - බෙරලිහෙල | මාස 03- |
| 47 | ජීවනෝපාය සංවර්ධන | කෘෂිකාර්මික චක්‍රිය ණය ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම | සමන්පුර | 100,000.00 | 100,000.00 | 15 | | සමෘද්ධි බැංකු සංගමය - වීරවිල | මාස 03- |
| 48 | ජීවනෝපාය සංවර්ධන | කෘෂිකාර්මික චක්‍රිය ණය ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම | මිහිඳුපුර | 100,000.00 | 100,000.00 | 15 | | සමෘද්ධි බැංකු සංගමය - වීරවිල | මාස 03- |
| 49 | ජීවනෝපාය සංවර්ධන | වාණිජ වගාවක් ලෙස මුරුංගා වගාව සඳහා චක්‍රිය ණය වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම | අභයපුර | 100,000.00 | 100,000.00 | 15 | | සමෘද්ධි බැංකු සංගමය - වීරවිල | මාස 03- |
| 50 | ජීවනෝපාය සංවර්ධන | වාණිජ වගාවක් ලෙස මුරුංගා වගාව සඳහා චක්‍රිය ණය වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම | මහඅලුත්ගම්ආර | 100,000.00 | 100,000.00 | 15 | | සමෘද්ධි බැංකු සංගමය - දෙවිරම්වෙහෙර | මාස 03- |
| 51 | ජීවනෝපාය සංවර්ධන | කෘෂිකාර්මික චක්‍රිය ණය ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම | අග්බෝපුර | 100,000.00 | 100,000.00 | 15 | | සමෘද්ධි බැංකු සංගමය - වීරවිල | මාස 03- |
| 52 | ජීවනෝපාය සංවර්ධන | ස්වයං රැකියා සඳහා චක්‍රිය ණය ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම | වීරවිල්ආර | 100,000.00 | 100,000.00 | 15 | | සමෘද්ධි බැංකු සංගමය - දෙවිරම්වෙහෙර | මාස 03- |
| 53 | ජීවනෝපාය සංවර්ධන | සුළු ව්‍යාපාර සංවර්ධනය සඳහා චක්‍රිය ණය වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම | ලුණුගම්වෙහෙර නව නගරය | 100,000.00 | 100,000.00 | 15 | | සමෘද්ධි බැංකු සංගමය - දෙවිරම්වෙහෙර | මාස 03- |
| 54 | ජීවනෝපාය සංවර්ධන | රණසිරිපුර ඉදිකර ඇති කෘෂි ළිඳෙහි වැඩ අවසන් කිරීම | රණසිරිපුර | 100,000.00 | | 15 | | | මාස 03- |
| 55 | යටිතල පහසුකම් සං: | 70 වේ පාර ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම | දෙවිරම්වෙහෙර | 400,000.00 | | 10 | 39,844.83 | | මාස 03- |
| 56 | යටිතල පහසුකම් සං: | සාලියපුර පන්සලේ සිට හන්දිය දක්වා දිවෙන මාර්ගය ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම ( අදියර වශයෙන්) | සාලියපුර | 400,000.00 | | 40 | 39,006.12 | සමෘද්ධි සමිතිය - සාලියපුර | මාස 03- |
| 57 | යටිතල පහසුකම් සං: | ගොවිජන සේවා මධ්‍යස්ථානයට යන පාර ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම බර වාහන වලට ඔරොත්තු දෙන සේ | සද්ධාතිස්සපුර නව නගරය | 400,000.00 | | 1500 | 16,431.51 | සමෘද්ධි සමිතිය - - සද්ධාතිස්සපුර | මාස 03- |
| 58 | යටිතල පහසුකම් සං: | 2009 වසරේ ජාතික සවිය මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම | සමන්පුර | 400,000.00 | 292,564.90 | 120 | 40,544.48 | ග්‍රාම සංවර්ධන සමිතිය | මාස 03- |
| 59 | යටිතල පහසුකම් සං: | පැලැස්ස පාර ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම | පංචිඅප්පුජදුර | 400,000.00 | | 300 | 43,830.68 | පුංචිඅප්පුජදුර ග්‍රාම සංවර්ධන සමිතිය | මාස 03- |
| 60 | යටිතල පහසුකම් සං: | ග්‍රාම නිලධාරී කාර්යාලය ඇති ඉඩමේ අංක 660 දක්වා වූ පාර ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම | පරාක්‍රමපුර | 400,000.00 | | 68 | 40,214.99 | සමෘද්ධි සමිතිය - පරාක්‍රමපුර | මාස 03- |
| 61 | යටිතල පහසුකම් සං: | ඉඩම් අංක 69 සිට 131 දක්වා පාර ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම | මිහිඳුපුර | 400,000.00 | | 200 | 42,792.13 | | මාස 03- |
| 62 | යටිතල පහසුකම් සං: | ප්‍රජා ශාලාව අසල සිට පල්ලිය පාර කොන්ක්‍රීට් කිරීම | රණසිරිපුර | 400,000.00 | | 225 | 39,764.08 | ග්‍රාම සංවර්ධන සමිතිය | මාස 03- |
| 63 | යටිතල පහසුකම් සං: | පන්සල ඉදිරිපිට පාර ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම | රණවරණාව | 400,000.00 | | 350 | 38,832.10 | | මාස 03- |
| 64 | යටිතල පහසුකම් සං: | සමූපකාරය ඉදිරිපිට පෙට්ටි බෝක්කු 02ක් සමග මාර්ගය ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම | අභයපුර | 400,000.00 | | 75 | 46,037.37 | | මාස 03- |
| 65 | යටිතල පහසුකම් සං: | සද්ධාතිස්ස පුර නිර්මාණ හන්දියේ සිට පාසල් මාවත කොන්ක්‍රීට් කිරීම | සද්ධාතිස්ස පුර | 400,000.00 | | 175 | 39,210.42 | | මාස 03- |
| 66 | යටිතල පහසුකම් සං: | තෝරාගත් ස්ථාන 03ක පෙට්ටි බෝක්කු 03ක් ඉදිකිරීම හා පැති බැම්මමේ ඉතිරි කොටස හා ජලයෙන් යටවන මාර්ග කොටස පස් හා බොරළු දමා පිරවීම | අග්බෝපුර | 400,000.00 | | 100 | 52,317.03 | ජනසතන ප්‍රජා ප්‍රබුද්ධ මණ්ඩලය | මාස 03- |
| 67 | ජීවනෝපාය සංවර්ධන | කරඹෑව ප්‍රජා ශාලාව ප්‍රති: ය කිරීම/යටවරිත් කිරීම/විදුලි සම්බන්ධය ලබාදීම හා කරඹෑව පාසලේ ගේට්ටුව | කරඹෑව | 500,000.00 | | 250 | | සමෘද්ධි සමිතිය - කරඹෑව | මාස 03- |
| 68 | යටිතල පහසුකම් සං: | සිංහපුර ඉඩම් අංක 619 හා 849 අතර පෝදා පාලුවට ලක්ව ඇති කොටස කොන්ක්‍රීට් කිරීම | සිංහපුර | 400,000.00 | | 200 | 39,844.83 | සිංහපුර සමෘද්ධි සමිතිය | මාස 03- |
| 69 | යටිතල පහසුකම් | ජුල්ගස්හන්දිය උඩවැව පාරේ මග හැයුමෙන් කොන්ක්‍රීට් කර ඇති පාරේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම | වීරවිල්ආර | 400,000.00 | | 200 | 39,844.83 | | මාස 03- |
| 70 | යටිතල පහසුකම් | කම්මල් දෙවට මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම | බෝගහවැව | 400,000.00 | | 50 | 250,000.00 | අදාළ වසමේ සමෘද්ධි සමිතිය | මාස 03- |
| 71 | යටිතල පහසුකම් | වැව පහලින් කුඹුරු වලට යන මාර්ගය කොන්ක්‍රීට් කිරීම(ඉතිරි කොටස) | අගුණකොළවැව | 400,000.00 | | 50 | 250,000.00 | අදාළ වසමේ සමෘද්ධි සමිතිය | මාස 03- |
| 72 | යටිතල පහසුකම් | උඩ මත්තල වැවට යන ප්‍රධාන මාර්ගය කොන්ක්‍රීට් කිරීම(ඉතිරි කොටස) | උඩමත්තල | 400,000.00 | | 90 | 250,000.00 | අදාළ වසමේ සමෘද්ධි සමිතිය | මාස 03- |
| 73 | යටිතල පහසුකම් | කුඩාගම් 03 බෙරලිහෙල ප්‍රජාශාලාව අලුත්වැඩියා කිරීම | බෙරලිහෙල | 400,000.00 | | 400 | 250,000.00 | අදාළ වසමේ සමෘද්ධි සමිතිය | මාස 03- |
| 74 | යටිතල පහසුකම් | ජනසවි මාර්ගය ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම | දුටුගැමුණුපුර | 400,000.00 | | 350 | 250,000.00 | අදාළ වසමේ සමෘද්ධි සමිතිය | මාස 03- |

| 1 | | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |
|---|---|---|---|---|---|---|---|---|---|
| | වැඩසටහන | ව්‍යාපෘතියේ නම | ග්‍රාම නිලධාරී කොට්ඨාශය | වෙන් කරන ලද මුදල රු. | 2009.11.30 ට වියදම් කළ මුදල | ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව | ප්‍රජා දායකත්වය රු. | ක්‍රියාත්මක ලියාපදිංචි කළ සමිතිය | නිමවීමෙන් පසු වග කියන කාල සීමාව |
| 75 | යටිතල පහසුකම් | ප්‍රජාශාලාව අලුත්වැඩියා කිරීම | ජයගම | 400,000.00 | | 200 | 250,000.00 | අදාළ වසමේ සමෘද්ධි සමිතිය | මාස 03- |
